328 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 328 - இல. 09
Volume 328 - No. 09

2026 අගෝස්තු 04 වන අඟහරුවාදා
2026 ஓகஸ்ட் 04, செவ்வாய்க்கிழமை
Tuesday, 04th August, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ:**

මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 1521]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1522]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1525]

**2026.08.01 දින මහර බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය:**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1529]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1532-1575]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සහ අධිකරණ පද්ධතියේ අනෙකුත් ප්‍රතිසංස්කරණ [තීරුව 1575]

එල් නිනෝ තත්ත්වයේ බලපෑමට මුහුණ දීමට රජයේ සූදානම [තීරුව 1583]

**මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉඩම් වෙන් කිරීම හේතුවෙන් උතුරු හා නැඟෙනහිර ජන සනත්වයට ඇති කරන බලපෑම:**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1587]

**උතුරු සහ නැඟෙනහිර පළාත්වල හමුදාව විසින් අත්පත් කරගෙන ඇති සිවිල් ජනතාවට අයත් ඉඩම් නිදහස් කිරීම:**

ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රකාශය [තීරුව 1592]

**ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 1599]

**පරිපූරක මුදල:**

මැද පෙරදිග යුද්ධයේ අහිතකර බලපෑම අවම කිරීම සඳහා සහන සැලසීම [තීරු 1599-1696]

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය:**

විගණකාධිපතිගේ වැටුප - විවාදය කල් තබන ලදී [තීරුව 1697]

**කල් තැබීමේ යෝජනාව:**

කුලී නිවැසියන් සඳහා ස්ථිර නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් [තීරු 1698-1709]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1710-1714]


# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்:**

பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 1521]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1522]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1525]

**2026.08.01ஆம் திகதி மஹர சிறைச்சாலையில் ஏற்பட்ட அமைதியின்மை:**

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரினது கூற்று [ப: 1529]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1532-1575]

**தனி அறிவித்தல் மூல வினா:**

நீதிபதிகளின் ஓய்வுபெறும் வயதை நீடித்தல் மற்றும் நீதித்துறை முறைமையின் இதர சீர்திருத்தங்கள் [ப: 1575]

எல் நினோ நிலைமையின் தாக்கத்தை எதிர்கொள்வதில் அரசின் தயார் நிலை [ப: 1583]

**மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழான நில ஒதுக்கீடு வடக்கு, கிழக்கு மக்களின் குடிப்பரம்பல்மீது ஏற்படுத்தும் தாக்கம்:**

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று [ப: 1587]

**வடக்கு, கிழக்கு மாகாணங்களில் இராணுவத்தினரால் கையகப்படுத்தப்பட்டுள்ள பொதுமக்களின் காணிகளை விடுவித்தல்:**

பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று [ப: 1592]

**பாதுகாப்புப் பணியாட்டொகுதியினரின் தலைமையதிகாரி (நீக்கல்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1599]

**குறைநிரப்புத் தொகை:**

மத்திய கிழக்குப் போரின் தாக்கத்தைக் குறைப்பதற்கு நிவாரணம் வழங்கல் [ப: 1599-1696]

**அரசியலமைப்பின் கீழான தீர்மானம்:**

கணக்காய்வாளர் தலைமையதிபதியின் சம்பளம் - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 1697]

**ஒத்திவைப்புப் பிரேரணை:**

வாடகை குடியிருப்பாளர்களுக்கு நிரந்தர வீடுகளை வழங்குவதற்கான வேலைத்திட்டம் [ப: 1698-1709]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1710-1714]

# PRINCIPAL CONTENTS


MESSAGES FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 1521]

AUDITOR - GENERAL'S REPORT [Col. 1522]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1525]

UNREST ERUPTED AT MAHARA PRISON ON 01.08.2026:
Statement by Minister of Justice and National Integration [Col. 1529]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1532-1575]

QUESTION BY PRIVATE NOTICE:
Extension of Retirement Age of Judges and Other Reforms in Judicial System [Col. 1575]
Government's Preparedness to Face Impact of El Niño [Col. 1583]

IMPACT ON DEMOGRAPHY OF NORTH AND EAST DUE TO LAND ALLOCATION MADE UNDER MAHAWELI DEVELOPMENT PROJECT:
Statement by Minister of Agriculture, Livestock, Land and Irrigation [Col. 1587]

RELEASE OF CIVILIAN LANDS HELD BY MILITARY IN NORTHERN AND EASTERN PROVINCES:
Statement by Deputy Minister of Defence [Col. 1592]

CHIEF OF DEFENCE STAFF (REPEAL) BILL:
Read the First time [Col. 1599]

SUPPLEMENTARY SUM:
Provision of Relief to Mitigate Adverse Impact of Middle East Conflict [Cols. 1599-1696]

DETERMINATION UNDER THE CONSTITUTION:
Salary of Auditor-General - Debate Adjourned [Col. 1697]

ADJOURNMENT MOTION:
Programme to Provide Permanent Housing for Tenants [Cols. 1698-1709]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1710-1714]

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2026 අගෝස්තු 04වන අඟහරුවාදා***
*2026 ஓகஸ்ட் 04, செவ்வாய்க்கிழமை*
*Tuesday, 04th August, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ
## சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்
## MESSAGES FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2026 ජූලි මස 27 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති



## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LVIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXXII කොටස;
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXII හා LXIII කොටස්, තෙවැනි කාණ්ඩයේ XXVIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XLVI කොටස; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ II කොටස සහ තෙවැනි කාණ්ඩයේ I කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Postgraduate Institute of Archaeology of the University of Kelaniya for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the seven institutions coming under the purview of the Ministry of Finance, Planning and Economic Development in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

The Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 01.06.2026 to 30.06.2026 in terms of Section 6(1) of the Appropriation Act, No. 23 of 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පහත සඳහන් වාර්තා මම ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද, 2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ ශීර්ෂය 240 - වැඩසටහන 02 යටතේ පරිපූරක මුදල සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 02 යටතේ තිබෙන, "... ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් නිශ්චය කර ඇති අතර, වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;..." යන තීරණය අපට එදා සම්මත කර ගන්න බැරි වුණා. අපි ඒ කාරණාව සම්බන්ධයෙන් ගරු ජනාධිපතිවරයාට ලිපියකින් දැනුම් දුන්නා. ඒ නිසා අපි නැවතත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ජනාධිපති කාර්යාලයේ සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් අද දින කැඳවා තිබෙනවා. අද සවස අපි මේ කාරණය සාකච්ඡාවට ගන්නවා, ගරු කථානායකතුමනි. ඒ නිසා මේ යෝජනාව අද දින ගන්න පුළුවන්ද කියන එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මා මෙම කාරණය අහන්නේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ගරු සභාපතිතුමා එම කරුණ සමාලෝචනය කරනවා කියන කාරණාව මත, අපි ඒ යෝජනාව අද ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මෙහි තිබෙන්නේ විගණකාධිපතිතුමියගේ වැටුප් වැඩි කිරීම සම්බන්ධ තීරණයක්. ඒ නිසා ඔබතුමාට අද දිනයේදී ඒක කරන්න බැරි නම්, අපට මේ සතිය තුළදී ඒ සඳහා අවස්ථාවක් ලබා ගන්න පුළුවන් වෙයිද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමාගේ ප්‍රශ්නයට පිළිතුර වන්නේ, අපි අද ඒ කාරණය ගන්නවා කියන එකයි. ඊට පස්සේ කාරක සභාවේදී එය සාකච්ඡා කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අනුමැතිය- *[බාධා කිරීමක්]* එහෙම එකක් නැහැ, සභාපතිතුමා ඒ පිළිබඳව දන්නවා. ස්ථාවර නියෝග අනුව, අවශ්‍ය නම් ආණ්ඩුවට මේ යෝජනාව සම්මත කරන්න පුළුවන්. Consultative, instructive level එකේ power එකක් මිසක් override කරන්න බලයක් කමිටුවලට නැහැ; main Chamber එක තේ වැදගත් වන්නේ. නමුත් අපි එහෙම කරන්න යන්නේ නැහැ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම කිව්වේ දවල් 2-3 වෙනකොට මෙම තීරණය සම්බන්ධව කාරක සභාවේ අනුමැතිය දෙන්න පුළුවන් නම්, අපට අද දිනයේදීම මේ යෝජනාව සම්මත කර ගැනීමට ඉදිරිපත් කරන්න පුළුවන් කියන එකයි. මොකද, මෙය Auditor-Generalගේ වැටුප සම්බන්ධ ප්‍රශ්නයක් නිසා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන්නේ ටිකක් ගැඹුරු ප්‍රශ්නයක්. ඒ කියන්නේ, විගණකාධිපතිවරයා හෝ විගණකාධිපතිවරිය රාජ්‍ය සේවකයෙක් හැටියට හඳුන්වන්න පුළුවන්ද කියන එක. ඉතින් ඒ ගැන සියලුම සාමාජිකයින් සමඟ සාකච්ඡා කරලා, නීතිමය ප්‍රශ්නයක් හැටියට තමයි මෙම කාරණය ගත්තේ, ගරු කථානායකතුමනි. සම්ප්‍රදායානුකූලව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමැතිය ලබාගෙන තමයි මෙහිදීත් කටයුතු කරන්නේ. නමුත් සභානායකතුමා කිව්වා හරි. ඕනෑ නම් එහෙම නැතිව කටයුතු කරන්නත් පුළුවන්, Standing Orders අනුව. හැබැයි, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව එහෙම කරන්නේ නැහැ. ඉතින් ඒ නිසා අපට අද දවස දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හර්ෂ ද සිල්වා මැතිතුමා සභාපති ධුරය දරන තාක්කල් අපි එහෙම කරන්න බලාපොරොත්තුවකුත් නැහැ. මෙතැන තිබෙන්නේ විගණකාධිපතිතුමියගේ වැටුප සම්බන්ධ ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි. එතුමියගේ වැටුප අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ වැටුප හා සමාන කරලා තමයි කැබිනට් මණ්ඩලය අනුමත කරලා තිබෙන්නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම කිව්වේ ඔබතුමන්ලා අද අනුමත කරලා දෙනවා නම්, අපට අද වුණත් මෙම තීරණය සම්මත කරන්න පුළුවන් කියන එකයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, law must never be *ad hominem,* පෞද්ගලික කාරණා මත නීති වෙනස් කරන්න හොඳ නැහැ කියන එකත් එතුමාට මතක් කරන්න ඕනෑ. ඒ නිසා මෙම තීරණය අද ඉදිරිපත් කරන්න එපා, සභානායකතුමා. අද අපට කාලය දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මේ කාරණය මම පටු විදියට ගන්නේ නැහැ. නමුත් මම ගරු සභානායකතුමාටත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මේ කාරණය කියන්න කැමැතියි. විශේෂයෙන්ම පක්ෂ නායකයින්ගේ රැස්වීමකදී අපි මෙම න්‍යාය පත්‍රය සකස් කර ගන්නවා. ඇත්තවශයෙන්ම ඒ න්‍යාය පත්‍රයට මේ කාරණා ඇතුළත් කරනකොට අපි පදනම් කර ගන්නවා, මේ වාගේ සම්ප්‍රදායානුකූලව අනුගමනය කළ යුතු ක්‍රියාදාමයන්. එතකොට අද දවසේ Parliamentary Business යටතේ මේ සාකච්ඡාව ක්‍රියාත්මක කරන්නට බැහැ. ඒ මන්ද, මෙතුමාට ඒ නිසි අවස්ථාව ලබා දීලා නැහැ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින්. *[බාධා කිරීමක්]* මට විනාඩියක් දෙන්න.

මම යෝජනා කරන්නේ Parliamentary Business Committee එකේ Business, ඒ කියන්නේ ඊළඟ සතියේ න්‍යාය පත්‍රය සකස් කරනකොට යම්කිසි මාර්ග සිතියමක් හදා ගන්න කියලා, මෙන්න මේ දවසට මේ දේවල් ටික ගන්නවා කියලා. එහෙම නැතුව පාර්ලිමේන්තුව රැස්වන මොහොතේ නැඟිටලා, සිදු විය යුත්තක් සිදු නොවී තිබෙන මොහොතක මෙහෙම කටයුතු කරන්න බැහැ. මොකද, එය සභාපතිතුමාගේ වරදක් නොවෙයි. මම රජයෙන් ඉල්ලීමක් කරනවා, මේ න්‍යාය පත්‍රය සකස් කරනකොට ඒ කරුණු කාරණා සඳහා මීට වැඩිය අවධානයක් යොමු කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, සවස කමිටුවේදී අදාළ සාකච්ඡාව කර ගන්න. මොකද, මේ වෙලාවේ කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම යෝජනා කරනවා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාම ඒක කරනවා නම් හොඳයි කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මෙහෙමයි, ගරු කථානායකතුමනි. Non-Sitting week එකකදී තමයි අපි හම්බ වුණේ. ඒ, ගිය අඟහරුවාදා. ගිය අඟහරුවාදා හමු වෙලා, මම හිතන විදියට, සභානායකතුමාට පණිවුඩය ගිහිල්ලා තිබුණේ, අපි මේක reject කළා කියලායි. එහෙමයි පණිවුඩය ගිහිල්ලා තිබුණේ. නමුත් ගරු සභානායකතුමනි, මම ඔබතුමාව දැනුවත් කළා; ඒක අපි hold කරලා තිබුණේ. එදා අපි පාර්ලිමේන්තුවේ හමුවෙන දවසකුත් නොවෙයි. සවස 5.00න් පසුව තමයි අපි මේ කටයුත්ත ඉවර කළේ. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව රැස්වෙන්නේ නැති දවස්වලත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව රැස්වෙනවා, අවශ්‍ය කරුණු ඉෂ්ට කරන්නට. ඒ නිසා අපට අද දවස දීලා, අදින් පස්සේ ඒ තීරණය ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ කාරණය සම්බන්ධව සමතුලිත ආකාරයෙන් බලලා කටයුතු කිරීම පිළිබඳව.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ගෝනපල, කෝරළඉම, III වන අදියර, සිල්වර්වැලි වත්ත, අංක 721/79 යන ලිපිනයෙහි පදිංචි ඕ.සී.එල්. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

Hon. Speaker, I present a petition from Mr. W.M. Jayarathne of No. 187/A, Millathe, Kirindiwela.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, කුරුණෑගල, මුත්තෙට්ටුගල, සිංහ මාවත, අංක 505/30 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එච්.එම්. අභයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, කුරුණෑගල, මුත්තෙට්ටුගල, සිංහ මාවත, සුප්‍රිම්සිටි යන ලිපිනයෙහි පදිංචි ඒ.එස්. සේනාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාවේ අවසරය ඇතිව, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය, ගරු (නීතිඥ) හර්ෂණ නානායක්කාර මහතාගේ විශේෂ ප්‍රකාශය.

## 2026.08.01 දින මහර බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය: අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## 2026.08.01ஆம் திகதி மஹர சிறைச்சாலையில் ஏற்பட்ட அமைதியின்மை: நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரினது கூற்று
## UNREST ERUPTED AT MAHARA PRISON ON 01.08.2026: STATEMENT BY MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2026.08.01වන දින මහර බන්ධනාගාරයේ වූ සිදුවීම සම්බන්ධවයි. මෙදින පස් වරු 3.45ට පමණ රැඳවියන් තිදෙනෙකු මුළුතැන් ගෙයි වහලය මතට නැඟ විරෝධතාවක් දක්වා තිබෙනවා. එම තත්ත්වය සමනය කිරීම සඳහා මහර බන්ධනාගාර අධිකාරිතුමන් එම ස්ථානයට ගොස් ඔවුන් සමඟ විනාඩි 15ක් පමණ සාකච්ඡාවක් සිදු කළද රැඳවියන් එකඟතාවකට පැමිණියේ නැහැ. ඉන් පසුව වාට්ටුවල සිටි රැඳවියන් 1,000ක් පමණ එම ස්ථානයට එකවර පැමිණ ඇති අතර ඔවුන් විසින් මහ හඬින් ඝෝෂා කර තිබෙනවා. එම අවස්ථාවේදී තත්ත්වය පාලනය කර ගැනීමට නොහැකි වූ බැවින් මහර බන්ධනාගාර අධිකාරිතුමන් නිලධාරින් සමඟ පසුබැස ප්‍රධාන දොරටුවට පැමිණ යකඩ දොරටුව අගුළු දමා වසාගෙන තිබෙනවා. එම අවස්ථාව වනවිට එය කැරැල්ලක් දක්වා වර්ධනය වී ඇති අතර, රැඳවියන් ප්‍රධාන දොරටුව දෙසට හා පරිශ්‍රයෙන් ඉවතට ගල්මුල් ප්‍රහාර එල්ල කර ඇති නිසා තත්ත්වය පාලනය කර ගැනීමට නොහැකි වූ බැවින් එම අවස්ථාවේදී කඳුළු ගෑස් හා රබර් උණ්ඩ භාවිතයෙන් තත්ත්වය පාලනය කර ගැනීමට උත්සාහ කරන ලදී.

ඒ වනවිටත් ප්‍රධාන ජේලර් කාර්යාලය හා විනය අංශය රැඳවියන් විසින් ගිනි තබා විනාශ කර තිබෙනවා. ඉන්පසුව පොලීසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය හා යුද හමුදාව කැඳවා බන්ධනාගාර පරිශ්‍රය අවට ආරක්ෂාව තර කර තිබෙනවා. නැවත කලහකාරී රැඳවියන් විසින් බන්ධනාගාර කර්මාන්ත අංශය හා බන්ධනාගාර මුළුතැන් ගෙය ගිනි තබා විනාශ කර තිබෙනවා. 2026.08.01 දින රාත්‍රියේ සිට 2026.08.02 දින පෙර වරුව වනතුරුම ප්‍රධාන දොරටුව හා තාප්පයෙන් ඉවතට ගල්මුල් ප්‍රහාර එල්ල වී තිබෙනවා.

2026.08.02 දින පෙර වරු 7.00ට පමණ බන්ධනාගාර නිලධාරින්, පොලීසිය හා පොලිස් විශේෂ කාර්ය බලකාය සමඟ බන්ධනාගාර පරිශ්‍රයට ඇතුළු වී සියලු රැඳවියන් වාට්ටුවලට දමා වසා තත්ත්වය සම්පූර්ණයෙන්ම පාලනය කරනු ලැබුවා. එම සිදුවීමෙන් එක් රැඳවියෙකු මිය ගොස් තවත් අටදෙනෙකු තුවාල ලබා රෝහල්ගත කර ඇති අතර, නිලධාරින්ට ජීවිත හානි හෝ තුවාල සිදු වී නොමැත.

ගරු කථානායකතුමනි, මහර බන්ධනාගාරයේ ඇති වුණේ මීගමුව බන්ධනාගාරයේ ඇති වූ තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයකුයි. මීගමුව බන්ධනාගාරයේ සිද්ධ වුණේ රැඳවියන් දෙපිරිසක් අතර මත්ද්‍රව්‍ය හා පාතාලය සම්බන්ධ ගැටුමක්. මහර බන්ධනාගාරයේ රැඳවියන් ගැටුම ඇති කර ගන්නේ පාලන තන්ත්‍රය සමඟයි.

හැබැයි, මෙතැන අපැහැදිලි කරුණ මේකයි. මොවුන්ට මේ තත්ත්වය ඇති කිරීමට ආසන්නතම හේතුව මොකක්ද කියන එක මේ දක්වා අපට සොයා ගැනීමට නොහැකි වී තිබෙනවා. රැඳවියන් දෙදෙනෙකු වහලය උඩට වෙලා කථා කරනකොට එතැනට තුන්හතර දෙනෙකු ඇවිල්ලා මොකක්ද වෙන්නේ කියලා බලන එක හරි; 10ක්, 15ක් ඇවිල්ලා මොකක්ද වෙන්නේ කියලා බලන එක හරි. නමුත්, එක වතාවටම 1,000ක් එන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. මොකද, ඕනෑම බන්ධනාගාරයක යම් යම් රැඳවියන් සමඟ ප්‍රශ්න මතු වුණාට ගොඩක් වෙලාවට සාකච්ඡා කිරීමෙන් ඒ තත්ත්වය පාලනය කර ගැනීමට පුළුවන් වනවා.

නමුත්, මෙහිදී පැහැදිලි කළ යුතුයි, පෙර නොවූ විරූ ආකාරයට ගිනි තැබීම් කර තිබෙන බව. මොවුන් ගිනි තබා තිබෙන්නේ ඔවුන් ඉන්න cells හැරුණුකොට ඔවුන්ට උයන මුළුතැන් ගෙය, කන්න බොන්න තිබෙන තැන්, බෙහෙත් හේත්

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

ගන්න තැන් සහ කාර්යාල. ඒ කියන්නේ, මේ කටයුත්ත කරපු කට්ටියට එවැනි වුවමනාවක් තිබිලා තිබෙනවා කියලා පැහැදිලිව පෙනෙනවා. මොකද, මීට කලින් මෙහෙම වෙලා නැහැ. තමන්ගේ පෞද්ගලික ප්‍රශ්නයක් තිබෙනවා නම් මුළුතැන් ගෙය ගිනි තියන්න යන්නේ නැහැ නේ. මොකද, ඒ තමන්ට කන්න බොන්න තිබෙන තැන. නමුත් මහර සිර ගෙය කඩාකප්පල් කිරීමේ වැඩ පිළිවෙළක් මේ සංවිධානාත්මක ක්‍රමය තුළ තිබිලා තිබෙන බව පෙනෙනවා. ඒ වාගේම ඉන් පසුව ඇති වූ තත්ත්වයන් සියල්ල බලනකොට යම් සැකයක් පහළ වනවා, මෙවැනි කලබලකාරී තත්ත්වයක් ඇති කරන්න බාහිර බලපෑමක් තිබුණාද කියලා. අපි දැන් ඒ ගැන සොයා බලමින් පවතිනවා. මේ වනකොට පොලීසිය එතැනට පැමිණිලා තිබෙනවා, මහෙස්ත්‍රාත්වරු පැමිණිලා තිබෙනවා. ඒ වෙච්ච අලාභය විශාලයි. එය අවසන් වශයෙන් ගණනය කිරීම තමයි මේ නිශ්චිත මොහොතේදී සිද්ධ වෙන්නේ. මේ ප්‍රශ්න යටතේ වුණත්, වෙනත් බන්ධනාගාරවලින් කෑම උයලා, වෙනත් බන්ධනාගාරවලින් පහසුකම් අරගෙන ඒ රැඳවියන්ට අවශ්‍ය මූලික අවශ්‍යතා, සියලු පහසුකම් ලබා දෙන්න මේ අවස්ථාවේදීත් අපේ බන්ධනාගාර නිලධාරීන් කටයුතු කරනවා. නමුත් ඒ කටයුත්ත කරපු කට්ටියගේ වුවමනාව තිබුණේ prison එක පවත්වාගෙන යන්න බැරි තත්ත්වයකට ගෙනෙන එකයි. ඒක තමයි මේ සංවිධානාත්මකව සිදු කරන ලද ගිනි තැබීමෙන් පෙනෙන්නේ.

ඒ වාගේම මා කලින් කියූ පරිදි මේ ගැන විමර්ශන පැවැත්වෙනවා. ඒ වාගේම අපි ඒ ගැන සොයා බලනවා. එවැනි කුමන්ත්‍රණකාරී උදවිය ඉන්නවා නම්, ඔවුන්ට විරුද්ධව පියවර ගන්නත් අපි පැකිළෙන්නේ නැහැ.

අවසාන වශයෙන් මා මේ ගැනත් කියන්න ඕනෑ. මේ සිදුවීම් සම්බන්ධයෙන් ජනතාවගේ අවධානයත් යොමු කරන්නට ඕනෑ. ඒ වාගේම, මේ බන්ධනාගාර තුළ සිටින සමහර රැඳවියන්ගේ දෙමාපියනුත් මේක තේරුම් ගන්නට ඕනෑ. මේ ගිනි තියලා විනාශ කළේ මේ රටේ බදු ගෙවන මිනිස්සුන්ගේ සල්ලිවලින් ගොඩ නඟපු දේවල්. මේවා නැවත ගොඩ නඟන්නත් අපි වියදම් කරන්නේ බදු ගෙවන මිනිස්සුන්ගේ සල්ලි. ඒවා ගෙවන්න වෙන්නේ මේ රටේ ජනතාවට. මේ කලහකාරී තත්ත්වය ඇති කළේ බන්ධනාගාරයේ සිටි රැඳවියන් සියලු දෙනාම නොවෙයි. නමුත්, මේ සිද්ධියට සම්බන්ධ කිහිප දෙනෙක් ඉන්නවා. මෙන්න මේ සම්බන්ධයෙන් බන්ධනාගාර ඇතුළේ ඉන්න තමන්ගේ ආදරණීයයන්ට කියන්නට ඕනෑ. රජය විසින් මේ වන විට රස පරීක්ෂක වාර්තා ඉක්මන් කරලා ඔවුන්ට අවශ්‍ය සහන, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරමින් සිටින මොහොතක, මෙවැනි සිදුවීම් හරහා ඔවුන් ඔවුන්ගේම සුබසාධන මට්ටම පිරිහීමට ලක්කර ගන්නා තත්ත්වයටයි පත් වෙන්නේ. අන්න ඒ දේ නොකර ඉන්නය කියන ආයාචනය අප කරනවා.

දැන් මහර බන්ධනාගාරයේ තත්ත්වය සම්පූර්ණයෙන්ම පාලනය වෙලා තිබෙනවා. මේ වන විට කැබිනට් මණ්ඩලයෙන් කමිටුවක් පත් කර තිබෙනවා, මගේ සභාපතිත්වයෙන් යුතුව. ආනන්ද විජේපාල මැතිතුමා ඇතුළු අපේ ලේකම්වරුනුත්, පොලීසිය, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් එම කමිටුවට ඇතුළත්. අපි මේ සම්බන්ධයෙන් වාර්තාවක් සකසමින් පවතිනවා. බන්ධනාගාර තුළ පවතින තදබදය අඩු කිරීමට, රස පරීක්ෂක වාර්තා කඩිනම් කිරීමට, බන්ධනාගාර තුළ ආරක්ෂාව ඇති කිරීමට අවශ්‍ය ක්‍රමවේද අපි දැන් සකස් කරමින් සිටිනවා. අපි නිතරම මුණ ගැසී සාකච්ඡා කරමින් කරපු දෙයක් තමයි දැන් මේ කමිටුවක් වශයෙන් කරන්නේ.

අවසන් කාරණාව මෙයයි, ගරු කථානායකතුමනි. මෙය රැල්ලක් වශයෙන් පැතිරෙන්න පුළුවන් ද කියන කාරණය සම්බන්ධයෙනුත් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. මේ අවස්ථාව වන විට අපි සියලුම බන්ධනාගාර අධිකාරිවරුන්ට උපදෙස් දීලා තිබෙනවා, විශේෂ අවධානය යොමු කරන්න අවශ්‍ය තැන් පිළිබඳව. ඒ වාගේම, තවත් බන්ධනාගාර දෙකක් හෝ තුනක් සම්බන්ධයෙන් අපට යම් තොරතුරු ප්‍රමාණයක් ලැබෙනවා. ඒ තොරතුරු මා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ට ලබා දී තිබෙනවා. ඇති වන ඕනෑම තත්ත්වයක් මැඩලන්න අවශ්‍ය සම්බන්ධීකරණයක් අපි ගොඩ නඟනවා. ඇති වන ඕනෑම තත්ත්වයකදී ජීවිත හානි අවම කර ගැනීමටත්, බන්ධනාගාර තුළ තත්ත්වයන් නිසි ලෙස පවත්වා ගැනීමටත් ගත හැකි සෑම පියවරක්ම ගන්නවා.

එපමණයි, ගරු කථානායකතුමනි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -31/2024- (1), ගරු (නීතිඥ) හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -136/2024- (2), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අනියම් පදනම මත බඳවාගත් සත්ව එන්නත්කරුවන්: නැඟෙනහිර පළාත
## அமய அடிப்படையில் கால்நடை தடுப்பூசி ஏற்றுபவர்கள்: கிழக்கு மாகாணம்
## ANIMAL VACCINATORS ON CASUAL BASIS: EASTERN PROVINCE

1450/2025

**3. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නැඟෙනහිර පළාතේ දිස්ත්‍රික් මට්ටමින් සේවය කරන, සත්වයින්ට එන්නත් කරන්නන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාතට ඉහත තනතුර සඳහා අවශ්‍ය මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2018 වර්ෂයේදී ජලභීතිකා රෝගය මර්දනය කිරීමේ වැඩසටහන යටතේ "ජලභීතිකා මර්දන සහායක" තනතුර සඳහා අනියම් පදනමින් බඳවා ගත් අය අතුරින්, 2019 වර්ෂයේදී "සත්වයින්ට එන්නත් කරන්නන්" ලෙස අනියම් පදනමින් බඳවා ගනු ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iv) එලෙස අනියම් පදනමින් බඳවා ගනු ලැබූ සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிழக்கு மாகாணத்தில் மாவட்ட ரீதியாக பணியாற்றும் கால்நடை தடுப்பூசி ஏற்றுபவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அம்மாகாணத்துக்கு மேற்படி பதவிக்குத் தேவைப்படும் மொத்த ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) 2018ஆம் ஆண்டில் நீர்வெறுப்பு நோயைக் கட்டுப்படுத்தும் செயற்றிட்டத்தின்கீழ் 'நீர்வெறுப்பு நோய் ஒழிப்பு உதவியாளர்' பதவிக்கு அமய அடிப்படையில் ஆட்சேர்ப்புச் செய்யப்பட்டவர்களுள், 2019ஆம் ஆண்டில் கால்நடை தடுப்பூசி ஏற்றுபவர்களாக அமய அடிப்படையில் இணைத்துக்கொள்ளப்பட்டவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அவ்வகையில் அமய அடிப்படையில் இணைத்துக்கொள்ளப்பட்ட ஊழியர்களுக்கு நிரந்தர நியமனங்கள் வழங்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of Animal Vaccinators serving at district level in the Eastern Province;

(ii) total number of employees required for the above post in the said province;

(iii) number of individuals who were recruited on casual basis as Animal Vaccinators in the year 2019, out of those recruited on casual basis for the post of Rabies Control Assistant under the Rabies Control Programme in the year 2018; and

(iv) date on which action will be taken to grant permanent appointments to the employees thus recruited on a casual basis?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැගෙනහිර පළාත තුළ ස්ථිර සේවකයින් නොමැති අතර, අනියම් සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | ත්‍රිකුණාමලය | මඩකලපුව | කල්මු ණේ | අම්පාර |
|---|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 0 | 03 | 01 | 0 |

(ii) 26යි.

| දිස්ත්‍රික්කය | ත්‍රිකුණාමලය | මඩකලපුව | කල්මුණේ | අම්පාර |
|---|---|---|---|---|
| අවශ්‍ය මුළු සේවක සංඛ්‍යාව | 05 | 07 | 07 | 07 |

(iii) අනියම් පදනමින් 08 දෙනෙකු බඳවාගෙන තිබෙනවා.

| දිස්ත්‍රික්කය | ත්‍රිකුණාමලය | මඩකලපුව | කල්මුණේ | අම්පාර |
|---|---|---|---|---|
| අනියම් පදනමින් බඳවා ගනු ලැබූ සංඛ්‍යාව | 02 | 03 | 01 | 02 |

(iv) 2026.07.27 දින ස්ථිර පත්වීම් ලබා දීම සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති අතර, ක්‍රියාවලිය මේ වන විටත් සිදුවෙමින් පවතී.

(ආ) පැන නොනඟී.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මා ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කළේ, විශේෂිත වූ පුද්ගලයින් 7දෙනෙකුගේ ප්‍රශ්නයක්. ගරු අමාත්‍යතුමා සඳහන් කළා, temporary - casual basis - ඉන්න අයගේ සංඛ්‍යාව. මඩකලපුවේ 03යි, කල්මුණේ 01යි, ත්‍රිකුණාමලයේ 02යි, අම්පාරේ 02යි කියලා. ඔක්කෝම 8දෙනෙක් ඉන්නවා. අවුරුදු 9කට පෙර ඒ අයව බඳවා ගත්තේ, rabiesවලට එන්නත් කරන්න. මා හිතන විධියට ඒගොල්ලන්ට අවුරුදු 9ක් ඒ රැකියාව permanent විධියට දෙන්නේ නැතුව තියාගෙන ඉඳලා තිබෙනවා. RDHS හරහා තමයි ඒගොල්ලන්ව බඳවා ගත්තේ. ඒගොල්ලන්ට රැකියාව permanent විධියට දෙන්න බැහැ කියලා, මීට දවස් කිහිපයකට පෙර කියා තිබෙනවා. 150 days casual වැඩ කළොත් permanent කරන්න පුළුවන් කියන පදනම යටතේ, -

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
One hundred and eighty days.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
One hundred and eighty days? Okay, 180 days යටතේ. ඒගොල්ලන් interview කර තිබෙනවා, 2026.07.27 දින. ඒ කියන්නේ ගිය සතියේ. මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ මීට

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

අවුරුද්දකට විතර කලින්. Interview එක තියලා තිබෙනවා. ඒ නිසා මඩකලපුව දිස්ත්‍රික්කයේ හෝ අනෙක් දිස්ත්‍රික්කවල rabies වාගේ, සත්වයන් ආශ්‍රිත රෝග පාලනය කරන අය විධියට මේගොල්ලන්ට permanent ලෙස ඒ රැකියාව දෙන්න ඔබතුමන්ලා ක්‍රියාමාර්ග ගන්නවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඒ සඳහා තමයි සම්මුඛ පරීක්ෂණ පැවැත්වූයේ. ඇත්තටම ඊට අමතර වශයෙන් ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි ගරු මන්ත්‍රීතුමනි. සෞඛ්‍ය අමාත්‍යාංශයත්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයත් කියන අමාත්‍යාංශ තුනම මේ විෂයට තිබෙන අමාත්‍යාංශ. අතීතයේදී සිදු වෙච්ච යම් යම් ක්‍රියාකාරකම් නිසා මේ බඳවා ගැනීම්වල සහ රාජකාරි පිළිබඳ ප්‍රශ්න පවතිනවා. ඒ ප්‍රශ්නත් නිරාකරණය කරන්න අපි කටයුතු කරනවා. එහෙම කරලා, මේ එන්නත්කරුවන්ගේ ප්‍රමාණය වැඩි කිරීම තමයි අපේ බලාපොරොත්තුව. නමුත් මේකෙදි මේ අමාත්‍යාංශ අතර යම් එකඟතාවකට එන්නට ඕනෑ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අහන්න තව ගොඩක් ප්‍රශ්න තිබෙනවා. හැබැයි ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නොවන නිසා ඒවා අහන්නේ නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, முல்லைத்தீவிலுள்ள பல குறைபாடுகளை நாங்கள் சுட்டிக்காட்டும்போது, அவற்றை நீங்கள் ஆர்வமாக நிவர்த்தி செய்துகொண்டு வருகின்றீர்கள். மன்னார் வைத்தியசாலையில் CT scanner வசதி ஏற்படுத்தப்படுமென சொல்லியிருந்ததுபோல், முல்லைத்தீவு வைத்தியசாலையிலும் அந்த வசதியை ஏற்படுத்தித் தர வேண்டும். ஏனெனில், அங்கு CT scanner வசதி இல்லாமையால் நீண்ட காலமாக நூற்றுக்கணக்கான நோயாளர்கள் வவுனியா அல்லது வேறு மாவட்டங்களிலுள்ள வைத்தியசாலைகளுக்குச் சென்று வருகின்றார்கள். எனவே, இந்த வசதியை மிக விரைவில் அங்கு ஏற்படுத்தித் தர வேண்டுமென நான் முல்லைத்தீவு மாவட்ட மக்கள் சார்பாக கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

අපි මන්නාරමට CT scanner එකක් කඩිනමින් ලබා දෙනවා. ඒ වාගේම මුලතිව්වල අලුත් වාට්ටු සංකීර්ණය ඉදි කිරීමේ කටයුතු මේ අවුරුද්දේ නොවැම්බර් වන කොට ආරම්භ කරන්න පුළුවන්කම ලැබේවි. ලබන අවුරුද්ද සඳහා CT scanner, MRI scanner ඇතුළු උපකරණ සම්බන්ධව හඳාගත් ලැයිස්තුව පිළිබඳව යම් සමාලෝචනයක් අපි කරමින් පවතිනවා. ගරු ජනාධිපතිතුමාත් එක්ක අය වැය සම්බන්ධයෙන් කරපු සාකච්ඡාවේදීත් අවශ්‍ය උපකරණ එක වර ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කළා. අපි එහිදී මුලතිව් දිස්ත්‍රික් මහ රෝහල පිළිබඳවත් සාකච්ඡා කළා. සාමාන්‍යයෙන් ලබන වසරේ තුන්වැනි කාර්තුවේදී විතර අදාළ උපකරණ ලබා දීමට තිබෙන හැකියාව පිළිබඳව සොයා බලා කටයුතු කරන්නම්.

## "රක්නා ආරක්ෂක ලංකා කුලුනු ව්‍යාපෘතිය": විස්තර
"ரக்னா பாதுகாப்பு லங்கா கோபுரத் திட்டம்": விபரம்
"RAKNA ARAKSHAKA LANKA TOWERS PROJECT": DETAILS

2042/2026

**4. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රක්නා ආරක්ෂක ලංකා සමාගම ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(ii) `රක්නා ආරක්ෂක ලංකා කුලුනු ව්‍යාපෘතිය' නමින් වාණිජ කාර්යාල සංකීර්ණයක් ඉදි කර තිබේද;

(iii) එසේ නම්, ආරම්භ කළ වර්ෂය සහ අනුමැතිය ලබා දුන් පුද්ගලයන් කවුරුන්ද;

(iv) ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර ඇති මුදල, ආයෝජන ක්ෂේත්‍ර සහ අරමුදල් සපයා ගත් ආකාරය කවරේද;

(v) ආයෝජනය කිරීමේදී වෙළෙඳ පොළ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(vi) නො එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ව්‍යාපෘතියේ අරමුදල් වැය කිරීම සම්බන්ධයෙන් විගණනයක් සිදු කර තිබේද;

(ii) නො එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) ප්‍රසම්පාදන සහ මූල්‍ය මාර්ගෝපදේශ අනුගමනය කර තිබේද;

(iv) නො එසේ නම්, එම ක්ෂේත්‍ර කවරේද;

(v) කොන්ත්‍රාත්කරුවන්ට සිදු කළ ගෙවීම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) ව්‍යාපෘතියේ පිරිවැය සහ සමාගමේ වත්කම් සංසන්දනය කිරීමේදී මූල්‍ය අලාභයක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, එය කොපමණද;

(iii) එය සමාගමට දැරිය හැකි මට්ටමක තිබේද;

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියෙකු පත් කර තිබේද;

(v) ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(vi) එහි අරමුණු ඉටු වී තිබේද;

(vii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ரக்னா பாதுகாப்பு லங்கா நிறுவனம் ஆரம்பிக்கப்பட்டதன் நோக்கம் யாது;

(ii) 'ரக்னா பாதுகாப்பு லங்கா கோபுரத் திட்டம்' எனும் பெயரில் வணிக அலுவலகத் தொகுதியொன்று நிர்மாணிக்கப்பட்டுள்ளதா;

(iii) அவ்வாறாயின், அது ஆரம்பிக்கப்பட்ட ஆண்டு மற்றும் அதற்கு அனுமதி அளித்தவர்கள் யாவர்;

(iv) அத்திட்டத்துக்காக முதலீடு செய்யப்பட்டுள்ள தொகை, முதலீட்டுத் துறைகள் மற்றும் நிதி பெற்றுக்கொள்ளப்பட்டுள்ள விதம் யாது;

(v) முதலீடு செய்யும்போது சந்தை ஆய்வொன்று மேற்கொள்ளப்பட்டுள்ளதா;

(vi) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கருத்திட்டத்தின் நிதியைச் செலவிடுவது தொடர்பில் கணக்காய்வு செய்யப்பட்டுள்ளதா;

(ii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

(iii) பெறுகை மற்றும் நிதி வழிகாட்டல்கள் பின்பற்றப்பட்டுள்ளனவா;

(iv) இன்றேல், அத்துறைகள் யாவை;

(v) ஒப்பந்ததாரர்களுக்குச் செலுத்தப்பட்டுள்ள கொடுப்பனவுகள் குறித்த விபரங்களைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) கருத்திட்டத்துக்கான கிரயம் மற்றும் நிறுவனத்தின் சொத்துகளை ஒப்பிடும்போது நிதி ரீதியான நட்டம் ஏற்பட்டுள்ளதா;

(ii) அவ்வாறாயின், அந்த நிதித்தொகை யாது;

(iii) இது நிறுவனத்தால் தாங்கிக்கொள்ளக்கூடிய மட்டத்தில் உள்ளதா;

(iv) கருத்திட்டத்துக்கான மேற்பார்வை உத்தியோகத்தர் ஒருவர் நியமிக்கப்பட்டுள்ளாரா;

(v) இக்கருத்திட்டம் தொடர்ந்தும் நடைமுறைப்படுத்தப்படுகின்றதா;

(vi) அதன் நோக்கங்கள் நிறைவேற்றப்பட்டுள்ளனவா;

(vii) இத்திட்டம் தொடர்பான எதிர்கால நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the purpose of establishing the Rakna Arakshaka Lanka Ltd.;

(ii) whether a commercial office complex named 'Rakna Arakshaka Lanka Towers Project' has been constructed;

(iii) if so, the year of commencement of the said project and the names of the persons who have granted approval for the same;

(iv) the amount that is invested in the said project, the areas on which investments have been made and the funding sources for such investments;

(v) whether a market survey was conducted prior to the investments; and

(vi) if not, the reasons therefor?

(b) Will he state -

(i) whether an audit has been conducted regarding the disbursement of funds of the said project;

(ii) if not, the reasons therefor;

(iii) whether procurement guidelines and Financial Regulations have been followed therein;

(iv) if not, the areas in which such guidelines and regulations have not been followed; and

(v) whether the details of payments that have been made to contractors will be presented?

(c) Will he also state -

(i) whether a financial loss has occurred as far as the cost of the said project is compared with the assets of the said company;

(ii) if so, the amount of such loss;

(iii) whether the said company can afford such a loss;

(iv) whether a supervisory authority has been appointed in relation to the said project;

(v) whether the said project is still in operation;

(vi) whether the objectives of the said project have been achieved; and

(vii) the future action that will be taken regarding the said project?

(d) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා. මේ යටතේ රක්නා ආරක්ෂක ලංකා සමාගම සම්බන්ධවයි ප්‍රශ්න කිහිපයක් අහලා තිබෙන්නේ.

(අ) (i) "ආරක්ෂක සේවාවන් සැලසීම සඳහා" වේ.

සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ අරමුණින් 2006 දෙසැම්බර් 06වන දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 06/2330/206/083 යටතේ අනුමැතිය ලබා ගනිමින් මෙම සමාගම "ප්‍රමුඛ ආරක්ෂක ලංකා" නමින් ආරම්භ කර

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

තිබේ. පසුකාලීනව "සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම" ලෙසින් මෙහි නාමය වෙනස් වූ අතර, ව්‍යාපාරික කටයුතු, ආරක්ෂක සේවාවන් සැලසීමට අමතරව සමුද්‍ර මෙහෙයුම් කටයුතු, මුදල් ප්‍රවාහන සේවාව, කේටරින් සේවාව, පවිත්‍රතා සේවාව යනාදී වශයෙන් පුළුල් වී තිබේ.

(ii) රක්නා ආරක්ෂක ලංකා සමාගම යටතේ විශේෂ ව්‍යාපෘතියක් හැටියට කුලුනු ව්‍යාපෘතියක් පටන්ගෙන තිබෙනවා. ඒ සම්බන්ධව තමයි පිළිතුර (ii) අදාළ වන්නේ.

2014 වර්ෂයේදී සමාගම සඳහා ප්‍රධාන කාර්යාලයක් ඉදි කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2015 වර්ෂයේදී ව්‍යාපෘතිය අත්හිටුවා ඇති අතර, 2019 වර්ෂයේදී නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇත. එහිදී එවක මුදල් අමාත්‍යවරයා විසින්, ඉහළ වාණිජ වටිනාකමකින් යුතු මෙම භූමිය ප්‍රධාන කාර්යාලයක් වෙනුවට වෙනත් වාණිජ ව්‍යාපෘතියකට යොදාගත හැකි බව සඳහන් කරමින් යෝජනාවට එකඟ වී නොමැත.

ඒ අනුව, 2014 වර්ෂයේ සිට සිදු කළ මුදල් ආයෝජන සැලකිල්ලට ගනිමින් ගොඩනැඟිල්ල වාණිජමය ස්වරූපයෙන් සංවර්ධනය කිරීම සඳහා නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. පසුව, 2022.04.27 දින ජාතික අය වැය චක්‍රලේඛ අංක 03/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීමේ උපදෙස් මත ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව, එතැන් සිට මේ දක්වා ව්‍යාපෘති කටයුතු සිදු වී නොමැත.

(iii) රක්නා කුලුනු ව්‍යාපෘතිය වාණිජමය ස්වරූපයෙන් ආරම්භ කිරීම CP/21/0912/303/069 දරන 2021.05.17 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය සඳහා අනුමැතිය 2021.05.24 ලබා ගනිමින් සිදු කර ඇත.

ඒකට වග කියන්න ඕනෑ කියලා නිර්දේශ කිරීමක් කරලා තිබෙන්නේ, ඒ කාල වකවානුවේ සිටි නිලධාරීන්. ඒ කියන්නේ, විගණන වාර්තා අනුව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව යම් ව්‍යාපෘතියක වටිනාකම රුපියල් බිලියන 5 ඉක්මවන අවස්ථාවකදී කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ කැබිනට් අනුමැතියට ඉදිරිපත් කිරීමට පෙර ගත යුතු වුවත්, එම ව්‍යාපෘතියට අදාළව 2022 වර්ෂයේදී එවැනි නිර්දේශයක් ලබා ගැනීමට හෝ කැබිනට් අනුමැතියක් ලබා ගැනීමට ක්‍රියා කර නොමැත. ඒ අනුව, රක්නා ආරක්ෂක ලංකා සමාගම රජය සතු සමාගමක් වශයෙන්, ඉදිකිරීම්වලට අදාළව කොන්ත්‍රාත් ලබා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අනෙකුත් මූල්‍යමය නියමයන් උල්ලංඝනය කරමින් ක්‍රියා කර ඇති බවයි පෙන්නුම් කරන්නේ. කොටස් තුනකින් යුත් විගණන වාර්තාවල තමයි ඒ බව සඳහන් කර තිබෙන්නේ.

(iv) 2026.03.31 දින වන විට ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර ඇති මුළු මුදල රුපියල් 2,050,488,718.13කි.

මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස වාණිජ කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමේ අරමුණින් සිදු කරන ලද රක්නා කුලුනු ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 700ක බැංකු ණය මුදලක් ලබාගෙන ඇති අතර, ඉතිරි මුදල මව් සමාගම වන රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් යොදා ඇත.

(v) මෙම සමාගම සතුව පවතින තොරතුරුවලට අනුව - දැනට තිබෙන තොරතුරු අනුව ආරක්ෂක අමාත්‍යාංශය සොයා ගෙන තිබෙනවා - වෙළඳ පොළ සමීක්ෂණයක් සිදු කළ බවට තොරතුරු අනාවරණය නොවේ.

තවද MOD/CSD/03/16 (Rakna) (පොදු) දරන 2022.09.23 විගණන වාර්තාවේද දක්වා ඇත්තේ වෙළඳ පොළ සමීක්ෂණයක් සිදු කර නොමැති බවයි.

ව්‍යාපෘතියට අදාළව කිසිදු වෙළඳ පොළ සමීක්ෂණයක් සිදු කර නොමැති අතර වෙළඳ පොළ පරතරය, කර්මාන්තයෙහි ප්‍රවණතාව සහ කර්මාන්තය තුළ පවතින තරගකාරිත්වය පිළිබඳව නිසි වෙළඳ පොළ සමීක්ෂණයක් සහ අතිවිශාල ආයෝජනයක් සිදු කිරීමට ප්‍රථම ඉන් ලබන්නා වූ ප්‍රතිලාභ පිළිබඳව කිසිදු සහතිකයක් නොමැති බවද විගණන වාර්තා තුළින්ම සඳහන් කර තිබෙනවා.

(vi) එසේ නොකිරීම සඳහා හේතු සාධක අනාවරණ කර ගැනීමට හෝ එවක මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව සිටි නිලධාරීන් සහ වගකිව යුතු පාර්ශ්ව මේ වන විට මෙම සමාගම තුළ රාජකාරි කටයුතු සිදු නොකරයි.

වෙළඳ පොළ සමීක්ෂණයක් සිදු වී ඇති බවට ලිඛිත සාක්ෂි නොමැති බැවින් එවැන්නක් සිදු වී නොමැති බව පමණක් සඳහන් කළ හැක.

(ආ) (i) විගණනය සිදු කර ඇත.

රක්නා කුලුනු ව්‍යාපෘතියට අදාළව සිදු කර ඇති විගණන විස්තර පහත පරිදි වේ.

- සමාගමේ අභ්‍යන්තර විගණන වාර්තාව: 2022.09.05 දිනැති අංක: RALL/IA/RPHL/2022/12(58)
- ආරක්ෂක අමාත්‍යාංශයේ විගණන වාර්තාව: 2022.09.23 දිනැති අංක: MOD/CSD/03/16 (Rakna) (පොදු)
- ජාතික විගණන කාර්යාලයේ විශේෂ විගණන වාර්තාව 2026.03.03 දිනැති අංක: DEF/B/RALL/2022-23/01

මෙම විගණන විස්තර ඇතුළත තමයි මේ සියලු නිරීක්ෂණ ගෙනහැර දැක්වුවේ.

(ii) අදාළ නොවේ.

(iii) විගණන දෙපාර්තමේන්තුවේ 2026.03.03 දිනැති අංක DEF/B/RALL/2022-23/01 විශේෂ විගණන වාර්තාවට අනුව මූල්‍ය මාර්ගෝපදේශ අනුගමනය කර නොමැත. එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ අනුව සිදුකර ඇත.

(iv) අදාළ නොවේ.

(v) ඔව්. මේ දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත සිදුකර ඇති ගෙවීම් පහත සඳහන් පරිදි වේ.

| අ/අ | කොන්ත්‍රාත්කරු | ගෙවූ මුදල (රුපියල්) |
|---|---|---|
| 01 | MAGA Engineering (Private) Limited | 1,575,024,583.15 |
| 02 | The Design Group Five International (Pvt.) Ltd. | 319,203,608.98 |
| 03 | Urban Development Authority | 156,260,526.00 |
| | එකතුව | **2,050,488,718.13** |

(ඈ) (i) සමාගමට අලාභයක් සිදු වී ඇත.

(ii) ඉහත සඳහන් ප්‍රාග්ධන වියදම්වලට අමතරව 2026.03.31 දින වනවිට ලබාගෙන ඇති බැංකු ණය සඳහා ගෙවූ පොලිය සහ පරිපාලන වියදම් ලෙස මේ වනවිට දරා ඇති මුළු වියදම රුපියල් 226,547,736.11ක් වේ. ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් එම වියදම සමාගමට සිදු වූ අලාභයක් බව විගණනය සඳහන් වේ.

(iii) නැත.

"රක්නා කුලුන ව්‍යාපෘතිය" වෙනම සමාගමක් ලෙස ස්ථාපිත කර තිබූ අතර ව්‍යාපෘතිය අවසන් වූ පසු ආදායම් උපයා ගත හැකි ආකාරයට සැලසුම් කර තිබුණි. මෙහි වෙනත් ආදායම් නොමැත. එබැවින් මේ වනවිටත් එහි පවත්වාගෙන යාමේ වියදම් දරනු ලබන්නේ මව් සමාගම වන රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් වන බැවින්, එම වියදම දැරීමට සමාගමට හැකියාවක් නොමැත.

(iv) මෙම සමාගම සතුව පවතින තොරතුරුවලට අනුව අධීක්ෂණ නිලධාරියෙකු පත් කර ඇති බවට තොරතුරු අනාවරණය නොවේ.

(v) 2022 අප්‍රේල් 27 දින රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් වන මුදල් අමාත්‍යාංශයේ ජාතික අය වැය චක්‍රලේඛ අංක 03/2022 පදනම් කරගනිමින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමන් විසින් ලිපියක් මෙම සමාගම වෙත යොමු කරමින් තාවකාලිකව මෙම ව්‍යාපෘති කටයුතු අත්හිටුවන ලෙසට දන්වා ඇත. සමාගමට දන්වලා තිබෙනවා. එම උපදෙස් පිළිපදිමින් සමාගම විසින් මෙම ව්‍යාපෘති කටයුතු අත්හිටුවීමට කටයුතු කර තිබේ. ඒ අනුව ව්‍යාපෘති කටයුතු අත්හිටවූ දින සිට මේ දක්වා ව්‍යාපෘති කටයුතු සිදු වී නොමැත.

(vi) ව්‍යාපෘති කටයුතු අත්හිටුවීමට සිදු වීම හේතුවෙන් එහි අරමුණු ඉටු වී නොමැත.

(vii) සමාගම විසින් ඉදිරියට - ඒ කියන්නේ අපි බලයට පත් වුණාට පස්සේ මේ ගැන විශේෂ අවධානයක් යොමු කළා - මෙම ව්‍යාපෘති කටයුතු සිදු කිරීම සඳහා කිසිදු ආකාරයකින් අපේක්ෂා නොකරන බවට පැහැදිලිව අරමුණු කරගෙන තිබෙනවා. මෙම ව්‍යාපෘතිය අත්හිටුවීමට කළඳ මේ සම්බන්ධයෙන් දැනටත් සමාගම සතුව පවතින වගකීම්වලින් නිදහස් වීමට සමාගම විසින් කටයුතු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය - UDA එක - සමඟ ඇති කරගෙන තිබෙන 99 අවුරුදු බදු ගිවිසුම අවලංගු කර ගැනීම සඳහා මෙම සමාගම පියවර ගනිමින් පවතී. ඊට අදාළව වගකිව යුතු පාර්ශ්වයන්ගේ මැදිහත් වීම යටතේ සාකච්ඡා වට කිහිපයක්ම පවත්වන ලද අතර එහි අවසන් ප්‍රතිඵලය ලෙසින් UDA එක විසින් MUDC&H/2025/CP/146 දරන 2025 නොවැම්බර් 24 දරන අමාත්‍යාංශ සන්දේශය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කර තිබෙනවා. මීට අදාළව මෙම සමාගම විසින් එය 2025.12.22 වන දින ඉදිරිපත් කර ඇත.

මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ ලෙස දක්වා ඇත්තේ අදාළ භූමිය නැවතත් කඩිනමින් UDA එක වෙත ලබා දීමත්, ඊට අදාළ බදු ගිවිසුම අවලංගු කර ගැනීමත්, අදාළ ව්‍යාපෘතිය සඳහා UDA එක විසින් මැදිහත් වී නව ආයෝජකයකු සොයා ගැනීමට කටයුතු කිරීමත්, එලෙස ආයෝජකයෙකු වෙත මෙය පවරා දීමෙන් පසු මෙම සමාගම මෙම ව්‍යාපෘතිය සඳහා මෙතෙක් වියදම් කර තිබෙන මුදල්වලින් කුමන හෝ ප්‍රතිශතයක් ලබා ගැනීමේ හැකියාවක් පවතී නම් එය ලබා ගැනීමත් වේ. කෙසේ හෝ වේවා, පවත්නා ගැටලු සහගත තත්ත්වය කඩිනමින් නිරාකරණය කර ගැනීම මෙම සමාගමේ අපේක්ෂාව වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා දැනුම් දුන්න විධියට, රක්නා ආරක්ෂක ලංකා සමාගමේ - RALL එකේ - කුලුනු ව්‍යාපෘතිය රුපියල් බිලියන 5කට වඩා වැඩි වියදමක් දරා කරන්න සැලසුම් කරපු ව්‍යාපෘතියක්. මේ වෙනකොට බිලියන 2.50කට වඩා මෙහි අදාළ සමාගම්වලට ගෙවලා තිබෙනවා කියලා එතුමා දැනුම් දුන්නා. නමුත් මේක රටටවත්, ආයතනයටවත් කිසිදු ඵලදායීතාවක් නැති සුදු අලියෙක් බවටත් පත් වෙලා තිබෙනවා. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගැනීම සඳහා බැංකුවලින් ලබා ගත් යම් කිසි ණය මුදලක් තිබේ නම් එය ප්‍රතිපූරණය කිරීමට, එහෙම නැත්නම් එම ණය ගෙවා දැමීම සඳහා යම් විධිමත් නිශ්චිත වැඩ පිළිවෙළක් එම සමාගම සතුව තිබුණාද කියලා ගරු අමාත්‍යතුමාගෙන් මා දැන ගන්නට කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට, ණය මුදලක් ලබාගෙන තිබෙනවා. ඒ කියන්නේ දැන් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයනකොටත් මම පැහැදිලිව කිව්වා, මෙහි මූල්‍ය සාක්ෂරතාව ගණනය කිරීමට යොදා ගත් ක්‍රමවේදය ප්‍රශ්න සහගතයි කියලා. ඒ කියන්නේ දෝෂයන් සහ අඩුපාඩුකම් රාශියක් තිබෙනවා. ඒ, විගණන වාර්තා තුනෙහි සඳහන් කරලා තිබෙන එක, ජාතික විගණන වාර්තාවත් එක්ක. ණය මුදලේ සියයට 9.5ක පොලී අනුපාතය ඉක්මවූ විට ව්‍යාපෘතියේ ලාභ අපේක්ෂා කරන්න බැහැ. ඒ කියන්නේ, මූල්‍ය සංසන්දනය කළාම. එතකොට, ඒ ඇගයීම කරන අවස්ථාවේ පවා මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූල්‍යමය වශයෙන් කළ හැක්කක් නොමැති බවයි ඒ විගණන වාර්තාවෙන් කියලා තිබෙන්නේ. ඒ ණය මුදල ගන්නකොටවත් ඒ ගැන කිසිම ඇගයීමක් කර නැහැ.

රක්නා ආරක්ෂක ලංකා සමාගම තම ස්ථාවර තැන්පතු ලංකා බැංකුවේ ඇප වශයෙන් තබලා තමයි බිලියන 1.4ක මුදලක් කෙටි කාලීන ණය මුදලක් හැටියට අරගෙන තිබෙන්නේ. බිලියන 1.481ක්. එම ණය ගෙවීමේ කිසිදු සැලසුමකින් තොරව තමයි මේ

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

ණය මුදල අරගෙන තිබෙන්නේ. මෙය නිරවුල් කරන්නේ කොහොමද, නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නේ කොහොමද කියන එක ගැන කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ ආකාරයට තමයි එම ණය මුදල ලංකා බැංකුවෙන් අරගෙන තිබෙන්නේ. ඒ සඳහා පොලී වශයෙන් ගෙවන්න තිබුණු මුදල ආසන්න වශයෙන් මිලියන 49.2ක්. ඒ වෙනුවෙන් ලංකා බැංකුවට මිලියන 85ක් වැඩිපුරත් ගෙවා තිබෙනවා. මිලියන 35.7ක් අමතර පොලී මුදලක් හැටියට ගෙවා තිබෙනවා. ඒ අනුව මිලියන 35.7ක අලාභයකුත් සිදු වෙලා තිබෙනවා කියලා තමයි විගණනයේ සඳහන් වන්නේ. එම ණය මුදල අරගෙන තිබෙන්නේ කිසිම මූල්‍යමය ඇගයීමක්වත් - finance analysis එකක්වත්, market analysis එකක්වත් කරන්නේ නැතුවයි.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙවැනි විශාල ව්‍යාපෘතියක් ආරම්භ කරද්දී මෙම ව්‍යාපෘතිය තුළින් ලැබෙන return එක, ඒ කියන්නේ රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් මෙම ව්‍යාපෘතිය කරගෙන යැමේදී ආයතනය සතු strengths මොනවාද, ආයතනය සතු weaknesses මොනවාද, එහෙම නැත්නම් පිටත ආයතනවලින් මෙම ව්‍යාපෘතිය සඳහා තිබෙන opportunities සහ threats මොනවාද කියන දේවල් පිළිබඳව analysis එකක් කර නැහැ වාගේයි පෙනෙන්නේ.

ඒ වාගේම මෙම ව්‍යාපෘතිය තුළින් ලැබෙන ආයෝජන ප්‍රතිලාභ - ROI - සහ මූල්‍ය ශක්‍යතාව ගණනය කිරීම සම්බන්ධව යම් නිවැරදි ක්‍රමවේදයක් මෙම ආයතනය විසින් අනුගමනය කර තිබෙනවාද කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු මන්ත්‍රීතුමනි, මම මේ ප්‍රශ්නයේ 3වන කොටසට පිළිතුර ලබා දෙනකොට කිව්වේත් ඒක තමයි. ප්‍රතිලාභ ගැන සොයන්න ව්‍යාපෘතියට අදාළව එවකට කිසිදු වෙළෙඳ පොළ සමීක්ෂණයක් - market analysis එකක් - සිදු කර නැහැ. එම ඉඩමේ ලොකු වාණිජමය වටිනාකමක් තිබෙනවා. මෙම ව්‍යාපෘතියට මෙච්චර මුදලක් වැය කළාට return on investment ගන්න පුළුවන්ද කියන එකවත් analyse කර නැහැ. මුදල් ආයෝජනය කිරීම තමයි මූලිකව පදනම් කරගෙන තිබෙන්නේ. ඒකට හේතුව මොකක්ද දන්නේ නැහැ. එච්චර මුදලක් ආයෝජනය කරන බව දැනගෙනත් මෙච්චර ලොකු ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ඒ දේවල් කර නැහැ. මේ සමාගමේ තිබෙන සියලුම වත්කම් එකතු කර බැලුවත් ආයෝජනය කර තිබෙන මුදල ඊට වඩා වැඩියි. මේ කර්මාන්තයේ ප්‍රවණතාව, කර්මාන්තය තුළ පවතින තරගකාරිත්වය දිහා බලලා ඒ දේවල් සැලසුම් කරන්න ඕනෑ. මෙවැනි අතිවිශාල ආයෝජනයක් සිදු කරන්න කලින්, ඔබතුමා ඇහුවා වාගේ ඒ තුළින් ලබා ගන්නා ප්‍රතිලාභ පිළිබඳ කිසිදු සහතිකයක් ලබා ගෙන නැහැ. මේ ව්‍යාපාරයට රුපියල් බිලියන 6කට ආසන්න මුදලක් වැය කර තිබෙනවා. නමුත් එහි ප්‍රතිලාභ ගැන කිසිදු analysis එකක් කරලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

## මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම: මොනරාගල දිස්ත්‍රික්කය

### நன்னீர் மீன் உற்பத்தியை விரிவுபடுத்தல்: மொனராகலை மாவட்டம்

### PROPAGATION OF FRESHWATER FISHING INDUSTRY: MONARAGALA DISTRICT

2054/2026

**5. ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය කොපමණද;

(ii) එම නිෂ්පාදනය සඳහා දායක වන වැව් සහ ජලාශ කවරේද;

(iii) එම දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අභිජනන මධ්‍යස්ථාන ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, එම මධ්‍යස්ථාන කවරේද;

(v) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අළුගල්ගේ ග්‍රාම නිලධාරි වසමේ ඉදිකරමින් පවතින `මුතුකණ්ඩිය මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ' ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(vi) එය ඉදිකිරීමෙන් පසු මොනරාගල දිස්ත්‍රික්කය තුළ මිරිදිය මත්ස්‍ය ව්‍යාප්තිය සඳහා පවතින අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉඟිණියාගල පිහිටි සේනානායක සමුද්‍රයේ පවතින ධීවර තොටුපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජලාශයේ බදුලුවෙල ප්‍රදේශය ආශ්‍රිතව ධීවර තොටුපොළක් ආරම්භ කිරීම සඳහා අයදුම්පත් ලැබී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்தின் வருடாந்த நன்னீர் மீன் உற்பத்தி எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி உற்பத்திக்காகப் பங்களிப்புச் செய்யும் குளங்கள் மற்றும் நீர்த்தேக்கங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி மாவட்டத்தில் நன்னீர் மீன் உற்பத்திக்காக இனப்பெருக்க நிலையங்கள் ஆரம்பிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி நிலையங்கள் யாவை என்பதையும்;

(v) மடுல்ல பிரதேச செயலாளர் பிரிவின், அளுகல்கே கிராம அலுவலர் பிரிவில் நிர்மாணிக்கப்பட்டு வரும் முத்துகண்டிய நன்னீர் மீன் இனப்பெருக்க நிலையத்தின் மதிப்பீட்டுச் செலவு எவ்வளவு என்பதையும்;

(vi) மேற்படி நிலையம் நிர்மாணிக்கப்பட்டதன் பின்னர் மொனராகலை மாவட்டத்தில் நன்னீர் மீன் உற்பத்தியை விரிவுபடுத்துவதற்கான இனப்பெருக்க நிலையங்களின் எண்ணிக்கை போதுமானதாக இருக்குமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இங்கினியாகலையில் அமைந்திருக்கும் சேனநாயக்க சமுத்திரத்திலுள்ள மீன்பிடி இறங்குதுறைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி நீர்த்தேக்கத்தின் பதுலுவெல பிரதேசத்தில் மீன்பிடி இறங்குதுறை ஒன்றை ஆரம்பிப்பதற்காக விண்ணப்பங்கள் கிடைக்கப்பெற்றுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) the annual freshwater fish production in the Monaragala District;

(ii) the tanks and reservoirs that contribute to the said production;

(iii) whether breeding centres have been established for freshwater fish production in the said district;

(iv) if so, the names of such centres;

(v) the estimated cost of the Muthukandiya Freshwater Fish Breeding Centrecurrently under construction in the Alugalge Grama Niladhari Division of the Madulla Divisional Secretary's Division; and

(vi) whether the number of breeding centres available for the propagation of freshwater fish within the Monaragala District will be sufficient after the construction of the said centre?

(b) Will he also inform this House -

(i) the number of landing sites in the Senanayake Samudraya located in Inginiyagala; and

(ii) whether applications have been received to establish a landing site in the Baduluwela area associated with that reservoir?

(c) If not, why?

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ 2025 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,800ක් වේ.

(ii) ජලාශ නාමලේඛනය පහත පරිදි වේ.

1.Mau Ara
2.Veheragala
3.Ethimale
4.Hadapangala Wewa
5.Hambegamuwa
6.Kiriibban
7.Muthukandiya
8.Urusita Wewa
9.Alapathaya Wewa
10. Alugalage Wewa
11. Aluth Heekaduara Wewa
12. Ambakola Wewa
13. Balaharuwa Wewa
14. Bogas Wewa
15. Buduruwagala Wewa
16. Cocoyaya Wewa
17. Dambe Ara Wewa
18. Debara Ara Wewa
19. Demaliya Wewa
20. Demodara Wewa
21. Dingimada Wewa
22. Diulana Wewa
23. Divulagahakanattha Wewa
24. Dosar Wewa
25. Galpoththa Wewa
26. Gestupana Wewa
27. Gurumada Wewa
28. Habaralu Wewa
29. Heekadu Ara Wewa
30. Hevan Arawa Wewa
31. HKT Wewa
32. Indurugas Wewa
33. Iththakatuwa Wewa
34. Japergi Maha Ara Wewa
35. Japergi Weli Ara Wewa
36. Kahakurullan Pelassa Wewa
37. Kandiyapita Wewa
38. Karamatiya Wewa
39. Karapinchalanda Wewa

[ගරු රත්න ගමගේ මහතා]

40. Katugahagalge Wewa
41. Katupila Wewa
42. Kindiliya Wewa
43. Kiule Ara Wewa
44. Kotiyagala Wewa
45. Kudanetola Wewa
46. Kukulkatuwa Wewa
47. Kukurampola Wewa
48. Laginagala Wewa
49. Lunugala Yoda Wewa
50. Maha Wewa
51. Mahadahaiyagala Wewa
52. Mahakadawara Wewa
53. Mahakaramatiya Wewa
54. Mahanetola Wewa
55. Mahapalessa Wewa
56. Malewanayaya Wewa
57. Malimpotha Wewa
58. Meegahaarawa Wewa
59. Meepana Ara Wewa
60. Milegama Wewa
61. Karawele Wewa
62. Nagala Wewa
63. Namadapelessa Wewa
64. Nelum Wewa
65. Neraluwa Wewa
66. Pahalabingalara Wewa
67. Paralu Wewa
68. Pokunutenna Wewa
69. Pothupitiya Wewa
70. Ranawaranawa Wewa
71. Saddatissa Wewa
72. Siyabalgas Wewa
73. Sugaladevi Wewa
74. Thabalavinna Ara Wewa
75. Thammannawa Wewa
76. Thenagallanda Wewa
77. Thiyabara Yaya
78. Thorathupitiya Wewa
79. Uyankubura Wewa
80. Weeraketiya Minindoru Kolaniya
81. Weli Ara Wewa
82. Yudaganawa Wewa
83. Alikota Ara Wewa
84. Kohombadigana Wewa
85. Meeyanketuara Wewa
86. Aluth Wewa
87. Andiriyas Wewa
88. Athula Wewa
89. Bambaragala Wewa
90. Bathala Ara Wewa
91. Galwale Wewa
92. Palugas Wewa
93. Weeraketiya Wewa
94. Gemunu Wewa
95. Idipadura Wewa
96. Indipelessa Wewa
97. Galwale Wewa
98. Hinguru Ara Wewa
99. Sumedha Wewa
100. Walas Kema Wewa
101. Dehigahalanda Wewa
102. Pubudu Wewa
103. Rahathangama Wewa
104. Jambugasara Wewa
105. Senasuma Wewa
106. Maliththanpelessa
107. Jayasingghekatuwa Wewa
108. Thalakola Wewa
109. Welangasara Wewa
110. Katupotha Wewa
111. Pelwatta Estate Tank

(iii) මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකයක් ආරම්භ කර ඇත.

(iv) මුතුකණ්ඩිය මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකය

(v) මුතුකණ්ඩිය මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකය ඉදි කර දෙනු ලබන එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 122ක් වේ.

(vi) ප්‍රමාණවත් නැත.

(ආ) (i) එක් තොටුපළක් පමණි.

(ii) තොටුපළක් ආරම්භ කිරීම සඳහා අයදුම්පත් ලැබී නැත. ධීවර සංවිධානයක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පතක් ලැබී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මොනරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බදුලුවෙල ප්‍රදේශයේ ජනතාව ඓතිහාසික වශයෙන් අසාධාරණයට ලක් වූ ජන කොටසක්. ඒ මන්ද, සේනානායක සමුද්‍රය අක්කර අඩි 770,000ක ජල ධාරිතාවකින් යුක්ත ජලාශයක්. එම ජලාශය ඉදි කිරීමේදී බදුලුවෙල ප්‍රදේශයේ ජනතාවගේ පූර්ව ග්‍රාමීය ඉඩම් සම්පූර්ණයෙන් අත්පත් කර ගැනීම සිදුව තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ එම ප්‍රදේශයේ ජනතාව ධීවර තොටුපළක් වෙනුවෙන් අරගළ කරනවා. නමුත්, ඒ ජනතාවට මේ දක්වා ඒ සඳහා අවස්ථාවක් ලැබිලා නැහැ. ඒ අනුව එම ප්‍රදේශයේ ජනතාවට ධීවර තොටුපළක් ලබා දීම සඳහා බාධාවක් පවතිනවාද කියලා මම ධීවර අමාත්‍යාංශයෙන් දැන ගන්න කැමැතියි.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු කථානායකතුමනි, ගරු සරත් කුමාර මන්ත්‍රීතුමා විසින් යොමු කරන ලද පළමුවැනි අතුරු ප්‍රශ්නයට අදාළව NARA එකත්, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියත්, සේනානායක සමුද්‍රයේ බදුලුවෙල ආශ්‍රිතව දීර්ඝ කාලයක් නිරීක්ෂණය කළා.

එම නිරීක්ෂණ වාර්තාවට අනුව සේනානායක සමුද්‍රයේ මත්ස්‍ය අභිජනන කලාපවලින් සියයට 60ක් තිබෙන්නේ, බදුලුවෙල ප්‍රදේශය ආශ්‍රිතව. ඒ නිසා බදුලුවෙල ප්‍රදේශය ආශ්‍රිතව ධීවර තොටුපොළක් ස්ථාපිත කිරීම NARA එකෙන් නිර්දේශ කරලා නැහැ. NARA සහ NAQDA කියන ආයතන එකතු වෙලා ඉදිරිපත් කළ අවසාන නිරීක්ෂණ වාර්තාවේත් තිබෙන්නේ, ඒ ප්‍රදේශයේ තොටුපොළක් ස්ථාපිත කිරීම නුසුදුසුයි කියලායි. අපි ඒ සම්බන්ධව තවදුරටත් පරීක්ෂණ පවත්වනවා. නමුත් ඒ ප්‍රදේශයේ ධීවර තොටුපොළක් ස්ථාපිත කිරීම සඳහා මේ වනතුරුත් අවස්ථාව ලබා දී නැහැ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

මේ රටේ ජනතාව රට පුරා පිහිටි ජලාශ විශාල ප්‍රමාණයක මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙනවා. සේනානායක සමුද්‍රය හැරුණු විට වෙනත් ජලාශවලත් මිරිදිය මසුන් බෝ වන ස්ථාන හැටියට කලාප වෙන් කිරීමක් සිදු කරලා තිබෙනවාද, ඒ වෙන් කරන ලද කලාප තුළ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදීම තහනම් කර තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු කථානායකතුමනි, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - NAQDA - සහ NARA එකත් මේ දක්වා කරපු ඒකාබද්ධ පර්යේෂණවලට අදාළව ධීවර තොටුපොළක් ස්ථාපිත කිරීම නුසුදුසු බවට තවම වාර්තා වෙලා තිබෙන්නේ, සේනානායක සමුද්‍රයේ බදුලුවෙල ප්‍රදේශය පමණයි. ඊට අමතරව මාදුරු ඔය, සේනානායක සමුද්‍රය ඇතුළු ජලාශ කිහිපයක් ආශ්‍රිත ප්‍රදේශවලත් ධීවර තොටුපොළ ස්ථාපිත කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තහනම් කරලා තිබෙනවා. නමුත් අපේ පර්යේෂණවලට අනුව තවම තහනම් කරලා තිබෙන්නේ, බදුලුවෙල ප්‍රදේශය ආශ්‍රිතව පමණයි. ගරු මන්ත්‍රීතුමා මගෙන් අහපු ප්‍රශ්නයට අදාළව කිව්වොත්, ඊයේ දවසේ අපේ ධීවර, ජලජ සහ සාගර සම්පත් ගරු අමාත්‍යතුමාත්, NARA එකත්, NAQDA එකත් මොනරාගල දිස්ත්‍රික්කයට අදාළව සේනානායක සමුද්‍රය ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක් ගියා. ඒ අනුව NARA එකටත්, NAQDA එකටත් අපි උපදෙස් දුන්නා, නැවත පරීක්ෂණයක් කරලා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් දෙන්න කියලා, බදුලුවෙල ධීවරයින්ටත් කිසියම් ස්ථානයකින් තොටුපොළක් ලබා දීම සඳහා. එතකොට, ඒ ස්ථානය මේ සඳහන් කරන breeding area එක නොවෙන්න පුළුවන්. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන කොට්ඨාසයට අදාළව මට කියන්න තිබෙන්නේ මේකයි. නුදුරු දිනයකදී ඒ ආසන්නව හෝ NARA එකත්, NAQDA එකත් නිර්දේශ කරන ප්‍රදේශයකින් අපි ඒ ධීවරයින්ට තොටුපොළක් ලබා දෙනවා. දැනට ලංකාවේ මේ ආශ්‍රිත එකම අවදානම් කලාපය වශයෙන් නම් කරලා තිබෙන්නේ එම කලාපය පමණයි.

## බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත: විස්තර
## பௌத்த கோவிலுடைமைகள் கட்டளைச் சட்டம்: விபரம்
## BUDDHIST TEMPORALITIES ORDINANCE: DETAILS

2102/2026

**6. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත හඳුන්වා දුන් වර්ෂය කවරේද;

(ii) එම ආඥාපනත මේ වන විටත් ක්‍රියාත්මක වන්නේද;

(iii) ආඥාපනත හඳුන්වා දීමේ ප්‍රධාන අරමුණ කවරේද;

(iv) ආඥාපනතට යටත්ව ශ්‍රී ලංකාව තුළ පවතින ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ආගමික ආයතන සතුව ඇති ඉඩම්වලින් බදු අය කිරීමට අවසර ලබා දී ඇති පනත කවරේද;

(ii) එම පනත හරහා බදු අය කළ හැකි සීමාව ප්‍රතිශතයක් ලෙස පැහැදිලිව දක්වා තිබේද;

(iii) යම් ආගමික ආයතනයක් සතුව ඇති ඉඩමක් බදු දිය හැකි උපරිම කාලසීමාව කොපමණද;

(iv) එවැනි එකඟතාවක් උල්ලංඝනය වුවහොත් අසාධාරණයට ලක්වන පාර්ශ්වයකට යුක්තිය ඉටු කර ගත හැකි ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු සුජීව දිසානායක මහතා]

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பௌத்த கோவிலுடைமைகள் கட்டளைச் சட்டம் அறிமுகப்படுத்தப்பட்ட வருடம் யாது என்பதையும்;

(ii) மேற்படி கட்டளைச் சட்டம் தற்போதும் அமுலிலுள்ளதா என்பதையும்;

(iii) மேற்படி கட்டளைச் சட்டத்தை அறிமுகப் படுத்தியதன் முக்கிய குறிக்கோள் யாது என்பதையும்;

(iv) இலங்கையில் மேற்படி கட்டளைச் சட்டத்தின் கீழ்வருகின்ற சமய நிறுவனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சமய நிறுவனங்கள் வசமுள்ள காணிகளிலிருந்து வரி அறவிடுவதற்கு அனுமதியளிக்கப்பட்டுள்ள சட்டம் யாது என்பதையும்;

(ii) மேற்படி சட்டத்தின்மூலம் வரி அறவிடற்பால தான வரம்பு, சதவீத அடிப்படையில் தெளிவாகக் குறிப்பிடப்பட்டுள்ளதா என்பதையும்;

(iii) சமய நிறுவனமொன்றின் வசமுள்ள ஒரு காணியைக் குத்தகைக்கு விடக்கூடிய உயர்ந்த பட்ச காலப்பகுதி யாது என்பதையும்;

(iv) அவ்வாறான ஓர் ஒப்புதல் மீறப்படும் பட்சத்தில், அநீதிக்கு உள்ளாகும் திறத்தவரொருவருக்கு நீதியை நிலைநாட்டிக்கொள்ளக்கூடிய விதம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the year in which the Buddhist Temporalities Ordinance was introduced;

(ii) whether the said Ordinance is still in force;

(iii) the key objective of introducing the said Ordinance; and

(iv) the number of religious institutions in Sri Lanka that come under the scope of the said Ordinance?

(b) Will he also inform this House -

(i) the name of the Act under which permission has been granted to levy taxes on lands owned by religious institutions;

(ii) whether the taxable limits have been clearly specified as a percentage in the said Act;

(iii) the maximum period of time for which a land owned by a religious institution can be leased out; and

(iv) the manner in which a party who is wronged can get justice in case such an agreement is violated?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1931.

(ii) ඔව්.

(iii) එතුමා අහන්නේ ආඥාපනත හඳුන්වා දීමේ ප්‍රධාන අරමුණු පිළිබඳවයි. ගරු කථානායකතුමනි, පනතේම හඳුන්වා දී ඇති ආකාරයට අරමුණු තුනක් තිබෙනවා.

1905 බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ විධිවිධානයන්ගෙන් බෞද්ධ විහාර හා දේවාලගම්වලට සෑහෙන පමණ ආරක්ෂාවක් නොලැබී තිබෙන බව පෙනී යන බැවින්ද,

එබඳු විහාර හා දේවාලගම්වලට එසේ සෑහෙන පමණ ආරක්ෂාව ලැබෙන පරිදි ඒ පිළිබඳව පාලන සංවිධාන ක්‍රමයක් සැලසීම යෝග්‍ය බැවින්ද,

ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් නීතිදායක මන්ත්‍රණ සභාවේ අනුශාසනයෙන් හා අනුමතයෙන් මෙම ආඥාපනත හඳුන්වා දී ඇත.

ගරු කථානායකතුමනි, "ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේ" යන යෙදුම්වලින්ම අපට පෙනෙනවා, මෙම ආඥාපනත කෙතරම් පැරණි සහ පැරණි යුගයක වුවමනාව සඳහා ද සකස් වෙලා තිබෙන්නේ කියලා.

(iv) 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන සංඛ්‍යාව 254ක් වේ. අනෙකුත් සියලු සිද්ධස්ථාන 4(2) වගන්තිය යටතේ පාලනය වේ. 2025.12.31 දිනට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විහාරස්ථාන සංඛ්‍යාව 10,499කි. විහාරස්ථාන ලියාපදිංචි කිරීමට අදාළව මෙම ආඥාපනත තුළ කරුණු ඇතුළත් වී නොමැත. ලියාපදිංචි කිරීම සම්බන්ධව ප්‍රමිති සහ ප්‍රතිපාදන තිබෙන්නේ කොමසාරිස් ජෙනරාල්වරයා වෙතයි.

(ආ) (i) 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත.

(ii) නැත.

(iii) 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 29(3) වගන්තිය ප්‍රකාරව "කවර කරුණක් නිසාවත් කිසිම බද්දක් අනූනව අවුරුද්දකට වඩා කාලයකට නොදිය යුතුයි" යනුවෙන් සඳහන් වේ. එමෙන්ම 2006 වසරේදී නිකුත් කළ බෞද්ධ විහාර දේවාලගම් ඉඩම්වලට අදාළ ගැටලු පරීක්ෂා කිරීමේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අනුව බදු කාලය සඳහා වර්ෂ 99ක් වැනි දීර්ඝ කාලයක උපරිමයක් තිබීම හේතුවෙන් බොහෝ ගැටලු ඇති වූ බව හෙළිදරව් විය. දැනට පරිපාලනමය වශයෙන් එම කාලය වසර 30ක සීමාවකට යටත් කර ඇත. ඒ අනුව වර්තමානයේදී වසර 30ක උපරිම කාලයකට යටත්ව බදු දීම් සිදු කරනු ලබයි.

(iv) බදු ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය වී ඇත්නම් ගරු අධිකරණය මඟින් නීතිමය රැකවරණ ලබා ගැනීමට කිසිදු බාධාවක් නැත.

(ඈ) අදාළ නොවේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ රටේ ආගමික ආයතන සතුව තිබෙන ඉඩකඩම්වලින් මේ වන විටත් විවිධ ප්‍රමාණවලින් බදු අය කරනවා, සමහර විට අමාත්‍යතුමා ප්‍රකාශ කළ කාල වකවානු තුළ වෙන්න පුළුවන්. ඒ ඉඩම්වල වාණිජ වටිනාකම පදනම් කරගෙන තමයි බදු අය කරන්න ඕනෑ. නමුත් ඇතැම් ආගමික ආයතනවලින් බදු අය කිරීමේදී ආයතනයෙන් ආයතනයට බදු ප්‍රතිශත වෙනස් වනවා. අවුරුදු තුනකට හෝ පහකට සැරයක් තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තමයි බදු ප්‍රමාණය තීරණය කරන්නේ. අමාත්‍යාංශය හැටියට බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත යටතේ ආවරණය වන විහාරස්ථානවලින් ඒ පාරිභෝගිකයන්ට සිදු වන අසාධාරණය සම්බන්ධයෙන් මොනයම් හෝ පියවරක් ගන්නවාද, ගරු ඇමතිතුමනි?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ඇත්තටම ගරු මන්ත්‍රීතුමා විමසන්නේ අපේ ජනතාව මුහුණ දෙන ප්‍රායෝගික ප්‍රශ්නයක් ගැනයි. 1931දී ගෙනා මේ ආඥාපනත වසර 100කට ආසන්න පැරණි ආඥාපනතක්, සංශෝධන කිහිපයක් කළා වුණත්. මේ ආඥාපනතේ තිබෙන ප්‍රතිපාදන සහ විධිවිධාන අනුවම තමයි ඔය ගැටලුව මතු වන්නේ. තක්සේරු කිරීම්, අතුරු බදු දීම්, නැවත බදු දීම් ආදිය මඟින් ජනතාව යම් පීඩාවකට පත්වීම පිළිබඳවයි මන්ත්‍රීතුමා විමසන්නේ. ඇත්තටම එහෙම ගැටලුවක් තිබෙනවා. එහෙම ගැටලුවක් තිබෙන නිසාම අපේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජෙනරාල්වරයා වෙත පීඩාවට පත් වන අයගෙන් ලිපි ලේඛන, දුක්ගැනවිලි සහ පෙත්සම් දෛනිකව ලැබෙමින් පවතිනවා. පවත්නා නීතියට අනුව අපි ඒවා විමර්ශනය කරමින් ඉන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

එක කරුණක් සඳහන් කළොත්, මේ ආඥාපනත ගෙනා වකවානුවේ තිබුණු සමාජ, සංස්කෘතික දර්ශක අද තීව්‍ර විධියට වෙනස් වෙලා තිබෙනවා. මම මේ සභාවේදී වාර රැසකම මේ ප්‍රශ්නයට පිළිතුරු දීලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, හැම පළාතකම දැඩි ඉඩම් හිඟයක් තිබෙන බව. මොකද, සංවර්ධන කටයුතු දැන් ගොඩක් වෙනස් වෙලා තිබෙනවා. ඉතින් මේ ආඥාපනතින් කියැවෙන බදු දීම්, ඒවා තක්සේරු කිරීමට තිබෙන ප්‍රතිපාදන, ඉඩම් අවශ්‍යතා පිළිබඳ නිර්ණායක නැවත සලකා බැලීම සහ සමාලෝචනය කිරීම දැඩි අවශ්‍යතාවක් බවට පත්ව තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ලැබෙන පෙත්සම් සහ පැමිණිලි දැනට පවතින නීති අනුව විභාග කරමින් ජනතාවට යුක්තිය සහ සාධාරණය ඉෂ්ට කරමින් ඉන්නවා. ඔබතුමා කියන කාරණය නිවැරැදියි. බොහෝ තැන්වල ඉතාම අත්තනෝමතික විධියට අතුරු බදු දීම් සහ තක්සේරු කිරීම් සිදු වනවා. එලෙස තක්සේරු කිරීම් නිසාම ඇති වන අක්‍රමිකතාවලට ජනතාව මුහුණ දෙමින් ඉන්නවා. එයට ප්‍රතිපාදන සැලසීම සඳහා මේ ආඥාපනත පිළිබඳව සලකා බැලීම එක පිළිතුරක්. අනෙක් කාරණය මෙකයි. ජනතාවට කිසිදු ආකාරයෙන් අසාධාරණයක් නොවන ලෙස දැනට තිබෙන නීතිය අනුව අපේ දෙපාර්තමේන්තුව ඒ ගැන කටයුතු කරමින් ඉන්නවා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ රටේ ආගමික ආයතනවලට ඉතිහාසය පුරාවට විවිධාකාරයෙන් විවිධ පුද්ගලයෝ ඉඩම් ප්‍රදානය කර තිබෙනවා. ඉතිහාසයෙන් අපට දැනගන්න ලැබෙන්නේ මුලින්ම වළගම්බා රජ්ජුරුවෝ වැටකේ පතක ලියා අභයගිරිය කියන විහාරස්ථානයට අයිති භූමිය හාමුදුරුවන් නමකට පූජා කළාය කියායි. එතැන් සිට මේ දක්වා විවිධ ක්‍රියාමාර්ග භාවිත කරලා ඉඩකඩම් ආගමික ආයතනවලට පූජා කරලා තිබෙනවා.

විශේෂයෙන්ම වාරියපොල ආසනයේ බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තිබෙනවා, ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාලය කියලා ඓතිහාසික දේවාලයක්. එම දේවාලය සතුව අක්කර 1,424ක බිම් ප්‍රමාණයක් තිබෙනවාය කියලා පාලන අධිකාරිය කියනවා. ඒක නින්දගම් හැටියටත්, බණ්ඩාරගම් හැටියටත් තිබෙනවා කියලා තමයි අදාළ දේවාලය විසින් ප්‍රකාශ කරන්නේ. නමුත්, මේ වනවිට එම සමස්ත භූමියම ජනවාසකරණය වෙලා ඉවරයි. මේ වනවිට අපේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට මේ ඉඩම් ප්‍රශ්නය පිළිබඳ ගැටලු ඉදිරිපත් වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමාගෙන් මා අහන්නේ මේ පිළිබඳව ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය ගන්නා ඉදිරි පියවර කුමක්ද කියායි.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, නැවත වතාවක් ගරු මන්ත්‍රීතුමා විමසන්නේ ආගමික ආයතන සතු ඉඩම්වලටම ආනුෂංගිකව බැඳුණු ගැටලුවක් ගැනයි. දේවාලයකට අයත්ව තිබෙන අක්කර එක්දහස් ගණනක ඉඩමක් සම්බන්ධවයි විමසන්නේ. ගරු මන්ත්‍රීතුමනි, අක්කර එක්දහස් ගණනක් කියන්නේ ආගමික ආයතන සතු ඉඩම් ගත්තාම කුඩා ප්‍රමාණයක්. රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන බැලුවොත්, අක්කර 8,500 හා අක්කර 12,000ක් දක්වා මේ බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතින් ආවරණය වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසාම තමයි මා කලිනුත් මතු කළේ දැඩි ඉඩම් හිඟයකට මුහුණ දීලා තිබෙන බව. මා හැම දාමත් පිළිතුරු දෙනකොට මේ කාරණය මතු කරනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට ලක් වූවන් පදිංචි කරන්න අපට ඉඩම් හොයා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. නමුත්, අක්කර දහදොළොස්දාහක් මේ වාගේ දේවාලවලට වෙන් වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය නිවැරැදියි. මේ ගැටලුව සම්බන්ධව අමාත්‍යාංශයට සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට කරන්න තිබෙන එකම දේ තමයි, දැනට තිබෙන ආඥාපනත ප්‍රකාරව කටයුතු කිරීම. ඉන් ඔබ්බට අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, අධිකරණයට යෑමේ නිදහස ජනතාවට හිමි වෙලා තිබෙනවා වාගේම ඒ නිදහස ආරක්ෂා කරන්න රජයක් හැටියට අපි බැඳී සිටිනවා. ඒ හැරෙන්න මේ ප්‍රශ්නය විසඳා ගැනීමට නම් මේ ආඥාපනත නැවත සලකා බැලීම කළ යුතු වනවා, ගරු කථානායකතුමනි.

එක උදාහරණයක් විතරක් කියලා මා මේ කාරණය අවසන් කරන්නම්. මා කලිනුත් සඳහන් කළා, දිනපතා ලැබෙන පෙත්සම්,

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

මේ පනතේ තිබෙන ප්‍රතිපාදන සහ නූතන සමාජ අවශ්‍යතාව අතර තිබෙන පරතරය පිළිබඳව. මේ ඉඩකඩම්වල ලොකු ගෙවල් දොරවල් හදලා තිබෙනවා. ස්ථිර ඉදිකිරීම් කර තිබෙනවා. අවුරුදු 30 බදු පදනම ඉවර වුණාම අර හිමිකාරත්වයට පුළුවන් වනවා, නැවත බදු දෙන්න හෝ ඒ පුද්ගලයාගෙන් මේ ඉඩම නැවතත් ලබා ගන්න. එතකොට තමයි අයථා මුදල් ගනුදෙනුවලට පාර කැපෙන්නේ. දැන් දරුමල්ලන් එක්ක දෙමහල්, තෙමහල් මැඳුරු හදාගෙන ඉන්න අපේ ජනතාව එතැනින් ඉවත් වෙන්න බැරිකමට වෙනත් ගනුදෙනුවලට ඉදිරිපත් වන අවස්ථා පිළිබඳව තමයි පෙත්සම්වල තිබෙන්නේ. ඒවා විමර්ශනයට ලක් වෙමින් තිබෙනවා.

රත්නපුර තිරිවානාකැටිය ප්‍රදේශයේ තිස්අවුරුදු බදු මුදල අවසන් වෙච්ච එක තැනක තාත්තා කෙනෙකු ලියුමක් ලියා සිය දිවි නසා ගත්තා, මීට මාස කිහිපයකට කලින්, ගරු කථානායකතුමනි. මේ මොහොතේදීත් මගේ දුරකථනයට පණිවුඩ ලැබෙනවා. මීට විනාඩි 5කට කලිනුත් පණිවුඩයක් ලැබුණා, අයගම ප්‍රාදේශීය සභාවට අයිති, එහි ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ කැටේපොළ ප්‍රදේශයේ දේවාලගම් ඉඩමක විශාල ප්‍රමාණයක් රබර් ගස් ගලවමින් ඉන්නවා කියලා. ඒ පිළිබඳව ජනතාව පැමිණිලි කරමින් ඉන්නවා. ඒ නිසා මේ ප්‍රශ්නය සාධාරණයි. අපට දැනට තිබෙන ප්‍රතිපාදන අනුව දෙපාර්තමේන්තුව කටයුතු කරමින් ඉන්නවා. ආඥාපනත නැවත සලකා බැලීමකින්ම තමයි ජනතාවට ඉමහත් සාධාරණයක් කරන්න පුළුවන් වෙන්නේ.

## සිගරට් නිෂ්පාදනය සහ අළෙවිය: බදු ආදායම
## சிகரெட் உற்பத்தி மற்றும் விற்பனை: வரி வருமானம்
## MANUFACTURE AND SALE OF CIGARETTES: TAX REVENUE

2110/2026

**7. ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දුම්වැටි නිෂ්පාදනය කිරීම හා අළෙවි කිරීමට අදාළව විශාල බදු මුදලක් වාර්ෂිකව රජය විසින් අය කර ගන්නා බව දන්නේද;

(ii) එසේ නම්, පසුගිය වර්ෂ 03 තුළ දුම්වැටි සඳහා පනවා ඇති බදු මඟින් අය කර ගත් මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීත්‍යනුකූල දුම්වැටි නිෂ්පාදනය කිරීම හා අළෙවි කිරීමට බදු අය කළද දුම්වැටි නීති විරෝධීව ආනයනය කර අළෙවි කරන බව දන්නේද;

(iv) එසේ නම්, දුම්වැටි නීති විරෝධීව ආනයනය කිරීම සහ අළෙවි කිරීම පාලනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) නීති විරෝධීව දුම්වැටි වෙළෙඳාමේ නිරත පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிகரெட் உற்பத்தி மற்றும் விற்பனை தொடர்பில் ஆண்டுதோறும் பாரியதொரு வரித்தொகையை அரசாங்கம் அறவிடுகிறது என்பதை அறிவாரா?

(ii) ஆமெனில், கடந்த 03 ஆண்டுகளில் சிகரெட்மீது விதிக்கப்பட்டுள்ள வரிகள்மூலம் அறவிடப்பட்ட தொகை, ஆண்டுவாரியாக வெவ்வேறாக யாது;

(iii) சட்டரீதியாக சிகரெட் உற்பத்தி மற்றும் விற்பனைமீது வரி அறவிடப்படுகின்ற போதிலும், சிகரெட்டுகள் சட்டவிரோதமான முறைகளில் இறக்குமதிசெய்து விற்பனை செய்யப்படுவதை அறிவாரா;

(iv) ஆமெனில், சட்டவிரோதமான முறைகளில் சிகரெட் இறக்குமதி செய்யப்படுவதையும் விற்பனை செய்யப்படுவதையும் கட்டுப்படுத்து வதற்கு தற்போது எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(v) சட்டவிரோதமாக சிகரெட் வியாபாரத்தில் ஈடுபடும் ஆட்களை அடையாளம் கண்டு, அவர்களுக்கு எதிராக சட்ட நடவடிக்கை எடுப்பதற்கு ஆவன செய்யப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House-

(i) whether he is aware that a large amount of tax revenue is collected annually by the Government from the manufacture and sale of cigarettes;

(ii) if so, the amount collected through the taxes imposed on cigarettes during the last three years, separately in respect of each year;

(iii) whether he is aware that, despite taxes being levied on the legal manufacture and sale of cigarettes, cigarettes are illegally imported and sold;

(iv) if so, the measures that have been taken at present to control the illegal import and sale of cigarettes; and

(v) whether measures will be taken to identify individuals engaged in the illicit trades of cigarettes and to take legal action against them?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දුම්වැටි සඳහා වන බදුකරණය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ නිෂ්පාදන බද්ද හරහාය. නිෂ්පාදන බද්දට අමතරව දුම්වැටි සඳහා එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද අය කෙරේ.

තවද, දුම්වැටි නිෂ්පාදනය හෝ දුම්කොළ පයිප්ප සඳහා යොදා ගැනෙන ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කෙරෙන සියලුම දුම්කොළ සඳහා දුම්කොළ බද්ද අදාළ වේ.

මීට අමතරව, දුම්කොළ නිපැයුම් නිෂ්පාදනය අළෙවියෙහි නිරත සමාගම් සඳහා සියයට 45ක සංස්ථාපිත ආදායම් බද්දක් පනවනු ලබන අතර, අනෙකුත් ව්‍යාපාර සඳහා අදාළ වන සංස්ථාපිත ආදායම් බද්ද සාමාන්‍යයෙන් සියයට 30ක් වේ.

(ii) දුම්කොළ නිෂ්පාදන මඟින් ලද බදු ආදායම (රුපියල් මිලියන)

| වසර | වක්‍ර බදු | | | | | සෘජු බදු |
|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදන බද්ද | දුම්කොළ බද්ද | එකතු කළ අගය මත බද්ද | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | සමස්ත වක්‍ර බදු | සංස්ථාපිත ආදායම් බද්ද* |
| 2023 | 117,467 | 1,014 | 16,680 | 756 | 135,917 | 13,971 |
| 2024 | 117,145 | 1,194 | 25,686 | 3,730 | 147,755 | 18,314 |
| 2025 | 101,173 | 1,545 | 30,669 | 3,705 | 137,092 | 19,969 |

*සංස්ථාපිත ආදායම් බදු ගණනය කිරීම් සඳහා අදාළ තක්සේරු වර්ෂ පදනම් කරගෙන තිබේ:

2022/2023, 2023/2024 සහ 2024/2025.

(iii) නීත්‍යානුකූල දුම්වැටි නිෂ්පාදනය සහ අළෙවිය මත බදු පනවා තිබියදීත්, දුම්වැටි නීති විරෝධී ලෙස ආනයනය කිරීම සහ අළෙවි කිරීමේ සිදුවීම් රජයට වාර්තා වී ඇත.

ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා පොලිසිය ඇතුළු අදාළ බලධාරීන් විසින් දැඩි නීතිරීති ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණ කටයුතු සහ නියාමන ක්‍රියාමාර්ග හරහා දුම්කොළ නිෂ්පාදනවල නීති විරෝධී වෙළෙඳාම වැළැක්වීමට සහ ඊට එරෙහිව කටයුතු කිරීමට විවිධ පියවර ක්‍රියාත්මක කර ඇත. රජයේ ආදායම රැක ගැනීමේ සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූල වීම තහවුරු කිරීමේ අරමුණින් දුම්වැටි නීති විරෝධී ලෙස ආනයනය කිරීම, බෙදා හැරීම සහ අළෙවි කිරීම පාලනය කිරීම සඳහා අඛණ්ඩව උත්සාහයන් දරනු ලැබේ.

(iv) නීති විරෝධී ලෙස දුම්වැටි ආනයනය කිරීම රේගු ආඥාපනත සහ දුම්කොළ බදු පනත යටතේ වරදක් වේ. රටේ ගුවන් තොටුපළවල සහ වරායන්හිදී එවැනි නීති විරෝධී ආනයනයන් හඳුනාගෙන අත්අඩංගුවට ගැනීමට සහ එවැනි වැරදිවලට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා රේගුව අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

ඊට අමතරව නීති විරෝධී ලෙස දුම්වැටි ආනයනය කිරීම, බෙදා හැරීම සහ විකිණීම වැළැක්වීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා පොලිසිය පරීක්ෂණ, විමර්ශන, වැටලීම් සහ බුද්ධි තොරතුරු හුවමාරුව ඇතුළු නීතිය බලාත්මක කිරීමේ කටයුතු සහ නිරීක්ෂණ කටයුතු සිදු කරයි. නීති විරෝධී දුම්කොළ වෙළෙඳාමට එරෙහිව සටන් කිරීමට සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීමට මෙම ආයතන සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරනවා.

(v) නීති විරෝධීව දුම්වැටි ආනයනය කිරීමේ නිරත පුද්ගලයින් හඳුනා ගැනීමටත්, අදාළ නීතිමය විධිවිධානවලට අනුකූලව ඔවුන්ට එරෙහිව සුදුසු නීතිමය පියවර ගැනීමටත්, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා පොලිසිය විසින් අවශ්‍ය පියවර ගනු ලබයි.

(ආ) පැන නොනඟී.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, මත් කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය ගෙන්වීම, අළෙවිය සහ භාවිතය නීති විරෝධී වන්නේ, ඒවා පරිභෝජනය තුළින් මිනිස් ශරීරයට කොච්චර අහිතකර බලපෑමක් සිදු වෙනවාද කියන කාරණයත් එක්ක බව. මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, නීති විරෝධී දුම්වැටි ආනයනයට අදාළ ඒ නීතිය ක්‍රියාත්මක වෙන්නේ කුමන හේතුවක් නිසාද කියලා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, දැනට දුම්වැටි සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් පනත් දෙකක් බලාත්මක වෙනවා. එකක් තමයි, දුම්කොළ බදු පනත. ඊට අමතරව, දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත ක්‍රියාත්මක වෙනවා. ඒ අණ පනත්වල තිබෙන නීති රීතිවලට අනනුකූල සියලුම දේවල් නීති විරෝධී වෙනවා. ඊට අමතරව, නීති විරෝධීව නිෂ්පාදනය කරන සහ නියමිත බදු මුදල් නොගෙවා මෙරටට ගෙන්වන ඒවාත් නීති විරෝධී වෙනවා. ඒ දෙයාකාරයට අයත් වන ඒවා තමයි නීති විරෝධී යටතට ගැනෙන්නේ. මේ නීති විරෝධී ලෙස ගෙන්වන සහ නිෂ්පාදනය කරනු ලබන සියලු දේවල් වැටලීම සඳහා - මා කලින් පිළිතුරු දුන් විධියට - මේ වනවිට අවශ්‍ය පියවර දැඩිව ගනිමින් සිටිනවා.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ, ප්‍රධාන දේශපාලන පක්ෂයක් නියෝජනය කරන ආසන සංවිධායකවරයෙක් වසර ගණනාවක් තිස්සේ මේ කූට ජාවාරමේ නියැළී සිටිනවා. අවස්ථා කිහිපයකදීම ඔහුට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග පවා අරගෙන තිබෙනවා. ඒ වාගේ අය අදටත් ඒ කූට ජාවාරම්වල නිරත වෙනවා. නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට ඔබතුමා, ඒ අය සම්බන්ධයෙන් ඉදිරියේදී ගන්න බලාපොරොත්තු වෙන ක්‍රියාමාර්ග මොනවාද කියන එක ගැනත් දැනගන්න කැමැතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, නීති විරෝධී විධියට ඒවා ආනයනය සහ නිෂ්පාදනය කරන ආයතන සම්බන්ධයෙන් අදාළ වැටලීම් දැනටත් සිදු කරමින් පවතිනවා. ඊට අමතරව තිබෙන යම් නීතිමය හිඩැස් හඳුනාගෙන දුම්කොළ බදු පනත සංශෝධනය කිරීමටත් අවශ්‍ය කටයුතු මේ වනකොට සිදු කරමින් පවතිනවා. ඉදිරියේදී ඒ සංශෝධන ඒමත් එක්ක නීතිය වඩාත් බලාත්මක කිරීමේ හැකියාව ඒ ආයතනවලට පවතිනවා. ගරු මන්ත්‍රීතුමනි, ඊටත් අමතරව කවුරු හරි කෙනෙක් මේ සම්බන්ධයෙන් නීති විරෝධී විධියට කටයුතු කරනවා කියලා, ඒ කියන්නේ නීති විරෝධී විධියට දුම්වැටි ආනයනය හරි නිෂ්පාදනය හරි කරනවා කියලා ඔබතුමා සහ රටේ ජනතාව දන්නවා නම් ඒක ඒ බලධාරි ආයතනවලට දැනුම් දුන්නොත් වහාම වැටලීම් කරන්න විශේෂයෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් මේ වන විට පිහිටුවා තිබෙනවා. ජනතාවටත් දැනුම් දීමේ අවස්ථාව තිබෙනවා, කවුරු හරි කෙනෙක් එහෙම නීති විරෝධී විධියට ඒ කටයුතු සිදු කරනවා නම්. එසේ දැනුම් දුන්නොත් ඒ අංශයන්ට වහාම ඒ තැන් වටලා අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව තිබෙනවා. මං ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ එහෙම තොරතුරු තිබෙනවා නම් වහාම දැනුම් දෙන්න කියලායි. ඒ අනුව ඒ අදාළ බලධාරි ආයතන ක්‍රියාත්මක වෙලා ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඉතාම කාර්යක්ෂම විධියට මේ වන විට සිදු කරමින් පවතිනවා.

## එච්.ජී. කවීෂ ගීතාංජන අමරසිංහ: උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා තෝරා නොගැනීම
## எச்.ஜீ. கவீஷ கீதாஞ்சன அமரசிங்க: உப பொலிஸ் பரிசோதகர் பதவிக்கு தேர்ந்தெடுக்கப்படாமை
## H.G. KAVEESHA GEETHANJANA AMARASINGHE: NON-SELECTION FOR POST OF SUB-INSPECTOR OF POLICE

2111/2026

**8. ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024.03.28 දිනැති අංක 2378 දරන ගැසට් පත්‍රය අනුව "උප පොලිස් පරීක්ෂක" තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත්;

(ii) එම අයදුම්පත් අතරින් පරීක්ෂණය සඳහා සියදෙනෙකු තේරී පත්වූ බවත්;

(iii) එච්.ජී. කවීෂ ගීතාංජන අමරසිංහ යන අයට එලෙස තේරී පත්වූවන් අතර සිටින බව හා පුහුණුව සඳහා පැමිණීමේදී රැගෙන ආ යුතු ද්‍රව්‍ය පිළිබඳව ලිඛිතව දැනුම්දී ඇති බවත්;

(iv) 2026.04.18 දින අනෙකුත් තේරී පත්වූ අය කළුතර පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයට කැඳවා තිබුණද ඔහුට එවැනි කැඳවීමක් සිදු කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත අ(iv) සඳහා හේතු කවරේද;

(ii) ඔහුට සිදුව ඇතැයි කියන අසාධාරණය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.03.28ஆம் திகதிய, 2378ஆம் இலக்க வர்த்தமானிப் பத்திரிகைக்கு அமைய 'உப பொலிஸ் பரிசோதகர்' பதவிக்கு விண்ணப்பங்கள் கோரப்பட்டுள்ளன என்பதையும்;

(ii) மேற்படி விண்ணப்பங்களில் தேர்வுக்காக நூறு பேர் தேர்ந்தெடுக்கப்பட்டனர் என்பதையும்;

(iii) எச்.ஜீ. கவீஷ கீதாஞ்சன அமரசிங்க என்பவர், அவ்வாறு தேர்ந்தெடுக்கப்பட்டவர்களில் உள்ளடங்குவதாகவும் பயிற்சிக்கு வரும்போது அவர் எடுத்துவர வேண்டிய பொருட்கள் பற்றியும் எழுத்துமூலம் அறிவிக்கப்பட்டுள்ளது என்பதையும்;

(iv) 2026.04.18ஆம் திகதி மற்றைய தேர்ந்தெடுக்கப் பட்டவர்களுக்கு களுத்துறை பொலிஸ் பயிற்சிக் கல்லூரிக்கு வருமாறு அழைப்பு விடுக்கப்பட்டு இருந்தபோதிலும், அவருக்கு அவ்வாறு அழைப்பு விடுக்கப்பட்டு இருக்கவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி அ(iv) க்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) அவருக்கு இழைக்கப்பட்டுள்ளதாக குறிப்பிடப் படும் அநீதி தொடர்பில் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Is he aware that-

(i) applications have been called for the post of Sub-Inspector of Police as per Gazette No. 2378 dated 28.03.2024;

(ii) out of the said applications, 100 applicants were selected for the test;

(iii) Mr. H.G. Kaveesha Geethanjana Amarasinghe was among those selected candidates and that he had been informed in writing of the items to be brought when reporting for training; and

(iv) although the other selected individuals were called to the Police Training College, Kalutara on 18.04.2026, he has not been called?

(b) Will he inform this House of the -

(i) reasons for (a) (iv) above; and

(ii) measures that will be taken regarding the alleged injustice caused to him?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) මුල් අවස්ථාවේ දැනුවත් කිරීමක් කර තිබුණද බඳවා ගන්නා අවස්ථාවේදී කැඳවීමක් කර නැත.

(iv) ඔව්.

(ආ) (i) අයදුම්කරුවන් බඳවා ගැනීමේදී සිදු කරන විෂ මත්ද්‍රව්‍ය භාවිත කිරීම පිළිබඳ පරීක්ෂණයෙන් අසමත් වීම.

(ii) අසාධාරණයක් සිදු වී නොමැත.

(ඇ) පැන නොනඟී.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඒ 100ක් වන පිරිසෙන් කීදෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවාද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, මුල් අවස්ථාවේදී 170දෙනෙකු වෛද්‍ය පරීක්ෂණයට භාජන කර තිබෙනවා. මුල් අවස්ථාවේදී මේ කියන තරුණයා ඒ 100 දෙනා අතර ඉඳලා තිබෙනවා. නමුත් මේ පිළිබඳව ආව පැමිණිලි 17ක් තිබුණා. ඒවා පිළිබඳව පූර්ණ විමර්ශනයක් කළා. ඒ විමර්ශනයේදී ඒ 100ක් දෙනා අතරින් 19දෙනෙකුට සහතික නොමැතිව ලකුණු දීලා මේකට ඇතුළත් කළ බව අනාවරණය වුණා. ඒ 19දෙනා ඉවත් කරලා විභාගයෙන් සමත් අලුත් 19දෙනෙක් මේ 100ක් දෙනා තුළට ඇතුළත් වුණා. අර මුල් 100දෙනා අතරේ මේ දරුවා හිටියා. ඉවත් වෙච්ච 19දෙනා අතරේත් ඔහු ඉන්නවා. සිද්ධ වුණේ මේකයි. මේකට බඳවා ගන්නා අවස්ථාවේ විෂ මත්ද්‍රව්‍ය පිළිබඳව වෛද්‍ය පරීක්ෂණයක් කරනවා. ඒ වෛද්‍ය පරීක්ෂණයෙන් මේ දරුවා අසමත් වෙනවා. විෂ මත්ද්‍රව්‍ය ශරීරගත වෙලා තිබෙන බව වෛද්‍යවරයා වාර්තා කරනවා. ඒ වාර්තා කරන නිසා ඔහු මේ බඳවා ගැනීමට ඇතුළත් කරන්නේ නැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, දැනට පොලිස් සේවයේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. අපි දන්නවා, සමහර පොලිස් නිලධාරීන් දවසේ පැය 24ම වැඩ කරන බව. ඒ තුළ ඒ අය අසහනයට පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා මේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරනවාද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම පුරප්පාඩු පිරවීම සඳහා දැනට අඛණ්ඩව සම්මුඛ පරීක්ෂණවලට කැඳවමින් තිබෙනවා. මේ වනකොට පොලිස් විද්‍යාල තුළ උප පොලිස් පරීක්ෂකවරු 200ක් පුහුණුව ලබමින් ඉන්නවා. ඊට අමතරව නැවතත් ගැසට් නිවේදනයක් නිකුත් කරලා මේ දිනවලදීත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙනවා. විශේෂ කාර්ය බලකායේ උප පොලිස් පරීක්ෂකවරු සඳහාත් මේ වෙනකොට සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙනවා. ඊට අමතරව මේ වසර තුළ තවත් නිලධාරීන් 7,800ක් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙනවා.

ඒ වාගේම වයස අවුරුදු 60 සම්පූර්ණ වෙලා යහපත් කල් ක්‍රියාවෙන් ඉන්න අයට අමතර වසරක සේවා දිගුවක් ලබා දීමේ හැකියාව පිළිබඳව අපි සොයා බලමින් ඉන්නවා. ඒ පිළිබඳව අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දස දහසක් පොලීසියට අනුයුක්ත කරලා තිබෙනවා. ඒ අයගෙන් නිලධාරීන් 6,000ක් දැන් වැඩ භාර අරගෙන තිබෙනවා. ඔබතුමා කියන කාරණය මා පිළිගන්නවා. මානව සම්පතේ යම් හිඟයක් තිබෙන බැවින් එය කළමනාකරණය කර ගැනීම සඳහා අපි කටයුතු කරනවා. රාජකාරි කටයුතුවල බහුලතාව හින්දා පහළ ශ්‍රේණිවල නිලධාරීන්ට යම් පීඩාකාරී තත්ත්වයක් තිබෙනවා. එයත් කළමනාකරණය කරන්න අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අපි මේ වෙනකොට අරගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා නේද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නැහැ, නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මතක හැටියට නම් ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා. ලේකම් මණ්ඩලයත් කියනවා, ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා කියලා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ලේකම් මණ්ඩලය දැනුම් දෙනවා, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහලා ඉවරයි කියලා.

ප්‍රශ්න අංක 9, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු අමාත්‍යතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

එතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයත් ඇහුවා. දෙවැනි අතුරු ප්‍රශ්නයත් ඇහුවා. ඔිනෑ නම් තුන්වැනි ප්‍රශ්නයකුත් අහන්න කියන්න. *[බාධා කිරීමක්]*

## වෘත්තීය පුහුණු ආයතන: ආබාධ සහිත පුද්ගලයින් සඳහා ඇති පාඨමාලා සහ පහසුකම්

தொழிற்பயிற்சி நிறுவனங்கள்: ஊனமுற்றோருக்கான கற்கைநெறிகளும் வசதிகளும்

VOCATIONAL TRAINING INSTITUTIONS: COURSES AND FACILITIES FOR THE DISABLED

2115/2026

**9. ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල පවතින පාඨමාලා කවරේද;

(iii) එම පාඨමාලා සඳහා පසුගිය වර්ෂය තුළ බඳවාගෙන ඇති ආබාධ සහිත අභ්‍යාසලාභීන් සංඛ්‍යාව ආබාධ වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම පාඨමාලා හැදෑරීම සඳහා ආබාධ සහිත අභ්‍යාසලාභීන්ට භෞතික ප්‍රවේශය සහ සන්නිවේදන පහසුකම් සලසා තිබේද;

(v) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, ආබාධිත තත්ත්වය හෝ අන්තර්කරණ බාධා හේතුවෙන් සපුරාලීමට නොහැකි අභ්‍යාසලාභීන්ට පාඨමාලාවලට ඇතුළත්වීම සඳහා විශේෂ අවස්ථා සලසා තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුකරුවන් සඳහා ආබාධ සහිත ප්‍රජාව සමඟ කටයුතු කිරීමට අවශ්‍ය විශේෂ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේද;

(ii) අභ්‍යාසලාභීන්ට සමීපතම වෘත්තීය පුහුණු ආයතනයේ අභිමත පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය අන්තර්කරණීය හා ආබාධිත හිතකාමී ආයතනික රාමුවක් ගොඩනැඟීමට අවධානය යොමු වී තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වෙන්කර ඇති ප්‍රතිපාදන කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இயங்குநிலையிலுள்ள தொழிற் பயிற்சி நிறுவனங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி நிறுவனங்களில் நடாத்தப்படும் கற்கைநெறிகள் யாவை;

(iii) மேற்படி கற்கைநெறிகளுக்கு கடந்த ஆண்டில் சேர்த்துக்கொள்ளப்பட்ட ஊனமுற்ற பயிலுநர்களின் எண்ணிக்கை, ஊன வகைவாரியாக வெவ்வேறாக யாது;

(iv) மேற்படி கற்கைநெறிகளைத் தொடர்வதற்கு, ஊனமுற்ற பயிலுநர்களுக்குப் பௌதிக ரீதியான அணுகல் மற்றும் தொடர்பாடல் வசதி செய்து கொடுக்கப்பட்டுள்ளதா;

(v) பயிலுநர்களைச் சேர்த்துக்கொள்வதற்குத் தேவை யான தகைமைகளை ஊனநிலை அல்லது அனைவரையும் உள்வாங்கிக்கொள்வதில் உள்ள தடங்கல்கள் காரணமாகப் பூர்த்திசெய்ய முடியாத பயிலுநர்களுக்கு கற்கைநெறிகளில் சேர்வதற்கு விசேட வாய்ப்புகள் ஏற்படுத்தப்பட்டுள்ளனவா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தொழிற்பயிற்சி நிறுவனங்களின் பயிற்றுநர் களுக்கு ஊனமுற்றோர் சமுதாயத்துடன் செயலாற்றுவதற்குத் தேவையான விசேட திறன் மேம்பாட்டு நிகழ்ச்சிகள் நடாத்தப் பட்டுள்ளனவா?

(ii) பயிலுநர்களுக்கு அண்மித்த இடங்களில் அமைந்துள்ள தொழிற்பயிற்சி நிறுவனத்தில் தாம் விரும்பும் கற்கைநெறியைத் தொடர் வதற்குத் தேவைப்படும், அனைவரையும் உள்ளடக்கிய மற்றும் ஊனமுற்றோர்நேய நிறுவனக் கட்டமைப்பொன்றை உருவாக்கு வதில் கவனம் செலுத்தப்பட்டுள்ளதா;

(iii) ஆமெனில், அதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டுள்ள நிதி ஒதுக்கீடுகளும் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of vocational training institutions operating in Sri Lanka;

(ii) the courses available at those institutions;

(iii) the number of trainees with disabilities enrolled in those courses during the last year, classified by the type of disability;

(iv) whether physical access and communication facilities have been provided to enable trainees with disabilities to pursue these courses; and

(v) whether special opportunities have been provided for trainees with disabilities who are unable to meet the prescribed qualifications for trainee recruitment due to disability-related or inclusion barriers to enroll in these courses?

(b) Will she also inform this House -

(i) whether programmes have been implemented for trainers in vocational training institutions to develop special skills required to work with persons with disabilities;

(ii) whether attention has been paid to establishing an inclusive and disability-friendly institutional framework to enable trainees to pursue their preferred courses at the nearest vocational training institution; and

(iii) if so, the measures that have been taken in that regard and the provisions allocated for that purpose?

(c) If not, why?

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව 1,573කි.

(ii) එම ආයතනවල පවතින පාඨමාලා විශාල ප්‍රමාණයක් තිබෙන බැවින් එහි මෘදු පිටපතක් DVD තැටියක් මඟින් ඉදිරිපත් කරනවා.

(iii) ඇමුණුම 01 ලෙස පහත දැක්වේ.

| Information on TVEC registered active training centres, courses and differently abled students as at 27/07/2026 | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| Owner / Institute | training c | registered c | No. of Differently Abled Students in 2025 | | | | | | |
| | | | Cognit | Commu | Hearing | Mobilit | Self-car | Vision | Grand Total |
| **Charity** | **24** | **85** | | | | | | | |
| Charity | 24 | 85 | | | | | | | |
| **Government** | **517** | **3,392** | **41** | **7** | **8** | **6** | **4** | **1** | **67** |
| Contruction Industry Development Authority | 3 | 30 | | | | | | | |
| Dcpartment of Agriculture | 4 | 4 | | | | | | | |
| DTET | 34 | 926 | | 1 | | | | | 1 |
| Gem and Jewellery Research and Training Institute | 8 | 42 | | | | | | | |
| NAITA | 36 | 106 | | | | | 1 | | 1 |
| National Institute of Plantation Management | 2 | 17 | | | | | | | |
| National Water Supply and Drainage Board | 1 | 8 | | | | | | | |
| National Youth Corps | 2 | 9 | | | | | | | |
| NYSC | 45 | 315 | 2 | 2 | 1 | | 3 | | 8 |
| Ocean University of Sri lanka | 6 | 51 | | | | | | | |
| Public-Other | 191 | 724 | 39 | 3 | 5 | 4 | | 1 | 52 |
| Sri Lanka Atomic Energy Board | 1 | 15 | | | | | | | |
| Sri Lanka Bureau of Foreign Employment | 10 | 20 | | | | | | | |
| Sri Lanka Institute of Tourism and Hotel Management | 7 | 54 | | | | | | | |
| University Colleges | 6 | 52 | | | | | | | |
| UOVT | 1 | 2 | | | | | | | |
| VTA | 159 | 1,012 | | 1 | 2 | 2 | | | 5 |
| Waste Management Authority | 1 | 5 | | | | | | | |
| **NGO** | **43** | **155** | **4** | **2** | | | | | **6** |
| NGO | 43 | 155 | 4 | 2 | | | | | 6 |
| **Private** | **989** | **3,403** | **3** | **5** | **11** | **1** | **1** | **3** | **24** |
| Private | 989 | 3,403 | 3 | 5 | 11 | 1 | 1 | 3 | 24 |
| **Grand Total** | **1,573** | **7,035** | **48** | **14** | **19** | **7** | **5** | **4** | **97** |

(iv) මූලික පහසුකම් (ප්‍රවේශය, මූලික උපකරණ) සපයා ඇත.

(v) ආබාධිත සිසුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පහසු කිරීම සඳහා NVQ මාර්ගගත පද්ධතිය තුළ අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත. ඊට අමතරව ඔවුන් ඇගයීමට ලක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය NVQ චක්‍රලේඛ 09/2023 - ඇමුණුම 02 - මඟින් අදාළ පුහුණු ආයතන හා ඇගයීම්කරුවන්ට උපදෙස් ලබා දී ඇත.

තවද, ආබාධිත දරුවන් ඉලක්ක කර ගත් පුහුණු පාඨමාලාවන් වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන අතර, සියලුම වෘත්තීය පුහුණු ආයතන ආබාධ සහිත දරුවන් ඉලක්ක කර ගත් විශේෂිත පාඨමාලා නොපවත්වයි. කෙසේ වුවද බඳවා ගැනීම් සිදු කිරීමේදී එවැනි දරුවන් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්නම් ඔවුන් සඳහා ප්‍රමුඛතාව ලබා දීමට කටයුතු කරනු ලබයි.

(ආ) (i) ඇගයීම්කරුවන්ට හා පුහුණුකරුවන්ට අවශ්‍ය පුහුණුව ලබා දී ඇත. ආබාධ සහිත සිසුන් ඇගයීමේදී අදාළ NVQ චක්‍රලේඛ 01/2020 - ඇමුණුම 03 - අනුව සිදු කළ යුතුය.

(ii) ආබාධිත සිසුන් සඳහා වෙන් වූ පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට අවධානය යොමු කර ඇත. අන්තර්කාලීන වශයෙන් දැනට ක්‍රියාත්මක කරන පුහුණු ආයතනවලට එම සිසුන් බඳවා ගැනීම සිදු වේ.

(iii) සාකච්ඡා මට්ටමේ පවතී.

(ඇ) අදාළ නොවේ.

ඉහත සඳහන් කරන ලද DVD තැටිය, ඇමුණුම් 02 සහ 03 **සභාගත*** කරමි.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**

(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)

(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, බොහොම ස්තුතියි පිළිතුර ලබා දුන්නාට. අප දන්නවා, ආබාධ සහිත ජනගහනයෙන් ශ්‍රම බලකායට අයිති කොටසෙන් සියයට 86ක් රැකියා විරහිත කණ්ඩායමයි කියන එක. එයින් සියයට 80ක් පිරිමි, සියයට 92ක් කාන්තාවන්. මේ ශ්‍රම බලකාය රටේ ආර්ථිකයට දායක කර ගන්න නම් යෝග්‍යතම ක්‍රමය තමයි වෘත්තීය පුහුණුව හරහා ඔවුන් පුහුණු ශ්‍රමිකයන් ලෙස ශ්‍රම බලකායට එකතු කිරීම. දැන් මෙන්න මේ කර්තව්‍යයට වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ වේවා, නිපුණතා සංවර්ධන ආයතන යටතේ වේවා තිබෙන ආයතන කොච්චර දුරට සූදානම්ද? එසේ සූදානම් නම් මෙම පාඨමාලා ආබාධ සහිත ප්‍රජාවට එකතු විය හැකි විධියට; අන්තර්කරණය විය හැකි විධියට සැකසෙන්න ඕනෑ. එක් පැත්තකින්, ඒ පාඨමාලා පවත්වන ආයතන, මධ්‍යස්ථාන ප්‍රවේශ පහසුකම් සහිතව තිබෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, බිහිරි ප්‍රජාව එක්ක වැඩ කරද්දී සංඥා භාෂාවෙන් සන්නිවේදන පහසුකම් ගොඩනැඟෙන්න ඕනෑ. මේ විධියට පසුතලය සැකසෙන්නේ නැත්නම් ආබාධ සහිත පුහුණුලාභීන්ට වෘත්තීය පුහුණු ආයතනවලට ඇතුළත් වීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මෙන්න මේ වාගේ ප්‍රතිසංස්කරණ සිදු කරන්න.

---

*** පුස්තකාලයේ තබා ඇත.**

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

විශේෂයෙන්ම අපි දන්නවා, දැන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ඉතා විශාල වෙහෙසක් දරමින් මේ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යන බව. මෙන්න මේ වැඩ පිළිවෙළ, ඒ කියන්නේ ආබාධ සහිත තැනැත්තන්ට හිතකර අන්දමට වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා, භෞතික ප්‍රවේශය සහ එහි මානව සම්පත සංවර්ධනය කරන්න වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විධියට කොයි වාගේ සූදානමක් තිබෙනවාද? අඩුම ගණනේ ලබන අය වැය ලේඛනයෙන් කොයි වාගේ ප්‍රතිපාදනයක් වෙන් කර ගන්න බලාපොරොත්තු වෙනවාද, මෙන්න මේ කියන ආබාධ සහිත අභ්‍යාසලාභීන්ට අන්තර්කරණීය ක්‍රමයට වෘත්තීය පුහුණු ආයතනවල පහසුකම් ලබා දෙන්නට?

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු මන්ත්‍රීතුමා කියන කාරණාව පිළිගන්නවා. ආබාධ සහිත පුද්ගලයන් සැලකිය යුතු ප්‍රමාණයක් සමාජයේ ඉන්නවා. ඒ අයට වෘත්තීය පුහුණුව ලබා දීම කෙරෙහි අපි අවධානය යොමු කර තිබෙනවා. මේ වන කොටත් අපේ ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් කැබිනට් උපකමිටුවක් පත් කරලා, මේ ක්ෂේත්‍රයටම අදාළ ගැටලු ටික විසඳීම සඳහා කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම මේ වන කොටත් අපි ඔටිසම් දරුවන්ට පාඨමාලාවක් ආරම්භ කරලා, NVQ සහතික ලබා දෙන ක්‍රියාවලියක් ආරම්භ කර තිබෙනවා. ඉදිරියේදී ආයතන පද්ධතිය නවීකරණය කරන කොට ගරු මන්ත්‍රීතුමා කියූ ආකාරයෙන්ම ඒ දරුවන්ට ප්‍රවේශ විය හැකි වන පරිදි, ඔවුන්ට අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය තාක්ෂණික මෙවලම් ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ සම්බන්ධයෙන් අපි අමාත්‍යාංශයක් හැටියට අවධානය යොමු කර තිබෙනවා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

"ස්වාභිමානී දිරිය නිපැයුම් - 2026" නමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව සංවිධානය කරන, ආබාධ සහිත ප්‍රජාවගේ ස්වයං රැකියාවලින් නිෂ්පාදිත නිෂ්පාදන, ඒ වාගේම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතන විසින් කරනු ලබන නිෂ්පාදන ප්‍රදර්ශනයක් සහ අලෙවි පොළක් මේ මොහොතේත් සෙත්සිරිපාය පරිශ්‍රයේ පැවැත්වෙනවා. ඒ කියන්නේ, ඔබ අමාත්‍යාංශයට අමතරව සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළත් වෘත්තීය පුහුණු ආයතන ගණනාවක් ඔස්සේ ආබාධ සහිත පුද්ගලයන් වෘත්තීය කටයුතුවල පුහුණු කිරීමේ කාර්යයෙහි නිරත වෙනවා. වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයත්, සමාජ සේවා දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධ ප්‍රවේශයකින් මෙන්න මේ කර්තව්‍යයට කර උර දෙනවා නම්, ඒකාබද්ධ ප්‍රවේශයකින් ආබාධ සහිත ප්‍රජාවට වෘත්තීය පුහුණුව ලබා දෙන්න මැදිහත් වෙනවා නම් වඩාත් යෝග්‍යයි කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම, මෙවැනි ඒකාබද්ධ ප්‍රවේශයකින් ආබාධ සහිත අභ්‍යාසලාභීන්ට වෘත්තීය පුහුණුව ලබා දෙන්න සූදානමක් තිබෙනවාද කියලා මම දැනගන්න සතුටුයි. මොකද, ආබාධ සහිත අභ්‍යාසලාභීන් සඳහා ගැළපෙන ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ විශේෂඥතාව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතනවල උපදේශකයන්ට තිබෙනවා.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අමතරව පෞද්ගලික අංශයත්, ඒ වාගේම තවත් අමාත්‍යාංශ ගණනාවකුත් මෙම පාඨමාලා පවත්වාගෙන යනවා. හැබැයි, ඒ සියලු පාඨමාලාවලට අදාළ සහතික පත් නිකුත් කරනු ලබන්නේ අපේ අමාත්‍යාංශය යටතේ ඇති තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින්. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟිනුත් මෙම පාඨමාලා පවත්වාගෙන යනවා. එම නිසා අපි මේ වනකොට සාකච්ඡාවක් පවත්වමින් ඉන්නවා, අනෙකුත් ආයතනත් එක්ක මේ සියල්ල ඒකාබද්ධ කර ගනිමින් වඩාත් හොඳ වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම සඳහා. ගරු මන්ත්‍රීතුමා කියන කාරණාවට අපි එකඟයි. ඒ අනුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟත් සාකච්ඡා කරලා අදාළ පහසුකම් ලබා දීමේ හැකියාව අපට තිබෙනවා.

## කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම්: විස්තර

## கமத்தொழில் ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர் பிரிவுகள்: விபரம்

## AGRICULTURAL RESEARCH AND PRODUCTION ASSISTANT DIVISIONS: DETAILS

2124/2026

**10.** ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් සංඛ්‍යාව;

(ii) මේ වන විට එම වසම්වල සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව;

(iii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් සංඛ්‍යාව;

(iv) එම දිස්ත්‍රික්කයේ මේ වන විට සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එම තනතුර අහෝසි කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள கமத்தொழில் ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர் பிரிவுகளின் எண்ணிக்கை;

(ii) தற்போது அப்பிரிவுகளில் பணியிலீடுபட்டுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை;

(iii) அநுராதபுரம் மாவட்டத்தில் உள்ள கமத்தொழில் ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர் பிரிவுகளின் எண்ணிக்கை;

(iv) மேற்படி மாவட்டத்தில் தற்போது பணியிலீடுபட்டுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை;

யாதென்பதை அவர் வெவ்வேறாக இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கமத்தொழில் ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர் பதவியில் உள்ள வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை எடுப்பாரா;

(ii) இன்றேல், மேற்படி பதவியை இல்லாதொழிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House, separately the number of -

(i) Agricultural Research and Production Assistant Divisions in Sri Lanka;

(ii) officers currently serving in the said Divisions;

(iii) Agricultural Research and Production Assistant Divisions in the Anuradhapura District; and

(iv) officers currently serving in the said District?

(b) Will he also inform this House -

(i) whether actions will be taken to fill the vacancies in the post of Agricultural Research and Production Assistant; and

(ii) if not, whether action will be taken to abolish the said position?

(c) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 10,400යි.

(ii) 2026.06.30 දිනට ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 5,919ක් සේවයේ නියුතුව සිටී.

(iii) 650යි.

(iv) 2026.06.30 දිනට ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 355ක් සේවයේ නියුතුව සිටී.

(ආ) (i) ඔව්.

2025.12.31 දිනට පැවැති පුරප්පාඩු මත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් බඳවා ගැනීම සඳහා පහත සඳහන් ලිපි මඟින් කටයුතු කර ඇත.

1) "රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ - කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර බඳවා ගැනීම" යන මැයෙන්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත. (ඇමුණුම 01)

2) කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ආහාර ප්‍රතිපත්ති හා ආහාර සුරක්ෂිතතා කමිටු නිර්දේශය ලබා ගැනීම සඳහා ජනාධිපති ලේකම් වෙත ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත. (ඇමුණුම 02)

(ii) දැනට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුර අහෝසි කිරීමට තීරණයක් ගෙන නැත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් 01 හා 02 **සභාගත*** කරමි.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු ඇමතිතුමනි, මේ කාරණයට අදාළ නොවුණත් මේ වෙලාවේ තිබෙන ප්‍රශ්නයක් නිසාත්, අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් නිසාත් මෙයට ඔබතුමා උත්තර දෙයි කියා මම බලාපොරොත්තු වෙනවා. ඔබතුමා දන්නවා, සාමාන්‍යයෙන් මහවැලි "එච්" කලාපයේ අක්කරයකට වී බුසල් 100ත්, 120ත් අතර අස්වැන්නක් තමයි උපරිම මට්ටමෙන් ලැබෙන්නේ කියන එක. හැබැයි ඔබතුමා එදා පොළොන්නරුවේදී පෙන්නුවා, අක්කරයකට වී බුසල් 200ක් ගන්න පුළුවන් ගොවියෙක්. ඒක හොඳයි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. වී මිල තීරණය කිරීමේදී අස්වැන්න විධියට වී බුසල් 200ක් හෝ ඒ වාගේ ප්‍රමාණයක් ලබා ගනීවි කියන උපකල්පනය මතද ඔබතුමන්ලා වී මිල තීරණය කළේ? වී මිල තීරණය කරන්න පදනම් කරගත් කාරණා, වී මිල තීරණය කරපු සූත්‍රය මොකක්ද කියන එක මේ ගරු සභාවට දන්වන්න පුළුවන්ද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඔය ප්‍රශ්නය ඔබතුමා අහපු ප්‍රධාන ප්‍රශ්නයට සම්බන්ධ අතුරු ප්‍රශ්නයක් නම් නොවෙයි. ඔය ප්‍රශ්නය ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට කිසිම සම්බන්ධයක් නැහැ. ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්න සංඛ්‍යාවක් අහලා තිබෙනවා. ඒ ප්‍රශ්නවලට ලබා දෙන උත්තරවල ඔය ප්‍රශ්නයට අදාළ කරන සම්පූර්ණ උත්තරය තිබෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් අහන්න ඔබතුමාට අවසරය තිබෙනවා. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මා ගරු ඇමතිතුමාගෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ, කැමැති නම් උත්තර දෙන්න කියලායි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියූ පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 650ක් ඉන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පළමුවෙනි අතුරු ප්‍රශ්නය අදාළ නැත්නම්, පළමුවෙනි එක ඔය අහන ප්‍රශ්නය නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, මේ සභාව මෙහෙයවන්නේ මම. ගරු මන්ත්‍රීතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු ඇමතිතුමනි, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර කොට්ඨාස 650ක් තිබෙනවා. දැනට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 342යි සේවයේ ඉන්නේ. ඒ කියන්නේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මෙම තත්ත්වය පොහොර සහනාධාරය ලබා දීමේ ප්‍රමාදයට බලපා තිබෙනවා; වී මිල දී ගැනීමේ ක්‍රියාවලියේ නිර්දේශවලට බලපා තිබෙනවා. විලච්චිය ආදි ප්‍රදේශවල තවම පොහොර සහනාධාරය නොලැබුණු තැන් තිබෙනවා. ඒ නිසා මේ පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව ඉතා ඉක්මනින් බඳවා ගැනීමේ කටයුතු කරන්න. ඔබතුමා දැන් කිව්වා, ඊට අදාළ නිර්දේශ ඉල්ලා තිබෙනවා කියලා. ඔබතුමන්ලාට ඒ පුරප්පාඩු සංඛ්‍යාව මොන තරම් කාලයක් ඇතුළත පුරවන්න පුළුවන්ද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
පසුගිය ආණ්ඩු දිගටම රාජ්‍ය සේවයට බඳවා නොගත් නිසා මේ නිලධාරින් සියයට 40ක් හිඟයි. මේ නිලධාරින් බඳවා ගැනීම පිළිබඳව ඔබතුමා අහපු ප්‍රශ්නයට ඇමුණුම 01 සහ ඇමුණුම 02 යටතේ පිළිතුරු ලබා දීලා තිබෙනවා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
කොච්චර කාලයකින් ඒ කටයුත්ත කර ගන්න පුළුවන්ද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඒ අදාළ කටයුතු වේගයෙන් කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -31/2024- (1), ගරු (නීතිඥ) හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම: ක්‍රමවේදය
### மதுவரித் திணைக்களத்தால் வழங்கப்படும் மதுபான உரிமங்கள்: வழிமுறை
### ISSUANCE OF LIQUOR LICENCES BY EXCISE DEPARTMENT: METHODOLOGY

136/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chaminda Wijesiri)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පසුගිය කාලයේදී විශාල සමාජ විරෝධයක් ඇති වූ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை, மதுவரித் திணைக்களத்தால் வழங்கப்பட்டுள்ள மதுபான உரிமங்களின் எண்ணிக்கை ஒவ்வொரு வருடத்துக்கும் ஏற்ப பிரதேச செயலக வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அத்தகைய மதுபான உரிமங்களை வழங்கும்போது பின்பற்றப்பட்டுள்ள வழிமுறை யாது என்பதையும்;

(iii) மேற்படி உரிமங்கள் வழங்கப்பட்டதன்மூலம் ஈட்டப்பட்டுள்ள வருமானம் ஒவ்வொரு வருடத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்

(iv) மதுபான உரிமம் வழங்கும் வழிமுறை சம்பந்தமாக கடந்த காலத்தில் பாரியளவில் சமூக எதிர்ப்பு எழுந்ததால், அந்த நிலைமையை மாற்றுவதற்கு எடுக்கப்படவுள்ள நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) number of liquor licences issued by the Excise Department in each year from the year 2015 up to now at the Divisional Secretary's Division level, separately;

(ii) methodology followed in issuing the said liquor licences;

(iii) revenue generated from issuing the above licences in each year, separately; and

(iv) steps that will be taken to change that situation in light of the significant social protest that occurred in the past regarding the methodology for issuing liquor licences?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2024.09.27 දින සිට මත්පැන් සිල්ලරට විකිණීම (ර.බී. 04) සඳහා අලුතින් බලපත්‍ර ලබා දී නැත. එසේම, අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ජනාධිපති ලේකම් විසින් 2024.10.21 දින සිට නැවත දැනුම් දෙන තුරු කිසිදු සුරාබදු බලපත්‍රයක් නිකුත් නොකරන මෙන් උපදෙස් දී ඇති අතර, සංචාරක කර්මාන්තයේ උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් පහත සඳහන් බලපත්‍ර කාණ්ඩ සඳහා නව සුරාබදු බලපත්‍ර ලබා දීමට 2024.12.12 දින ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දන්වා ඇත.

1. ර.බී. 7/8 - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් හෝටල් බලපත්‍ර
2. ර.බී. 11 - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් භෝජනාගාර බලපත්‍ර
3. ර.බී. 22 බී - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් ස්ථානීය පරිභෝජනය සඳහා බියර්, ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා වූ විශේෂ බලපත්‍ර
4. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් සුරාබදු නිවේදන අංක 936 යටතේ ලබා දෙන බුටික් විලා බලපත්‍ර
5. ර.බී. 14 - සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල තුළින් උත්සව සඳහා දිනකට/එක් පීඨිකාවක් වෙත ලබා දෙන අවස්ථා බලපත්‍ර

2015 වර්ෂයේ සිට 2026.05.31 දින දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නව මත්පැන් බලපත්‍රවලට අදාළ විස්තර එක් එක් වර්ෂය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් **ඇමුණුම I**** යටතේ දක්වා ඇත.

(ii) 2024 ජනවාරි 12 දිනැති අංක 2366/39 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ අංක 02/2024 දරන සුරාබදු නිවේදනය **(ඇමුණුම II**)** මඟින් දක්වා ඇති රීති හා මාර්ගෝපදේශයන් අනුව මත්පැන් බලපත්‍ර ලබා දීම සිදු කරනු ලබයි. එය 2024.01.12 දින සිට ඉදිරියට නිකුත් කරන ලද සුරාබදු බලපත්‍ර සඳහා අදාළ වේ.

(iii) සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමෙන් ලබන ආදායම දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් බලපත්‍ර නිකුත් කිරීමේදී සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු ලෙස එකතු කරනු ලබයි. එම ආදායම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් එක් එක් පළාත අනුව පළාත් ආදායම් ශීර්ෂයට බැර කරනු ලබයි. කෙසේ වෙතත්, 2015 සිට 2026 මැයි දක්වා කාලය තුළ නව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයාගත් ඇස්තමේන්තුගත ආදායම පහත පරිදි වේ;

| වර්ෂය | නව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඇස්තමේන්තුගත වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව (රුපියල් මිලියන) | ••කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අය කරනු ලබන ඇස්තමේන්තුගත ගාස්තුව (රුපියල් මිලියන) | මුළු ආදායම (තාවකාලික) (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2015 | 38.7 | - | 38.7 |
| 2016 | 31.5 | - | 31.5 |
| 2017 | 8.5 | - | 8.5 |
| 2018 | 25.4 | - | 25.4 |
| 2019 | 43.7 | - | 43.7 |
| 2020 | 17.5 | - | 17.5 |
| 2021 | 100.3 | - | 100.3 |
| 2022 | 81.5 | - | 81.5 |
| 2023 | 150.3 | - | 150.0 |
| 2024 | 207.7 | 3,303.3 | 3,511.0 |
| 2025 | 39.3 | - | 39.3 |
| •2026 | 5.8 | 7.0 | 12.8 |

•2026 මැයි දක්වා

••මෙම ගාස්තුව 2024 වසරේදී සුරාබදු නිවේදන අංක 03/2024 මඟින් හඳුන්වා දී ඇති අතර, 2024 දෙසැම්බර් 06වන දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද අත්හිටුවීමේ නියෝගයක් මත 2025 වසරේදී අය නොකෙරිණි. 2025 දෙසැම්බර් මාසයේදී සුරාබදු නිවේදන අංක 03/2025 ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, මෙම ගාස්තුව නැවත අය කිරීම සිදු කර ඇත.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iv) මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පසුගිය කාලයේදී විශාල සමාජ විරෝධයක් ඇති වූයේ ප්‍රධාන වශයෙන් ර.බී. 04 බලපත්‍ර, එනම් මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර නිකුත් කිරීමට අදාළවයි. ඒ පිළිබඳව සැලකිල්ලට ගෙන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර ද 2024 ඔක්තෝබර් 21 දින සිට නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇත. එසේ වුවද, සංචාරක කර්මාන්තයේ උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා සංචාරක මණ්ඩල අනුමැතියලත් පහත සඳහන් බලපත්‍ර කාණ්ඩ සඳහා නව සුරාබදු බලපත්‍ර ලබා දීමට කටයුතු කර ඇත.

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් හෝටල් බලපත්‍රය (ර.බී. 7/8)
2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් භෝජනාගාර බලපත්‍රය (ර.බී. 11)
3. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් ස්ථානීය පරිභෝජනය සඳහා බියර්, ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා වූ විශේෂ බලපත්‍රය (ර.බී. 22බී)
4. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලත් සුරාබදු නිවේදන 936 යටතේ ලබා දෙන බුටික් විලා බලපත්‍රය
5. සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල තුළින් උත්සව සඳහා දිනකට/එක් පිටිකාවක් වෙත ලබා දෙන අවස්ථා බලපත්‍රය (ර.බී.14)

(ආ) පැන නොනගී.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සහ අධිකරණ පද්ධතියේ අනෙකුත් ප්‍රතිසංස්කරණ
### நீதிபதிகளின் ஓய்வுபெறும் வயதை நீடித்தல் மற்றும் நீதித்துறை முறைமையின் இதர சீர்திருத்தங்கள்
### EXTENSION OF RETIREMENT AGE OF JUDGES AND OTHER REFORMS IN JUDICIAL SYSTEM

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, රටේ අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් උපරිමාධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාම වයස් සීමාව දීර්ඝ කිරීමේ යෝජනාව - දැන් අපට දැන ගන්න ලැබිලා තිබෙනවා, සමස්ත විනිසුරුවරුන්ගේ කියලා - රජය ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කර තිබෙනවා. එහෙත්, එම යෝජනාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු නීති ක්ෂේත්‍රයේ සංවිධාන රැසක් විරෝධය පළ කර ඇති අතර, 2023 වසරේ ADBහි තාක්ෂණික සහයෝගය ඇතිව අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන්ම සකස් කළ වාර්තාවේ ද වෙනත් ප්‍රමුඛතා අවධාරණය කරනවාය කියන එක සඳහන් වෙනවා.

මා ළඟ තිබෙනවා ඒ වාර්තාවේ පිටපතක්. එය පිටු 506ක වාර්තාවක්.

ඒ අනුව, රජයේ ප්‍රතිපත්තිමය පදනම සහ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කිරීමක් ලබාගැනීම සඳහා පහත ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

1. රජය පවසන්නේ විනිසුරුවන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම අධිකරණ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ පුළුල් වැඩ පිළිවෙළක එක් කොටසක් බවයි. එසේ නම්, එම පුළුල් වැඩ පිළිවෙළේ අනෙකුත් ප්‍රතිසංස්කරණ කවරේද? ඒවා ක්‍රියාත්මක කරන නිශ්චිත කාලවකවානුව කුමක්ද?

විශේෂයෙන්ම අපි මේ කාරණය දැන ගන්න කැමැතියි. රජය කියන්නේ, "පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන්න අවශ්‍යයි, ගොඩගැහිලා තිබෙන නඩු ලක්ෂ 11ක් පමණ තිබෙනවා" කියලා. අපිත් විශ්වාස කරනවා, අධිකරණ පද්ධතිය කාර්යක්ෂම විය යුතුයි කියලා. නමුත් ඒ සඳහා හොඳ ශක්‍යතා වාර්තාවක් අවශ්‍යයි. පිටු 506ක ADB funding හරහා ලබා දුන් වාර්තාවක් වාගේ විධිමත් වාර්තා කැඳවීමක් ඇයි ඔබතුමන්ලා කරලා නැත්තේ?

2. රජය පෙන්වා දෙන පරිදි ගොඩගැසී ඇති නඩු මිලියන 1.1න් - ලක්ෂ 11න් - කොපමණ ප්‍රමාණයක් විනිසුරුවන්ගේ හිඟය නිසා සිදුවී ඇත්දැයි ඔබ තක්සේරු කරන්නේද? එයින් කොපමණ ප්‍රමාණයක් අධිකරණ පරිපාලනය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතනවල ප්‍රමාදය නිසා සිදුවී තිබේද යන්න ගැන අපට උත්තරයක් ලබා දෙනවාද?

විශේෂයෙන්ම ඒ පිළිබඳව නිල දත්ත සභාගත කරන්නේද කියලා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

3. 2023 වසරේ ආසියානු සංවර්ධන බැංකුවෙහි තාක්ෂණික සහයෝගය ඇතිව අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන්ම සකස් කළ ප්‍රතිසංස්කරණ වාර්තාව මඟින් ද පද්ධතිමය ප්‍රතිසංස්කරණවලට ප්‍රමුඛතාව ලබා දී තිබේ.

මම සතුව එම වාර්තාව තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා මම එය **සභාගත*** කරනවා.

එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කුමක්ද? අපි ළඟ එහි නිර්දේශ තිබෙනවා. ඒවායේ ප්‍රගතිය ගැන අපි ගරු අධිකරණ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. කොච්චරක් දුරට ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරලා තිබෙනවාද? තවමත් ක්‍රියාත්මක නොකරපු නිර්දේශ මොනවාද?

4. ශ්‍රී ලංකා නීතිඥ සංගමය, නීති කොමිසම, නීතිපති දෙපාර්තමේන්තුව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව සමඟ ඔබ කරන්නට බලාපොරොත්තු වන සංශෝධන පිළිබඳව ප්‍රමාණවත් සාකච්ඡා පවත්වලා තිබෙනවාද?

විනිසුරුවන් 65:0 ක් ලෙස මේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය නැහැ කියලා තීන්දු කරලා තිබෙනවා. ඒකෙන්ම තේරෙනවා, ඒ පාර්ශ්වකරුවන් සමඟ විධිමත් සංවාදයකට එළැඹිලා නැහැයි කියලා. එවැනි සාකච්ඡාවකට එළැඹීම වැදගත් කියලා අපි යෝජනා කරනවා.

එසේ නම්, එම දිනයන් කවරේද? ඇත්ත වශයෙන් මේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා නොකිරීම පිළිබඳව ඔබතුමාගේ ස්ථාවරය මොකක්ද?

5. LAWASIA, Commonwealth Lawyers Association, French National Bar Council ඇතුළු නීති ක්ෂේත්‍රයේ සංවිධාන රැසක් මේ පිළිබඳව බරපතළ විරෝධය දක්වා ඇත.

ඒ වාගේම මම ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේකත් කියන්න කැමතියි. අද උදේ, ලෝකයේ විනිසුරුවරුන්ගේ විශාලම සංවිධානය වන International Association of

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

Judges කියනවා, මේ ප්‍රතිසංස්කරණ කරන්නට හදන කාල රාමුව, කරන්න යන ආකාරය, ඒක සිදුවන්නට තිබෙන පසුබිම බොහොම ප්‍රශ්න සහගතයි, මේක අධිකරණයේ ස්වාධීනත්වයට බරපතළ බලපෑමක් කියලා. ඉතින් මේ වාගේ ප්‍රවීණ කණ්ඩායම් විදේශීය වාගේම දේශීයවත් ඉන්නවා. ඔබතුමා දන්නවා, Colombo High Court Lawyers' Association එකත්, නීති සංගම් විශාල ප්‍රමාණයකුත් මේ සඳහා විරෝධතාව පළ කරලා තිබෙනවා කියලා. Bar Association එකත් විරෝධතාව පළ කරලා තිබෙනවා. ඇයි, ඔබතුමන්ලා ඒ කණ්ඩායම් එක්ක සංවාදයකට, සාකච්ඡාවකට යන්නේ නැත්තේ? Bar Association එක ගරු ජනාධිපතිතුමාත් සමඟ මේ ගැන සාකච්ඡා කරන්නය කියලා අවස්ථාවක් - appointment එකක් - ඉල්ලා තිබෙනවා. මම මේ අවස්ථාවේ දී ඔබතුමාට යෝජනා කරනවා, ඔබතුමා මැදිහත් වෙලා ඒ සාකච්ඡාව ලබා දෙන්න කියලා. මොකද, මේකට කැබිනට් අනුමැතිය ගන්න කලින් මේක කරන්න තිබුණා කියන එක තමයි මම මේ කියන්නේ.

එම විරෝධතා රජය සැලකිල්ලට ගනු ලැබුවේද? ඒ පිළිබඳ රජයේ ප්‍රතිචාරය කුමක්ද?

6. දැනට පවතින උපරිමාධිකරණ හා පහළ අධිකරණ පුරප්පාඩු සම්පූර්ණයෙන් පුරවා අවසන් නොකර විශ්‍රාම වයස දීර්ඝ කිරීමෙන් පමණක් අධිකරණවල නීතියේ ප්‍රමාදය - law's delays - අවම වන බවට රජය සතුව ඇති අධ්‍යයනය කවරේද? එම අධ්‍යයනයට අනුව, විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම නඩු විභාග ඉක්මන් වීම සඳහා බලපාන්නේ කෙසේද?

   මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ගැන හොඳ විග්‍රහයක්, විස්තරාත්මක විග්‍රහයක් කරන්න කියලා.

7. අධිකරණ ප්‍රතිසංස්කරණයේ සාර්ථකත්වය මැනීමට රජය භාවිත කරන ප්‍රධාන දර්ශක - Key Performance Indicators - මොනවාද? විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමෙන් එම දර්ශකවල කුමන වෙනසක් අපේක්ෂා කරන්නේද?

8. යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කළේ කවදාද? එම කෙටුම්පත නීතිපති විසින් අනුමත කළේ කවදාද? එම කෙටුම්පත ගැසට් කිරීමට අපේක්ෂා කරන්නේ කවදාද? එය පළමුවන වර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ කවදාද?

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නත් සමඟම මම කියන්න කැමැතියි, ගරු අධිකරණ ඇමතිතුමාත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඇත්ත වශයෙන්ම මෙම කාරණාවට අදාළව සමහර මාධ්‍යවලට උත්තර දී තිබෙන බව, මේකට Referendum එකක් අවශ්‍ය නැහැ කියලා. මම ඔබතුමාට පෙන්නුම් කරන්න කැමැතියි, ගරු බුවනෙක අලුවිහාරේ මහතා, ගරු මුර්දු ප්‍රනාන්දු මහත්මිය, ගරු ජනක් ද සිල්වා මහතා යන විනිසුරුවරුන් 2022දී පැහැදිලි නඩු තීන්දුවක් දීලා තිබෙන බව. ඒ නඩු තීන්දුව හරහා කියනවා, මෙන්න මෙහෙම.

"ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යැමේ වයස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පනවා ඇති බව මෙමඟින් නොසලකා හැරේ. ධුරයේ කාර්යයේ නියුතු විනිසුරුවන්ට සෘජුව හා වක්‍රව බලපෑම් ඇති කරමින් ඔවුන් විශ්‍රාම යැමේ වයසට හෝ ධුර කාලයට සංශෝධනයක් එක් කරන ඕනෑම ව්‍යවස්ථා සංශෝධනයක් මඟින් අධිකරණයේ ස්වාධීනත්වයට බාධාවක් සිදු වන අතර, එය ජනමත විචාරණයක් අවශ්‍ය කරන පරිදි තුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් ද වේ." මේක මම නොවෙයි කියන්නේ, ගරු විනිසුරු බුවනෙක අලුවිහාරේ මහතා, ගරු මුර්දු ප්‍රනාන්දු මහත්මිය, ගරු ජනක් ද සිල්වා මහතා යන විනිසුරුවරුන්. ඔබතුමන්ලාගෙන් Referendum එක ගැන ඇහුවාම උත්තර නැහැ. මේ නඩු තීන්දුව කියවන්න. මේ සඳහා උත්තර ලබා දෙන්න, ගරු අමාත්‍යතුමනි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරන්න විනාඩි 10ක් ගත්තා.

ගරු අධිකරණ අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. අපි විනිශ්චයකාරවරුන් විශ්‍රාම යන වයස් සීමාව වෙනස් කරන්නේ සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කොටසක් වශයෙන්; ඉතා සුළු කොටසක් වශයෙන්. ඊට අමතරව අපි කටයුතු රාශියක් කර තිබෙනවා. ඒ වාගේම අපගේ රජය බලයට පත් වුණු දිනයේ සිට මේ දක්වා මූලිකවම අධිකරණයේ ප්‍රතිසංස්කරණ තමයි අපි කරන්නේ. ඒක මේ අවුරුදු පහේම කරගෙන යන්න වෙනවා; ඉදිරියටත් කරන්න වෙනවා. මොකද, මූලිකවම නඩු කල් යෑම, මිනිස්සු අධිකරණවල රස්තියාදු වීම කියන සියල්ල වළක්වන්න අවශ්‍යයි.

   ඉස්සර තිබුණු තත්ත්වයක් තමයි නඩු ඇදි ඇදී ගිහිල්ලා, අන්තිමට වැරදි කළ පුද්ගලයන් ආණ්ඩු මාරු වුණාම නිදහස් වෙලා යන එක. එවැනි ගතියකුත් ජනතාවට තේරිලා තිබෙනවා. මේ සියල්ල නවත්වා ගන්න ඕනෑ නිසා තමයි අපි බලයට පැමිණියාට පසුව විශේෂයෙන්ම කොළඹ අධිකරණ සංඛ්‍යාව වැඩි කර තිබෙන්නේ. ඒ වාගේම තදබදය වැඩි මහාධිකරණ 11ක් හඳුනා ගෙන තිබෙනවා. කොළඹින් පිට මහාධිකරණ 11ක් පිහිටුවන්නත් යෝජනා වෙලා තිබෙනවා. ඒ වාගේම සුළු හිමිකම් අධිකරණ සහ Commercial High Courts වැඩි කර තිබෙනවා. ත්‍රිපුද්ගල උසාවි වැඩි කර තිබෙනවා. ඒ වාගේම කොළඹින් බැහැරව ත්‍රිපුද්ගල නඩු විභාග කිරීමට මහාධිකරණයට අවශ්‍ය විනිශ්චයකාරවරුන් ප්‍රමාණය බඳවා ගන්නත් අපි කල්පනා කරනවා. ඒ වාගේම අභියාචනාධිකරණය යුක්තියට ප්‍රවේශ වීම පහසු කරනු වස්, කොළඹ වාඩි වන අභියාචනාධිකරණය කොළඹින් බැහැරව යම් කාල සීමාවකට පැවැත්වීම පිළිබඳවත් කටයුතු කරනවා. ඒ වාගේම නව මහෙස්ත්‍රාත්වරුන් බඳවා ගැනීම මේ අවස්ථාව වනවිට සිදු වෙනවා. අවශ්‍ය ප්‍රමාණයටම බඳවා ගෙන නැහැ. නැවත වතාවක් interviews කැඳවන්න වෙයි කියා මට JSC එකෙන් දැනුම් දුන්නා. ඒ වාගේම නව අධිකරණ ගොඩනැඟිලි ඉදිකිරීම, ඒවායේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම, නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙන මානව සම්පත් හිඟය නිසා නව රජයේ අධිනීතිඥවරුන් බඳවා ගැනීමට කටයුතු කිරීම, ඔවුන්ගේ promotions සලකා බැලීම, ඒ වාගේම බරපතළ ගැටලු ඇති රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට නිලධාරීන් බඳවා ගැනීම, අවශ්‍ය සම්පත් ලබා ගැනීම ආදී කරුණු හරහා තමයි අපි මේ ප්‍රතිසංස්කරණ කටයුතු කරන්නේ. එයින් එක සුළු කොටසක් පමණයි, විශ්‍රාම වයස වැඩි කිරීම.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

2. මා විසින් ඉහත 1 ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර අනුව මෙම ආයතනයන්හි ද උග්‍ර නිලධාරි හිඟය හා සම්පත් හිඟතාව මෙකී ගොඩගැසී ඇති නඩු විශාල සංඛ්‍යාවට හේතු සාධක වී ඇති බව නොරහසකි. එකී ආයතනයන්හි වැඩ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට ගන්නා ලද පියවර මා විසින් 1වැනි පිළිතුර මඟින් ලබා දී තිබෙනවා. අසා තිබෙන නිල රථ පිළිබඳ තොරතුරු සභාගත කරන්නට ලැබුණු පැය 24ක කාලය ප්‍රමාණවත් නැහැ.

3. ආසියානු සංවර්ධන බැංකුවේ - ADB එකේ - මූල්‍ය ප්‍රතිපාදන යටතේ 2017 වසරේදී අත්සන් තබන ලද "වාණිජ නීතිය, ආයෝජන සහ ගිවිසුම් බලගැන්වීම කෙරෙහි අවධානය යොමු කරමින් අධිකරණ ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව නැංවීම" නමැති ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නීති උපදේශක ජනාධිපති නීතිඥ හර්ෂ ප්‍රනාන්දු මහතා විසින් ඇගයීම් වාර්තාවක් සහ උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබෙනවා.

එම ඇගයීම් වාර්තාව මඟින් ප්‍රධාන ක්ෂේත්‍ර හතක් යටතේ ක්‍රියාකාරී යෝජනා 160කට ආසන්න සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවා වාණිජ නීති ප්‍රතිසංස්කරණය, ගිවිසුම් බලගැන්වීම, කාර්යක්ෂමතාව, ආයතනික ධාරිතාව වර්ධනය කිරීම, අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම, අන්තර් ආයතනික සම්බන්ධීකරණය, විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රමවේද සහ මහජන පාරදෘශ්‍යභාවය යන ක්ෂේත්‍ර ආවරණය කරනවා.

මෙම ඉලක්කගත යෝජනා ක්‍රියාත්මක කිරීම මඟින් අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ඇතුළු සෙසු අදාළ ආයතනයන්හි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇති කිරීමටත්, ආරවුල් විසඳීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවා සමස්ත ආයෝජක විශ්වාසය තහවුරු කිරීමටත් අපේක්ෂා කර තිබෙනවා.

එම ක්‍රියාකාරී යෝජනා අතරින් මේ වනවිට පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

i. නඩු ගොනු ඒකාකාරී ක්‍රමවේදයකට අංකකරණය, හඳුනා ගැනීම සඳහා QR කේත භාවිතය

ii. ඩිජිටල්කරණ ව්‍යාපෘති ආරම්භ කිරීම

iii. අධිකරණ සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම

iv. විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රමවේද ශක්තිමත් කිරීම

v. ප්‍රමාණවත් යටිතල පහසුකම් ලබා දීම

vi. ක්‍රියාවලීන් පහසු කිරීමේ නීති

4. ශ්‍රී ලංකා නීතිඥ සංගමය මා වෙතින් සාකච්ඡාවක් ඉල්ලා සිටි අතර ඔවුන් සමඟ මා විසින් සාකච්ඡාවක් 2026.07.29 දින පවත්වන ලදී. එහිදී ඔවුන් වාචිකව හා ලිඛිතව මා වෙත තමන්ගේ අදහස් දක්වන ලදී. මෙහි සඳහන් අනෙකුත් ආයතන සහ අධිකරණ සේවා කොමිෂන් සභාව මා වෙත අදහස් ඉදිරිපත් කර නොමැති අතර, මේ සිද්ධිය සම්බන්ධයෙන් හමුවීමට ඉල්ලීමක් ද ඉදිරිපත් කර නොමැත.

එමෙන්ම, ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළ පරිදි මේ සියලු කරුණු සම්බන්ධයෙන් මා විසින් ගරු ජනාධිපතිවරයා දැනුවත් කර තිබෙනවා. ඔවුන් එතුමා මුණ ගැසෙන්න ඉල්ලීමක් කළ බවටත් මා විසින් ගරු ජනාධිපතිතුමාට දැනුම් දී තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරාවි. ඒ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා දැනුවත් කර තිබෙනවා.

5. මෙවැනි ආයතන විසින් තම තමන්ගේ අදහස් දැක්වීම ඉදිරිපත් කර තිබුණු බව මාධ්‍ය ඔස්සේ දැන ගන්නට ලැබුණි. එකී විරෝධතා සෘජුව ඉදිරිපත් නොවූ ඒවා වේ. එකී ආයතන විසින් දක්වන ලද ප්‍රතිචාරයන්ට ස්තුති පූර්වක වෙමි. මාධ්‍ය වෙත හුදු දැන්වීමක් නිකුත් කර එවැන්නක් කිරීම තුළින් සලකා බැලීමට කරුණු ප්‍රමාණවත් නොවූ බැවින් විශේෂයෙන් සංකල්ප පත්‍රිකාවක් වශයෙන් යෝජනා ඉදිරිපත් කරන ලද්දේ නම් සලකා බැලිය හැකිව තිබිණි.

ගරු කථානායකතුමනි, මා කියූ පරිදි 6 වන ප්‍රශ්නයේ තිබෙන්නේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව වැඩි කිරීමෙන් කාර්යක්ෂමතාව ඇති කර ගන්නේ කොහොමද කියලා. ඒක වැරැදියි. ප්‍රශ්නය වැරැදියි කියලා කියනවා නොවෙයි. ඒකේ අඩුව තිබෙන්නේ මෙයයි. මේ විශ්‍රාම වයස් සීමාව වැඩි කිරීම එක් සුළු කොටසක් පමණයි. ඒක කියවා ගන්න ඕනෑ, මා කලින් සඳහන් කළ සමස්ත අධිකරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ.

6. විනිසුරුවරුන්ගේ අනිවාර්ය විශ්‍රාම ගත යුතු වයස් සීමාව වෙනස් කිරීම පිළිබඳව සහ අධිකරණයන්හි කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩි කිරීම සම්බන්ධයෙන් කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් අවස්ථා කිහිපයකදී සාකච්ඡා කරන ලද අතර, එම කරුණු පහත සඳහන් සඳහන් ලෙස සාරාංශ කොට ඉදිරිපත් කරමි.

(i) විනිසුරුවරුන්ගේ අනිවාර්ය විශ්‍රාම ගත යුතු වයස් සීමාව වෙනස් කිරීම පිළිබඳව සලකා බැලීමේදී, වෙනත් රටවල විනිසුරුවරුන් විශ්‍රාම ගනු ලබන වයස් සීමාවන් කෙරෙහි සැලකිල්ල දක්වන ලද අතර, බහුතරයක් රටවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 70ක් හෝ ඊට වැඩි වයසක් වන බව අමාත්‍ය මණ්ඩලයෙහි අවධානයට යොමු විය. එහෙත්, සාකච්ඡා කරන ලද හා ඉදිරිපත් වූ කරුණු අනුව මෙරට විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස වසර 2කින් පමණක් දීර්ඝ කිරීම යෝග්‍ය බව හා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විනිසුරුවරුන්ගේ පමණක් නොව, සියලුම විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස වසර 2කින් දීර්ඝ විය යුතු බවටද එම සාකච්ඡාවලදී අවධානය යොමු විය. අත්දැකීම් බහුල පරිණත විනිශ්චයකාරවරුන්ගේ සේවය තවදුරටත් අධිකරණ සේවයෙහි රඳවා තබා ගැනීම එහි මූලික පරමාර්ථය වේ.

(ii) එමෙන්ම, ඉහත සඳහන් කරුණු සම්බන්ධව සාකච්ඡා කිරීමේදී පහත සඳහන් ලේඛනවලටද මෙකී යෝජනා, අදහස් ඉදිරිපත් වී ඇති බව දක්වනු කැමැත්තෙමි.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයෙහි මෙහෙයුම් කමිටුවෙහි රවුෆ් හකීම් මහතා සභාපතිත්වය දැරූ අධිකරණය පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාවට අවධානය යොමු වෙලා තිබෙනවා.

(ආ) 2016 අප්‍රේල් 12 දින ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවෙහි සභාපති ලාල් විජේනායක මහතා වෙත එවකට ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙහි සභාපති ජෙෆ්රි අලගරත්නම් මහතා ඉදිරිපත් කළ නිර්දේශ යෝජනාවලිය සලකා බලා තිබෙනවා.

8. නීති කෙටුම්පත් සම්පාදක වෙත 2026.07.28 දින යොමු කරන ලද බව දන්වනු කැමැත්තෙමි. එමෙන්ම නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද කෙටුම්පතට 2026.07.31 දින නීතිපතිතුමා විසින් ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය නිකුත් කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබුණු පසු ගැසට් පත්‍රයෙහි පළ

කිරීමට අදහස් කරමි. එය අද ගැසට් කරන්න යවලා තිබෙන බව මට දැනුම් දුන්නා. එකී ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු දින 7ක් ඉක්මවූ දින සිට, ඊට පසු කිසියම් හෝ දිනක පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ආසන්න වශයෙන් සති තුනක් පමණ ඒ ක්‍රියාවලියට යනවා. නමුත්, අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් වුණොත් එයට ඊට වඩා වැඩි කාලයක් ගත වෙයි කියලා මා හිතනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, පැහැදිලි කරගැනීමක් තිබෙනවා නම් කෙටියෙන් අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කෙටියෙන් නම් අමාරුයි. මොකද, අපැහැදිලි තත්ත්වයන් හුඟක් තිබෙනවා.

ගරු ඇමතිතුමා කිව්වා, මේක ක්ෂණික ක්‍රියාවලියක් නොවෙයි, process එකක් කියලා. ආපු දවසේ ඉඳලාම ප්‍රතිසංස්කරණ කළා කියලා කිව්වා. හැබැයි, මේ පැය 24ක් ඇතුළත අහපු ප්‍රශ්නයකට අදාළ වාර්තාව සභාගත කරන්න අමාරුයිලු. මා ළඟ තිබෙනවා, පිටු 506කින් යුත් වාර්තාවක්. මේක සභාගත කරන්න යන්නේ තත්පර කිහිපයයි. ඒ නිසා ඔබතුමා ඒක සභාගත කරන්න.

මම ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් හැටියට මෙය අහන්න කැමැතියි. අපි ශ්‍රී ලංකා නීතිඥ සංගමයට යෝජනා කරලා තිබෙනවා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා ගරු මන්ත්‍රීවරුන් 225දෙනාටම මේ තිබෙන තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කරන්න කියලා. ඒකට පහසුකම් සපයන්න කියලා අපි ගරු කථානායකතුමාට ලිඛිතව දැනුම් දුන්නා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාත් අන්න ඒ වාගේ ක්‍රියාවලියකට සහයෝගය ලබා දීලා, ශ්‍රී ලංකා නීතිඥ සංගමයට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ 225දෙනාටම ඒ අයගේ මතය, ඒ අයගේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න. ඔබතුමා දන්නවා නේ, විජේනායක මැතිතුමා මාධ්‍යයට ඇවිල්ලා එතුමාගේ මතය බොහොම පැහැදිලිව ප්‍රසිද්ධව ප්‍රකාශ කරලා තිබෙන බව. විශේෂයෙන්ම මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. නීතිඥ සංගමයේ සභාපතිතුමා කරපු ප්‍රකාශයට අනුව අපට දැන ගන්න ලැබිලා තිබෙනවා, මේ ඉදිරිපත් කරන්නට හදන යෝජනාවට ගෞරවනීය ත්‍රෛනිකායික මහා සංඝරත්නය විරුද්ධ වෙලා තිබෙනවා කියලා. අපි නම් කැමැතියි, ඔබතුමා ඒ ලිපිය සභාගත කරනවා නම්. ත්‍රෛනිකායික මහා සංඝරත්නය ගරු ජනාධිපතිතුමාට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා, මේ යෝජනාවට විරුද්ධයි කියලා. කරුණාකරලා එම ලිපිය සභාගත කරනවාද කියලා මම ඔබතුමාගෙන් අහනවා. ත්‍රෛනිකායික මහා සංඝ රත්නය නියෝජනය කරන මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ අත්සනින් එහෙම ලිපියක් ඉදිරිපත් වෙලා තිබෙනවාය කියන එක අපට ආරංචි වෙලා තිබෙනවා. ඔබතුමා ඒ ලිපිය සභාගත කරන්න කටයුතු කරනවාද කියලා මම අහනවා.

අවසාන වශයෙන් මම ඔබතුමාට මෙම කරුණ කියන්න කැමැතියි. ඔබතුමා දක්වා තිබෙන ප්‍රතිචාර අනුව, පෙනෙන දේ අනුව, මේ සභාවේදීත්, එළියේදීත් දීලා තිබෙන උත්තර අනුව මා හිතන්නේ නැහැ,- යම් අකමැත්තක් තිබෙනවා, මේ ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳව. ඒ නිසා අඩුම ගණනේ ඔබතුමාවත් මැදිහත් වෙලා ප්‍රශස්ත, ප්‍රබුද්ධ සොයා බැලීමක් මේ සම්බන්ධව කරන්න. පිටු 506ක මේ ADB funding පිළිබඳ වාර්තාව වාගේ විධිමත් සමීක්ෂණයකින්, ගවේෂණයකින්, සොයා බැලීමකින් පසුව මේ වෙනස්කම් කරන්න. තනිකරම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන්නේ විනිසුරුවන්ගේ විශ්‍රාම වයස වෙනස් කිරීමට නම්, ඒක වැරදියි. ඔබතුමන්ලා පොරොන්දු වුණේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවාය කියලායි. අන්න ඒ පදනම මත සිට ඔබතුමාට කටයුතු කරන්න බැරි ඇයි? ඔබතුමා විජේනායක මැතිතුමාගේ අඩි පාරේ ගිහිල්ලා කටයුතු කරනවා නම්, ඒක වඩා වැදගත් කියලා මම විශ්වාස කරනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි, පිටු 506ක ඔය වාර්තාව සභාගත කරන්න පුළුවන් නම්, මගේ අනෙක් නිල දත්ත සභාගත කරන්න බැරි ඇයි කියලා ඔබතුමා ප්‍රශ්න කළා. ඔය වාර්තාව හදන්නේ 2023දී. එතකොට ඒ වාර්තාව මෙතැනට ඉදිරිපත් කරන්න බොහෝ කාලයක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, නමුත් ඔබතුමා ඉල්ලන නිල දත්ත මා ගෙන්වාගන්න අවශ්‍යයි, ඒ අදාළ ආයතනවලින්. ඒකට තමයි පැය 24 මදි කියලා කිව්වේ.

ඒ වාගේම සඳහන් කළා, Bar Association එකේ නියෝජිතයින් මෙතැනට ගෙනැල්ලා රැස්වීමක් පවත්වන්න කියලා. මා හිතන විධියට, මේ පාර්ලිමේන්තුව තුළ පනත් කෙටුම්පතක් ගැන කථා කරන්න අවශ්‍ය වෙනම ව්‍යුහයක් තිබෙනවා. ඒ සඳහා Ministerial Consultative Committees තිබෙනවා. එවන් තත්ත්වයක් යටතේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුකූලව, මෙහි තිබෙන ආයතන ක්‍රමවේදය අනුව තමයි ඒ ගැන සාකච්ඡා කළ යුත්තේ. මොකද, නීතිඥ සංගමයේ මතයට වෙනස් මත දරන නීතිඥවරුන් බහුතරයකුත් මේ වනකොට මේ සම්බන්ධව මට නොයෙක් දැනුවත් කිරීම් කරනවා. එහෙම නම් අපට ඔවුන්ටත් මෙතැන අවස්ථාවක් දෙන්න වෙනවා. ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදායට පටහැනි බව තමයි පෙනෙන්නේ.

ඒ වාගේම ඔබතුමා සඳහන් කළා, ලාල් විජේනායක මැතිතුමාගේ මතයක් සම්බන්ධයෙන්. ඔව්, අපේ පක්ෂය තුළ, අපේ ආණ්ඩුව තුළ හැමෝටම තම තමන්ගේ අදහස් තිබෙනවා. ඒ අදහස්වලට එකඟවීම්, නොවීම් අපි දක්වා තිබෙනවා. නමුත් අවසානයේදී පොදුවේ ගන්නා තීන්දුවට හැමෝම හිස නවනවා. මම හිතන විධියට, ලාල් විජේනායක මැතිතුමාත් ඒ මතයේම ඇති. එතුමා එකඟ නොවුණාට එතුමා අප සමඟ කටයුතු කරගෙන යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාගේ මතය මොකක්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
පස්සේ කියන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පස්සේ කියන්න එපා, දැන් කියන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මගේ මතය තමයි රජයේ මතය. අධිකරණ ඇමති වශයෙන් වෙනත් මතයක් මට තිබෙන්න පුළුවන්ද? මම නේ Cabinet Paper එක අත්සන් කරන්නේ. ඉතින් මට වෙනත් මතයක් තිබෙන්න පුළුවන්ද?

ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැනත් කරුණු කිව්වා. ඔව්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියපු ආකාරයට වෙනවා. නමුත් ඒක දීර්ඝ කාලීනව යන වැඩක්. දැන් අපි දන්නවා, ගෙය සම්පූර්ණයෙන්ම අබලන් කියලා. වහලෙන් වතුර leak වෙනවා. එතකොට මුළු ගේම හදනකල් වහලේ තෙමෙන තැන හදන්නේ නැතුව ඉන්න බැහැ නේ. ඒ වාගේ තමයි හදිසියේ කරන්න ඕනෑ මේ සංශෝධනය අපි දැන් කරන්නේ. අනෙක් ඒවා අපි දැන් කරන්නේ නැහැ. ඒක තමයි පැහැදිලි කිරීම.

ඒ වාගේම මේ කාරණයත් මම කියන්න ඕනෑ. ගෞරවනීය මහානායක ස්වාමීන් වහන්සේලා අපි මුණගැහුණා. ඒ අවස්ථාවේදී උන්වහන්සේලාට නිවැරදි තොරතුරු ලැබී තිබුණේ නැහැ. මමත්, නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් තමයි ගියේ. අපි නිවැරදි තොරතුරු පැහැදිලි කළාට පස්සේ, සාකච්ඡාවට ගිහිල්ලා අවශ්‍ය කටයුතු කරන්න කියලා තමයි උන්වහන්සේලා කිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලිපිය?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
එහෙම ලිපියක් මට ලැබිලා නැහැ. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාට එවැන්නක් ලැබුණාද කියලා එතුමා මට කියලාත් නැහැ. ඒ නිසා එවන් දෙයක් ගැන මා දන්නේ නැහැ, සභාගත කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මහතා.

## II

## එල් නිනෝ තත්ත්වයේ බලපෑමට මුහුණ දීමට රජයේ සූදානම
### எல் நினோ நிலைமையின் தாக்கத்தை எதிர்கொள்வதில் அரசின் தயார் நிலை
### GOVERNMENT'S PREPAREDNESS TO FACE IMPACT OF EL NIÑO

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, 2026-2027 කාල සීමාව තුළ ප්‍රබල එල් නිනෝ දේශගුණික තත්ත්වයක් ඇති විය හැකි බවට ජාත්‍යන්තර, විද්‍යාත්මක කාලගුණ අනාවැකි මඟින් පෙන්වා දී ඇති අතර, එමඟින් ශ්‍රී ලංකාව තුළ දිගු කාලීන නියඟ, ගංවතුර, ආහාර සුරක්ෂිතතාවට තර්ජන, පානීය ජල හිඟය, ජල විදුලි නිෂ්පාදනය අඩුවීම, මහජන සෞඛ්‍යයට අහිතකර බලපෑම් සහ ආර්ථික බාධා ඇතිවීමේ අවදානමක් පවතින බැවින්ද, එවැනි තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන රැසක ඒකාබද්ධ ක්‍රියාමාර්ග අවශ්‍ය වන බැවින්ද, ගරු අග්‍රාමාත්‍යතුමිය පහත කරුණු මෙම සභාවට දන්වන්නේද? ගරු කථානායකතුමනි, මා අගය කරනවා, හෙට දින මේ රට පාලනය කරන තරුණ තරුණියන් ඉදිරියේ මේ ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලැබීම ගැන.

1. එල් නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා ජාතික වශයෙන් සූදානම් වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් - National El Niño Preparedness and Response Plan - රජය විසින් සකස් කර අනුමත කර තිබේද? එසේ නම්, එහි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද? එම සැලැස්ම කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද්දේ කවදාද? එය මහජනතාවට ප්‍රසිද්ධ කරනු ලැබුවේ කවදාද?

ගරු කථානායකතුමනි, මා මෙය ඉදිරිපත් කරන්නේ මේ හේතුව නිසායි. අපේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා දැක්වූ අදහස් කිහිපයක් 02.08.2026 දින "The Morning" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

> "Sri Lanka currently has sufficient rice stocks, with paddy production already exceeding.."

ගරු කථානායකතුමනි, ඒ වාගේම එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් National Water Supply and Drainage Board එකේ Chairman වන්දන බණ්ඩාර කියනවා, මුළු රටටම තිබෙන්නේ බවුසර 100යි කියලා.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් වන පුවත්පත් වාර්තා මා **සභාගත*** කරනවා.

2. මෙම වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රධාන සම්බන්ධීකරණ ආයතනය හෝ අමාත්‍යාංශය ලෙස නම් කර ඇත්තේ කුමක්ද? කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම, වාරිමාර්ග, සෞඛ්‍ය, ජල සම්පාදන, බලශක්ති අමාත්‍යාංශය, මහවැලි අධිකාරිය සහ පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණය සඳහා ක්‍රියාත්මක යන්ත්‍රණය කුමක්ද?

   Hon. Speaker, National System Operator (Pvt.) Limitedහි Chairman ප්‍රදීප් පෙරේරා 02.08.2026 දින "The Morning" පුවත් පතට දැක් වූ අදහස් "Power supply: 450 MW power shortfall by Jan." නැමැති පුවත් වාර්තාවේ තිබෙනවා. So, it is a very serious situation and I am sure you all would take cognizance of that fact.

3. 2026 අයවැය යටතේ හෝ වෙනත් ප්‍රතිපාදන යටතේ එල් නිනෝ තත්ත්වයට සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද? එය කෘෂිකර්මය, වාරිමාර්ග, ආපදා කළමනාකරණය, පානීය ජල සැපයුම්, මහජන සෞඛ්‍ය, විදුලිබල උත්පාදනය සහ හදිසි සහන කටයුතු අනුව වෙන් වෙන්ව දක්වන්නේද? 2027 වසර දක්වා මෙහි බලපෑම් පවතිනු ඇතැයි අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීමට සැලසුම් කර තිබේද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

4. වත්මන් එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් රජයේ විද්‍යාත්මක ඇගැයීම කුමක්ද? එහි ආරම්භය, උපරිම බලපෑම් ඇතිවන කාලය, අපේක්ෂිත කාල සීමාව, බරපතළ තත්ත්වය සහ වැඩිම බලපෑමට ලක්විය හැකි - the most impacted and affected - දිස්ත්‍රික්ක හෝ ප්‍රදේශ මොනවාද?

5. ආහාර නිෂ්පාදනය, වාරිමාර්ග පද්ධති, ජල සම්පත්, විදුලි සැපයුම, සෞඛ්‍ය සේවා සහ ආපදා ප්‍රතිචාර ආරක්ෂා කිරීම සඳහා රජය ගෙන ඇති හදිසි සැලසුම් සහ ක්‍රියාමාර්ග මොනවාද? එමෙන්ම ආහාර, බීජ, ඖෂධ, පානීය ජලය සහ හදිසි සහන ද්‍රව්‍යවල ප්‍රමාණවත් සංචිත පවත්වාගෙන යෑම සඳහා ගෙන ඇති පියවර මොනවාද?

ගරු කථානායකතුමනි, 2026.07.31 දින "දිවයින" පුවත් පත වාර්තා කරලා තිබෙනවා, "එල් නිනෝ නිසා කුඩා වැව් සිඳීයෑමේ අවදානමක්" යනුවෙන්. මම හිතන්නේ ඒ නිසායි මේක ඉතාම වැදගත් අවස්ථාවක් වන්නේ.

6. ජනතාව, විශේෂයෙන් ගොවීන්, ධීවරයින් සහ අවදානම් කලාපවල ජීවත් වන ජනතාව දැනුවත් කිරීම, පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ සූදානම් කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් මොනවාද? ඉහළම අවදානම් සහිත දිස්ත්‍රික්ක සහ ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත්තේ කුමන ප්‍රදේශද?

7. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය - WMO, ආහාර හා කෘෂිකර්ම සංවිධානය - FAO, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව - ADB - හෝ වෙනත් ජාත්‍යන්තර ආයතනවලින් තාක්ෂණික හෝ මූල්‍ය ආධාර ඉල්ලා තිබේද? එසේ නම්, එම ආධාරයේ ස්වභාවය, වටිනාකම සහ වත්මන් ප්‍රගතිය කුමක්ද?

8. 2016/2017 කාල සීමාවේදී සිදු කළ පරිදි ස්වාභාවික ආපදා සඳහා ජාතික රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට හෝ අලුත් කිරීමට රජය පියවර නොගෙන ඇත්තේ මන්ද?

Sir, මම මුදල් ඇමති වශයෙන් හිටපු කාලයේ මේ මහජන ව්‍යසන - public disasters - සම්බන්ධව රක්ෂණ ආවරණයක් ක්‍රියාත්මක කර තිබුණා. ඇයි, දැන් එහෙම කරගෙන නැත්තේ? එවැනි රක්ෂණ ආවරණයක් නැවත ක්‍රියාත්මක කිරීමට අදහස් කරන්නේද?

9. එල් නිනෝ තත්ත්වය හේතුවෙන් ඇති විය හැකි ආර්ථික බලපෑම් සම්බන්ධයෙන් රජය ප්‍රමාණාත්මක ඇගැයීමක් සිදු කර තිබේද? එසේ නම්, පහත කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නේද?

උද්ධමනය, විශේෂයෙන්ම ආහාර උද්ධමනය කෙරෙහි ඇති විය හැකි බලපෑම

ගරු කථානායකතුමනි, මම ඒ සම්බන්ධයෙන් කියන්න කැමතියි. උද්ධමනය සියයට 7.3ක් දක්වා වැඩි වෙලා තිබෙනවා කියලා ඊයේ වාර්තා වෙලා තිබෙනවා. එල් නිනෝ එන්න ඉස්සෙල්ලා උද්ධමනය සියයට 7.3ක් වැඩි වුණා නම් ඊට පසුව කොතරම් බලපෑමක් ඇති වෙයිද කියන ප්‍රශ්නය අපේ හිත්වලට කාවද්දනවා නොවෙයිද?

- තේ, රබර් සහ පොල් වැනි අපනයන භෝගවලට ඇති විය හැකි බලපෑම.
- ආපදා සහන සහ පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය අතිරේක රාජ්‍ය වියදම; What is the additional expenditure on disaster management? ඒ අතිරේක රාජ්‍ය වියදම කොතරම් අවශ්‍ය වේද කියන ප්‍රශ්නය ඉදිරිපත් වෙනවා.
- රජයේ ආදායම් අහිමි වීම, the reduction in revenue;
- මධ්‍යස්ථ සහ දැඩි එල් නිනෝ තත්ත්වයන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ - GDP එකේ - අපේක්ෂිත අඩු වීම කුමක්ද, කියන ප්‍රශ්න මම ගරු අගමැතිතුමියගෙන් අහනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන්, මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා.

2026.02.19 දින ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා සහ 2026.07.07 දින ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ගන්නවාය කිව්වා. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් ආණ්ඩුව සූදානම් වෙනවා කියලා කියන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාට point එකක් නොවුණාට, ඒක රටට point එකක්. උද්ධමනය වැඩි වෙලා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කේ.ඩී. ලාල් කාන්ත අමාත්‍යතුමා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ස්ථාවර නියෝග 27(2) යටතේ අසා ඇති ප්‍රශ්න දෙකෙන් පළමුවෙන් පිළිතුරු දෙන්න ඕනෑ මොන ප්‍රශ්නයටද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ 26. 02. 19 දින අසන ලද ප්‍රශ්නයට පළමුව පිළිතුරු දුන්නා නම් හොඳයි, ගරු ඇමතිතුමනි.

## මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉඩම් වෙන් කිරීම හේතුවෙන් උතුරු හා නැඟෙනහිර ජන සනත්වයට ඇති කරන බලපෑම: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழான நில ஒதுக்கீடு வடக்கு, கிழக்கு மக்களின் குடிப்பரம்பல்மீது ஏற்படுத்தும் தாக்கம்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று
## IMPACT ON DEMOGRAPHY OF NORTH AND EAST DUE TO LAND ALLOCATION MADE UNDER MAHAWELI DEVELOPMENT PROJECT: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු කථානායකතුමනි, 2026.02.19 දින ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(1) මහවැලි "එල්" කලාපයේ ජන වාර්ගික අනුපාතය පදනම් කරගෙන දිස්ත්‍රික් වශයෙන් ඉඩම් බෙදා දීමක් සිදු කර නැත. මහවැලි "එල්" කලාපය 1988.04.14 දිනැති අංක 04/247 දරන ගැසට් පත්‍රය මඟින් හා 2007.03.07 දිනැති අංක 1487/32 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ වනවිට පදිංචිව සිටි පදිංචිකරුවන්ගේ ඉඩම් අයිතිය විධිමත් කර ඇති අතර, ඔවුන්ගේ අනුපවුල්වලට ඉඩම් බැහැර කර ඇත. ඊට අමතරව අවස්ථා කිහිපයකදී රටේ ඉඩම් නොමැති අයවලුන් වෙනුවෙන් ඉඩම් කච්චේරි පවත්වා පදිංචි කිරීම සිදු කර ඇත.

(2) ජන වර්ගය අනුව බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය (අක්කර) හා ඉඩම් කට්ටි ගණන ඇමුණුම 01 සහ ඇමුණුම 02 මඟින් දැක්වේ.

ඇමුණුම 01

**බැහැරකර ඇති ඉඩම් ප්‍රමාණය (අක්කර)**

| අනු අංකය | කලාපය | ජන වර්ගය | ඉඩම් සංවර්ධන ආඥාපනත | | | රජයේ ඉඩම් ආඥාපනත | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ගොඩ | වාරි | වර්ෂාපෝෂිත | ආයෝජන | වාණිජ | නිවාස |
| 1. | බී | සිංහල | 18448.5 | 43572.5 | 2614.5 | 1197 | 77.21 | 17.25 |
| | | දෙමළ | 943.5 | 3022.5 | 82.5 | 35 | 1 | පර්චස් 20 |
| | | මුස්ලිම් | 1729 | 3472.5 | 312 | 343 | 6 | 6 |
| 2. | සී | සිංහල | 8189 | 18889 | 260.6 | 770 | 46.1338 | 74.20 |
| | | දෙමළ | 1.2130 | 4 | - | - | - | - |
| | | මුස්ලිම් | 3.6410 | 18 | - | - | 0.1000 | - |
| 3. | ඩී | සිංහල | 1248.7 | 3526.42 | - | 1658.97 | 3.97 | - |
| | | දෙමළ | - | 18 | - | - | - | - |
| | | මුස්ලිම් | - | 22.5 | - | - | - | - |
| 4. | එච් | සිංහල | 20066.62 | 49907 | 590.13 | 500.78 | 143.32 | 905.64 |
| | | දෙමළ | 3.5 | - | - | - | - | 30 |
| | | මුස්ලිම් | 235 | 187 | - | - | 1.5 | 39 |
| 5. | එල් | සිංහල | 4870.5 | 2287 | 6125 | 985.53 | 7.41 | - |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | - | - | - | - | - | - |
| 6. | වික්ටෝරියා | සිංහල | 52.015 | 44.76 | - | 111.12 | 27.99 | 370.35 |
| | | දෙමළ | 78.120 | - | - | 51.94 | 9.197 | 15.338 |
| | | මුස්ලිම් | 1.665 | - | - | 1.92 | 11.654 | 29.255 |
| 7. | හුරුළුවැව | සිංහල | 3561.07 | 11623.5 | - | 162.35 | 9.5 | 17.5 |
| | | දෙමළ | 20 | 34.5 | - | - | - | 0.6 |
| | | මුස්ලිම් | 664 | 1287 | - | 4.23 | 4.5 | 0.5 |
| 8. | මොරගහකන්ද | සිංහල | 11730.3312 | 14268.493 | 101.8052 | 2.8634 | 3.7384 | 23.7285 |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | - | 8.9225 | - | - | | - |
| 9. | වලව | සිංහල | 35760.312 | 41453.496 | 13179.2268 | 1389.0232 | 210.0597 | 1344.9900 |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | 9.4481 | 44.9228 | - | - | - | - |
| 10. | රඹකැන්ඔය | සිංහල | 9424 | 2245.5 | 3612 | 112.7 | 1.3 | 0.2 |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | - | - | - | - | - | - |

ඇමුණුම 02

**බැහැරකර ඇති ඉඩම් කට්ටි ගණන**

| අනු අංකය | කලාපය | ජන වර්ගය | ඉඩම් සංවර්ධන ආඥාපනත | | | රජයේ ඉඩම් ආඥාපනත | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ගොඩ | වාරි | වර්ෂාපෝෂිත | ආයෝජන | වාණිජ | නිවාස |
| 1. | බී | සිංහල | 36,897 | 17,429 | - | 12 | 297 | 11 |
| | | දෙමළ | 1,887 | 1,209 | 55 | 05 | 27 | 01 |
| | | මුස්ලිම් | 3,458 | 1,389 | 208 | 35 | 191 | 28 |
| 2. | සී | සිංහල | 39,640 | 21,137 | 644 | 54 | 1,892 | 1,283 |
| | | දෙමළ | 06 | 04 | - | - | - | - |
| | | මුස්ලිම් | 18 | 18 | - | - | 01 | - |
| 3. | ඩී | සිංහල | 2,499 | 2,383 | - | 13 | 73 | - |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | - | - | - | - | - | - |
| 4. | එච් | සිංහල | 34,925 | 20,501 | 79 | 68 | 2,292 | 3,282 |
| | | දෙමළ | 07 | - | - | - | 04 | 75 |
| | | මුස්ලිම් | 785 | 75 | - | - | 24 | 129 |
| 5. | එල් | සිංහල | 7,647 | 2,287 | 4,276 | 39 | 162 | - |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | - | - | - | - | - | - |
| 6. | වික්ටෝරියා | සිංහල | 252 | 139 | - | 32 | 576 | 4,018 |
| | | දෙමළ | 864 | 03 | - | 03 | 172 | 171 |
| | | මුස්ලිම් | 14 | - | - | 01 | 219 | 329 |
| 7. | හුරුළුවැව | සිංහල | 7,491 | 4,761 | - | 6 | 152 | 141 |
| | | දෙමළ | 163 | 14 | - | - | - | 5 |
| | | මුස්ලිම් | 1,433 | 521 | - | 4 | 72 | 47 |
| 8. | මොරගහකන්ද | සිංහල | 11,832 | 7,663 | 37 | 08 | 648 | 206 |
| | | දෙමළ | 10 | 01 | - | - | - | - |
| | | මුස්ලිම් | - | 01 | - | - | - | - |
| 9. | වලව | සිංහල | 40,260 | 20,040 | 4,424 | 110 | 935 | 2,176 |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | 19 | 18 | - | - | - | - |
| 10. | රඹකැන්ඔය | සිංහල | 5,007 | 1,497 | 1,806 | 06 | 09 | 02 |
| | | දෙමළ | - | - | - | - | - | - |
| | | මුස්ලිම් | - | - | - | - | - | - |

(3) කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතියේ ජලයෙන් යට වන ප්‍රදේශය හෙක්ටෙයාර 1,589යි. (ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීමේදී යම් වෙනසක් සිදු විය හැකිය.) කිවුල් ඔය ව්‍යාපෘතිය යටතේ පදිංචි කිරීම් සිදු කර නැත.

(4) ඉදිකර ඇති මාදුරු ඔය ජලාශයේ දකුණු ඉවුර ඇළ ව්‍යාපෘතිය යටතේ අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි හෙක්ටෙයාර 17,735කට ආසන්න ප්‍රදේශයක් නව සංවර්ධන ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට පරිසර අනුමැතිය ලැබී ඇත. එම ප්‍රදේශයට අදාළව දැනට පවතින ග්‍රාම නිලධාරි වසම් අනුව මයිලත්තමඩු හා මාදවන් ලෙස හඳුනා ගැනීමට ප්‍රදේශයක් නොමැති අතර, ඊරලකුලම් හා බෝගමුයාය යන ග්‍රාම නිලධාරි වසම් සඳහා ඇතුළත් වන ප්‍රදේශය හෙක්ටෙයාර 2,511ක් පමණ වේ. ප්‍රදේශයට අදාළ මැනුම් කටයුතු මෙතෙක් සිදු කර නොමැත.

(5) මහවැලි "එල්" කලාපයට අයත් ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත මුළු බිම් ප්‍රමාණය හෙක්ටෙයාර 199,210කි. නමුත්, "එල්" කලාපයට ප්‍රකාශිත මුළු බිම් ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් "එල්" කලාපය ලෙස පරිපාලනය කරනු ලබන, එනම් දැනට සංවර්ධනය කරනු ලබන බල ප්‍රදේශය හෙක්ටෙයාර 29,087කි. කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා අක්කර 13,000ක් භාවිත කිරීමට යෝජිත නැත. මහවැලි "එල්" කලාපයේ ප්‍රකාශිත මුළු භූමි ප්‍රමාණයෙන් වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු රක්ෂිත ප්‍රදේශ ලෙස හෙක්ටෙයාර 74,458ක් වෙන් කර ඇත. දිස්ත්‍රික් ලේකම්වරුන් යටතේ පරිපාලනය වන භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 98,882කි. ඒ අනුව තවදුරටත් හෙක්ටෙයාර 3,000ක භූමි ප්‍රමාණයක් මුදා හැරීම සඳහා ප්‍රමාණවත් ඉඩ නොමැත.

(6) මහවැලි "කේ" කලාපය ලෙස අලුතින් ව්‍යාපෘතියක් ඇති කිරීමට දැනට සැලසුම් කර නොමැත.

(7) මේ වනවිට අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කර එම ප්‍රදේශවලට අවශ්‍ය ජල පහසුකම් ලබා දීමට සුදුසු ඇළ වේලි සකස් කිරීමට නියමිතව ඇත.

ඉන්පසු නැවත පදිංචි කිරීම් ආරම්භ කිරීමට ප්‍රථම අමාත්‍යාංශ ලේකම්තුමා විසින් එම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් හා දේශපාලන නායකත්වය සමඟ සාකච්ඡාකොට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කමිටුවක් පත් කිරීමට නියමිතය. එකී කමිටු තීරණ අනුව ඉදිරි කටයුතු සැලසුම් කිරීමට නියමිතව ඇති අතර, එහිදී ජාතික ජන වාර්ගික අනුපාතය වෙනස් නොවන ලෙස හෝ ප්‍රදේශයේ පදිංචි ජාතීන් අවතැන්වීම් හා නොසලකා හැරීම් ඇති නොවන බවට වගබලා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! இந்தக் கேள்வியானது கிவுல் ஓயா திட்டம் கொண்டுவரப்போவதாகச் சொல்லப்பட்ட நேரத்தில், அதாவது கடந்த பெப்ருவரி மாதம் கொடுக்கப்பட்ட கேள்வியாகும். ஆறு மாதங்கள் கடந்து இன்றுதான் இந்தக் கேள்விக்குப் பதில் கிடைத்திருக்கிறது. நான் கேட்ட சில தரவுகள் Annex A மற்றும் Bஇல் உள்ளதாகவும், அவற்றைச் சபையில் சமர்ப்பிப்பதாகவும் நீங்கள் சொன்னீர்கள். அந்த annexes இல்லாமல் எனது அடுத்த கேள்வியைத் தொகுப்பது சில நேரங்களில் கஷ்டமாக இருக்கலாம்.

கௌரவ அமைச்சர் அவர்களே, நேற்றைய தினம் நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்தபொழுதுகூட, ஜனநாயக தமிழ்த் தேசியக் கூட்டணியின் தலைவரான செல்வம் அடைக்கலநாதன் அவர்கள் இந்த விடயம் சம்பந்தமாக குறிப்பாக, மகாவலி அதிகாரசபையின் காணிகள் சம்பந்தமாகப் பேசியிருந்தார். இப்பிரச்சினைகளுக்குத் தீர்வுகளைப் பெற்றுத்தருவதாக சனாதிபதி அவர்கள் சொல்லியிருந்தார். இருந்தாலும், கிவுல் ஓயா திட்டம் தற்போது கிடப்பில் போடப்பட்டதுபோல தெரிகின்றது. எங்களுடைய வன்னித் தேர்தல் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் உங்களுடன் இது பற்றி பேசியிருந்தார். இப்போதைக்கு அந்தத் திட்டம் கைவிடப்பட்டதுபோலவே எங்களுக்குத் தெரிந்தது. எதிர்காலத்தில் இத்திட்டத்தை மீண்டும் கொண்டுவர முயற்சியெடுத்தால் நாங்கள் அதைப் பற்றி பேசலாம்.

கௌரவ அமைச்சர் அவர்களே, மகாவலி அதிகாரசபை ஊடாக இதுவரை வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு ஒருசொட்டு நீர்கூட வழங்கப்படவில்லை. ஆனால், பொலன்னறுவை, அநுராதபுரம் போன்ற பிரதேசங்களுக்கு நீர் வழங்கப்பட்டு இருக்கின்றது. மகாவலி வலயங்களில் இருக்கின்ற காணிகளைப் பிரித்துக்கொடுப்பதில்தான் பிரச்சினை! அப்படி எந்தக் காணியும் வழங்கப்படவில்லையென நீங்கள் சொன்னீர்கள். ஆனால், 'மணலாறு' என்ற பிரதேசத்தை 'வெலிஓயா' என்று பெயர்மாற்றி, அந்த இடத்தில் மக்கள் குடியேற்றப்பட்டது இந்த மகாவலி அபிவிருத்தித் திட்டத்தின் கீழ்தான். அந்த மக்களுக்கு நீர் வழங்குவதற்குத்தான் நீங்கள் நடவடிக்கை எடுக்கிறீர்கள். இப்பொழுது இருக்கின்ற பிரச்சினை என்னவென்றால், எங்களுடைய பிரதேசத்துக்கு மகாவலி அதிகாரசபை ஊடாக ஒரு சொட்டு நீர்கூட வராத நிலையில், தேசிய இனவிகிதாசாரத்தை மாற்றும் வகையிலான குடியேற்றத் திட்டங்கள் அங்கு மேற்கொள்ளப்படுவதுதான். இதுதான் எங்களுடைய அடிப்படைப் பிரச்சினை!

தேசிய இனவிகிதாசார அடிப்படையில் மகாவலி அதிகாரசபை ஊடாக இந்தக் காணிகள் வழங்கப்பட வேண்டும் என்றுதான் இருந்தது. நான் சிறியதோர் உதாரணத்தைச் சொல்கின்றேன். இப்பொழுது நீங்கள் மயிலத்தமடு - மாதவனை என ஓர் இடம் இல்லையெனச் சொன்னீர்கள். ஆனால், இன்று காலையில் மயிலத்தமடு - மாதவனை பிரதேசத்தில் பசுக்கள் கொல்லப்பட்டு இருக்கின்றன. தற்பொழுது என்னிடமுள்ள அது சம்பந்தமான புகைப்படங்களை உங்களுக்கு அனுப்புகிறேன். இவை colour புகைப்படங்கள் இல்லை. ஏனெனில், இது printout எடுத்தது. நான் colour புகைப்படங்களை உங்களுக்கு WhatsAppஇல் அனுப்புகிறேன். மகாவலி அதிகாரசபையின் காணிக்குள் சட்டவிரோதமாக குடியேற்றங்களை உருவாக்கிக்கொண்டு இருக்கிறார்கள். அதன் காரணமாக, பாற்பண்ணை வைத்திருக்கின்ற பண்ணையாளர்களுக்கும் கால்நடைகளை வைத்திருக்கின்ற பண்ணையாளர்களுக்கும் அந்த இடத்துக்குப் போக முடியாத நிலை காணப்படுகின்றது. இந்தப் பிரதேசத்தை Gazetteமூலம் - வர்த்தமானிமூலம் - மேய்ச்சல் தரையாக அறிவிப்பதாக அரசாங்கம் சொல்லியிருந்தது. இன்றைக்கு நீங்கள் வழங்கிய பதிலைப் பார்த்தால், அதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டதுபோல தெரியவில்லை. அந்தப் பிரதேசத்தை அளவீடு செய்யக்கூட இல்லை என்று நீங்கள் சொன்னீர்கள். ஆகவே, மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரை சம்பந்தமாக உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும். உங்களுடைய கவனத்துக்காக இந்தப் புகைப்படங்களை உங்களுக்கு அனுப்பிவைக்கிறேன். மகாவலி அதிகாரசபையின் காணிக்குள் பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்தவர்கள் சட்டவிரோதமாக வந்து குடியேற்றங்களை உருவாக்கிக்கொண்டு இருப்பதால், பண்ணையாளர்களுக்கும் அவர்களுக்கும் இடையிலான முறுகல்நிலை எதிர்காலத்தில் இன்னும் அதிகரிக்கும். குறிப்பாக, விவசாய நடவடிக்கைகள்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ஆரம்பித்த பின்னர் இன்னும் அதிகரிக்கும். எனவே, இது சம்பந்தமாக உடனடியாக கவனத்திலெடுத்து, இதனை நிறுத்த வேண்டுமென கோரிக்கை விடுக்கின்றேன்.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු කථානායකතුමනි, අපේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් මේ ප්‍රශ්නය සාකච්ඡා කළා. කිවුල්ආරු ව්‍යාපෘතිය නතර කිරීමක් කර නැහැ. එහි කටයුතු ඉදිරියට යමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වවුනියාව දිස්ත්‍රික්කයේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, මුලතිව් දිස්ත්‍රික්කයේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, - ඔබතුමාට මෙහා අසුනේ දැන් වාඩි වෙලා ඉන්න මන්ත්‍රීතුමා, මුලතිව් දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා විධියට සාක්ෂි දරනවා - එකතු වෙලා මේ පිළිබඳව පුළුල්ව සාකච්ඡා කළා. එතුමන්ලා යම් ගැටලු ප්‍රමාණයකුත් ඉදිරිපත් කළා. ඒ ගැටලුත් සැලකිල්ලට ගනිමින් මේ වනකොට කිවුල්ආරු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නැවත සලකා බැලීම් කරමින් තිබෙනවා. ඒ කියන්නේ, මේ ව්‍යාපෘතිය නතර කිරීමට නොවෙයි, එහි ගැටලු විසඳමින් ඉදිරියට කටයුතු කිරීම සඳහා. ඔබතුමා යොමු කළ අදහස් ටිකත් මම සැලකිල්ලට ගන්නම්. ඒ වාගේම නැවතත් අපට ඒ සම්බන්ධයෙන් වන සාකච්ඡාවක් වුණත් කර ගන්න පුළුවන්. දැනට බරපතළ ගැටලුවක් නිර්මාණය වෙලා නැහැ. නමුත්, අපේ මන්ත්‍රීතුමන්ලා, විශේෂයෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා ඇතුළු පිරිස, ඊළඟට, වවුනියාවේ මන්ත්‍රීතුමා ඇතුළු පිරිස මේ සම්බන්ධයෙන් අවබෝධයක ඉන්නවා. අපට මේ සම්බන්ධයෙන් යම් ගැටලුවක් තිබෙනවා නම් තවත් කථා කර ගන්න පුළුවන්. ව්‍යාපෘතිය නතර කරන්න තීරණයක් අරගෙන නැහැ. ජනවාර්ගික අනුපාතයන් වෙනස් වීමට අපි කිසිදු අවස්ථාවක ඉඩ තියන්නේ නැහැ කියන සහතිකය ඔබතුමාටත්, පාර්ලිමේන්තුවටත් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඊළඟට ඔබතුමා විපක්ෂ නායකතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට- *[බාධා කිරීමක්]*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
පැහැදිලි නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. දැන් විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න, ගරු අමාත්‍යතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, දැන් වේලාව පෙර වරු 11.40 වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් ගැටලුවක් නැත්නම්, ඔබතුමා මට හෙට හෝ අනිද්දා උත්තර දුන්නාම ඇති. කවදාද දෙන්නේ? මොකද, තව වෙලාව යනවා නේ. පෙර වරු 11.30ට විවාදය පටන් ගන්න තිබෙනවා නේ. ඔබතුමා කැමැති නම්, හෙට හෝ අනිද්දා වුණත් පිළිතුර දුන්නාට මට කමක් නැහැ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මටත් කමක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා දිනය කිව්වා නම් හරි.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
හෙට දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා.

2026.07.08 වන දින ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## උතුරු සහ නැගෙනහිර පළාත්වල හමුදාව විසින් අත්පත් කරගෙන ඇති සිවිල් ජනතාවට අයත් ඉඩම් නිදහස් කිරීම: ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රකාශය
## வடக்கு, கிழக்கு மாகாணங்களில் இராணுவத்தினரால் கையகப்படுத்தப்பட்டுள்ள பொதுமக்களின் காணிகளை விடுவித்தல்: பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று
## RELEASE OF CIVILIAN LANDS HELD BY MILITARY IN NORTHERN AND EASTERN PROVINCES: STATEMENT BY DEPUTY MINISTER OF DEFENCE

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
Hon. Speaker, the Answer is as follows:
Hon. Speaker, the Answer is as follows:

(a) The particulars are given in Annex I and I **table*** it for your reference.

According to the data, the total extent of land utilized by the military since 2009 is, 85,497.81 acres. Then, the total extent of land released since 2009 up to the end of December, 2024 is, 72,165.64 acres. After we came to power, that is from 01st of January, 2025 to date, we have released a total of 1,109.65 acres in the North and the East. Then, the extent of land currently utilized by the military in the North and the East is, 12,222.52 acres. And, we have a plan which has identified certain lands in the North and the East to be released in the months and years to come, totalling to an extent of 343.50 acres.

(b) The lands currently utilized by the Sri Lanka Army within 16 Grama Niladhari Divisions belonging to the Valikamam North Divisional Secretary's Division are important for security of those areas as well as they are of strategic significance. Accordingly, those are essential land parcels that have been retained for the continued use of the Sri Lanka Army. Furthermore, the three Grama Niladhari Divisions that are entirely utilized by the Sri Lanka Army have been acquired by the Government for the Palaly High Security Zone under the Order made in terms of Section 38 (a) of the Land Acquisition Act (Chapter 460), as published in Extraordinary Gazette No. 1807/23 dated 26th April, 2013.

There are five land parcels within the Valikamam North Divisional Secretary's Division in the Jaffna District which are being utilized by the Sri Lanka Navy and those lands are located in areas of critical and strategic importance for national security.

Although in your Question you have used the word “occupied”, the military has not occupied them; we have taken over the lands for emergency and security purposes for the assurance of national security, including for preventing illegal trafficking of narcotics, weapons, prohibited goods and human smuggling across the international maritime boundary between Sri Lanka and India as well as for suppressing illegal fishing activities carried out by Indian fishing vessels within the maritime boundary between Sri Lanka and India.

Accordingly, the radar systems established in the area continuously monitor the sea and coastal areas, while the Sri Lanka Navy continuously ensures the security of the area by conducting maritime patrols using small craft and other tactical activities.

Furthermore, to date, six land parcels belonging to the Valikamam North Divisional Secretary's Division have been released by the Sri Lanka Navy for civil administrative purposes on several occasions.

Considering the above-mentioned facts, the five land parcels currently utilized by the Sri Lanka Navy are essential for national security and are highly important from a tactical and strategic perspective. Therefore, arrangements will be made to retain some of these land parcels under the control of the Sri Lanka Navy after consulting the National Security Council for strategic significance.

The total land area within the High Security Zone containing the Palaly International Airport, which is utilized by the Sri Lanka Air Force, is 774.98 acres. The Sri Lanka Air Force is conducting operational activities jointly with the Civil Aviation Authority of Sri Lanka and the Airport and Aviation Services (Sri Lanka) (Private) Limited. Therefore, the releasing of these land parcels need further scrutiny, for the reasons mentioned above. Furthermore, since the Sri Lanka Air Force does not have information to accurately identify whether these lands belong to 16 Grama Niladhari Divisions, it is recommended that the relevant specific information be obtained from the Divisional Secretary, Valikamam North.

So, taking all these strategic concerns into consideration, the release of these lands in the said GS Divisions needs some more time for scrutiny and will let you know after consultation with the National Security Council.

(c) The religious sites and schools located in the Myliddy and Palaly areas of the Jaffna District, which civilians have requested to be released from the use of the Sri Lanka Army, are land parcels that have been acquired by the Government for the Palaly High Security Zone under the Order issued in terms of Section 38(a) of the Land Acquisition Act (Chapter 460), published in Extraordinary Gazette No. 1807/23 dated 26th April, 2013. Approval has been granted by the Directorate of Operations and the Security Forces Headquarters - Jaffna to enter those locations and carry out religious activities.

So, we have discussed case-by-case with the Commander of the Security Forces there to facilitate access for the people to all those religious places on their request, and they are in the process of providing facilities for them to do so.

(d) The land parcel requested for the expansion of the Iranamadu Kanakambikai Amman Kovil in the Kilinochchi District is the land currently occupied by the Sri Lanka Army 1 Corps and which was previously utilized by the Security Headquarters - Kilinochchi. The land parcel requested for the expansion of the Kovil is a land parcel that was taken over by the Sri Lanka Army from civilian ownership. The said land parcel can be released from the use of the Sri Lanka Army after recovering the amount of Rs. 8.4 million spent by the Army because all those expenses had been audited. For the construction of buildings and other structures, that money had been utilized. So, based on that condition, we are able to release the land.

---

* පුස්තකාලයේ තබා ඇත.
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

The land parcel No. 924 - Part B in Plan No. 2549 located near the Sri Lanka Army 1 Corps at Iranamadu Junction and utilized by the Army was used as a children's park, and that land parcel was formally handed over to the Divisional Secretary's Office- Karachchi last year, on the 29th of March, 2025. I personally discussed this matter with the Divisional Secretary when I visited Mullaitivu and made arrangements to facilitate access to the people visiting those religious places, Hon. Member.

Furthermore, the above-mentioned land parcel belonging to the Department of Agriculture, which was utilized by the Sri Lanka Army, was released from the Army and formally handed over to the Deputy Director of Agriculture, Department of Agriculture - Kilinochchi, on the 11th of March this year.

(e) With regard to the lands belonging to the Government and civilian residents in the Keppapilavu area of Mullaitivu District, which are currently being utilized by the Sri Lanka Army, only 44 out of the 55 civilian claimants of the respective land parcels expressed their willingness to accept alternative lands in lieu of their original lands, where we have put up a model camp adjoining the same land.

The Government provided the 44 individuals, who expressed their willingness to accept alternative land, plots of 40 perches each in the Keppapilavu Model Village and constructed houses, a preschool and a school for the future education of their children as well as a Grama Niladhari Office and a community hall. All those were constructed by the tri-forces, specially by the Sri Lanka Army. The Divisional Secretary of Muhudubadapattu has confirmed that the remaining 11 civilians expressed their unwillingness to accept alternative lands and houses nearby the lands of the Model Village, about 300 metres apart.

Furthermore, the Divisional Secretariat of Muhudubadapattu was informed to ascertain from the 11 civilians who had not accepted the alternative lands and houses whether they would agree to receive compensation based on the value assessed by the Government for the aforementioned land parcels, which they claim to belong to them, and transfer those lands to the Sri Lanka Army. Accordingly, although the Divisional Secretariat inquired from them in this regard, they did not express their consent.

However, the Divisional Secretary of Muhudubadapattu has informed on several occasions that land plots corresponding to the extent of the lands previously claimed by the 11 civilians who did not accept the lands and houses in the Keppapilavu Model Village, could be allocated from the remaining portion of the land occupied by the Sri Lanka Army and that houses could be constructed for them.

So, as I said, when I went to Mullaitivu last week, I met the District Secretary and then spoke with the people who are demanding those lands and told them, "We can release the lands after considering all the other concerns." That is a total of 6.7 acres for those 11 civilians. So, we discussed the matter with the District Secretary also, along with the Governor of the Northern Province. The response from those civilians is yet to come. Once it is received, we are willing to release the lands to the District Secretary.

At the Ministerial Consultative Committee Meeting on Defence held on the 7th of April, 2026, the Commander of the Sri Lanka Army also apprised His Excellency the President of the above-mentioned matters.

Thank you, Sir.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Thank you, Hon. Deputy Minister. I would like to contradict a few things in your Statement. You said that these lands are not occupied by the military, but in reality, they are occupied by the military. Most of these lands are civilian lands and they have not been released yet. So, in that sense, they are occupied.

At the same time, you mentioned that some of these camps are essential for preventing trafficking of narcotics, people smuggling and for other reasons. Then, I would like to ask you why you do not have the same number of camps on the western coast and the southern coast because narcotics are being smuggled not only from the North and the East, Hon. Deputy Minister. So, please do not bring up containing narcotics as an excuse.

Also, I have always said that I thank you for releasing some of the land used for camps in Batticaloa; we are very thankful to you for releasing them.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் இந்தக் கேள்விக்கு மிக நீண்ட பதிலை வழங்கியிருக்கிறீர்கள். நேரம் போதாத காரணத்தால், நீங்கள் குறிப்பிட்ட அனைத்து விடயங்களையும் தெளிவுபடுத்திக் கொள்வதற்கான கேள்விகளைக் கேட்பதற்கு எனக்குச் சந்தர்ப்பம் கிடையாது. குறித்த பிரதேசங்கள், இராணுவக் கட்டுப்பாட்டில் இருக்கின்ற 'அதியுயர் பாதுகாப்பு வலயங்கள்' என்று நீங்கள் குறிப்பிட்டீர்கள். அண்மையில் நடைபெற்ற பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனை குழுக் கூட்டத்திலும், அந்தக் காலப்பகுதியிலிருந்த சூழலைக் கருத்திற்கொண்டுதான் குறித்த பிரதேசங்கள் 'அதியுயர் பாதுகாப்பு வலயம்' என்று அறிவிக்கப்பட்டதெனச் சொல்லப்பட்டது. இன்று அப்படியான ஒரு சூழல் இல்லாதபொழுது, குறித்த பிரதேசங்களை 'அதியுயர் பாதுகாப்பு வலயம்' என்று அறிவிக்க வேண்டிய அவசியம் இல்லையென்பது அந்தக் கூட்டத்தில் பேசப்பட்ட விடயமாகும்.

அடுத்து, ஜே/252 இருந்து ஜே/256 வரை பலாலியிலும், ஜே/246, ஜே/248, ஜே/257 மயிலிட்டியிலும் உள்ள பிரதேசங்களில் இருக்கின்ற மதஸ்தலங்களுக்குப்

போகலாமென நீங்கள் சொல்கிறீர்கள். இந்தப் பிரதேசங்களில் சென். செபஸ்டியன் தேவாலயம், மயிலிட்டி ரோமன் கத்தோலிக்க தமிழ் கலவன் பாடசாலை, வசாவிளான் ஸ்ரீ வேலுப்பிள்ளை வித்தியாலயம், மயிலிட்டி - காணிக்கை மாதா ஆலயம் என்பன இருக்கின்றன. இந்த இடங்களில் இருந்த சில ஆலயங்கள்கூட இப்பொழுது அங்கு இல்லை. உதாரணத்துக்கு, சென். செபஸ்டியன் தேவாலயம் இருந்த இடம்கூட இல்லாமல் போயிருக்கிறது.

அதேமாதிரிதான் கேப்பாப்புலவு காணிகள் சம்பந்தமான விடயமும். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் முல்லைத்தீவு மாவட்டத்துக்கு விஜயம் செய்தீர்கள். அந்த மாவட்டத்தைச் சேர்ந்த எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களை நீங்கள் அந்த இடத்துக்கு அழைத்திருந்தால், இந்த விடயங்கள் சம்பந்தமாக இன்னும் கொஞ்சம் அதிகமாகப் பேசியிருக்கலாம். இந்த விடயமானது, கௌரவ துரைராசா ரவிகரன் அவர்கள் பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் அடிக்கடி பேசுகின்ற ஒரு விடயமாகும். இதில் 11 பேருக்கு மட்டும்தான் காணி கொடுக்க இருப்பதாக நீங்கள் சொல்கிறீர்கள். 55 பேரில் 44 பேருக்கு காணி வழங்கியதாகச் சொல்கிறீர்கள். அந்த நேரத்தில் போவதற்கு இடமில்லை என்பதற்காக அவர்களுக்கு தற்காலிகமான குடில்தான் வழங்கப்பட்டது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
අවසන් කරනවා.

முதலில் ஒருவருக்கு ஓர் ஏக்கர் வீதம் காணி வழங்கப்பட்டதென நினைக்கின்றேன். அந்தளவு காணியை தங்களுக்குத் தரச்சொல்லி அந்த 44 பேரும் கேட்கிறார்கள். ஏனெனில், இப்பொழுது 20 அல்லது 30 பேர்ச்சஸ் காணிதான் கொடுக்கப்படுகிறது. அடுத்து, கிளிநொச்சியிலுள்ள குறித்த காணியை 80 இலட்சம் ரூபாயைச் செலுத்தி தனியார் பெற்றுக்கொள்ளலாமென நீங்கள் சொல்கிறீர்கள். இன்னொருவருடைய காணியில் கட்டிடம் கட்டச்சொல்லி யார் இராணுவத்துக்குச் சொன்னது? நீங்கள் அல்ல! இது உங்களுடைய காலப்பகுதியில் நடந்த விடயமுமல்ல!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, தனியாருடைய காணியில் 80 இலட்சம் ரூபாய் செலவில் இராணுவம் கட்டிடத்தைக் கட்டிவிட்டு, அந்த 80 இலட்சம் ரூபாவைச் செலுத்தினால்தான் இராணுவம் அந்தக் காணியை விடுவிக்கும் என்றால், எப்படி இதை ஏற்றுக் கொள்வது? அடுத்து, கரைச்சி பிரதேச சபைக்குக் காணி வழங்கப்பட்டதென நீங்கள் சொன்னீர்கள். அதில் ஒரு சிறிய பகுதிதான் வழங்கப்பட்டு இருக்கின்றது. ஏனைய பகுதி -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා අවසන් කරන්න. ඔබතුමා විනාඩි 4ක් අරගෙන තිබෙනවා, පැහැදිලි කිරීමට.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
අවසන් කරනවා.

கிளிநொச்சி மாவட்டத்தில் விவசாய ஆராய்ச்சி நிலையத்துக்குரிய காணியும் முழுமையாக வழங்கப் படவில்லை. நன்றி!

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
Hon. Speaker, the Hon. Member of Parliament made a series of allegations. I deny those facts. In fact, when you say "occupied", it is in the sense that you forcibly occupy. If you cast your mind back a decade and a half, you would recall the conflict situation we had there. The tri-forces or the military had to take over certain lands to address strategic concerns, for security purposes or looking at it from a national security perspective.

And, you have also used the word "demilitarization." The military has been deployed across the country. Deployment of troops in any part of the country is not militarization. That is to ensure public security, national security and also to respond to emergency situations and save lives. Ultimately, the responsibility lies on the Government and the security forces. It is not militarization; it is the legal security force in the country. So, those lands are not occupied. - [Interruption.] No, those lands are not occupied.

Then, you said that Members of Parliament were not invited when I visited Mullaitivu. The meeting was open; the people who were demanding lands, too, attended that meeting. So, it was open. It was your mistake that you did not come for that. The Hon. Governor was informed and the political authorities from other parties also had been in attendance.

Those lands had been taken over to address strategic concerns. Narcotic trafficking is only one of the transnational crimes that takes place there. It is not the only thing that happens in the North and the East. If you take illegal fishing activities taking place there, do you know the trouble the Sri Lanka Navy is taking to curb those activities and the violence involved? So, without the deployment of the Sri Lanka Navy and the Sri Lanka Coast Guard, it cannot be done. They need certain lands to attend to those matters immediately. If they are stationed at a distant place, they would take a very long time to respond. During the recent emergency situation in Chalai due to Cyclone "Ditwah", five Sri Lanka Navy personnel sacrificed their lives when they went to rescue others. They were not from the North and the East, but from some other parts of the country. So, Hon. Member, I hope you, being in Parliament for many years, would understand that national security must be given the highest priority.

Thank you, Hon. Speaker.

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

## ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
### பாதுகாப்புப் பணியாட்டொகுதியினரின் தலைமையதிகாரி (நீக்கல்) சட்டமூலம்
### CHIEF OF DEFENCE STAFF (REPEAL) BILL

"2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ඉවත් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවට ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2026 අගෝස්තු 18වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பாதுகாப்பு அமைச்சர் சார்பாக மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஓகஸ்ட் 18, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake on behalf of the Minister of Defence; to be read a Second time upon Tuesday, 18th August, 2026 and to be printed;*

*and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩකටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම.

විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු අනිල් ජයන්ත අමාත්‍යතුමා.

## පරිපූරක මුදල: මැද පෙරදිග යුද්ධයේ අහිතකර බලපෑම අවම කිරීම සඳහා සහන සැලසීම
### குறைநிரப்புத் தொகை: மத்திய கிழக்குப் போரின் தாக்கத்தைக் குறைப்பதற்கு நிவாரணம் வழங்கல்
### SUPPLEMENTARY SUM: PROVISION OF RELIEF TO MITIGATE ADVERSE IMPACT OF MIDDLE EAST CONFLICT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හැත්තෑ එක්දහස් හත්සියයක් (රු. 71,700,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 240 | - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | |
| වැඩසටහන | 02 | - | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 71,700,000,000 |
| | | | මුළු වියදම | රු. 71,700,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) සහ 41ඇ(1) ව්‍යවස්ථා ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය අනුව, 2026.02.05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති වශයෙන් පත් කර ඇති හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් නිශ්චය කර ඇති අතර, වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2026.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සන්දේශයට අදාළව අංක අමප/26/1258/801/020 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එල්.එස්.අයි. ජයරත්න මහත්මියට පහත පරිදි වැටුප් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති හෙයින්ද:-

(අ) විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය එම තනතුරට පත් කළ 2026.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-4 වැටුප් කේතයේ (175,000-12x5,300-238,600) 5 වන වැටුප් පියවරෙහි පිහිටුවා, ඒ අනුව එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 196,200/- ක වැටුප් පියවරට අනුරූපීව උපලේඛන III ට අනුව රු. 170,528/- වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීමට; සහ

(ආ) එම වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට සහ උක්ත චක්‍රලේඛයේ කලින් කල සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව වැටුප පරිවර්තනය කිරීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පරිදි මාසික වැටුප් ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි."

ගරු කථානායකතුමනි, Parliamentary Business Committee එකේදි එකඟ වූ පරිදි අප මෙම යෝජනාව අද දිනයේ ඉදිරිපත් කරනවා.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අද පස්වරු 2.00ට රැස්වෙන බව දැනුම් දී තිබෙනවා. එම වාර්තාවේ නිර්දේශය මත පදනම්ව අපි බලාපොරොත්තු වෙනවා, අද දින මෙම යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන්න. එම වාර්තාව ලබා ගැනීමට ප්‍රමාද වුණොත් මේ සතියේ වෙනත් දිනයක මෙම යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන්න අප බලාපොරොත්තු වෙනවා.

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, අද දින මේ යෝජනාව ඉදිරිපත් නොකළොත් නැවත Parliamentary Business Committee එකෙන් schedule කර ගන්නකල් අපට මේ සඳහා අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. එම අවශ්‍යතාව වෙනුවෙන් තමයි මේ Item එක ඉදිරිපත් කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Anil Jayantha to start the Debate. You have 14 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[අ.භා. 12.05]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මේ ඉදිරිපත් කරනු ලබන්නේ විශේෂයෙන්ම මැද පෙරදිග ඇති වෙච්ච ගැටුම්කාරී යුදමය තත්ත්වය නිසා ලංකාවට ඇති වෙච්ච බලපෑම වෙනුවෙන් විශේෂයෙන්ම මහජනතාවට සහන සැලසීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ගත් රුපියල් බිලියන 100ක විශාල සහන පැකේජයයි. මේ සහන පැකේජයට මුදල් සම්පාදනය කරගන්නා ක්‍රමවේදයේ එක් පියවරක් විධියට ඉන් රුපියල් බිලියන 71.7කට පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා තමයි මේ වැඩ කටයුත්ත සිද්ධ වෙන්නේ.

විශේෂයෙන්ම මෙහිදී අවධානය යොමු කරන්නට ඕනෑ විශේෂ කාරණයක් තිබෙනවා. ඒ තමයි, පරිපූරක ඇස්තමේන්තු බොහෝ අවස්ථාවලදී ඉදිරිපත් කරනකොට ඒ අවුරුද්දේ අය වැයෙන් අනුමත කර ගත්ත වැය ශීර්ෂ, වැය සීමා ඉක්මවා යනවා. ඒ වැය සීමා වැඩි වන අවස්ථා දකින්නට තිබෙනවා. නමුත්, අපි 2025 වර්ෂයේදීත් ලංකාවේ දැවැන්තම අර්බුදයකට මුහුණ දීලා "දිට්වා" සුළි කුණාටුවේදීත් රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර ගත්තා. ඒ සඳහා මුදල් සම්පාදනය කර ගත්තේ ආණ්ඩුව විසින් අතිරේකව එකතු කරන ලද බදු මුදල් සහ ආදායම්, වියදම් කළමනාකරණයේ ප්‍රතිඵලයක් හැටියට මිසක්, අලුතින් ණය අරගෙන නොවෙයි. ඒ වාගේම, අපට වියදම් වැඩි කරන්න සිද්ධ වුණේත් නැහැ. එතකොට මේ මැදපෙරදිග යුදමය තත්ත්වය නිසා ඇති වෙච්ච බලපෑම වෙනුවෙන් අපි ලබාදෙන සහන පැකේජයටත් රුපියල් බිලියන 100ක මුදල් ලබා ගන්නේ අතිරේක වියදම් වැඩි කරලා නොවෙයි, ණය ලබාගෙන නොවෙයි, තිබෙන වියදම් කළමනාකරණය කරලායි. එය තමයි මූල්‍ය විනය පිළිබිඹු කරන එක්තරා සාධකයක් බවට පත් වෙන්නේ. අද අපි ඉදිරිපත් කරන පරිපූරක ඇස්තමේන්තුව රුපියල් බිලියන 71.7ට කලින් මේ සමස්ත පැකේජය රුපියල් බිලියන 100ක්. මේ රුපියල් බිලියන 100න් අප්‍රේල් මාසයේදී ඉක්මනින් ගෙවීම් සිදු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අය වැය සංචිත පාවිච්චි කරමින් සහ ඒ වැය ශීර්ෂ කළමනාකරණය කරමින්, මීට පෙර රුපියල් බිලියන 20ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. එය පාර්ලිමේන්තුවේ අනුමත කළා. එහිදී අපි විශේෂයෙන්ම ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ යම් වැය ශීර්ෂ ගණනාවක ඉතිරි වූ මුදල් මේ සඳහා භාවිත කළා.

අද දින ඉදිරිපත් කරනු ලබන මේ පරිපූරක ඇස්තමේන්තුවේ ප්‍රධාන වශයෙන් මේ වෙනකොට ප්‍රතිපාදන ලබාදී තිබෙන මුදල් ප්‍රමාණය වන රුපියල් බිලියන 47.1ක මුදල අත හැරියාම ඉතිරි වෙනවා, රුපියල් බිලියන 52.8ක්. ඒ කියන්නේ රුපියල් බිලියන 100න්, දැනටමත් රුපියල් බිලියන 47.1ක ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මම කලින් සඳහන් කළ ආකාරයට කලින් අවස්ථාවේදී වියදම් ඉක්මන් කර ගැනීම සඳහා රුපියල් බිලියන 18.9ක් Treasury Miscellaneous හරහා, අය වැය සංචිතවලින් ලබා දුන්නා. ඒ රුපියල් බිලියන 18.9ක් ලබා ගැනීම සහ ඒ එකතුව තමයි රුපියල් බිලියන 71.7ක් බවට පත් වන්නේ. මේ සම්බන්ධයෙන් ඉතාම වැදගත් වන්නේ මෙයයි. විශේෂයෙන්ම අර්බුදයකට මුහුණ දීලා රට ඉදිරියට අරගෙන එනකොට, මුහුණ දෙන ලද අපට පාලනය කරන්න බැරි අභ්‍යන්තර ගැටලුවලට, පරිපාලනමය ගැටලුවලට, ව්‍යුහාත්මක ප්‍රශ්නවලට මුහුණ දෙන්න අපේ ආණ්ඩුව යටතේ අපට පුළුවන්කම ලැබී තිබෙනවා. හැබැයි, අපට මුහුණ දෙන්න සිද්ධ වෙච්ච "දිට්වා" සුළි කුණාටුවත්, මැදපෙරදිග යුද්ධයත් අපේ පාලනයට එපිටින් තිබුණේ. ඒ යටතේ අපි ලබා දුන් සහන පැකේජයේ විස්තර ටිකක් මම කියන්න කැමැතියි.

පළමුවෙන්ම මේ රුපියල් බිලියන 100 සහන පැකේජයේ අස්වැසුම්ලාභීන් දැනටමත් ඉතාම අවදානම් කලාපයේ ඉන්නේ. මොකද, මැදපෙරදිග යුද්ධය නිසා අපි අපේක්ෂා නොකරපු මට්ටමකින් යම් ආකාරයකට ආහාරමය නොවන භාණ්ඩවල වෙළෙඳ පොළේ මිල ගණන් වැඩි වුණා. තෙල් මිල වැඩිවීම, ගමනාගමනය, රක්ෂණ ගාස්තු වැඩිවීම් ආදිය නිසා උද්ධමනයටත් යම් ආකාරයක බලපෑමක් පැන නැඟිලා තිබුණා. නමුත්, ඒ උද්ධමනයේ රාමුව ඇතුළේ එය දැනට පාලනය කරන්න පුළුවන් මට්ටමක තිබෙනවා. කෙසේ වෙතත්, අර ඉලක්කගත ප්‍රජාවට; වේගයෙන් සහන ලබා දිය යුතු ප්‍රජාවට සහන ලබාදීමේ අරමුණින් තමයි රුපියල් 7,500ක්, රුපියල් 5,000ක් සහ රුපියල් 2,500 බැගින් පවුල් 1,700,000කට ආසන්න "අස්වැසුම" ප්‍රතිලාභීන් ප්‍රමාණයකට මේ රුපියල් බිලියන 8,475ක වෙන් කිරීම සිදු

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කරන්නේ. ඒ වාගේම ගොවීන් සඳහා අවශ්‍ය පොහොර සහනාධාරය ලබා දීම සිදු කරනවා. දැනට වී වගාව සඳහා හෙක්ටෙයාර එකකට රුපියල් 25,000ක් ලබා දෙනවා. එය රුපියල් 5,000කින් වැඩි කරමින් හෙක්ටෙයාර 500,000ක් වෙනුවෙන් මේ සහනාධාරයට මුදල් ප්‍රතිපාදන වෙන් කරනවා. ඒ වාගේම, වී වගාවට අමතරව තිබෙන වෙනත් ක්ෂේත්‍ර භෝග සඳහාත් හෙක්ටෙයාර 50,000ක් වෙනුවෙන් පොහොර සහනාධාරය රුපියල් 3,000කින් වැඩි කරනවා. ඊට අමතරව යූරියා පොහොර මිටියක් සඳහා ලබා දෙන වෙළෙඳ පොළේ මිල උච්චාවචනය වළක්වා ගනිමින් යූරියා පොහොර මිටියක් වෙළෙඳ පොළේ රුපියල් 10,200ක ස්ථාවර මිලකට අළෙවි වන අවස්ථාවේදී ඒ සඳහාත් රුපියල් 3,000ක සහනාධාරයක් ලබා දෙනවා. මේ පරිපූරක ඇස්තමේන්තුව ඇතුළේ මෙන්න මේ පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 3,850ක වෙන් කිරීමක් සිදු කරනවා. ඒ වාගේම, කුඩා තේ වැවිලිකරුවන් සඳහාත් කිලෝග්‍රෑම් 50ක පොහොර මිටියක් සඳහා රුපියල් 5,000 බැගින් පොහොර සහනාධාරය ලබා දෙනවා. එවැනි පොහොර මිටි ලක්ෂ 5කට රුපියල් බිලියන 2.5ක - රුපියල් මිලියන 2,500ක - මුදලක් වෙන් කරනවා.

අපේ ධීවර කර්මාන්තය වේගයෙන් අවදානමට ලක් වෙන්න පුළුවන්. ඒ සඳහාත් රුපියල් මිලියන 4,121ක් වෙන් කරනවා. ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකදී එක් දින යාත්‍රා තෝරා ගැනීමට ලක් කරනවා. යාත්‍රා 35,000ක් වෙනුවෙන් මොන වර්ගයෙන් භාවිත කළත්, දිනකට භාවිත කරන ඉන්ධන ලීටරයකට රුපියල් 50ක සහනාධාරයක් ලබා දෙනවා. දින 25ක් ධීවර කටයුතුවල නියැළෙයි කියලා අපේක්ෂා කරමින් ඒ සහනාධාරය ලබා දෙනවා. ඒ අනුව මාස 3කට මේ සහනාධාරය ලබා දෙනවා. එක් මාසයකට එක් ධීවරයෙකුට ලැබෙන සහනාධාරය රුපියල් 31,250යි. ඒ වාගේම, බහුදින ධීවර යාත්‍රාවලට එක්වරක් පමණයි මේක ලබා දෙන්නේ. ඒ අනුව ධීවර යාත්‍රා 5,600කට රුපියල් 150,000 බැගින් ලබා දෙනවා. ධීවර යාත්‍රා 40,600කට තමයි රුපියල් මිලියන 4,121ක් වෙන් කරලා ලබා දෙන්නේ.

විදුලිය නිෂ්පාදනයේදී ඉන්ධන භාවිත කිරීම නිසා විදුලි පාරිභෝගිකයන්ගේ විදුලි බිලටත් යම් ආකාරයක බලපෑමක් සිද්ධ වුණා. නමුත් ඒ අවස්ථාවේදී අපි මැදිහත් වෙලා මහා භාණ්ඩාගාරය විසින් විදුලිය පරිභෝජනය කරන පහළ කාණ්ඩවලට සහනයක් ලබා දුන්නා. විදුලිය ඒකක 180ට අඩුවෙන් භාවිත කරන අය වෙනුවෙන් සහන සැලසීමක් විධියට රුපියල් බිලියන 15,300ක් වෙන් කළා. ඊට අමතරව, ඉන්ධන මිල ගණන් වැඩිවීම සම්බන්ධයෙනුත් ඩීසල් ලීටරයකට උපරිමය රුපියල් 100ක් දක්වාත්, පෙට්‍රල් ලීටරයකට උපරිමය රුපියල් 20ක් දක්වාත් සහනාධාරයක් ලබා දුන්නා. මේ සහන පැකේජය යටතේදී රුපියල් බිලියන 57ක් -රුපියල් මිලියන 57,000ක්- වෙන් කරනවා. ඒ වාගේම, අනෙකුත් සහන ලබාදීම සඳහා තවත් රුපියල් මිලියන 8,754ක් වෙන් වෙනවා. ඒ අනුව තමයි මේ සමස්ත සහන පැකේජය තීරණය වන්නේ. ඒ සහන පැකේජය ඇතුළේ දැනටමත් මම සඳහන් කරපු ක්ෂේත්‍රවලට රුපියල් මිලියන 47,167ක් ගෙවා තිබෙනවා. ඉතිරි රුපියල් මිලියන 52,833 සහ මහා භාණ්ඩාගාරයේ සංචිතවලට ලබා දිය යුතු රුපියල් මිලියන 18,900 තමයි මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් අපි වෙන් කරගන්න බලාපොරොත්තු වන්නේ.

මම කලිනුත් සඳහන් කළ ආකාරයට ඉතාම වැදගත්ම කාරණය තමයි, වියදම් වැඩි වෙන්නේ නැති එක. එයින් පෙන්නුම් කරන්නේ අපේ මූල්‍ය විනයේ තත්ත්වය. ඒ කියන්නේ ඉතා විශිෂ්ට ආකාරයකට මේ මූල්‍ය විනය පවත්වා ගෙන යනවා. මේ මූල්‍ය විනය පවත්වාගෙන යෑමේදී එක් පැත්තකින් වියදම් කළමනාකරණය වැදගත් වෙනකොට, අනෙක් පැත්තෙන් ආදායම් කළමනාකරණයත් ඉතාම වැදගත් වෙනවා. අපි අපේක්ෂා කරන ආදායම් ඉලක්ක සියල්ලම අබිබවා තිබෙනවා. මේ වෙනකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් මාස 7ක් ඉක්මවා පසුගිය ජූලි 31 වෙනකොට අවුරුද්දක් ඇතුළත අත්පත් කරගත යුතු ඉලක්කයෙන් සියයට 65ක් අත්පත් කරගෙන තිබෙනවා. එයින් අදහස් වන්නේ මේ වේගයෙන්ම, මේ ඉලක්කයෙන්ම ගමන් කළොත් වර්ෂය අවසාන වෙනකොට සියයට 112ක මට්ටමකින් ආදායම එකතු කරගන්න පුළුවන් කියන එකයි. නමුත් අපි සාමාන්‍යයෙන් දන්නවා, වර්ෂය අවසාන වෙනකොට අපිට වැඩිපුර ආදායම් එකතු කරගන්න පුළුවන් බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපේ ආදායම් ඉලක්ක කිසිදු ගැටලුවකින් තොරව අත්පත් කර ගැනීමේ පරිසරය නිර්මාණය වෙලා තිබෙන බව මම සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා ආණ්ඩුව වෙන් කරලා තිබෙන සියලු වියදම් නිසියාකාරයෙන් වියදම් කරලා සංවර්ධනයට අදාළ වියදම් සහ මහජනතාවට අදාළ කරන අනෙකුත් සේවා සැපයීම් ඇතුළු සියලු කටයුතු සිද්ධ කිරීමේ හැකියාව තිබෙනවා. ආණ්ඩුව පිළිබඳව හෝ අපි කරන වැඩ කටයුතු පිළිබඳව සමාජය ඉදිරිපත් කරන විවිධාකාරයේ තොරතුරුවලදී විශේෂයෙන් සමාජ මාධ්‍යවල විවිධ වූ වැරදි තොරතුරු ප්‍රචාරය වෙනවා. නමුත් අපිට බලන්න සිද්ධ වන්නේ ජාත්‍යන්තර වශයෙන් පිළිගත්, ඒ වාගේම ලේඛනගත නිල තොරතුරු හරහා. ඒ කුමන ආකාරයකින් බැලුවත්, අපේ මේ ආර්ථික ගමන් මඟ අභියෝග හමුවේ ක්‍රමිකව ස්ථාවරව ඉදිරියට ගමන් කරමින් තිබෙනවා. ඒ අනුව ජනවාරි සිට ජූනි දක්වා වූ අර්ධ වාර්ෂික රාජ්‍ය මූල්‍ය වාර්තාව ඊයේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමත කළා. ඉදිරියේදී එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. පළමුවැනි මාස 6 ඇතුළතදී රුපියල් බිලියන 9.5ක අය වැය අතිරික්තයක් එයින් පෙන්නුම් කරනවා. ඒකට විශේෂයෙන් බලපා තිබෙන්නේ මා කලින් සඳහන් කරපු ආදායම් එකතු කර ගැනීමේ ප්‍රගතිය කියන කාරණයයි. ඒ නිසාම අපට අතිරේකව, සැලසුම් කළාට වැඩිය, අනවශ්‍ය ආකාරයට ණය ගැනීමේ අවශ්‍යතාවක් එන්නේ නැහැ, අපට ණය තිරසරභාවය පවත්වාගෙන යෑමේ ඉඩකඩ තිබෙනවා. මේ කරුණු කාරණා නිසා අපි ආර්ථික වර්ධනයෙන් ඉදිරියට යන්නට ඕනෑ, ආයෝජන කැන්දන්නට ඕනෑ. ඒ කටයුතු සඳහා වැදගත් වන්නේ ආයෝජකයින්ගේ විශ්වාසය තහවුරු කරගැනීමයි. අපි විවිධ අඩුපාඩු සහිතව, බාධක මැද යම් ආකාරයකට ආයෝජකයින්ගේ විශ්වාසය තහවුරු කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ වාගේම අපි ඒ ආයෝජකයින්ට නිසි පරිදි ආයෝජනය කරන්න පුළුවන් සම බිමක් නිර්මාණය කරමින් තිබෙනවා, ඒ සඳහා තාක්ෂණය කැඳවමින් සිටිනවා.

ඒ අනුව ලංකාවේ ණය ශ්‍රේණිගත කරනු ලබන විවිධ ආයතන අතරින් S&P - Standard & Poor's - ආයතනය විසින් ජූලි මාසයේදී කලින් ශ්‍රේණිගත කරපු මට්ටමේම අපේ රටේ ණය ශ්‍රේණිගත කිරීම පවත්වාගෙන ගිහින් තිබෙනවා. අපි එතැනදී විශේෂයෙන් අවධානය යොමු කරන්නේ CCC+ කියන මට්ටමට. එතැන අතිරේක වර්ධනයක් වෙලා තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව, මැද පෙරදිග යුද්ධමය තත්ත්වය වැනි දැඩි ප්‍රශ්නවලට මුහුණ දීලා, ඒ පසුබෑමේ බලපෑම් යටපත් කරමින් තමයි කලින් තිබුණු මට්ටම ම අපි පවත්වා ගෙන යමින් මේ තත්ත්වය ආරක්ෂා කරගෙන තිබෙන්නේ, ස්ථාවරභාවය පෙන්නුම් කරලා තිබෙන්නේ.

S&P එකෙන් ඊට අමතරව තවත් දෙයක් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන් ආයෝජකයින්ගේ විශ්වාසය තහවුරු කර ගැනීමේදී ඔවුන් ගෙන එන ආයෝජන නැවත ඩොලර්වලට පරිවර්තනය කරලා ආපසු ගෙන යෑමේ හැකියාව පිළිබඳ

දර්ශකයෙන් අපි ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව එහි CCC+ කියන දර්ශකයෙන් B- කියන තත්ත්වයට අපි ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව අපට පෙනෙනවා, විශ්වාසවන්තභාවය ඉදිරියට ඇවිල්ලා තිබෙන බව. ඒ අනුව ඔවුන්ගේ වාර්තාවේ සඳහන් කරනවා, near-term payment crisis එකක් පැන නඟින්නේ නැහැ කියලා. නමුත්, අපි මේ ස්ථාවරත්වයෙන් ඉදිරියට ගමන් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා.

ඒ වාගේම තවත් ජාත්‍යන්තර ආයතනයක් වන International Institute of Finance කියන මූල්‍ය ආයතනය විසින් හුවමාරු කිරීම සහ පරිවර්තනය කිරීම පිළිබඳව, විශේෂයෙන්ම ආයෝජන කිරීම පිළිබඳ විශ්වාසය සහ සම්බන්ධතාව ගොඩනඟා ගැනීමට අවශ්‍ය තහවුරුව ලබා දෙනවා. ඒකට පාදක වන්නේ IIF - International Institute of Finance - එක ලබා දෙන තහවුරුවයි. එහිදී විශේෂයෙන් අපේ අවධානයට යොමු කරනවා, ණය පාරදෘශ්‍යභාවය - debt transparency - පිළිබඳ වාර්තාවත්, ණය හිමියන් එක්ක තිබෙන සම්බන්ධතාව පවත්වාගෙන යෑමත් පිළිබඳව. එහිදී අපට පුළුවන්කම ලැබී තිබෙනවා, ඒකක 6.3කින් ඉදිරියට ඇවිල්ලා මේ වර්ධනය අත්පත් කරගත් රටවල් අතරින් 4වැනි ස්ථානයට ළඟා වන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු කරුණු කාරණාවලින් පෙන්නුම් කරන්නේ ආයෝජකයින්ගේ විශ්වාසය දිනා ගැනීමට මූලික අඩිතාලම දැමීම අපි තහවුරු කරමින් තිබෙනවා කියන කාරණයයි. ඒත් එක්කම මෙම තත්ත්වය අපේ උපාය මාර්ගික වියදම් කළමනාකරණයත් එක්ක ගැට ගැහෙනවා.

ගියවර අය වැයේදී ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, මේ අභියෝග ජයග්‍රහණය කරන්න නම් අපි අනිවාර්යයෙන්ම තිරසාර සහ සියලුදෙනා සම්බන්ධ වන සියයට 7කට වඩා වැඩි ආර්ථික වෘද්ධියක් ළඟා කර ගැනීම සඳහා කටයුතු කරන්නට ඕනෑය කියලා. ඒ අනුව ඊට අවශ්‍ය කටයුතු පිළිබඳව අපි සාකච්ඡා කරමින් ඉන්නවා. මේ කරුණුවලට අමතරව ඊට අවශ්‍ය අදාළ නීතිමය රාමුව ස්ථාපිත කිරීමට, පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු අපි යෝජනා කරනවා. ඒ අනුව Investment Protection Act එකේ සියලු කටයුතු දැනටමත් සිදු කර අවසානයි. නීතිපති දෙපාර්තමේන්තුවෙන් අපි ඒ සඳහා අවසරය ලබා ගන්න ඕනෑ. දැනටත් ඒක තිබෙන්නේ Legal Draftsman's Department එකේ. එහි යම් සංශෝධන ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. ඒ සංශෝධන ඉදිරිපත් කළාට පසුව අපි ඉදිරියේදී මේ පනතත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, you have exhausted your allotted time.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මූල්‍ය විනය, මුදල් පාලනය මේ ආකාරයෙන්ම පවත්වා ගනිමින්, ඔරොත්තු දීමේ හැකියාව මත ආර්ථිකය දියුණු කරන්න අවශ්‍ය පදනම මේ පරිපූරක මුදලින් ලබා දෙන ගමන්ම අවදානමට ලක් වන ජනතාවට සුවිශේෂී වූ සහන සැපයීමට මෙය උදව් උපකාර වනවා කියන කාරණයත් සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. S.M. Marikkar. You have 12 minutes to participate in today's Debate.

[අ.භා. 12.20]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කරන රුපියල් බිලියන 71ක පරිපූරක මුදල සම්බන්ධයෙන් වන විවාදය ආරම්භ කරපු මගේ මිත්‍රයෙකු වන මුදල් නියෝජ්‍ය ඇමතිතුමාට මම ගරු කරනවා. එතුමා හොඳ මහත්මයෙක්.

එතුමා මූල්‍ය විනය ගැන කථා කළා. ඒක සාපේක්ෂව යම් දුරකට නිවැරදි වෙන්න පුළුවන්. අතිරේක ආදායම් සොයාගත්තා කිව්වා. හැබැයි, ඒ අතිරේක ආදායම් සොයාගන්න මේ රටේ ජනතාවගේ රීරි මාංස උරා බීලා වාගේ වර්තමාන රජය බදු වැඩි කරලා, විදුලි බිල වැඩි කරලා, ජීවන වියදම වැඩි කරලා කටයුතු කළාට ඒකෙන් පීඩාවට ලක්වන ජනතාව ගැන කථා කළේ නැහැ. *[බාධා කිරීමක්]* උදාහරණයකට ගත්තොත්, සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා ඇවිදින්න යනවා නම් මේ ගැන දන්නවා ඇති. මම දන්නේ නැහැ, එතුමා ඇවිදින්න යනවා ද කියලා. කොළඹ නාගරික වතු නිවාසවල ජීවත් වන ජනතාව උදේටයි, දවල්ටයි හොදියි, බතුයි කන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාන් රාත්තලක් ගෙදරට ගෙනෙන්නේ නැහැ. මොකද, පාන් රාත්තල කන්න පුළුවන් දෙදෙනෙකුටයි. හාල් කිලෝ එක හයදෙනෙකුට කන්න පුළුවන්. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. ඔබතුමා ඇවිදලා බලන්නකෝ, නගරාධිපතිගේ පස්සෙන් සාරියේ එල්ලිලා යන්න එපා, වත්ත ඇතුළට ගිහිල්ලා බලන්න. මම මේ වෙන කථාවක් කිව්වේ. තව ඕනෑ නම් කියන්නම්. *[බාධා කිරීමක්]* කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් රුපියල් බිලියන 71ක් නොවෙයි, රුපියල් බිලියන 700ක් වුණත් ගන්න පුළුවන්. මොකද, බොහෝ අමාත්‍යාංශවල, ආයතනවල ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රජයෙන් වෙන් කරපු සල්ලි වියදම් කරන්නේ නැතිව ඒ සල්ලි මහා භාණ්ඩාගාරයට හරවා යවනවා. ඒ නිසා මේ රුපියල් බිලියන 71 ණය ගන්නේ නැතුව කළමනාකරණය කරලා ගත්තා කියන එක බොරුවක්. නොහැකියාව නිසා, වැඩ නොකිරීමෙන් ඉතිරි වන සල්ලි මහා භාණ්ඩාගාරයට යවලා කළමනාකරණය කර ගත්තා කියලා ඒක නිවැරදි වෙන්න ඕනෑ. මම ඒ සම්බන්ධව ඊට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේක මම කියන එකක් නොවෙයි. නමුත් මම ඒ ගැන දන්නවා. මම මේක quote කරනවා, පසුගිය ජූලි 31වන දා "Daily Mirror" පුවත් පතේ වාර්තාවක තමයි මෙය තිබෙන්නේ. අපි යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ අංශික අධීක්ෂණ කාරක සභාවේදීත් මේ ගැන කථා කළා. Central Expressway Project Section 3 එකේ අදියර 7ක් contractorsලා හයදෙනෙකුට දුන්නා. එතකොට මොකක්ද වුණේ? තරගකාරිත්වය සීමා වුණා. මේ තරගකාරිත්වය සීමා කරන්න විවිධ හේතු හැදුවා. සාමාන්‍යයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවක් මත පදනම් කරගෙන සියයට 5ක්, 10ක් plus or minus තමයි යන්නේ. නමුත්, මේ වාර්තාව අනුව මොකක්ද වෙලා තිබෙන්නේ? රුපියල් බිලියන 94.69කට ඇස්තමේන්තු කරපු එක රුපියල් බිලියන 112.56ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. වර්තමාන රජය යටතේ සීමාසහිත

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කොන්ත්‍රාත්කරුවන් අතර සීමාසහිත තරගයක් ඇති කිරීම නිසා, තරගකාරී සමාගම්වලට ඉල්ලුම් කරන්න තිබුණු අවස්ථාව technical process එකෙන්ම, එහෙම නැත්නම් tender process එකෙන්ම ඇවර කිරීම නිසා රුපියල් බිලියන 17.87ක් වැඩිපුර ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. මම මේ අවධානය යොමු කරවන්නේ මොකකටද?

අපට තේරෙනවා, මේ අය වැයෙන් පස්සේ දඹුල්ල-කුරුණෑගල අධිවේගී මාර්ගයත්, Colombo Suburb Railway track එකත්, ඒ වාගේම ඉංගිරිය-හොරණ අධිවේගී මාර්ගයත් ඊළඟ අවුරුද්දට එන්න නියමිතයි කියලා. තරගකාරිත්වය සීමා කළාම මාෆියාවක් හැදෙනවා. ඒ මාෆියාව හැදුණාම විශාල මුදල් ප්‍රමාණයක් වැඩිපුර වියදම් කරන්න වෙනවා. එතකොට ඒක අය වැයටත් බලපානවා. දැන් තරගකාරිත්වය වැඩි කළා නම් මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒ සමාගම් 6 මේ කොන්ත්‍රාත්තුව ගත්තාට ඒ සමාගම්වලින් මේ කොන්ත්‍රාත්තුව කරන්නේ නැහැ. ඒගොල්ලන් ඊට පහළින් ඉන්න අයට මේකේ subcontracts දෙනවා. එහෙම subcontracts දීමේදී ඒ අය අතර ගාණක් - ලාභයක් - තබාගෙන තමයි ඊළඟ කෙනාට දෙන්නේ. ඒ නිසා මේ රජය යටතේ මේ කරපු දෙයින් රුපියල් බිලියන 17.87ක් වැඩිපුර ගෙවන්න වෙලා තිබෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, අපි මේ පිළිබඳව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ අංශික අධීක්ෂණ කාරක සභාවේදී කථා කළායින් පසුව අද වෙද්දී යම් ධනාත්මක දේවලුත් සිදු වෙලා තිබෙන බව. පුවත් පත් දැන්වීමක් දාලා තිබෙනවා, "Road Development Authority - Invitation for the bids" යනුවෙන්, අර ඊළඟට එන්න තිබෙන ඒවාට අදාළව. මේක expressway අත්දැකීම් තිබෙන අය දැම්මා නම් ඔය හය හත්දෙනා අතරම තමයි යන්නේ. හැබැයි, මේක highway අත්දැකීම් තිබෙන අයටත් - highway කියන්නේ අධිවේගී මාර්ග නොවෙයි, කොළඹ-නුවර වාගේ, කොළඹ-රත්නපුර වාගේ ප්‍රධාන මාර්ග හදපු අයටත් - open කළා නම්, CIDA එකේ registered bidderslා 13ක් ඉන්නවා. මේක 13දෙනෙක් අතර බෙදිලා ගියා නම් මොකක්ද වෙන්නේ? උදාහරණයකට මම මේ කියන්නේ. ඒක නිසි සුදුසුකම් සහිත 15ක් වෙන්න පුළුවන්, 17ක් වෙන්න පුළුවන්, 20ක් වෙන්න පුළුවන්, එහෙම වුණා නම්, එක් පැත්තකින් මේ වැඩේ වේගයෙන් කෙරෙනවා. අනික් පැත්තෙන් පගා ගෙවීමත් අඩු වනවා. ඒ වාගේම තරගකාරිත්වය හරහා රජයට වැඩිපුර ගෙවන්න සිදුවන මුදල් ප්‍රමාණයත් අඩු වනවා. ඒ වාගේම කියනවා, හරි, අපි දැන් CS2වලටත් open කරනවා කියලා. හැබැයි open කරලා financial qualifications දමද්දී, බිලියන 25ක් තිබෙනවා කියලා දැම්මොත්, ආයෙත් එක් පැත්තකින් දොර ඇරලා අනික් පැත්තෙන් දොර වහනවා වාගේ දෙයක් වනවා. ඒ වැඩේ කරන්න එපා කියලා ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නියෝජ්‍ය ඇමතිතුමා මගේ මිත්‍රයා. දැන් එතුමා මේ සභාවෙන් පිටතට ගියා. එතුමා කිව්වා, අර වන්දිය ගෙව්වා, අස්වැසුම මේ විධියට දෙනවා, අර විධියට දෙනවා කියලා. "දිට්වා" ආපදාව වෙනුවෙන් රුපියල් කෝටි ගණන් හම්බ වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස විධියට ගත්තොත්, තනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් විධියට කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තමයි වැඩිම ජනතාවක් ආපදාවට ලක් වුණේ. ඔප්පු නැති මිනිසුන්ට ගංවතුර වන්දිය දෙන්නේ නැහැ. ගංවතුර එනකොට අදාළ ගෙදර පදිංචි වෙලා හිටියා කියලා ඔප්පු කරන්න පුළුවන් විධියට ලයිට් බිල තිබෙනවා, වතුර බිල තිබෙනවා, tax bill තිබෙනවා, ඡන්ද හිමි නාම ලේඛනයේ නම තිබෙනවා. අල්ලපු ගෙදරට ඔප්පු තිබෙන නිසා ඒ අයට වන්දි දෙනවා, මේ ගෙදරට ඔප්පු නැහැ කියලා ඒ අයට වන්දි දෙන්නේ නැහැ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඔබතුමා ඒ ගැන දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ නිසා ඔබතුමාගේ වෙලාවේදී ඒ ගැන කථා කරන්න. ආපදා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙක් විධියට මම මේ පිළිබඳව ගරු ජනාධිපතිතුමාගේ අවධානයත් යොමු කළා. හැබැයි, ඒත් ඔවුන්ට වන්දි ලබා දුන්නේ නැහැ. ඔයාට සල්ලි තිබෙනවාද, ඔයා කොයි ජාතියේද, ඔයා කොයි ආගමේද, ඔයාට ඔප්පු තිබෙනවාද, ඔයාට ඔප්පු නැද්ද කියලා බලලා ගංවතුර ආවේ නැහැ. ගංවතුර එනකොට අල්ලපු ගෙදරට ආපු විධියටම තමයි අනික් ගෙදරටත් ආවේ. එතකොට නිවාස වන්දිය ලබා දෙන්නේ ගංවතුර නිසා හානි වෙච්ච නිවස හදා ගන්න නම් ඔප්පු තිබුණාද, නැද්ද කියන එක අදාළ නැහැ. 2016 අවුරුද්දේ ගංවතුර ආපු වෙලාවේ අපි ගෙවල් 19,905කට රුපියල් ලක්ෂ 23,000ක් වන්දි වශයෙන් ලබා දුන්නා. අපි ඒ අවස්ථාවේදී ඔප්පු තිබුණාද, නැද්ද කියලා බැලුවේ නැහැ.

ඒ වාගේම අපි මතක් කර දෙන්න කැමැතියි, මේ ඔප්පු නැති ජනතාවගෙන් වැඩි පිරිසක් ඡන්දය දුන්නේ මාලිමාවට කියන එක. ඔබතුමාටත් එයින් කොටසකගෙන් මනාප ඇවිල්ලා ඇති නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ගැන මම ආපසු කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ විධියට සමාජයේ එක හරස්කඩක් විශාල ආපදාවකට ලක් වෙද්දී ඒ ගැන කථාවක් නැහැ. මේ ගැනත් අවධානය යොමු කරන්න කියන එකයි මම කියන්නේ. ඒ මිනිස්සු පව්. මේ දේවල් අල්ලාගෙන දේශපාලනය කරන්න අපට පුළුවන්. නමුත්, අපේ අරමුණ එහෙම දේශපාලනය කරන එක නොවෙයි, ඒ ජනතාවට වන්දි ලබා දෙන එකයි. මොකද, ඒ තුළ ඉතාම දුක්ඛිත ජීවිත ගෙවන ජනතාවක් ඉන්නේ. සාමාන්‍යයෙන් ඔප්පු තිබෙන කෙනාට මොනවා හෝ පොඩ්ඩක් ලැබෙනවා. *[බාධා කිරීමක්]* ඔය විධියට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වැඩක් නැහැ, field එකට ගිහිල්ලා බලන්නකෝ. නගරාධිපතිතුමියගේ සාරි පොටේ එල්ලෙන්නේ නැතුව ඒ වතුවලට ගිහිල්ලා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් මේ ගැන හොඳින්ම දන්නවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි කාරණය මෙයයි. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා මතක් කළා, Investment Protection Act එක ගෙනෙන්න යනවා කියලා. Investment Protection Act එක ගෙනෙන එක ඉතාම හොඳයි. හැබැයි, එහෙම කළා කියා සෘජු විදේශ ආයෝජන ලොකු තොගයක් එනවා කියලා හිතනවා නම්

ඒක ලොකු මෝඩකමක්. මොකද, BoI එකෙන් ඔක්කෝම එක සැරේ කර ගන්න එක හොඳයි කියලා තමයි ආයෝජකයා බලාපොරොත්තු වෙන්නේ. ඒක විතරක් නොවෙයි, ඔවුන් බලාපොරොත්තු වෙන්නේ. මේ රටේ නීති පද්ධතිය ක්‍රියාත්මක වෙනවාද, අධිකරණ පද්ධතිය අපක්ෂපාතීව ක්‍රියාත්මක වෙනවාද කියාත් ඔවුන් බලනවා. මොකද, ඒ පුද්ගලයා ආයෝජනයක් කළාට පස්සේ ප්‍රශ්නයක් ආවොත් ඔහුට මුහුණ දෙන්න වෙන්නේ මේ රට ඇතුළේ නීතිය ක්‍රියාත්මක වන විධිය අනුව සහ මේ රට ඇතුළේ අධිකරණය ක්‍රියාත්මක වන විධිය අනුවයි. එම නිසා ආණ්ඩුව මේ නීති හදනවා වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නත් ඕනෑ. "ප්‍රජාතන්ත්‍රවාදය කන්නද?" කියලා අහපු අයට තමයි අද ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් නොවීම නිසා ආයෝජන නොලැබීමේ ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. මා මිත්‍ර නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්න වෙලාවේ මට මේ ගැන කියන්න තිබුණා නම් මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව කරුණු දෙකක් කෙටියෙන් කියන්නම්. තවමත් බදු ගෙවන්නේ නැතුව ලංකාවට පොල් තෙල් එනවා. මම මේ සම්බන්ධයෙන් හත් වතාවක් ප්‍රශ්න අහලා තිබෙනවා. නමුත්, ඒ කටයුතු නතර වෙලා නැහැ. වසන්ත සමරසිංහ ඇමතිතුමාත් ඒකට උත්තරයක් දුන්නා. හැබැයි, ඒක තවමත් නතර වෙලා නැහැ, බදු අය කරගෙනත් නැහැ. ඒ පිළිබඳ මගේ තව ප්‍රශ්නයක් බ්‍රහස්පතින්දාට අහනවා. ඒ ප්‍රශ්නය අහන වෙලාවට මම ඒ සම්බන්ධයෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බාල ගල් අඟුරු ගෙන්වීම නිසා ජූනි මාසයේ 31වැනි දා වනකොට රුපියල් මිලියන 8,527ක් පාඩු වෙලා තිබෙනවා. මහජන උපයෝගිතා කොමිසම ගණන් හදලා තිබෙන විධියට බාල ගල් අඟුරු ගෙන්වීම හේතුවෙන්, ඒ තුළින් නිෂ්පාදනය කරන්න නොහැකි වුණු විදුලිය මිලදී ගැනීම නිසා තමයි ඒ පාඩුව සිදු වෙලා තිබෙන්නේ. ඒ අනුව ජූලි මාසයේ, අගෝස්තු මාසයේ සහ සැප්තැම්බර් මාසයේත් ඔය පාඩුව වෙන්න තිබෙනවා. මේ වැස්ස අගෝස්තු මාසය සහ සැප්තැම්බර් මාසය පුරාවට දිගටම පැවතුණොත් පාඩුව තව පොඩ්ඩක් අඩු වෙයි. හැබැයි, රුපියල් බිලියන 10කට වඩා වැඩි වෙනවා. මොකද, ජූනි මාසයේ විතරක් පාඩුව රුපියල් මිලියන 1,900කට වැඩියි.

අපි දැන් බලන්න ඕනෑ, දිගින් දිගටම බාල ගල් අඟුරු පාවිච්චි කිරීම නිසා ලක් විජය බලාගාරයේ යන්ත්‍ර සූත්‍රවලට මොනවාද වෙලා තිබෙන්නේ කියලා. අපට මතකයි, කලින් වතාවකදී අපේ කමිටුවේදී කියනවා, blade එකක් ගියොත් රුපියල් මිලියන 100ක් වියදම් වෙනවා කියලා. එම නිසා මාස 8ක් තිස්සේ බාල ගල් අඟුරු පාවිච්චි කරලා කළ විදුලිය උත්පාදනය හරහා සිදු වුණු පාඩුවට අමතරව යන්ත්‍ර සූත්‍රවලට වෙලා තිබෙන හානියත් ගණනය කිරීමට කාලය එළඹ තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාස්කු ප්‍රහාරය වළක්වා නොගැනීම සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම්තුමාටයි, හිටපු පොලිස්පතිතුමාටයි දඬුවම් ලැබුණා. ඒ ප්‍රහාරයට සෘජුව හෝ අනියමින් සම්බන්ධ වෙච්ච සියලුදෙනාට දඬුවම් ලැබෙන්න ඕනෑ, ඒ වින්දිතයන්ට සාධාරණයක් වෙන්න නම්. එය වළක්වා නොගත්ත අයට දඬුවම් ලැබුණා වාගේම කුමන්ත්‍රණය කරපු අයටත් දඬුවම් ලැබෙන්න ඕනෑ. එතුමන්ලාට ඒ ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණේ කණ්ඩායමක් විසින් ඒ ත්‍රස්තවාදී ප්‍රහාරය සංවිධානය කරපු හින්දා නේ. හැබැයි, ඉස්සෙල්ලාම දඬුවම් ලැබුණේ ඒ ප්‍රහාරය සංවිධානය කරපු අයට නොවෙයි, එය වළක්වා නොගත්ත අයටයි. ඒක වැරැදියි කියලා නොවෙයි මම කියන්නේ. Something is better than nothing. හැබැයි, ඒක නිසා පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණයක් ඉෂ්ට වුණා කියලා මතයක් හදන්න යනවා නම් ඒක පට්ටපල් බොරු. මොකද, 70,000ක ඩෝබි බලකායක් ඉන්නවා කිව්වා නේ. ඒගොල්ලන් එහෙම මතයක් හදන්න යනවා. ඒ නිසායි මම එහෙම කිව්වේ. ඒ ප්‍රහාරය නිසා මැරුණු සියලුදෙනාටම සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. බුද්ධි අංශ තොරතුරු ලබා දී තිබෙනවා කියන එක තහවුරුයි. අප්‍රේල් මාසයේ 04වැනි දා සිට 21වැනි දා උදේ වෙනකල් සැරින් සැරේ බුද්ධි අංශ තොරතුරු ලබා දීලා තිබෙනවා. ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙලා නැහැ කියන එක දැන් අධිකරණයේ ඔප්පු වෙලා තිබෙනවා. එතකොට බුද්ධි අංශ ඉලක්ක කරලා වැඩක් නැහැ, ඒ ප්‍රහාරය වළක්වා නොගත් අයට වාගේම ඒ ප්‍රහාරය සංවිධානය කරපු අයටත් දඬුවම් ලැබෙන්න ඕනෑ. ඒ ප්‍රහාරයෙන් මිය ගිය 260දෙනාටම සාධාරණයක් සිද්ධ වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් මුස්ලිම් ජාතිකයෙක්, මමත් මුස්ලිම් ජාතිකයෙක්. ඔබතුමාට මතක ඇති, ඒ කාලයේ අපේ හිතවත් සහෝදරවරු අපිව විශ්වාස කළාට සමාජය අප දෙස වපර ඇහෙන් බැලූ බව. සමහර අය එකට table එකේ වාඩි වුණේ නැහැ, කන්න. වපර ඇහෙන් අප දෙස බැලුවා. ව්‍යාපාර වර්ජනය කළා. සියලුම මුස්ලිම් ජාතිකයන් දෙස ත්‍රස්තවාදීන් විධියට බැලුවා. එහෙම යුගයක් පසු කරලා තමයි අපි ආවේ. ඊට පස්සේ කොවිඩ් වසංගතය පැවති කාලයේ මුස්ලිම් මෘත දේහ හිතාමතාම, බලෙන් ආදාහනය කළා. ඒ ඔක්කොම එක agenda එකේ ආවේ. එම නිසා ඒ ප්‍රහාරය සංවිධානය කරපු අය අර යුද්ධයේ හිටියා, මේ යුද්ධයේ හිටියා, රට වෙනුවෙන් අරක කළා, මේක කළා කියලා ඒගොල්ලන්ට මිනී මරන්න අයිතියක් නැහැ. ඒ ප්‍රහාරය සංවිධානය කළේ කවුරු වුණත් ඒ අයව හොයා ගන්න ඕනෑ. මහ මොළකරුවන් හොයා ගන්න ඕනෑ. බෝම්බකාර සහරාන් පමණක් නොවෙයි, බෝම්බ ගහනකොට ඒ අයගේ ළඟ හිටපු කට්ටියත් ඇති නේ. ඒගොල්ලන් මෙහෙයවපු කට්ටියත් ඇති නේ. ඒ අයවත් හොයා ගන්න ඕනෑ. මොකද, බුද්ධි අංශ විසින් මේ සියලු තොරතුරු නිසියාකාරව ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි රජයට මතක් කරන්න කැමතියි, අර දෙදෙනාට දඬුවම ලැබුණා කියලා පාස්කු වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වුණේ නැහැ කියන එක හොඳට මතක තියා ගන්න කියන එක. ඒ ප්‍රහාරය සංවිධානය කරපු අයටත්, ඒ බෝම්බකරුවන් එක්ක හිටපු කට්ටියටත් දඬුවම් දීලා එහි වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට කරන්න කියලා ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sunil Watagala?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 91 (ඉ) ස්ථාවර නියෝගය යටතේයි මම point of Order එකක් ගන්නේ. මේ ගරු සභාව තුළ අසත්‍ය ප්‍රකාශ කරන්න බැහැ. මේ ගරු මන්ත්‍රීතුමා ජයකොඩි මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් අභියෝගයක් කළා. *[බාධා කිරීමක්]* ඒ වාගේම අභියෝගයක්,- *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, කොළොන්නාව ආසනය ඇතුළේ ඔප්පු නැති අයට වන්දි හම්බ

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

වෙලා නැහැ කියලා මන්ත්‍රීතුමා දැන් කිව්වා. එහෙම වන්දි හම්බ වෙලා නැති එක නමක් කියන්න. එක නමක් කියන්න, තමුන්නාන්සේ. එක නමක් සභාගත කරන්න. *[බාධා කිරීමක්]* එක නමක් සභාගත කරන්නකෝ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Marikkar, එය සභාගත කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
කොහේවත් නැති බොරු මෙතැනට ඇදගෙන ඇවිල්ලා මොකක්ද මේ කරන විහිළුව? එක නමක් කියන්න. *[බාධා කිරීමක්]* මොකක්ද මේ බොරුව?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are not going for a debate on this.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මේ, බොරු සභාගත කරන මන්ත්‍රීවරයෙක්. එක අභියෝගයක් කරලා ඇන ගත්තා. හෝමාගම පැත්තේ උදාහරණයක් ගෙනැල්ලා ඇන ගත්තා. *[බාධා කිරීම්]*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Hon. Deputy Speaker, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you 30 seconds.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා නීතිඥයෙක් වුණාට නඩු කථා කරපු කෙනෙක් නොවෙයි. මෙතුමාට කියන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ගිහිල්ලා ඒ ගැන ප්‍රාදේශීය ලේකම්ගෙන් අහන්න. ඔබතුමාට මම නම් 7,000ක් කියවන්න ඕනෑ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you are going too far.

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for the lunch break.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Nilanthi Kottahachchi. You have 10 minutes.

[අ.භා. 1.00]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ විවාදයේදී අදහස් දැක්වීමේදී ප්‍රථමයෙන්ම අවධානයට ලක් කරගත යුතු කරුණක් පිළිබඳව කරුණු දැක්වීමක් කළ යුතුයි කියලා මා හිතනවා. ඊයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පක්ෂ මූලස්ථානයේදී පක්ෂයේ මහලේකම්වරයා විසින් සියලු මාධ්‍ය කැඳවා, මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මාධ්‍ය සාකච්ඡාවේදී අදහස් දක්වමින් ඔහු ඉදිරිපත් කළ කරුණු අතර එක් තැනක සඳහන් කරනවා, "අපි වත්මන් පොලිස්පතිතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා දැන්වත් ආණ්ඩුවට සේවය කරන එක නවත්වලා රජයට සහ ජනතාවට සේවය කරන්න පටන් ගන්න කියලා. මොකද අපි කැමති නැහැ, 37වන පොලිස්පතිවරයා වන ඔබතුමා මිනිසුන්ගෙන් ගුටි කාලා මහ පාරේ මැරිච්ච පොලිස්පතිවරයකු හැටියට ඉතිහාසගත වෙනවාට. පොලිස් දෙපාර්තමේන්තුව ඒ තරමට පහත් තැනකට වැටෙනවාට අපි කැමැති නැහැ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මහජනතාවගේ නිදහසට, සාමයට ගරු කරන, එය රැක ගන්න උත්සාහ කරන ජනතාවාදී ආණ්ඩුවක් වන අපි, රටේ ප්‍රධාන දේශපාලන පක්ෂයක මහලේකම්වරයෙකු සියලු මාධ්‍ය කැඳවා ඒ කරපු ප්‍රකාශය හෙළා දකිනවා. ඒක තරයේ හෙළා දකිනවා. ඒ ප්‍රකාශය ඇතුළේ ගැබ් වෙලා තිබෙන සාහසික බව, ම්ලේච්ඡත්වය, තර්ජනය මොකක්ද කියලා මේ රටේ පොදු මහජනතාවට යම් අදහසක් ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම පක්ෂයක මහලේකම්වරයෙකුට රටේ නීතිය හා සාමය ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා පොලිස් බල ඇණියේ නායකයා ගැන මේ විධියට අදහස් දැක්වීමක් කරන්න පුළුවන්ද?

මම අපේ මහජන ආරක්ෂක ඇමතිතුමාගෙනුත් අහන්න කැමැතියි, මේ වාගේ ප්‍රකාශ සම්බන්ධයෙන් නිහඬව ඉන්නවාද කියලා. මේ වාගේ ප්‍රකාශ සම්බන්ධයෙන් අපි යම් පැහැදිලි නීතිමය විමර්ශනයක් කළ යුතුයි. මේ රටේ මහජනතාවට පොලිසිය කෙරෙහි තිබෙන ගෞරවය, විශ්වාසය යම් ආකාරයකින් ගොඩ නැඟෙමින් තිබෙන වෙලාවක, පොලිසියෙන් මේ රටේ මහජනතාවට විය යුතු අවංක, කාර්යක්ෂම සේවාව ලැබෙමින් තිබෙන කාලපරිච්ඡේදයක මේ වාගේ ප්‍රකාශ කිරීම අපි ආණ්ඩුව විධියට තරයේ හෙළා දකිනවා. ඒ වාගේම නීතිය පසිඳලන, නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ස්වාධීනව, අපක්ෂපාතීව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය ඒ සාධාරණ පරිසරය නිර්මාණය කරන ආණ්ඩුවක් විධියට අපි, නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට නීතිය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව අකර්මණ්‍ය කරන, අඩපණ කරන, ඒ ආයතන කෙරෙහි ඇති මහජන විශ්වාසය බිඳ වට්ටන මේ වාගේ ප්‍රකාශ තරයේම හෙළා දකින බව මුලින්ම කියන්න කැමැතියි.

නීතියේ ආධිපත්‍යය කෙලෙසූ සාතන්ගේ දේශය අපි අතීතයේදී දැක්කා. ඒක ගැන අමුතුවෙන් අදහස් දැක්වීම අවශ්‍ය වන්නේ නැහැ. මා හිතන විධියට මේ රටේ මහජනතාවට මතකයි, අධිකරණයෙන් අපරාධ නඩු විභාගයක තීන්දුවක් දෙන්න තිබෙන කොට, ඒ තීන්දුව දෙන්න කලින් කොහොමද ඒ නඩු ඉල්ලා අස් කරගත්තේ කියලා. එහෙම අතීතයක් අපි පහු කළා. තීන්දුවක් දුන්නාම අධිකරණයට ගල් ගහපු ඒ අතීතය පහු කරලා තමයි අපි මේ ජනතාවාදී ආණ්ඩුව හදාගෙන තිබෙන්නේ. අධිකරණ තීන්දුවක් දුන්නාට පස්සේ ඒ අධිකරණ තීන්දුව, අධිකරණයේ ක්‍රියාකාරිත්වය මිලේච්ඡයි කියලා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා පාර්ලිමේන්තුව ඇතුළේ අදහස් දක්වපු ආණ්ඩු පහු කරගෙන ඇවිල්ලා තමයි මිනිස්සු මේ ආණ්ඩුව හැදුවේ. ඒ වාගේම ස්වාධීනව තීන්දුවක් දීපු, විනිශ්චයක් දීපු ගරු විනිශ්චයකාරතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභා ඉදිරියට ගෙන එන්න මේ පාර්ලිමේන්තුව තුළදීම යෝජනා කරපු අතීතයක් හරහා ඇවිල්ලා තමයි අපි අද ස්වාධීන, අපක්ෂපාතී අධිකරණයක්, මේ රටේ මහජනතාවට විශ්වාසය තැබිය හැකි අධිකරණයක් සඳහා අවශ්‍ය වටපිටාව නිර්මාණය කරලා තිබෙන්නේ. අපි කියන්න කැමැතියි, නීතියක හරයාත්මක වෙනසක් වෙනවා නම්, ඒ හරයාත්මක වෙනස ගැන ප්‍රශ්න කරන්න, විවේචනය කරන්න, දැන ගන්න මේ රටේ මහජනතාවට සියයට සියයක අනුල්ලංඝනීය අයිතියක් තිබෙන බව. අපි ඒක පිළිගන්න, ඒ වෙනුවෙන් පෙනී ඉන්න ආණ්ඩුවක්. එතකොට ජනතාවට අපෙන් ප්‍රශ්න කරන්න පුළුවන්, "මොකක්ද මේ කරන්න යන වෙනස?" කියලා. ඒ වාගේම අපි කැමතියි, ජනතාවට ඒ සම්බන්ධ අදහස දෙන්න. තර්ක බුද්ධියෙන් කරන ඒ සාධාරණ විවේචන භාර ගන්න අපි කැමතියි. ඒවාට උත්තර දෙන්න අපි කැමතියි. අපේ ආණ්ඩුවේ පරමාර්ථය බවට පත් වෙලා තිබෙන්නේ ජනතාවගේ අභිලාෂ සංතෘප්ත කරන එක නම්, එහි කාර්යභාරයේ පළමුවැනිම එක මොකක්ද? මේ රටේ මිනිසුන්ට යුක්තිය ඉෂ්ට කරගන්න, අයිතිවාසිකම් කඩ වුණාම ඒ අයිතිවාසිකම් රැක ගන්න, හානියක් වුණාම ඒ හානිය පූරණය කරගන්න යන්න තිබෙන්නේ එකම තැනයි. ඒ තමයි අධිකරණය. ඒ අධිකරණය කාර්යක්ෂම කරන එක, විධිමත් කරන එක, සක්‍රිය කරන එක අපේ ආණ්ඩුවේ වැඩක්. ඒක කරන්නේ අපි මේ අද ඊයෙක ඉඳලා නොවෙයි. ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා දිවුරුම් දීපු 2024 සැප්තැම්බර් 23වැනි දාට පහුව දා ඉඳලා අද මම මේ පාර්ලිමේන්තුවේ කථාව කරන මොහොත දක්වාම ඒ කාර්යභාරය තමයි කරමින් ආවේ. අන්න ඒ අධිකරණය ශක්තිමත් කිරීම, කාර්යක්ෂම කිරීම කියන අඛණ්ඩ ක්‍රියාවලිය ඇතුළේ එක පියවරක්, එක කොටසක් විතරයි විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම කියන කාරණාව. අපි අලුතින් අධිකරණ හැදුවා. හදපු අධිකරණවලට පහසුකම් ටික දුන්නා. අධිකරණ පද්ධතියේ නඩු ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ඩිජිටල්කරණය ආරම්භ කර තිබෙනවා. එතකොට දැන් අධිකරණවල හරි හරියට නඩු ටික ඇහෙනවා. දැන් මිනිසුන්ට විශ්වාසයක් තියලා අධිකරණයකට ගිහිල්ලා ඔවුන්ට දැනෙන ලෙස යුක්තිය සොයා ගන්න පුළුවන් ඒ සමප්‍රවේශී අයිතිය අපි තහවුරු කර තිබෙනවා. ඒ සඳහා අපි කරන්න යන එකම සහ අවසානම දේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කිරීම විතරක් නොවෙයි.

මෙතැනදී අපි මේ රටේ මහජනතාවගේ අවබෝධය හදන්න ඕනෑ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සේවා දීර්ඝය පමණක් නොවෙයි මෙතැනදී කෙරෙන්නේ කියන කාරණය ගැන. පැහැදිලිවම ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 67 දක්වා දීර්ඝ කිරීම, අභියාචනාධිකරණ විනිසුරුවන් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම, මහාධිකරණ විනිසුරුවන් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම, ප්‍රාථමික අධිකරණවල - මහෙස්ත්‍රාත් අධිකරණවල සහ දිස්ත්‍රික් අධිකරණවල - විනිසුරුවන් විශ්‍රාම ගැන්වීමේ වයස වසර දෙකකින් දීර්ඝ කිරීම කෙරෙහි අපි අවධානය යොමු කර තිබෙනවා. ඇයි ඒ? මනුස්සයෙක් කම්කරු අයිතියක් කඩ වෙලා කම්කරු උසාවියකට ගියාම වන්දිය ලැබෙන්නේ අවුරුදු ගණනක් ප්‍රමාද වෙලා නම් ඒ මනුස්සයාට ඉෂ්ට වෙන සාධාරණය මොකක්ද? විශේෂයෙන් රටට එන්න තිබෙන ආයෝජන කම්කරු නඩුවක් අහන කාල ප්‍රමාදය නිසා නැවතිලා තිබෙනවා නම්, රටක් විධියට අපි අත්පත් කර ගන්න ජයග්‍රහණ මොනවාද? 1960දී දාපු බෙදුම් නඩුවක මූලික සාක්ෂි අහන්නේ 2000දී නම්, ඒ නඩුවෙන් යුක්තිය ඉෂ්ට වෙන්නේ, ඒ අයිතිය තහවුරු කර ගන්න වෙන්නේ පරම්පරා ගණනක් මහ පොළොවේ වැළලුණාට පසුව නම් මිනිසුන්ට අධිකරණයේ කාර්යක්ෂමභාවය ගැන තිබෙන විශ්වාසය මොකක්ද? ඒ නිසා මේ රටේ බිම් මට්ටමේ මිනිසුන්ට අධිකරණය පිළිබඳව තිබෙන විශ්වාසය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය කාරණාත් මේ සංශෝධන ඇතුළේ තිබෙනවා.

ඒ වාගේම අභියාචනාධිකරණය ප්‍රාදේශීයව ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි යෝජනා කරලා තිබෙනවා. ප්‍රාදේශීයව තිබෙන සිවිල් අභියාචනාධිකරණවල සහ මහාධිකරණවල බලතල ඉහළ නැංවීම සඳහා මේ වෙද්දි අපි සාකච්ඡා මට්ටමක ඉන්නවා. ඒ නිසා මේක තනි පුද්ගලයෙකු ඉලක්ක කරගෙන කරන්න යන සංශෝධනයක් නොවෙයි. ඒක පැහැදිලිවම මේ රටේ මහජනතාව තේරුම් ගන්න ඕනෑ. එහෙම කිරීමෙන් අපට ආණ්ඩුවක් විධියට බලාපොරොත්තු වෙන්න තිබෙන්නේ මොකක්ද? අපට පටු දේශපාලන අරමුණ නැහැ.

මිනිස්සු මේ ගැන විවේචනය කරනවා; ප්‍රශ්න කරනවා. ඒ ගැන අපට ගැටලුවක් නැහැ. මොකද, මිනිසුන්ට අදහසක් තිබෙනවා, අතීතය ගැන. ජනාධිපතිවරණයට තුන්වතාවක් තරග කරන්න පුළුවන් පුළුවන් කියලා මේ රටේ ව්‍යවස්ථාව සංශෝධනය කළේ කොහොමද කියලා, තනි පුද්ගලයෙකු පාර්ලිමේන්තුවට ගේන්න ව්‍යවස්ථාව සංශෝධනය කළේ කොහොමද කියලා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම සඳහා ව්‍යවස්ථාව සංශෝධනය කළේ කොහොමද කියලා අතීතය මතක නම් මේ රටේ මිනිසුන්ට අදහසක් තිබෙනවා. ඒ නිසා මිනිස්සු මේ ගැන අහනවා. ඒ අහන අයට අපි බොහොම කාරුණිකව කියනවා, විනිශ්චයකාරවරුන් පළපුරුද්ද ලබලා, අත්දැකීම් ලබලා දැනුම අරගෙන, ඒ පරිචයෙන් මේ රටේ මහජනතාවට සාධාරණ විනිශ්චයක් ලබා දීමට කටයුතු කරලා, විශ්‍රාම ගියාට පස්සේ එතුමන්ලාගේ සේවය බැංකු සභාපතිවරු විධියට, වෙනත් ආයතනවලට ලබා දෙන බව. ඒ සේවය තව අවුරුදු දෙකක් මේ රටේ අධිකරණ පද්ධතියටම දෙන්න බැරි ඇයි? එහි අවසාන ප්‍රතිඵලය ලැබෙන්නෙත් මේ රටේ මහජනතාවටම තමයි. ඒ අර්ථයෙන් බලලා මේ සංශෝධනයට සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම විතරයි අපි මේ රටේ විපක්ෂයෙන් කරන්නේ. විපක්ෂය බුද්ධිමත් නම්, මේ කාරණාව බුද්ධිමත්ව ගන්න.

ඒ වාගේම මේ ගැන සාකච්ඡා කෙරෙන පළමුවැනි අවස්ථාවත් මේක නොවෙයි. 2016 වසරේදී ජනාධිපති නීතිඥ ජෙෆ්රි අලගරත්නම් මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා ලෙස හිටපු කාලයේදීත් මේ වාගේම ක්‍රියාන්විතයක් සිද්ධ වුණා. එදා ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා අධිකරණ කටයුතු පිළිබඳ අනුකමිටුවේ සභාපතිත්වය දැරුවා ඔබතුමන්ලාටත් මතක ඇති. එහි නිර්දේශවලත් පැහැදිලිව කියා තිබෙනවා, විනිශ්චයකාරවරුන් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කළ යුතුයි කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Nilanthi Kottahachchi, your time is up.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

මට තව මිනිත්තුවක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කරුණ කියලා මම කථාව අවසන් කරන්නම්.

ඒ වාගේම, ප්‍රාථමික අධිකරණවල සේවය කරන ගරු විනිශ්චයකාරතුමන්ලාගේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා, උපදෙස් ලබා දීම සඳහා ඇතැම් උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් යෙදවීම සුදුසුයි කියලා 2016 වසරේ එම පාර්ලිමේන්තු අනුකමිටුවේදී නිර්දේශ වුණා. අන්න ඒ විනිශ්චයකාරවරුන්ගේ සේවා දීර්ඝය වසර 70ක් දක්වා ගත්තාට කමක් නැහැ කියලාත් නිර්දේශ වෙලා තිබෙනවා. එතකොට එහෙම යෝජනාවක් එවකට පැවැති කාල වකවානුවේ මහජන අවශ්‍යතාව මත ඉදිරිපත් වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා මේ සංශෝධනය ගැන සාධනීයව බලන්න. මේකේ අවසන් ප්‍රතිඵලය ලැබෙන්නේත් මේ රටේ මහ ජනතාවටම තමයි. අපි නීතිගරුක, යුක්තිය ගැන මිනිසුන්ට විශ්වාසයක් තබන්න පුළුවන් රටක් හදලා තිබෙනවා. ඒ රට තවත් ඉදිරියට අරගෙන යනවාද, නැද්ද කියන එක තීරණය කිරීමේ අයිතිය රටේ මහ ජනතාවට තියලා, බුද්ධිමත්ව තීන්දු තීරණ ගන්න තිබෙන අයිතිවාසිකම අපි ජනතාවට භාර දීලා තිබෙනවා. විපක්ෂයේ දේශපාලන උගුල් ඇටවීම් ගැන බොහොම බුද්ධිමත්ව කටයුතු කරන්න කියාත් ඉල්ලමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have seven minutes.

[பி.ப. 1.11]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று முன்வைக்கப்பட்டுள்ள இரண்டு முதன்மையான பொருண்மைகள் தொடர்பான எனது கருத்துகளை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன். முதலாவது, தேசிய பாதீட்டுத் திணைக்களத்தால் முன்வைக்கப்பட்டுள்ள 2026ஆம் ஆண்டின் 03ஆம் எண்கொண்ட குறைநிரப்பு மதிப்பீடு. இரண்டாவது, நாடாளுமன்ற ஒழுங்குப் புத்தகத்தின் 4(3)ஆம் சேர்ப்பு அட்டவணையில் விவரிக்கப்பட்டுள்ள அரசியல மைப்பின் கீழான தீர்மானம். இறையாண்மையுள்ள மக்கள் பிரதிநிதிகள் என்ற வகையில், அரசியலமைப்பின் 148ஆம் உறுப்புரையின்கீழ், பொது நிதியின் முழுமையான கட்டுப் பாடும் மேலாண்மையும் எமது பொறுப்பாகும். பொதுப் பணம் என்பது நாட்டு மக்களது சொத்து! எனவே, நிறைவேற்றுத் துறையானது குறைநிரப்பு முன்மொழிவுகளையோ அல்லது அரசியலமைப்புத் தீர்மானங்களையோ கோரி இந்தச் சபையின் முன் வரும்போதெல்லாம், அந்தக் கோரிக்கைகளை நாம் கட்சி சார்பற்ற முறையில் நுண்ணிய மேற்பார்வையோடு ஆய்வுசெய்ய வேண்டும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, முதலில் 2026ஆம் ஆண்டு யூலை மாதம் 24ஆம் நாள் முன்வைக்கப்பட்ட, 2026ஆம் ஆண்டின் 03ஆம் எண்கொண்ட 520 பில்லியன் ரூபாய் குறைநிரப்பு மதிப்பீட்டைப் பார்ப்போம். குறைநிரப்பு மதிப்பீடு என்பது, பொது நிதி நிருவாகத்தின் நிறுவப்பட்ட ஒரு பகுதியாகும். எந்தவொரு பாதீட்டுத் திட்டமும் அனைத்து சாத்தியக்கூறுகளையும் முன்னரே கணிக்க முடியாது. எதிர்பாராத அரச கடப்பாடுகள், பேரிடர் சார்ந்த செலவுகள், இன்றியமையாச் சேவைத் தொடர்ச்சிகள் மற்றும் ஒப்பந்தக் கடன்களைச் சரிசெய்தல்கள் ஆகியன பெரும்பாலும் நிதி ஆண்டின் இடையில் குறைநிரப்பு ஒதுக்கீடுகளைக் கோரவைக்கின்றன.

தேசிய பாதீட்டுத் திணைக்களம் இந்த நிறுவனக் கோரிக்கைகளை மதிப்பீடு செய்வதில் ஒரு முதன்மையான நிருவாகப் பணியைச் செய்கிறது. இருப்பினும், குறைநிரப்பு நிதிக்கு எமது ஒப்புதலை வழங்குவது என்ற அடிப்படையில், நிறைவேற்றுத் துறையின் விருப்பத்துக்கு அமைய நாம் வெறும் இறப்பர் முத்திரைகளாக இருக்க முடியாது. நிதி ஒழுக்கத்தை நடைமுறைப்படுத்தவும், பாதுகாப்பற்ற அரச செலவு நடைமுறைக்கு முடிவுகட்டவும் இந்த நாடாளுமன்றத்தால் இயற்றப்பட்ட 2024ஆம் ஆண்டின் 44ஆம் எண்கொண்ட பொது நிதி மேலாண்மைச் சட்டத்தின்கீழ் அமைக்கப்பட்ட சட்ட அடிப்படையிலான அளவுகோல்களுக்கு அமைய இந்த மதிப்பீட்டை நாம் ஆராய வேண்டும். இந்தச் சூழலில், 2026ஆம் ஆண்டின் 03ஆம் எண்கொண்ட குறைநிரப்பு மதிப்பீடு, நிதி நடுநிலைமையைப் பேணுகிறதா? இந்தக் குறைநிரப்பு நிதியைப் பெறும் திணைக்களங்களுக்கு உள்ளேயே சரிபார்க்கப்பட்ட சேமிப்புகளால் ஈடுசெய்யப் படுகின்றனவா? அல்லது அவை நிதிப் பற்றாக்குறையை விரிவுபடுத்தி எமது பொருண்மிய நிலைப்படுத்தல் இலக்குகளைப் பாதிக்குமா? என்பதை நாம் ஆராய்ந்து பார்க்க வேண்டும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றியமையா பொதுத்துறைத் தேவைகள் மற்றும் பேரிடர் உதவிகள் தாமதமின்றி நிறைவு செய்யப்பட வேண்டும் என்றாலும், குறைநிரப்பு ஒதுக்கீடுகள் தேவையற்ற நிருவாகக் குறைநிரப்புச் செலவுகளுக்கு நிதியளிக்கக் கூடாது என்பதில் நாடாளுமன்றம் உறுதியாக இருக்க வேண்டும். இந்த மதிப்பீட்டின்கீழ் ஒதுக்கப்படும் ஒவ்வொரு ரூபாயும் திறமை யாகவும் வெளிப்படையாகவும் சட்ட வரம்புகளுக்கு உட்பட்டும் பயன்படுத்தப்படுவதை தேசிய பாதீட்டுத் திணைக்களம் உறுதி செய்ய வேண்டும். அரசியலமைப்பின் கீழான தீர்மானமானது, எம்முன்னே உள்ள இரண்டாவது பொருண்மையாகும். இது எமது ஆளுமையின் கட்டமைப்பு அமைப்பைத் தொடும் ஒரு விடயத்தைக் கையாள்கிறது.

அரசியலமைப்பின் 46ஆம் உறுப்புரையின்கீழ் நிறைவேற்று வரம்புகளைக் கட்டுப்படுத்தும் முடிவாக இருந்தாலும் சரி, 108 மற்றும் 148ஆம் உறுப்புரைகளின்கீழ் நீதித்துறை மற்றும் அரசியலமைப்பு அடிப்படையிலான ஊதியங்களை ஆளுமை செய்யும் முடிவுகளாக இருந்தாலும் சரி, அரசியலமைப்புத் தீர்மானங்களுக்குச் சமமான சட்டவாக்க விழிப்புணர்வு எமக்குத் தேவைப்படுகிறது. நாட்டில் அரசியலமைப்பு அதிகாரத்தைப் பயன்படுத்தும்பொழுது, நாடாளுமன்றமானது நிறுவனப் பேண்தகைமை மற்றும் நிதிப் பொறுப்புடைமை ஆகிய இரண்டு வழிகாட்டும் கோட்பாடு களையும் பேண வேண்டும்.

ஒரு முடிவானது, நிறைவேற்று நியமனங்கள் அல்லது நிருவாகக் கட்டமைப்புகளைப் பற்றியதாக இருந்தால், அது திறமையான மற்றும் செலவு குறைந்த அரசு அமைப்பின் பொது எதிர்பார்ப்புகளோடு உறுதியாகச் சீரமைக்கப்பட

வேண்டும். மாறாக, ஒரு முடிவானது நீதித்துறை அல்லது அரசியலமைப்பு ஆணைக்குழுக்களின் சம்பளம் மற்றும் நிதிச் சுதந்திரத்தைப் பாதுகாக்குமானால், சட்டத்தின் ஆட்சியைப் பேண, இந்த அவையானது அந்த விதிகளுக்கு ஆதரவாக நிற்க வேண்டும். நிறுவனப் பேண்தகைமை ஒருபொழுதும் தளர் வடையக் கூடாது. அதேநேரம், அரச ஆளுமைச் செலவுகள் எல்லையின்றி விரிவடைய ஒப்புதல் அளிக்கவும் கூடாது. பொருண்மிய ஆய்வாளர்களும் பொது நிதி வல்லுநர்களும் ஆண்டின் இடையில் குறைநிரப்பு மதிப்பீடுகளைத் திரும்பத் திரும்பச் சார்ந்திருப்பது குறித்து கவலை தெரிவிக்கின்றனர். அவர்களது முதன்மையான கவலையானது, நிதிச்சரிவு இடரை நடுவணாகக் கொண்டுள்ளது.

வாகனக் கொள்வனவு, அரசுமுறை இல்லங்களை மறுசீரமைத்தல் அல்லது விரிவாக்கப்பட்ட அமைச்சுப் படிகள் முதலிய செலவுகளுக்காக குறைநிரப்பு ஒதுக்கீடுகள் வழங்கப்படும்பொழுது, அவை மூலதன முதலீடுகளுக்குப் பதிலாக அரசின் வருவாயை நெருக்கடிக்குள்ளாக்கி, பன்னாட்டு நிலைப்படுத்தல் திட்டங்களின்கீழ் அமைக்கப் பெற்ற இலக்குகளைப் பாதிக்கின்றன. மேலும், பொதுத்துறையில் திட்டமிடப்படாத பணப்புழக்கத்தைச் செலுத்துவது இலங்கை மத்திய வங்கியின் பணவியல் கொள்கைச் செயலாக்கத்தைச் சிக்கலாக்கும். குறைநிரப்பு ஒதுக்கீடுகளுக்கு நிதியளிக்கத் தேவைப்படும் கூடுதல் கடன்கள், தனியார் துறைக்கான கடன் வாய்ப்புகளைக் குறைத்து, உள்நாட்டு வட்டி விகிதங்களில் அழுத்தத்தை ஏற்படுத்தி, பரந்த பொருண்மிய மீட்சி முயற்சிகளைப் பாதிக்கும் பணவீக்க அழுத்தங்களை உருவாக்கக் கூடும்.

திட்டமிடப்பட்ட விவாத நாட்களுக்குச் சற்று முன்னர் ஒழுங்குப் புத்தகத்தின் சேர்ப்பு அட்டவணைகளில் முதன்மையான நிதி முன்மொழிவுகளை வைக்கும் நடைமுறை கவலை அளிக்கும் விடயமாகும். இது நாடாளுமன்ற உறுப்பினர்கள் விரிவான ஆய்வை மேற்கொள்வதற்குக் கிடைக்கும் நேரத்தைக் குறைக்கின்றது. சுருக்கப்பட்ட விவாத வடிவங்கள் சிக்கலான நிதியியல் கண்காணிப்பை மேற்கொள்ளத் தேவையான ஆழமான சட்டவாக்க ஆய்வுக்கு மாறாகச் சுருக்கமான அரசியல் உரைகளாகக் குறைப்பதாக விமர்சகர்கள் வாதிடுகின்றனர். சுருக்கப்பட்ட பேச்சு நேர வரம்புகளுக்குள், சேர்ப்பு அட்டவணைப் பதிவுகள்மூலம் சிக்கலான குறைநிரப்பு மதிப்பீடுகளையும் அரசியலமைப்புத் தீர்மானங்களையும் விவாதத்துக்கு அட்டவணைப்படுத்துவது நுணுக்கமான ஆய்வைச் செய்யும் திறனைத் தடுக்கிறது. மேலும், 46(4)ஆம் உறுப்புரையின்கீழ் குறைநிரப்பு மதிப் பீடுகள் அல்லது அரசியலமைப்புத் தீர்மானங்கள் நிருவாகப் பதவிகளை விரிவுபடுத்துவதற்கு அல்லது விருப்புரிமைசார் தேவைகளுக்குப் பயன்படுத்தப்படலாம் என்ற கவலைகளும் தெரிவிக்கப்படுகின்றன. இது பொதுத்துறை சிக்கனக் கோட்பாடுகளைப் பாதிக்கக் கூடும்.

நாடாளுமன்றம் மேற்பார்வையை வலுப்படுத்தவும், அரசின் நிதி ஆளுமையில் பொதுமக்களின் நம்பிக்கையைப் பேணவும் பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்கின்றேன்.

முதலாவதாக, அனைத்து குறைநிரப்பு மதிப்பீடுகளும் அரசியலமைப்புத் தீர்மானங்களும் விவாதத்துக்கு எடுக்கப் படுவதற்கு குறைந்தபட்சம் 14 நாட்களுக்கு முன்னர், விரிவான நிதியியல் அறிக்கைகளோடு அரசாங்க நிதி பற்றிய குழுவுக்கும் நாடாளுமன்ற உறுப்பினர்களுக்கும் வழங்கப்பட வேண்டு மென நிலையியற் கட்டளைகள் திருத்தப்பட வேண்டும். இரண்டாவதாக, தேசிய பாதீட்டுத் திணைக்களமானது, ஒவ்வொரு குறைநிரப்புக் கோரிக்கையோடும் சரியான ஈடுசெய்யும் சேமிப்புகளை அடையாளம் காட்டும் நிதி நடுநிலைமை அறிக்கையை இணைக்க வேண்டும். மூன்றாவதாக, நாடாளுமன்ற வாக்கெடுப்புக்கு முன்னதாக, ஒவ்வோர் இடைக்கால நிதித் தீர்மானம் குறித்தும், தேசிய கடன் போக்குகள் மற்றும் பணவீக்கத்தின் மீதான அதன் தாக்கத்தை மாதிரியாகக்கொண்ட ஒரு சுதந்திரமான, பக்கச்சார்பற்ற பொருண்மிய மதிப்பீட்டை வெளியிடும் பொறுப்பை நாடாளுமன்ற பாதீட்டு அலுவலகத்திடம் ஒப்படைக்க வேண்டும். நான்காவதாக, ஒப்புதல் அளிக்கப் பட்ட குறைநிரப்பு ஒதுக்கீடுகளின் வழங்கல் மற்றும் செயற்றிறனைக் கண்காணிக்க, பொதுமக்கள் அணுக்கக்கூடிய வெளிப்படைத்தன்மையை உறுதிசெய்யும் மற்றும் தலைமை தணிக்கையாளரால் ஒரேநேரத்தில் தணிக்கை செய்ய வழிவகை செய்யும் ஒரு நிகழ்நேர எண்மிய கண்காணிப்பு வலைத்தளத்தை நிதி அமைச்சு நிறுவ வேண்டும்.

பொது நலனுக்கு உண்மையாகச் சேவை செய்யும் மற்றும் இன்றியமையாத அரசாங்கச் செயற்பாடுகளைப் பேணக்கூடிய தேவையான குறைநிரப்பு முன்மொழிவுகளுக்கு ஒப்புதல் அளிப்போம். நிதி ஒழுக்கம், வெளிப்படைத்தன்மை மற்றும் அரசியலமைப்புக் கடமை ஆகியவற்றின் கொள்கைகளுக்கு நிறைவேற்றுத் துறையைப் பொறுப்புக்கூறலுக்கு உட்படுத்து வோமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Upali Pannilage. You have 13 minutes.

[අ.භා. 1.18]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විවාදයට ගනු ලබන පරිපූරක මුදල සම්බන්ධයෙන් සහ එහි තාක්ෂණික කාරණා සම්බන්ධයෙන් මට කලින් අදහස් දැක් වූ ගරු මන්ත්‍රීතුමා යම් කරුණු කිහිපයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා සඳහන් කරන්න අවශ්‍යයි මේ පරිපූරක ඇස්තමේන්තුව අපි රජය විධියට ඉදිරිපත් කරලා තිබෙන්නේ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලවයි කියන එක. ඒ වාගේම, අප විසින් 2025 වර්ෂයේදී 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අය වැය ලේඛනයත්, ඉන් අනතුරුව "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව රුපියල් බිලියන 500ක් සපයා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ පරිපූරක ඇස්තමේන්තුවත් කියන මූලික සංකල්ප රාමුව ඇතුළේ තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ මේ පරිපූරක ඇස්තමේන්තුව සඳහා මුලින් රුපියල් බිලියන 100ක ප්‍රතිපාදන සපයා ගැනීමට අපි අපේක්ෂා කළ බව. නමුත්, මේ වන කොට අපේ අවශ්‍යතාව ආසන්න වශයෙන් රුපියල් බිලියන 71.7ක සීමාවට ඇවිල්ලා තිබෙනවා. මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් කිසිම ආකාරයකින් නැවත ණය ගැනීමක් හෝ අය වැය පියවා ගැනීමේ ගැටලුවක් ඇති වෙන්නේ නැහැ කියන එක මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍යයි.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මෙවැනි පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන සපයා ගැනීමට අවශ්‍ය වුණේ කුමන කරුණක් නිසා ද කියන එකත් අපි මේ රටේ ජනතාවගේ විශේෂ අවධානයට ලක් කරවන්න ඕනෑ.

මේ වර්ෂයේ පෙබරවාරි මාසයේ 28වන දා මැද පෙරදිග යුද තත්ත්වයක් ආරම්භ වුණා. ඒ යුද තත්ත්වය හේතුවෙන් මුළු ලෝකයේම ඉන්ධන සැපයුමට දැඩි බලපෑමක් එල්ල වුණා. ඒ හේතුවෙන් බලශක්තිය සැපයීමේ ගැටලු වාගේම ඉන්ධන ආශ්‍රිත නිෂ්පාදනවල මිල ශීඝ්‍රයෙන් ඉහළ යන්නත් පටන් ගත්තා. ඒ මිල ඉහළ යෑම ලෝකයේ සෑම රටකටම වාගේ අඩු වැඩි වශයෙන් බලපාන්න වුණා. ගෝලීය වශයෙන් ඇති වූ ඒ තත්ත්වය ලංකාවටත් යම් ආකාරයකින් බලපෑවා. අපේ රටේ ජන ජීවිතයට එයින් වන බලපෑම අවම කර ගැනීම සඳහා සහන සැලසීම වගකිව යුතු රජයක් විධියට අපට අවශ්‍ය වුණා. ඒ නිසා තමයි මැද පෙරදිග අර්බුදයෙන් පීඩාවට පත් වන ජනතාවට සහන සැලසීම සඳහා අද අපි විවාදයට ගන්නා මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන ලබා දීමට ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලෝකයේ ඕනෑම තැනක ඇති වන යම් අර්බුදයක්, යම් ව්‍යසනයක් ගෝලීයකරණය හමුවේ ඕනෑම සමාජයකට බලපාන්න පුළුවන් බව අපි දන්නවා. විශේෂයෙන්ම ඉන්ධන ගත්තොත්, අපට අවශ්‍ය ඉන්ධන සම්පූර්ණයෙන්ම සපයා ගැනීම සඳහා අපි වෙනත් රටවල් මත යැපෙන තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා ලෝකයේ ඉන්ධන ක්ෂේත්‍රයේ ඇති වන කුමන හෝ බලපෑමක් අපේ සමාජයටත් බලපානවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි තත්ත්වයකදී රටේ ජනතාව සංක්‍රාන්තික දිළිඳුබවට - transient poverty තත්ත්වයට - ඇද වැටෙනවා. ජනතාවට ඇතිවන ඒ බලපෑම අවම කිරීම සඳහා තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් අපි අරමුදල් සපයා ගැනීමට උත්සාහ කරන්නේ. ඒ වෙනුවෙන් තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

මෙහිදී අපි ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර පහක් ඔස්සේ මේ රටේ ජනතාවට සහන සැලසීම සඳහා කටයුතු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ යෑමත් සමඟ අපේ රටට ඉන්ධන ලබා ගැනීමේ බරපතළ අර්බුදයක් තිබුණා. නමුත් අපට අවශ්‍ය වුණා, අඛණ්ඩව ඉන්ධන සපයන අතරතුර, සාධාරණ මිලකට ජනතාවට ඉන්ධන ලබා දීමට. ඒ නිසා මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් ලබා ගන්නා මුදලින් විශාල ප්‍රමාණයක් - රුපියල් බිලියන 52කට ආසන්න ප්‍රමාණයක් - අපි වැය කළේ ඉහළ ගිය ඉන්ධන මිල පාලනය කර ජනතාවට සහන ලබා දෙන්නයි. ඒ අනුව තමයි ජනතාවට ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහනාධාරයකුත්, පෙට්‍රල් ලීටරයකට රුපියල් 20ක සහනාධාරයකුත් ලබා දීලා ඒ වෙනුවෙන් රුපියල් බිලියන 52.8ක් වැය කරලා ඉන්ධන මිල ඉහළ යෑමෙන් ජන ජීවිතයට ඇති වන බලපෑම අවම කර ගැනීමට අපි කටයුතු කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක ඉතා වැදගත්. මොකද, ඉන්ධන මිල ඉහළ යෑමත් එක්ක රටේ භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යනවා. ඒක ජීවන වියදමට බලපානවා. අන්න ඒ වාගේ අවස්ථාවකදී වග කිවයුතු රජයක් විධියට ඒ බලපෑමට ලක් වන ජනතාවට සහන සැලසීම අත්‍යවශ්‍ය වෙනවා. පළමුව, අපි මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් සපයා ගන්නට අපේක්ෂා කළ බිලියන 100න්, බිලියන 52.8ක්ම වැය කර තිබෙන්නේ ඉන්ධන සහනාධාරය වෙනුවෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දෙවනුව, ඉන්ධන ආශ්‍රයෙන්ම ඉහළ යන ජනතාවගේ විදුලි ගාස්තුවට සහන ලබා දීමට මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් සපයා ගන්නා අරමුදල් අපි භාවිත කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දළ වශයෙන් ගත්තොත්, අපේ රටේ විදුලි පාරිභෝගිකයන් ඉන්නවා, ලක්ෂ 72ක් විතර; 7,184,604ක් ඉන්නවා. මේ අයගෙන් සියයට 80කට, සියයට 85කට ආසන්න පාරිභෝගිකයන් පිරිසක් මාසිකව විදුලි ඒකක 180ට වඩා අඩුවෙන් තමයි පාවිච්චි කරන්නේ. මේ අයගේ විදුලි බිල ඉහළ යෑම පාලනය කිරීම සඳහා, - විශේෂයෙන්ම ඔවුන්ගේ විදුලි බිල එක ශතයකින්වත් වැඩි කරන්නේ නැතිව - මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් ලබා ගන්නා මුදල් භාවිත කළා. ඒ මඟින් ජනතාවගේ ජීවිතයට ඇති වෙන ඒ ආර්ථික තෙරපුම, ඒ බලපෑම අවම කිරීම සඳහා අපි කටයුතු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම ඒ ඔස්සේ අපේ රටේ පවුල් ලක්ෂ 62කට පමණ සහන ලබා දීමට අපට හැකියාවක් ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි වැදගත් කාරණය මේකයි. මැද පෙරදිග ඇති වුණු අර්බුදය අපේ රටේ සාමාන්‍ය ජන ජීවිතයටත් බලපාන්න පටන්ගත්තා. ඒ නිසා විශේෂයෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ - වී ගොවිතැන වෙන්න පුළුවන්, අනෙකුත් ප්‍රධාන ගොවිතැන් වෙන්න පුළුවන්, ඒ වාගේම අතුරු භෝග වෙන්න පුළුවන් - නියැළෙන ජනතාවට තාවකාලික සහනයක් අවශ්‍ය වුණා, ජීවන වියදම පාලනය කර ගැනීම සඳහා. ඒ නිසා අපි විශේෂයෙන්ම ඒ ගැන කල්පනා කරලා පසුගිය යල කන්නයේදී වී ඇතුළු ප්‍රධාන භෝග සඳහා හෙක්ටෙයාරයකට ලබා දෙන පොහොර සහනාධාරය වැඩි කළා. අපි බලයට එනකොට රුපියල් 15,000යි සහනාධාරය හැටියට තිබුණේ. අපි එය රුපියල් 25,000ක් කළා. මැද පෙරදිග අර්බුදය නිසා, ඒ ඇති වෙච්ච තත්ත්වය පාලනය කිරීම සඳහා තවත් රුපියල් 5,000ක් වැඩි කරලා, හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක පොහොර සහනාධාරයක් ලබා දීම සඳහා මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් වෙන් කළ මුදල් අපි භාවිත කළා. ඒ වාගේම, අනෙකුත් භෝග සඳහා රුපියල් 18,000ක සහනාධාරයක් ලබා දීමට තමයි අපි මේ මුදල් භාවිත කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ඔස්සේ අපට පුළුවන් වුණා ගොවිතැනින් ජීවත් වන අපේ රටේ සියයට 24ක ප්‍රමාණයකට මේ මැද පෙරදිග ආර්ථික අර්බුදයෙන් ඇති වන බලපෑම අවම කර ගැනීම සඳහා සහන සැලසීමට. එක පැත්තකින් අපේ රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය තුළින් වාගේම, අනෙක් පැත්තෙන් අපේ රටේ සැලකිය යුතු ජනතාවක් ධීවර ක්ෂේත්‍රයේ වක්‍ර සහ ඍජු රැකියාවල නිරත වෙමින් ජීවත් වෙනවා. අන්න ඒ ධීවර ජනතාවටත් සහන අවශ්‍ය වුණා. ඒ නිසා කුඩා බෝට්ටු හිමි ධීවරයන්ට කලින් දුන්නු රුපියල් 100 සහ රුපියල් 20 ඉන්ධන සහනාධාරයට අමතරව, සෑම ඉන්ධන ලීටරයකටම රුපියල් 50ක අමතර සහනාධාරයක් මේ මැද පෙරදිග අර්බුදය නිසා ඇති වෙච්ච තත්ත්වය සමනය කිරීම සඳහා අපි ලබා දුන්නා. ඒ කුඩා ධීවර බෝට්ටු හිමි අයට ලීටරයකට රුපියල් 50ක ඉන්ධන සහනාධාරයක් ලබා දුන්නා වාගේම, බහුදින ධීවර යාත්‍රා සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන රුපියල් 150,000ක සහනාධාරයක් ලබා දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ විධියට කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නිරත වන අයට, විදුලිය පරිභෝජනය කරන අයට, සමස්තයක් වශයෙන් ඉන්ධන පරිභෝජනය කරන අයට වාගේම, ධීවර කර්මාන්තයේ නිරත වන අයටත් සහන ලබා දීම සඳහා තමයි අපි මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් වෙන් කර ගන්නා ප්‍රතිපාදන භාවිත කරනු ලැබුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පස්වැනි කාරණයත් ඉතා වැදගත්. මෙවැනි අර්බුදයක් ඇති වුණාට පස්සේ සාමාන්‍යයෙන් සමාජයේ පහළම ආදායම් කාණ්ඩයේ ඉන්න අය තමයි විශාල වශයෙන් බලපෑමට ලක් වන්නේ. ඒ නිසා අපි කල්පනා කළා, ඒ වෙනකොටත් අපේ රටේ අස්වැසුම සහනාධාරය ලබන පවුල්වලට යම් සහනාධාරයක් ලබා දෙන්න ඕනෑ කියලා. විශේෂයෙන්ම ඒ

වෙනකොට සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය පැමිණෙමින් තිබුණා. ඒ නිසා අප්‍රේල් මාසයට පමණක් බලපාන පරිදි අපි අස්වැසුම ප්‍රතිලාභීන්ගේ ඒ ජීවනාධාර මුදල ඉහළ දැමීම සඳහා මේ මුදල් භාවිත කළා. ඒ ඔස්සේ අස්වැසුම ප්‍රතිලාභ ලබන අන්ත දිළිඳු කියන කාණ්ඩයට අයත් පවුල් 434,520කට, ඒ වෙනකොට ලබා දීලා තිබුණු රුපියල් 17,500ක මුදල රුපියල් 25,000ක් දක්වා ඉහළ දාලා අමතර රුපියල් 7,500ක දීමනාවකුත් ඒ පවුල්වලට ලබා දුන්නා. ඒ වාගේම, දුප්පත් කාණ්ඩයේ පවුල් 887,930කින් එක පවුලකට අපි සාමාන්‍යයෙන් ලබා දෙන්නේ මාසයකට රුපියල් 10,000යි. ඒ අයට රුපියල් 15,000ක් අප්‍රේල් මාසයේ ලබා දුන්නා. අමතර රුපියල් 5,000ක් ලබා දීලා අපි ඒ කණ්ඩායමටත් යම් සහනයක් ලබා දුන්නා. ඒ වාගේම ආන්තික කණ්ඩායම ලෙස හඳුන්වන, මාසිකව රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන අයට අමතර රුපියල් 2,500ක් දීලා ඒ අයගේ ජීවනාධාර මුදල රුපියල් 7,500කින් වැඩි කළා.

මේ සමාජයේ ජීවනාධාර ලබන අන්ත දිළිඳු, දිළිඳු හා ආන්තික සමාජ කණ්ඩායම සමස්තයක් වශයෙන් ගත්තාම පවුල් 1,777,753ක්. ඒ සියලුදෙනාට අපි මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් ලබාගත් මුදල්වලින් අස්වැසුම සහනාධාරය ලබා දීමට කටයුතු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් වශයෙන් ගත්තාට පස්සේ මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන වෙන් කිරීමට අපි තීරණය කළේ, ලෝකයේ ගෝලීය වශයෙන් ඇති වෙච්ච අර්බුදයක් අපේ රටේ සමාජයට බලපාන්නේ මොන ආකාරයටද කියන එක අවබෝධ කරගෙන, ඒ ඔස්සේ සාමාන්‍ය ජනතාවගේ ජීවිතයට ඇති වන බලපෑම අවම කිරීම සඳහායි. ධීවර ක්ෂේත්‍රයේ අය වෙන්න පුළුවන්, කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ අය වෙන්න පුළුවන්, විදුලි පාරිභෝගිකයන් වෙන්න පුළුවන්, දිළිඳු සහන ලබා ගන්නා අය වෙන්න පුළුවන්, මේ අයට සමස්තයක් වශයෙන් සහන සැලසීම සඳහා තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් අපි අරමුදල් සපයා ගනු ලැබුවේ. අපි අය වැයෙන් සැලසුම් කළාට වඩා අමතර වියදමකින් තොරව, අමතර ණය ලබා ගැනීමකින් තොරව මේ අරමුදල් සපයා ගැනීම හරහා ජනතාවට මේ සහන සපයා තිබෙනවා. ඉතා කාර්යක්ෂම ලෙස රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරලා, කැබිනට් මණ්ඩලයේදී සැලකිය යුතු මට්ටමකට මේවා ගැන සාකච්ඡා කරලා, ඒ සඳහා අවශ්‍ය අනුකම්ටු පිහිටුවලා ඒ ඔස්සේ ලබා ගත්ත තොරතුරු අනුව තමයි අපි මේ කටයුතු දිගින් දිගටම කරගෙන යන්නේ.

අද දින අපි සම්මත කර ගැනීමට අපේක්ෂා කරන මේ පරිපූරක ඇස්තමේන්තුව, මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවිතයට ඇති වන බලපෑම පාලනය කිරීම සඳහා මාස තුනක සහන පැකේජයක් වශයෙන් භාවිත කර තිබෙන බව අවසාන වශයෙන් මා කියන්න ඕනෑ. ජීවන වියදම ඉහළ යෑම, උද්ධමනය ඉහළ යෑම ඒ ඔස්සේ යම් කිසි මට්ටමකට පාලනය කරගෙන තිබෙනවාය කියන කාරණයත් සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.31]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගන්නේ, මේ රටේ ජනතාවට සහන ලබා දීම සඳහා බව අපි දන්නවා. ආණ්ඩුව නියෝජනය කරමින් මුලින්ම මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරද්දී ඉන්ධන සහනාධාරය ලබා දීම ගැන කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා මේ රජය බලයට පත් වෙන්න ඉස්සර වෙලා ජනතාවට ඉන්ධන ලබා දෙනවාය කියපු ක්‍රමය පාවිච්චි කළා නම් හොඳයි කියලා අපි ආණ්ඩුවට මතක් කරන්න කැමැතියි. එදා වේදිකාවක් වේදිකාවක් ගාණේ කිව්වේ මොකක්ද? ඉන්ධන ගෙනෙනකොට එදා හිටපු අමාත්‍යවරයා එක ලීටරයකින් රුපියල් 165ක් ගහනවා කියලා කිව්වා. ඒ වාගේම වරායෙන් ගොඩ බාන ගණනට ඉන්ධන ටික දෙනවා කිව්වා. ඉතින් රටේ ජනතාව හිතුවා, "ඉන්න ඇමතියා ගහනවා, ඒක නවත්වා ගන්න මාලිමා ආණ්ඩුව ගෙනෙනවා" කියලා. එහෙම කියලා ගෙනාවා මේ ආණ්ඩුව. දැන් අවුරුදු දෙකකට ආසන්නයි. දැන් මේ පරිපූරක ඇස්තමේන්තු දමන්නේ මොකටද? අර ඇමතියා ගහපු 165ත් බේරාගෙන, වරායෙන් බාන මිලට තෙල් ටික දුන්නා නම් මේ පරිපූරක ඕනෑ නැහැ. ඉතින් ඒ කියපු විධියටද වුණේ?

ඊළඟට, විදුලි බිලට මොකද වුණේ? විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කිව්වා. තුනෙන් එකක් අඩු කරනවා කිව්වා. එහෙමයි එදා පොරොන්දු වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පොරොන්දු වෙච්ච දේ තමයි රට වැසියා බලාපොරොත්තු වෙන්නේ. ඒවා ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් ලිඛිතව පොරොන්දු වුණා. වාචිකව, වේදිකා ගාණේ කිව්වා. ඒ ටික කරන්න කියන එක තමයි විපක්ෂය හැටියට අද අපි කියන්නේ. අපි එදා ආණ්ඩුව කරපු අය නේ. වරද්දා ගත්තා නේ අපි. වැරදිච්ච නිසා නේ තමුන්නාන්සේලාට ආණ්ඩුව දුන්නේ. දැන් තමුන්නාන්සේලාට ආණ්ඩු බලය දීලා, වැරැද්ද නිවැරදි කරලා දුන් පොරොන්දු ඉටු කර ගන්න ජනතාව බලාගෙන ඉන්නවා.

සහනාධාර දෙනවා කියලා දැන් කිව්වා. ඒක දැනිලා තිබෙනවාද මිනිසුන්ට? මේ ගන්න රුපියල් බිලියන 100න් දෙන සහනාධාරය මිනිසුන්ට දැනිලා තිබෙනවාද? දැනිලාද, නැද්ද කියලා දැන ගන්න ජනතාව අතරට යන්න වෙනවා. වතුකරයට යන්න. ඒ අහිංසක මිනිස්සු ජීවත් වෙන විධිය බලලා හිතන්න, දැනිලාද නැද්ද කියලා. මොනවාටද මුදල් යන්නේ? ඇත්ත කථාව, ලයිට් බිල ගෙවා ගන්න අමාරුයි. පෙට්‍රල් ෂෙඩ් එකකට ගියාට පස්සේ තමුන්නාන්සේලාට බණින්නේ නැහැ; තමුන්නාන්සේලාගේ දෙමව්පියන්ට බණින්නේ. ඒකයි ඇත්ත කථාව. මොකද, අර කියපු ඒවා මතක් වෙනවා නේ. අවුරුදු දෙකකට ඉස්සර වෙලා කියපු ඒවා මතක් වෙනවා නේ. පෙට්‍රල් ෂෙඩ් එකට ගිහිල්ලා ලීටර තුනක් හතරක් ගැහුවාම, සාක්කුවේ සල්ලි නැහැ දෙන්න. ඉතින් බණිනවා. බණින්නේ දෙමව්පියන්ට. ඒකයි ඇත්ත කථාව. ඒක තේරුම් ගන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි නේ. ඊළඟ ඇත්ත කථාව මොකක්ද? IMF එකට යන්න වුණා. ඒක ඇත්ත. මම පෞද්ගලිකව කියනවා, IMF එකට යන්න වෙනවා කියලා; ගියා. හැබැයි IMF එක ගහන ගහන පදයට නැටුවොත් මොකද වෙන්නේ? ගහන ගහන පදයට නැටුවොත් මේ රටේ මිනිසුන්ට මොකක්ද සිද්ධ වෙන්නේ? මිනිසුන්ට කන්න නොවෙයි ලෙව කන්න සිද්ධ වෙන්නේ. ඒකයි ඇත්ත කථාව.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ධීවර ජනතාව ගැන කිව්වා. ඇමතිතුමා ඉන්නවා මේ සභාවේ. මේ ඇත්ත තිත්තයි. යන්න, ධීවර වරායවලට. බහුදින ධීවර යාත්‍රා කීයක් ගාල් කර තිබෙනවාද? ඒවා ගාල් කර තිබෙනවා. මුහුදට යවන්න විධියක් නැහැ. ඔබතුමා දන්නවා ඇමතිතුමා. හුඟක් ඒවා අද මුහුදට යවා ගන්න විධියක් නැහැ. මොකද, අවශ්‍ය න මූලික මුදල නැහැ. ඒකට රුපියල් ලක්ෂ 30ක්, 35ක් ඕනෑ ඩීසල් ටික ගහගන්න. රුපියල් ලක්ෂ 18ක්, 19ක් ඕනෑ නිසා පොඩි බෝට්ටු යවා ගන්න විධියක් නැහැ. නැඟෙනහිර පළාතට, උතුරු පළාතට ගිහිල්ලා බලන්න. ඒක තමයි ඇත්ත කථාව. නමුත් ඒක දැනෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, VAT එක අඩු කරයි කියලා අපි හිතුවා; VAT එක නැති කරයි කියලා හිතුවා. එහෙම නේ කිව්වේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් VAT එක ගහනවා. VAT එක නිසා ව්‍යාපාරිකයාත් flat, මිනිස්සුත් flat. සාමාන්‍ය සිල්ලර කඩයක කොහොමත් රුපියල් ලක්ෂයක් දවසට තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි ඒක ඒ ව්‍යාපාරයට දවසට එන මුදල් ටික. ඒක ලාභය නොවෙයි. ශුද්ධ ලාභය නොවෙයි. ඒකෙන් සියයට 18ක් ගත්තාම මොකක්ද සිද්ධ වෙන්නේ? අමාරුයි. කරගෙන යන්න බැරි වෙනවා. VAT එක නිසා වෙන්නේ මොකක්ද? එළවලු කඩේ එළවලු ටික විකුණන අහිංසක මනුස්සයා, මාළු ටික විකුණන මනුස්සයා, සිල්ලර බඩු ටික විකුණන මනුස්සයා වාගේ ගම්වල පුංචි ව්‍යාපාරයක් කරන මනුස්සයෝ VAT ගෙවන්නේ නැතුව අන්තිමට හිරේ යනවා.

ඒකයි වෙන්නේ. ඇත්ත තත්ත්වය ඒකයි. අද ව්‍යාපාරිකයෝ භය වෙලා. මහා පරිමාණයේ ව්‍යාපාරිකයෝ භය වෙලා. සුළු පරිමාණයේ ව්‍යාපාරිකයෝ භය වෙලා. මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයෝ භය වෙලා. ඒ මිනිස්සු භය කරලා රටක් දුවන්න බැහැ. ඒ අය වැරදි කරනවා නම්, බදු ගෙවන්නේ නැත්නම් බදු ගන්න ඕනෑ. හැබැයි බදු පිට බදු ගැහුවොත් ඒ අයට ව්‍යාපාර කරන්න අමාරු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

සමහර වෙලාවට තමුන්නාන්සේලා රජයක් හැටියට කියනවා අපි දැක්කා, භාණ්ඩාගාරය පිරෙන්න සල්ලි තිබෙනවා කියලා. භාණ්ඩාගාරය පිරෙන්න සල්ලි තිබෙනවා කිව්වත්, ඉරානය සහ ඇමෙරිකාව අතර තිබෙන යුද්ධය අපට බලපානවා කියලා තමුන්නාන්සේලා කියනවා නම්, මිනිස්සුන්ටත් ඒක දැනිලා තිබෙනවා නම්, ඒකෙන් මිනිස්සුන්ගේ බඩට වැදිලා තිබෙනවා නම්, භාණ්ඩාගාරය පුරවාගෙන ඉඳලා මොකටද? භාණ්ඩාගාරය පුරවාගෙන ඉන්නේ, ඒක පුරවලා තිබෙනවා කියලා කවුරු හරි සතුටු කරන්නද? සමහර නිලධාරිනුත් ඉන්නවා ඒක පුරවලා දුන්නාම හරි සතුටෙන් ඉන්න. සතුටෙන් හිටියා වාගේ නොවෙයි, බඩට වැදුනාම තමයි දැනෙන්නේ. ඔය ඉන්න මහ බැංකු අධිපතිතුමා ඉඳලා යන්න යයි. ඔය වාගේ නිලධාරින් අපි ළඟත් හිටියා. ඒ ගොල්ලන් යනවා. හැබැයි මහජන නියෝජිතයාට තමයි ජනතාවට උත්තර දෙන්න වෙන්නේ. ඒක ගැන වැඩි අවධානයක් යොමු කරන්න කියලා මතක් කරනවා.

මේ වන විට රටේ තත්ත්වය මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ වෙනකොට දේශගුණ විපර්යාස සිද්ධ වෙනවා. දිට්වා ඉවරවෙලා හුස්ම ගන්න ඉස්සෙල්ලා මෙන්න එනවා, තව එකක්. ඊයේ පෙරේදා වැස්සා. ආයේ 6වෙනි දාට වහිනවා ලු. මේ වෙනකොට නුවර, නුවරඑළිය, නාවලපිටිය, ගම්පොල වාගේ පැතිවල මිනිස්සු අසරණ වෙලා. ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ. දිට්වාවලින් බැට කාලා ඉන්නකොට ආපහු තව එකක්. මොකද්ද මේ මිනිස්සුන්ට වෙන්නේ? එකක් ඉවර වෙනකොට එකක් එනවා. මිනිස්සු තවම ඉන්නේ කූඩාරම්වල. දැන් කූඩාරමත් යට වෙනවා, කූඩාරමත් ගහගෙන යනවා, කූඩාරම උඩට ගස් කඩාගෙන වැටෙනවා. ඒකයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. එක පැත්තකින් ඒ දේවල් හරස් වෙලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දවස්වල රටේ සිදු වුණු ඉතාම අවාසනාවන්ත සිදුවීම අපි දන්නවා. ඒ තමයි මීගමුව බන්ධනාගාරයේ වූ සිදුවීම. මීගමුව බන්ධනාගාරයේ සිද්ධියෙන් මිනිස් ජීවිත කීයක් අහිමි වුණාද? බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරින් - තරුණ ළමයි; තරුණ කොල්ලෝ - කීදෙනෙක් අහිමි වුණාද? ඒ වාගේම රැඳවියෝ කීදෙනෙක් අහිමි වුණාද? ඒ ඔක්කෝම අපේ රටේ ජීවිත. ඒ අය රටට අහිමි වුණා. ඒ අහිමි වීම්වලින් අපි මොකක්ද ගන්න ඕනෑ? ඒ වාගේ දෙයක් වුණාම ඒක අත්දැකීමක්. රජයක් හැටියට, විෂය භාර ඇමතිවරයා හැටියට, අමාත්‍යවරු හැටියට ඒ අත්දැකීම අරගෙන යළි එවැන්නක් නොවෙන්න කටයුතු කරන්න ඕනෑ. දැන් මොකක්ද වුණේ? ඒකේ රස්නය යන්නත් ඉස්සෙල්ලා මහර බන්ධනාගාරයේත් සිදුවීමක් ඇති වුණා. ඒකේ දේපොළ විනාශ කළා, එක ජීවිතයක්ද කොහෙද අහිමි වෙලා තිබෙනවා. නිලධාරින් දැන් භයයි. පවු ඒ මිනිස්සු. ඒ අයටත් දරුමල්ලෝ, බිරින්දෑවරු, දෙමවුපියන් ඉන්නවා. ඒ සියලුදෙනාම දැන් භයෙන් ඉන්නේ. ඉස්සර යුද්ධය කාලයේ රණ විරුවා උතුරට ගිහින් එනකම් භයෙන් ඉන්නවා වාගේ දැන් බන්ධනාගාර නිලධාරින්ගේ ඥාතීන් ඒ අය ගැන භයෙන් ඉන්නේ. බන්ධනාගාර නිලධාරින් සම්බන්ධයෙන් දැන් ඇති වෙලා තිබෙන්නේ ඒ වාගේ තත්ත්වයක්. ඒ තරමට භයෙන් ඉන්නේ. ඇයි? කොයි වෙලාවේ ජීවිතය අහිමි වෙයිද දන්නේ නැහැ. ඒ තත්ත්වය තුළ කරන්න පුළුවන් මොකක්ද?

ඒ වාගේ එක සිද්ධියක් ඉවර වුණා විතරයි. ඒකට විශ්වාස භංග යෝජනාවකුත් ගෙනාවා. ආණ්ඩුව ඒ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළා. ඇමතිතුමාත් අත්පුඩි ගහලා ජොලියේ හිටියා. දෙවි හාමුදුරුවනේ, එහෙම ඉඳලා අනෙක් පැත්ත හැරෙනකොට ආපහු මෙන්න, මහර ගිනි ගන්නවා! ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක දැක්කාම මට හිතුණා වේලුපිල්ලේ ප්‍රභාකරන් වේලාසන ඉපදුණු එක හොඳයි කියලා. මොකද, වේලුපිල්ලේ ප්‍රභාකරන් පහුවෙලා ඉපදුනා නම් පහුවෙලා තමයි වේලුපිල්ලේ ප්‍රභාකරන් ඊළම ඉල්ලන්නේ. ඊළම ඉල්ලන්න තමයි යුද්ධ කළේ, ඊළම ඉල්ලන්න තමයි බෝම්බ හැහුවේ, ඊළම ඉල්ලන්න තමයි මේ රටට විනාශයක් කළේ. වේලුපිල්ලේ ප්‍රභාකරන් වැරදිලා වත් පහුවෙලා ඉපදුනා නම් එහෙම මොකද වෙන්නේ? එහෙම පහුවෙලා ඉපදිලා කරකැවිලා, කරකැවිලා ඇවිල්ලා තමුන්නාන්සේලා ආණ්ඩු කරනකොට වේලුපිල්ලේ ප්‍රභාකරන් ඊළම ඉල්ලුවා නම්, මේ රට දෙකට කඩන්න ඕනෑ කියලා ඉල්ලුවා නම් තමුන්නාන්සේලා ඒකට මුහුණ දෙන්නේ කොහොමද? බන්ධනාගාරයක් බලා ගන්න බැරි ආණ්ඩුවක් කොහොමද දෙවියනේ වේලුපිල්ලේ ප්‍රභාකරන් එක්ක යුද්ධ කරන්නේ? යුද්ධ කරන්න බැහැ. වේලුපිල්ලේ ප්‍රභාකරන් කියන්නේ කවුද? එදා ඔහුට නාවික බල ඇණියක් තිබුණා, පොලිස් බල අණියක් තිබුණා. නඩු ඇහුවා. එදා ඒ වාගේ මහ බලවේගයක් තිබියදී තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපේ වීරෝදාර රණ විරුවෝ සටන් කරලා යුද්ධය අවසන් කළේ. තමුන්නාන්සේලාට මොකක්ද කරන්න තිබෙන්නේ? ඔක්කෝම සිරකරුවෝ ඉන්නේ 41,000ක්. ඒ අතර සැකකරුවෝත් ඉන්නවා, වරදකරුවෝත් ඉන්නවා. එම සැකකරුවන්වයි, වරදකරුවන්වයි බලාගන්න ඉන්නේ අහිංසක නිලධාරින් 4,000යි. තමුන්නාන්සේලාට ඒ ටික බලාගන්න බැහැ. දෙවි හාමුදුරුවනේ වේලුපිල්ලේ ප්‍රභාකරන් දැන් හිටියා නම් අපට මොකද වෙන්නේ? එහෙම නම් රටට දෙවියන්ගේම පිහිටයි. ඒකයි ඇත්ත කථාව. එම නිසා අපි කියනවා, කරුණාකරලා තමුන්නාන්සේලා භාර ගත් මේ වගකීම් ටික අත්දැකීම් අනුව ඉටු

කරන්න කියලා. ඒක තමයි සිද්ධ විය යුතු දේ. එහෙම නැත්නම් ඉතාම භයානක තත්ත්වයක් ඇති වනවාය කියන කාරණයත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ.

අදත් පාර්ලිමේන්තුවේ කථා කළා, විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම ගැන. දැන් මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය ඒකද? දැන් මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය ඒක බවට පත්වෙලා. ඒක නොකළොත් මොකද වෙන්නේ? ආණ්ඩුව ඉවරයි. දැන් රටේ මිනිසුන්ට වෙන ප්‍රශ්න නැහැ. මිනිසුන්ට බඩගින්න පිළිබඳ ප්‍රශ්න නැහැ, ආර්ථිකය කඩා වැටීමෙන් ඇති වුණු ප්‍රශ්න නැහැ, වැස්ස නැහැ, ඉදිරියේදී නියඟයක් එයි කියන ප්‍රශ්න නැහැ. ඒවා නොවෙයි දැන් තිබෙන ප්‍රශ්න. ඊළඟට, ඇමෙරිකාවයි ඉරානයයි අතර තිබෙන යුද්ධය ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ මොන ප්‍රශ්නයක්වත් දැන් නැහැ. තිබෙන එකම ප්‍රශ්නය තමයි මේ ඉන්න විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කරන එක ඉක්මනටම සිදු කිරීම. දෙවි හාමුදුරුවනේ, ඒක පුදුම වැඩක් නේ. දැන් ලොකුම ප්‍රශ්නය කරගෙන තිබෙන්නේ ඒකද? ඒක ලොකුම ප්‍රශ්නය කරගෙන සද්භාවයෙන් ඒ ගැන කථා කරනවා. මේක හරියට අර නංගි පෙන්වලා අක්කා දෙන්න හදනවා වාගේ වැඩක්. දැන් නම් අක්කා නොවෙයි, නංගි පෙන්වලා ආච්චි දෙන්න හදන්නේ. දැන් එහෙමයි මේ කරන්න හදන්නේ. නංගි පෙන්වන්නේ, කසාද බඳිනකොට ආච්චිව දෙන්නයි. එහෙම ගේම් ගහන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම ගේම් ගහලා විනාශ වෙච්ච අය තමයි අපි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය කියලා මම කථාව අවසන් කරනවා.

එදා අගවිනිසුරු ධුරයෙන් ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඉවත් කරනකොට ඒ ආණ්ඩුවේ මමත් හිටියා. ඒක මම පැකිළීමෙන් තොරව කියනවා. එදා අපි බලය පාවිච්චි කරලා තීන්දු තීරණ අරගෙන ලොකුවට කරලා සියල්ල නැති කර ගත්තා. එම නිසා තමුන්නාන්සේලාත් බලයෙන් උදම් වෙන්න එපා. විශේෂයෙන් අධිකරණයට අත තියන්න එපා. මේ රටේ ශ්‍රී ලංකා නීතිඥ සංගමය, මහා සංඝ රත්නය ඇතුළු සැම දෙනාම විරුද්ධ දේ තමුන්නාන්සේලා කරන්න ගිහිල්ලා පස්සේ විඳවන්න එපා. දැන් ඒක කරාවි. මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා නේ. පාර්ලිමේන්තුවට ඒ යෝජනාව ඉදිරිපත් කරලා සම්මත කර ගනීවි. හැබැයි ආණ්ඩුව විධියට දැන් ඒක කළා වාගේ නොවෙයි, තමුන්නාන්සේලාට ඒවායේ ඵල විපාකත් විඳින්න වෙයි කියලා මතක් කරමින්, මා නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.43]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද මේ විවාද කරන්නේ ජනතාවට සහන සැලසීම වෙනුවෙන් ඉදිරිපත් කළ පරිපූරකයක් සම්බන්ධවයි. විපක්ෂයේ කථා දිහා බැලුවාම මට තිබෙන ප්‍රශ්නය තමයි, ජනතාවට සහන දෙන එකටත් දෝෂාරෝපණ සහ බැණ වැදීම් වාගේ දේවල් ඉදිරිපත් කිරීම. නමුත් රට ගැන කල්පනා කරන විපක්ෂයක් නම්, ජනතාවට මේ ලබා දෙන සහනවල මදි පාඩුවක් තිබෙනවා නම්, මේ මේ ක්ෂේත්‍රවලට සහන ලැබිය යුතුයි කියන පැත්තෙන් කරුණු දැක්වීම් කරනවා නම් එය සතුටට කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ජනතාවට මේ ලබා දෙන්නේ රුපියල් මිලියන 100,000ක සහන පැකේජයක්. පීඩාවට පත් ජනතාව වෙනුවෙන් අපි රුපියල් මිලියන 100,000ක් වෙන් කරලා ඒ සම්බන්ධ කරුණු දක්වනවා. එතුමන්ලා කරුණු දක්වන්නේ එතුමන්ලාගේ ප්‍රශ්න ගැන. පීඩාවට පත් ජනතාවට සහන ලබා දෙන්න අපට පරිපූරක ඉදිරිපත් කරන්න පුළුවන් වුණාට, පීඩාවට පත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සහන ලබා දෙන්න පරිපූරක ඉදිරිපත් කරන්න අපට පුළුවන්කමක් නැහැ. ඒවා වෙනම සලකා බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය මේ වනකොට පරිපූරක ඇස්තමේන්තු දෙකක් ගෙනැල්ලා තිබෙනවා. ඒ දෙක පසුගිය ආණ්ඩු කාලයේ ගෙනා පරිපූරක දිහා බැලුවාමත් වෙනස් ඒවා. අපේ රටේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අපි හොඳින් අනුගමනය කරනවා. අය වැයක් ඉදිරිපත් කළාට පසුව අය වැයෙන් පිට පැනලා නිතර නිතර පරිපූරක ගෙනෙනවා නම් සහ අනවශ්‍ය දේවල්වලට පරිපූරක ගෙනෙනවා නම් ඒක රජයේ යම් දුර්වලකමක්. අපි මේ පරිපූරකය ඉදිරිපත් කළේ, වාහන ගෙන්වන්න හෝ මේ රටේ පාරවල් හදන්න වාගේ සංවර්ධන කටයුතුවලට නොවෙයි. අපි ඒ අවශ්‍යතා හඳුනාගෙන ඒ සංවර්ධන කටයුතු ඒ විධියටම කරගෙන යනවා. හැබැයි අපි මේ පරිපූරක දෙකම ඉදිරිපත් කළේ ජනතාව වෙනුවෙන්. අපට එක පරිපූරකයක් ඉදිරිපත් කරන්න වුණා, "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් ජනතාවට සහන ලබා දෙන්න. ඒ සඳහා අපි රුපියල් බිලියන 500ක පරිපූරකයක් ඉදිරිපත් කළා. ඇත්තෙන්ම කිව්වොත්, ඒ ආපදාව නිසා මේ රටේ ජනතාව විශාල පීඩාවකට පත් වුණා. මට ඉස්සෙල්ලා කථා කළ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, දැනුත් ආපදාවක් වෙලා තිබෙනවා කියලා. ඒ ආපදාවත් පුළුවන් නම් ආණ්ඩුව පිට පටවන්න තමයි ආපදාවට පත් වුණු විපක්ෂය උත්සාහ ගන්නේ.

මේ එල් නිනෝ තත්ත්වය ශ්‍රී ලංකාවට විතරක් බලපාන සිද්ධියක් නොවෙයි. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුව ලංකාවට විතරක් බලපෑ ආපදාවක් නොවෙයි. මේවා ලෝකයේ සැලකිය යුතු රටවල් ගණනාවකට බලපා තිබෙනවා. මම හිතන විධියට, මේ අයට ඒක තේරෙන්න ඕනෑ. නොතේරෙනවා නොවෙයි, නමුත් වෙන මතයක් හදන්න මහන්සි ගන්නවා.

කොහොම නමුත්, ඊයේ පෙරේදා ඇති වෙච්ච අධික වැසි තත්ත්වයත් එක්ක අපේ දිස්ත්‍රික්ක කිහිපයකට බලපෑම් එල්ල වෙලා තිබෙනවා. ඒ අනුව දිස්ත්‍රික්ක 5ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 36ක් බලපෑමට ලක් වෙලා තිබෙනවා. අපේ රටේ වැසියන් 5දෙනෙක් මේ වනකොට ජීවිතක්ෂයට පත් වෙලා කියා

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

වාර්තා වෙලා තිබෙනවා. ඔය ජීවිතක්ෂයට පත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිරිස ගැන මම ඊයේ රාත්‍රියේත්, අද උදෑසනත් දිස්ත්‍රික් ලේකම්තුමිය එක්ක කථා කළා. ඇත්තටම මම ඇහුවා, මේවා අධි අවදානම් ප්‍රදේශ කියලා හඳුනාගෙන තිබුණේ නැද්ද, NBRI එක මේ සම්බන්ධ නිර්දේශ දීලා තිබුණේ නැද්ද, එහෙම නිර්දේශ දීලා තිබුණා නම්, ඇයි මේ අය එළියට ගන්න බැරි වුණේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවා නිර්දේශ දීලා තිබුණු තැන් නොවෙයි. ඒ, NBRI එක හඳුනා ගත් තැනක් නොවෙයි. නොහිතපු තැනක නායයක් ගිහිල්ලා එකම ගෙදර තුන්දෙනෙක් එතැන වැළලුනා. ඉතින් ඒ වාගේ තත්ත්වයක් තමයි මේ සමහර ප්‍රදේශවල තිබෙන්නේ. මෙය ආපදා තත්ත්වයක්. කොහොම නමුත්, මේ වනකොට බලපෑමට ලක් වෙලා තිබෙනවා, පවුල් 769ක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදෑසන මම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ඒ තොරතුරු ගත්තා. බලපෑමට ලක් වෙච්ච පවුල් සංඛ්‍යාව 769යි. තුවාල ලබා තිබෙනවා, තුන්දෙනෙක්. පූර්ණ නිවාස හානි වාර්තා වන්නේ නැහැ. නිවාස 129ක් අර්ධ වශයෙන් හානි වෙලා තිබෙනවා. ඒ වාගේම සුරක්ෂිත මධ්‍යස්ථාන 9ක් මේ වනකොට ක්‍රියාත්මක කරලා තිබෙනවා. පවුල් 479ක් ඒ සුරක්ෂිත මධ්‍යස්ථානවල ජීවත් වනවා. එතකොට රජයක් හැටියට අපි කඩිනමින් මේ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මම හිතනවා, මේ වේගයට තමයි උපරිම ධාරිතාවෙන් කටයුතු කළත් කරන්න වෙන්නේ කියා. සමහර සිද්ධි වළක්වාගන්නට පූර්ව අවබෝධයට ගන්න පුළුවන්කමක් නැහැ. මොකද, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ NBRI එක නිර්දේශ කරලාත් නැත්නම් අපට ඒ සිද්ධි වළක්වා ගන්න ක්‍රමයක් නැහැ. ඉතින් මේ ආපදා තත්ත්වයත් සමහරු ආරෝපණය කරන්න හදනවා, මේ ආණ්ඩුවේ දෝෂයක් නිසා එල් නිනෝ එනවා, "දිට්වා" එනවා කියලා. ඉතින් මම කියන්න කැමැතියි, මේ දේවල් වෙන්නේ ආණ්ඩුවේ දෝෂයක් නිසා නොවෙයි කියලා. හැබැයි මේ ඔක්කෝම දේවල් විපක්ෂයට කැරකිලා එන එක නම් අපට වළක්වන්න බැහැ. ඒවා පූර්වයෙන් කරපු දේවල්වලට අනුව එමින් තිබෙනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

කොහොම නමුත් මම කිව්වා, ආපදාවට ලක් වෙච්ච ජනතාවට සහන දෙන්න රුපියල් බිලියන 500ක පරිපූරකයක් දැම්මා කියලා. ඒවා දැන් කඩිනමින් ලබා දෙමින් තිබෙනවා. ඒ හින්දා ආපදාවට පත් වෙච්ච අය තවම කුඩාරම්වල ඉන්නවාය, ගෙවල් දොරවල් හදලා නැහැ කියන එක ඒ විධියටම භාර ගන්න අපට පුළුවන්කමක් නැහැ. ඔබතුමන්ලා කවුරුත් දන්නවා, මධ්‍යම කඳුකරයට මේ දිනවල ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ වාගේම කැලණි ගඟ ආශ්‍රිතව ඉන්න ජනතාව ගත්තාම, ඔවුන්ට ඉඩ කඩම්වල ප්‍රශ්න තිබෙනවා. ඒවා නිරවුල් කර ගන්න අපේ රටේ තිබෙන ක්‍රමයට අනුව කාලයක් ගත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු හැටියට අපි අත්විඳින ප්‍රශ්නයක් තිබෙනවා. NBRI එකට පෙන්වා, ඒ ප්‍රදේශයෙන් සුදුසු ඉඩමක් තෝරා ගන්න ගියාම අපට ප්‍රශ්න රැසකට මුහුණ දෙන්න වනවා. මොකද, අපට තිබෙන ඉඩම් හරි සීමිතයි. ඒ තත්ත්වය ඇතුළේ වුණත් අපි වෙනදාට වැඩි වේගයෙන් වැඩ කරනවා. මම මතක් කරන්න කැමැතියි, ජූලි මාසයේ මම වැලිමඩ, බෝවවත්ත ප්‍රදේශයේ ගෙවල් 19කට මුල්ගල් තියන්න ගිය බව. අපි රජයක් හැටියට පර්චස් 10ක් දීලා, ප්‍රදානයක් හැටියට රුපියල් ලක්ෂ 32ක් යොදවා ගෙයක් හදලා දෙනවා. මම ඒ ජනතාවගෙන් ඇහුවා, ඔවුන් කවදාද ආපදාවට ලක් වුණේ කියලා. 2012 වසරේදී බවයි අපට දැනගන්න ලැබුණේ. එතකොට කවුද ආණ්ඩු කළේ? 2012දී ආපදාවට ලක් වෙච්ච මිනිස්සුන්ගේ නිවාසවලට මුල්ගල් තියන්න වුණේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ. ඒ, පසුගිය 4වෙනි දා. 5වෙනි දා මම ගියා, පස්සර, කනවැරැල්ල ගම්මානයේ ගෙවල් 57කට මුල්ගල් තැබීමට. ඒවාට මම මුල්ගල් තියලා ජනතාවගෙන් ඇහුවා, කවදාද ඒ ගෙවල් නාය ගියේ කියලා. ඒ ගෙවල් නාය ගිහිල්ලා තිබෙන්නේත් 2012 වසරේ. වසර 14කට පස්සේ තමයි ඒ අයට ගෙයක්, ඉඩමක් හිමි වන තැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ හින්දා එතුමන්ලාගේ කාලයේ වෙච්ච දේවල්වලටත් අපි දැන් කටයුතු කරගෙන යනවා වාගේම "දිට්වා" ආපදාවට ලක් වෙච්ච ජනතාවටත් අපි ඉක්මනටම සහන සලසමින් යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ජනතාවගේ ගෙවල් මේ විධියට හැදුවේ නැති වුණාට, ඒ අයගේ ප්‍රශ්න බැලුවේ නැති වුණාට අර මහර බන්ධනාගාරය ගිනි ගහලාද, ගිනි තැබුවාද කියන එක අපි බලන්න ඕනෑ. අපට අද වනකොට ඒ සම්බන්ධ තොරතුරු ලැබෙනවා. මේවා යට තිබෙන්නේ හිරකරුවන්ගේ ප්‍රශ්න විතරක් නොවෙයි. එළියේ ඉන්න, සමහර විට හිරගත වන්න බලාපොරොත්තුවෙන් ඉන්න ඒ වැරදිකාරයන්ට තේරෙනවා ඇති නේ, වැරැද්දේ තරාතිරම. ඒ නිසා යම් යම් කුමන්ත්‍රණ සිද්ධ වනවා.

"දිට්වා" සහ ඔය ඇති වන එල් නිනෝ තත්ත්වය ගත්තොත්, ඒවා ස්වාභාවික විපත්. මේ සමහර විපත් දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ විපත් යට කුමන්ත්‍රණත් තිබෙනවා කියලා. ඒවා සම්බන්ධයෙනුත් රජයක් හැටියට අපි කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. දැන් දැන් සමහර දේවල් හෙළිදරව් වනවා. ඒවාට අදාළ නීතිමය ක්‍රියාමාර්ගත් ඉදිරියේදී අපි ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොහොම නමුත්, ජනතාවට ඉස්සර මේ වාගේ විපත් වුණාම මම අර ඉස්සෙල්ලා පැහැදිලි කළා වාගේ සහන ලබා දීම් වේගවත් වුණේ නැහැ, කඩිනම් වුණේ නැහැ, ඇහැක් ඇරලා බැලුවේ නැහැ. හොඳම උදාහරණය තමයි, 2023දී අපේ දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ලේ, කබරගල ලැයිම නාය යෑම. එතැන හිටියා, පවුල් 50ක්. ඒ කාලයේ පැවති ආණ්ඩුව මොකද කළේ? ඔවුන්ට ඉන්න තැනක් නැති හින්දා වසා දමා තිබුණු තේ ෆැක්ටරි එකක් අරගෙන ඒකේ මකුළු දැල් කඩලා, දූවිලි අතු ගාලා, පවුල් 50ක පොඩි දරු පැටවු එක්ක 300කට ආසන්න පිරිසක් එතැන පදිංචි කළා. ඊට පස්සේ මේගොල්ලන්ගේ ගෙවල් ගිනි ගත්තා කියලා -මේ අය ගිනි තියාගෙන හරි, කවුරු හරි ගිනි තියලා හරි- රුපියල් කෝටි ගණන් වන්දි ගත්තා. ඒ වන්දි ගත්ත සමහර අය තමයි ඉස්සෙල්ලා කථා කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒගොල්ලන් වන්දි ගත්තාට මිනිස්සුන්ගේ නැති වුණ ලැයිම වෙනුවට ගෙවල් හැදුවේ නැහැ. අපි ඒ ගෙවල් ටික හදලා මේ මාසයේ 28වැනි දා ජනතා අයිතියට පත් කරනවා. මම කියන්න කැමැතියි, අපේ රට දුර්වල ආර්ථිකයක් තිබෙන රටක් වුවත් මේ කටයුතු වේගයෙන් ක්‍රියාත්මක වන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පරිපූරක මුදල ගත්තත්, මේ සල්ලි හොයා ගත්තේ ණය අරගෙන නොවෙයි, සල්ලි අච්චු ගහලා නොවෙයි, යම් දේපළක් විකුණලා නොවෙයි. භාණ්ඩාගාරය පිරෙව්වා කියනවා, පිරෙව්වා කියනවා කියලා අර පැත්තේ කෙඳිරියක්, කෑ ගැහිල්ලක්, අඳෝනාවක් නිරන්තරයෙන් ඇහෙනවානේ. ඉතින්, ඒ පුරවපු භාණ්ඩාගාරයේ දොර ජනාධිපතිතුමා ඇරියා. එතුමා මේ සභාවටම ඇවිල්ලා "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වූ ජනතාවට සහන සැලසීම සඳහා රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් ලබා දුන්නා. ඊළඟට, මැද පෙරදිග ඇති වූ යුද තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සලසා දීම සඳහා රුපියල් බිලියන 100ක් ලබා දුන්නා. ඉස්සර වාගේ "කරන්න දෙයක් නැහැ, පටි තද කර

ගන්න එකයි කරන්න තිබෙන්නේ" කියලා අපි ජනතාවට කියලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ජනතාවට පටි තද කර ගන්න කිව්වේ නැහැ. අපි ජනතාවට සහන ලබා දෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කණ්ඩායම මේ කාරණා පැහැදිලි කළා. මම නැවතත් මේ කාරණය කියනවා. රුපියල් බිලියන 100ක් - රුපියල් මිලියන ලක්ෂයක් - ලබා දෙන්නේ මේ රටේ පීඩාවට පත් වෙච්ච ජනතාවට. අපේ උපාලි පන්නිලගේ ඇමතිතුමාත් පැහැදිලි කළා, අස්වැසුම ප්‍රතිලාභීන්ට රුපියල් මිලියන 8,475ක් වෙන් කර තිබෙනවා කියලා. පීඩාව අවම කරන්න මේ රටේ දිළිඳු ජනතාවට මේ මොහොතේ සහන ලබා දීම වැරදිද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැද පෙරදිග ඇති වූ යුද තත්ත්වයත් එක්ක අපේ රටේ තෙල් මිල ඉහළ ගියා, පොහොර මිල ඉහළ ගියා, සමහර භාණ්ඩවල මිල ඉහළ ගියා කියන එක අපි දන්නවා. ඒ තත්ත්වය රටකට තනිවම වළක්වන්න පුළුවන්කමක් නැහැ. මොකද, නැව් ගාස්තු ඉහළ යනකොට, රක්ෂණ ගාස්තු ඉහළ යනකොට මේ රටට ආනයනය කරන භාණ්ඩවල මිල ඉහළ යනවා. ඒක සාමාන්‍ය ස්වභාවයක්. ඒකට එතුමන්ලාගේ කාලයේදීත් මුහුණ දුන්නා, අපිත් මුහුණ දෙනවා. එතකොට අපි කිව්වේ නැහැ, තෙල් මිල ඉහළ ගියා, පටිය තද කර ගන්න කියලා. ලෝකයේ යුද තත්ත්වයක් තිබෙන නිසා අපට සහන ලබා දෙන්න බැහැ කියලා අපි කිව්වේ නැහැ. ඒ නිසා, දිළිඳු ජනතාව වෙනුවෙන් රුපියල් මිලියන 8,475ක් ලබා දීම වැරදියි කියලා මේගොල්ලන් කියනවාද කියලා අපි අහන්න කැමැතියි.

විශේෂයෙන්ම මේ රට කෘෂිකාර්මික රටක්. ගොවි ජනතාවක් ඉන්න රටක්. පොහොර මිල ඉහළ ගියා. ඒ අවස්ථාවේදී අපි ඇස් කන් පියාගෙන හිටියේ නැහැ. අවුරුදු 76ක පාලන කාලයක් අවසන් කරලා තමයි අපට මේ රට භාර දුන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි බලයට එනකොට ගොවියාට පොහොර සහනාධාරය විධියට දුන්නේ හෙක්ටෙයාරයකට රුපියල් 15,000යි. අපි බලයට ඇවිල්ලා තවම අවුරුදු දෙකක් වුණේ නැහැ. ඒ රුපියල් 15,000 අපි රුපියල් 25,000ට ගෙනැල්ලා තිබෙනවා. ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා රුපියල් බිලියන 100ක් වෙන් කරන ගමන් කිව්වා, මැද පෙරදිග ඇති වූ යුද තත්ත්වය නිසා තවත් රුපියල් 5,000ක් වැඩි කරලා අපි හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් දෙමු කියලා. ඒකත් තිබෙනවා, මේ රුපියල් බිලියන 100 ඇතුළේ. අපි මේ රටේ කෘෂි කර්මාන්තය ආරක්ෂා කරන්න, ගොවියා ආරක්ෂා කරන්න කටයුතු කරනවා. ගොවියා අවුස්සමින් යන විපක්ෂයේ සමහර අයට අපි කියන්නේ, ගොවීන් වෙනුවෙන් ලබා දිය හැකි දේවල් අපි ලබා දෙනවා කියන එකයි. ඒ අයට තව ගොඩක් ප්‍රශ්න තිබෙනවා. ඔක්කොම ප්‍රශ්න එක වතාවට විසඳන්න බැහැ. නමුත්, යම් සාධනීය පියවර රජයක් හැටියට අපි අරගෙන තිබෙනවා. ඒ සාධනීය පියවර අරගෙන තිබෙන්නේ වී වගාවට විතරක් නොවෙයි.

මම නියෝජනය කරන්නේ වැවිලි ක්ෂේත්‍රය. වැවිලි ක්ෂේත්‍රයේ නියුතු කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් අපිට පෙර හිටපු ආණ්ඩුත් යම් යම් සහන දුන්නා. ඒක අපි නැහැ කියන්නේ නැහැ. 2024 අවුරුද්ද ගත්තොත් මෙට්‍රික්ටොන් 13,000ක් පොහොර ලබා දී තිබෙනවා, කුඩා තේ වතු හිමියන්ට. හැබැයි, අපි QR කේතය අනුගමනය කරමින් ලංකාවේ පළමුවැනි වතාවට ගොවීන්ට පොහොර ලබා දීම ආරම්භ කළා. ඒ යටතේ මේ වනකොට අපි මෙට්‍රික්ටොන් 21,500ක් ලබා දීලා තිබෙනවා. එතුමන්ලා මෙට්‍රික් ටොන් 13,000ක් ලබා දුන්නා. අපි මෙට්‍රික් ටොන් 21,500ක් දුන්නා. එතුමන්ලා මෙට්‍රික් ටොන් 13,000 ගොවීන් 84,000කට තමයි දුන්නේ. අපි මේ වනකොට කුඩා තේ වතු ගොවීන් 191,000කට පොහොර සහනාධාරය ලබා දීලා තිබෙනවා. ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය තීන්දු කළා, මැද පෙරදිග යුද තත්ත්වය නිසා කුඩා තේ වතු හිමියන්ට දෙවැනි වටයට පොහොර දමා ගැනීමේ අපහසුවක් තිබෙනවා, ඒ නිසා තව රුපියල් මිලියන 2,500ක මුදලක් දෙමු කියලා. මේ රුපියල් බිලියන 100න් රුපියල් මිලියන 2,500ක් දීලා තිබෙනවා, කුඩා තේ වතු හිමියන්ට. දැන් අපි ඒ කටයුත්ත ආරම්භ කරලා, ඒ ගොවීන්ගේ ගිණුම්වලට මේ මුදල් බැර කරමින් ඉන්නවා. පීඩාවට පත් වෙච්ච ජනතාවට ලබා දෙන සහන කන්දරාව, සහන මල්ල විපක්ෂය දකින්න එපායැ. සමහර විට ඒක කෙනෙකුට ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. නමුත්, අපේ රට හැටියට ගත්තොත්, තිබෙන ආර්ථික ප්‍රශ්න එක්ක ගත්තොත්, සැලකිය යුතු සහනයක් අපි ලබා දීලා තිබෙනවා. තිබෙන ඔක්කොම ප්‍රශ්න විසඳන්න පුළුවන්කමක් නැහැ.

ඒ වාගේම මේ රටේ හතර වටේට තිබෙන්නේ මුහුද. ධීවර ජනතාවටත් සහන ලබා දීලා තිබෙනවා. ධීවර ජනතාව ගත්තොත්, කුඩා බෝට්ටුවකට දවසකට ලීටර් 25ක් වශයෙන් ගන්න මාසයකට රුපියල් 31,250ක සහනයක් ලබා දීලා තිබෙනවා. මෙවන් අවස්ථාවල මම නිතර කියනවා වාගේ අපේ ආණ්ඩුව ඇස් කන් පියාගෙන, පටිය තද කරගෙන, අරහේ යුද්ධයක් තිබෙනවා නේ, බංකොලොත් රටක් නේ, ණය ගෙවා ගන්න බැහැ නේ කියලා අත්හැරියේ නැහැ. එහෙම අත්හරින්නේ නැතිව, මහ හරින්නේ නැතිව භාණ්ඩාගාරයේ දොරවල් ඇරියා. ඒ හින්දා අර පුරවා ගත්ත භාණ්ඩාගාරයෙන් එක වතාවක රුපියල් බිලියන 500ක් දුන්නා. ඊළඟ වතාවේ තව රුපියල් බිලියන 100ක් දුන්නා. මම ඔබතුමන්ලාට කියන්නේ මේවාට සහාය දෙන්න කියායි. අපට දේශපාලන ප්‍රශ්න වෙනම තිබෙන්න පුළුවන්. ජනතාවට සහනයක් දෙනකොට ඒක අවතක්සේරු කිරීම, ඒකට අකුල් හෙළීම සහ දෝෂාරෝපණය කිරීම සාධාරණ නැහැ කියා මම හිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විධියට අපි මේ ජනතාව වෙනුවෙන් සහන ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ ඉන්නේ සුළුපටු විදුලි පාරිභෝගිකයන් ගණනක් නොවෙයි. අපේ රටේ විදුලි පාරිභෝගිකයන්ට අපි සහනයක් දුන්නා, මේ රුපියල් බිලියන 100න්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, දැන් මෙතුමන්ලා යන වාහනයේත්, සාමාන්‍ය මනුස්සයා පදවන ත්‍රී වීලර් එකේත්, මෝටර්සයිකලයේත් ඉන්ධන මිල අඩු කර ගන්න ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහ පෙට්‍රල් ලීටරයකට රුපියල් 20ක සහනාධාරයක් ආණ්ඩුවෙන් ලබා දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ මාස කිහිපය තිස්සේ මාසයකට රුපියල් කෝටි 2,000ක් ඉන්ධන සහනාධාරය වෙනුවෙන් අයින් කරලා තිබෙනවා. දැන් අපි මේ විධියට රුපියල් මිලියන ලක්ෂයක සහනය නොදුන්නා කියමුකෝ, මේක නැවැත්තුවා කියමුකෝ. එහෙම නම් කාටද මේක බලපාන්නේ? එහෙම නම් ඒක මේ රටේ ගොවියාට, ධීවරයාට, කුඩා තේ වතු හිමියන්ට සහ සාමාන්‍ය ජනතාවට බලපානවා. එහෙම නම් උද්ධමන තත්ත්වයක් ඇති වෙනවා. ඒවා වළක්වන්න රජයක් හැටියට නිසි පියවර අරගෙන තිබෙනවා. අඩුම තරමින් මේ වාගේ ඒවාටවත් ඔබතුමන්ලාගේ සහාය සහ එකඟතාව ලබා දෙන්න කියලා විපක්ෂයෙන් ඉල්ලීමක් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Namal Rajapaksa. You have nine minutes.

[අ.භා. 1.58]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් සහන දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ කියවනවා විතරයි නේ. මුදල් වෙන් කරනවා කියනවා, සහන දෙනවා කියනවා. දැන් ගොවි මහත්වරුන්ට පොහොර ලැබිලා තිබෙනවා කියනවා. එහෙම නම් මොකද දන්නේ නැහැ, ගොවි ජනතාව පාරට බැහැලා ආණ්ඩුවෙන් පොහොර ඉල්ලලා, වීවලට සහතික මිලක් ඉල්ලලා උද්ඝෝෂණ කරන්නේ. මේ සභාව ඇතුළේ කියවන එක ලේසියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, ඒ කියන සහන දෙනවා නම් අපි කැමැතියි. මේ වෙලාවේ අපි විශ්වාස කරනවා, මේ රටේ ගොවි ජනතාවට, ව්‍යවසායකයාට, ධීවරයාට සහ ව්‍යාපාරිකයාට සහනයක් දෙන්න ඕනෑ කියලා. හැබැයි, ඒ සහන දීම පාර්ලිමේන්තුවේ කථාවකට පමණක් සීමා වෙනවා නම් වැඩක් නැහැ නේ. දැන් මේ රුපියල් බිලියන 100න් කීයක් හැකර් අරගෙන යයිද දන්නේ නැහැ. හැකර් ගැන විවාදය මෙහෙට තිබෙනවා. හැබැයි, මේ ආණ්ඩුවේ ඔබතුමන්ලා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය සල්ලි පුරවා ගන්නවා කිව්වාට, මහදී හැකර් කෙනෙක් පැනලා ඒවා අරගෙන යනවා නේ. අන්තිමට හැකර් හොයා ගන්නත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම, අද වනවිට පවතින ආපදා තත්ත්වය පිළිබඳවත් විශේෂයෙන්ම කථා කළා. අපි මේ කථා කරන වෙලාවේත් මේ රටේ රණ විරුවන්, රාජ්‍ය නිලධාරින්, ස්වේච්ඡාවෙන් වැඩ කරන තරුණ පිරිස් විශාල කැපවීමකින් කටයුතු කරන ආකාරය අපි දැක්කා. අපේ රටේ රාජ්‍ය සේවකයෝ විපතට පත් වුණු මිනිසුන්ගේ ජීවිත බේරා ගන්න ඉදිරිපත් වුණා.

"දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අසීමිත පොරොන්දු ලබා දුන්නා. හැබැයි, ඒවා යථාර්ථයක් බවට පත් කරන්න ඔබතුමන්ලාට බැරි වුණා. ඒක තමයි ඇත්ත කථාව. ඔබතුමන්ලා ඒක කළේ නැහැ. මාස ගණනක් ගත වෙලා දැන් කියනවා ගෙවල් 30කට මුල්ගල් තැබුවා කියලා. "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා මාස 8ක් ගත වෙලා, දෙවැනි වරටත් දැන් වැස්ස පටන් අරගෙන, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහර ප්‍රදේශවල ජීවත් වුණු ජනතාවට ඒ නිවාසවලට යන්න එපා කියද්දී ආණ්ඩුව මැදිහත් වෙලා නිලධාරින් ලවා බලෙන් ගිහිල්ලා ඒ අය පදිංචි කළා. ඒ අය බලෙන් යැව්වා, නිවාසවලට. අද ඒ නිවාස, ඒ ගම්මාන නැවත වතාවක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. දැන් මෙකට වගකීම භාර ගන්නේ කවුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට වගකීම භාර ගන්නේ කවුද?

තව පැත්තකින්, උසස් පෙළ විභාගය ලියන දරුවෝ ඉන්නවා. ඒ අය අධ්‍යාපන අමාත්‍යතුමිය සමඟ සාකච්ඡාවක් ඉල්ලුවා. නිරන්තරයෙන් මේ ගැන කථා කළා. උසාවිත් ගියා, විභාගය නියමිත කාලයට කලින් පවත්වන්න කටයුතු කළා කියලා. නමුත් ඒ වෙනුවෙන් සහනයක් ලැබුණේ නැහැ. Syllabus cover කරලා නැහැ. ඒක තමයි ඇත්ත කථාව. හැබැයි, දැන් එක පැත්තකින් ආණ්ඩුව විදියට ගත්ත තීන්දුවක් නිසා ඒ ළමයි පීඩනයට පත් වෙනවා. අනෙක් පැත්තෙන් දැන් මේ ආපදා තත්ත්වය නිසාත් ඒ දරුවෝ පීඩනයට පත් වෙනවා. තව දින කිහිපයකින් ඒ දරුවෝ විභාගය ලියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, ආණ්ඩුව විදියට ඒ උසස් පෙළ විභාගය ලියන දරුවන්ට සාධාරණයක් කරන්න මොකක්ද ගෙන තිබෙන සැලැස්ම? තවදුරටත් අපි ඇහුම්කන් දෙන්නේ නැහැ, ඒක අපි බලා ගන්නම් කියලා ඔබතුමන්ලාගේ සුපුරුදු දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරනවාද, එහෙම නැත්නම් මේ දරුවන්ට ඇහුම්කන් දෙනවාද? මේ කාරණය පිළිබඳව ආණ්ඩුවේ සියලුදෙනාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන් මුහුණ දෙන මේ පීඩනයට ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. මේක සුළුකොට තකන්න එපා. ඔබතුමන්ලාට පාර්ලිමේන්තුවේදී ලොකු කයිවාරු ටිකක් ගහලා මේකෙන් බේරෙන්න පුළුවන් වෙයි. හැබැයි, මේ දරුවෝ විශාල පීඩනයක ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම දැන් ඉඩම් සම්බන්ධයෙනුත් කථා කළා. මම දැක්කා එක ඇමතිවරයෙක් කියනවා, ආණ්ඩුවට නම් ඉඩම් නැහැ, හැබැයි පන්සල්වලටයි, දේවාලවලටයි ඕනෑ තරම් ඉඩම් තිබෙනවා කියලා. ඒ, සාංඝික දේපළ. ගරු ඇමතිවරුන්ට, ගරු අගමැතිවරියට, ගරු ජනාධිපතිවරයාට පුළුවන්, මහා සංඝ රත්නය එක්ක සාකච්ඡා කරලා ඒ ඉඩම් ජනතාවට අවශ්‍ය නම් ඒවා ඉල්ලා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති, සුනාමි ව්‍යසනය ඇති වුණු වෙලාවේ විශේෂයෙන් දකුණු පළාතේ අපේ ගම්වල, - ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා - අපේ නායක හාමුදුරුවරු ඉදිරිපත්වෙලා ගෙවල් හදලා දීපු හැටි. උන්වහන්සේලා ඉඩම් බලෙන් තියාගෙන ඉන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ගරහලා වැඩක් නැහැ, "අපට ඉඩම් නැහැ. පන්සල්වලට, දේවාලවලට ඉඩම් තිබෙනවා. අපි ඉඩම් දෙන්නේ කොහොමද" කියලා. ආණ්ඩුවක් හැටියට ඒකට මැදිහත්වෙලා උන්වහන්සේලා එක්ක සාකච්ඡා කරන්න. බොහෝ නායක හාමුදුරුවරු, දේවාල භාරව කටයුතු කරන අය ගෙවල් ටික හදලා දෙන්නත් මැදිහත්වෙයි. ඒක රටේ, සමාජයේ ලොකු කතිකාවක් හදන්න අවශ්‍ය කාරණාවක් නොවෙයි කියලා මම මේ ආණ්ඩුවේ අයට කියන්න කැමැතියි.

අද ඔබතුමන්ලා සහන ගැන කථා කරනවා. ගොවියාගේ පොහොර ප්‍රශ්නයට ඔබතුමන්ලා ලබා දෙන විසඳුම මොකක්ද? වීවලට සහතික මිලක් ඉල්ලනවා. ඔබතුමන්ලා ගොයම් කැපෙන කාලයට පිටරටින් හාල් ගේනවා. පිටරටින් හාල් ගෙනැල්ලා කියනවා, දැන් හරි කියලා. හැබැයි, ගොවියා අසරණ වෙනවා. එළවලු ගොවියා අසරණ වෙනවා. පොහොර ලබා දෙනවා කිව්වාට, පොහොර දෙනකොට පොහොර යොදන්න ඕනෑ කාලය පැනලා. ඒ වෙනකොට කළු කඩයකින් එහෙම නැත්නම් ව්‍යාපාරිකයන්ගෙන් අසීමිත මුදලක් දීලා පොහොර මිලදී අරගෙන ඉවරයි. එහෙම අසීමිත මුදලක් දීලා පොහොර මිලදී ගත්තාට පස්සේ, ආණ්ඩුවෙන් පොහොර දුන්නා කියලා ඒ මුදල refund කරන්නේ නැහැ. ඒක තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා ප්‍රායෝගික වෙන්න. ගොවි මහත්වරු සාකච්ඡාවක් ඉල්ලුවාම ඔබතුමන්ලා කියන්නේ මොකක්ද? එක්කෝ කසිප්පුකාරයෙක් කියනවා. නැත්නම් මේක දේශපාලනීකරණය කරලා කියනවා. එහෙම නැත්නම් ඒ අය විපක්ෂයෙන් මෙහෙයවනවා කියනවා. ඔය ගොවි සංවිධානවලින් භාගයක් ඔබතුමන්ලා එක්ක වැඩ කරපු අය; ඔබතුමන්ලාගේ දේශපාලන න්‍යාය පත්‍රයේ හිටපු අය. අද ඒ ජනතාව අසාධාරණයට ලක්වෙනකොට ඔබතුමන්ලා පක්ෂයක් විදියට ඒකට මුහුණ දෙන්නේ නැත්නම්, ඔබතුමන්ලා ආණ්ඩුවක් විදියට ඒකට මැදිහත් වෙන්නේ නැත්නම් ඒ ජනතාව පාරට බහිනවා. ඒක නවත්වන්න බැහැ. ඒක, මට වඩා හොඳට ඔබතුමන්ලා දන්නවා. ඔබතුමන්ලා ඒ අය මෙහෙයවපු අය.

ඒ වාගේම පොලිස්පතිවරයා ගැනත් කථා කළා. ඔව්, පොලිස්පතිවරයා ජේවීපී එකේ, පැලවත්තේ කාර්යාලයේ

පොලිස්පතිවරයා විධියට තමයි හැසිරෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකේ හංගන්න දෙයක් නැහැ. ඒක මුළු රටම දන්නවා. පොලීසියේ මාධ්‍ය ප්‍රකාශකතුමාගේ කථාව ඇහුවාම, ඒක හරියට ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශක කථා කරනවා වාගෙයි. ඒක ප්‍රශ්නයක් නොවෙයි. දැන් අර සාගර කාරියවසම් අපේ ලේකම්තුමාගේ ප්‍රකාශයක් ගැන කිව්වා. මේක පාර්ලිමේන්තුව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉන්න ආණ්ඩුවක්, අවබෝධයෙන් බොරු කියන 159ක් ඉන්න ආණ්ඩුවක්. අවබෝධයෙන් බොරුව කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවබෝධයෙන් බොරු කියන 159 දෙනෙක් ඉන්න, පාපිසි කැලි ඉන්න ආණ්ඩුවක් විපක්ෂය හැසිරෙන්න ඕනෑ කොහොමද කියලා අද කථා කරනවා. ඉස්සෙල්ලාම ආණ්ඩුව හැසිරෙන්න ඕනෑ විධියට හැසිරෙන්න. ඔබතුමන්ලා දැන් ඉන්නේ ආණ්ඩුවේ.

මේ රටේ අධිකරණ පද්ධතිය ස්වාධීන වෙන්න ඕනෑ. හැබැයි, පොලීසිය දක්වන කරුණු මත තමයි ගරු විනිශ්චයකාරවරු ක්‍රියාත්මක වෙන්නේ. පොලීසිය සම්පූර්ණයෙන් දේශපාලනීකරණය වෙනවා නම්, ආණ්ඩුවේ අතකොළුවක් බවට පොලීසිය පත්වෙලා තිබෙනවා නම්, පොලිස්පතිවරයා හැසිරෙන්නේ පැලවත්තේ කාර්යාලයට නැත්නම් ජේවීපී එකට ඕනෑ විධියට නම් ඒ පිළිබඳව ජනතාව තුළ යම් මතයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම පොලිස්පතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, දේශපාලනඥයන් දෙන ලණු කන්න එපා කියලා. මම මේ කියන්නේ පොලිස්පතිතුමාට. මීට පෙර ඔය විධියටම පක්ෂවලට කඩේ ගිය පොලිස්පතිවරුන්ට වෙච්ච දේ ගැන හිතලා බලන්න. *[බාධා කිරීම්]* හරියට හරි. මමත් කියන්නේ ඒකම තමයි. ඔබතුමන්ලා ඒක පිළිගත්ත එක ලොකු දෙයක්. ඒක පිළිගත්තා වාගේම ඔබතුමන්ලාට අසීමිතව කඩේ යන පොලිස්පති අසරණ කරන්න එපා. *[බාධා කිරීම්]* ඔව්, මම කියනවා තමයි. ඇයි? *[බාධා කිරීම්]* ඔව්, මම කියනවා. අහගෙන ඉන්න. ඇඟට අමාරුයි තමයි. මේවා කියනකොට දැනෙනවා නේද? අපි දන්නවා නේ ඉතින්. *[බාධා කිරීම්]* අනේ මේ! ඔබතුමන්ලාගේ දේශපාලන හැසිරීම ජේනවා නේ. ගැරඬින්ට හුමිතෙල් ගැහුවා වාගේ දඟලන්නේ. ගැරඬින්ට හුමිතෙල් ගැහුවා වාගේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පව්! අසරණයි. *[බාධා කිරීම්]* දේශපාලනීකරණය වෙච්ච පොලිස්පතිවරුන්ට, පොලීසියට ගිය කල දසාව ගැන ඔබතුමන්ලා දන්නවා නම්, ඔබතුමන්ලා මේ පොලිස්පති අනාථ කරන්න එපා. ඒකයි මම මේ කියන්නේ. *[බාධා කිරීම්]* ඔව්, ඔබතුමා තමයි කිව්වේ. ඔහොම කිය කියා ඉන්න. 159දෙනාම විනෝද වෙන්න. අවසාන කාලය වෙනකොට ඔය වාගේ දේවල් සිද්ධ වෙනවා. ඔබතුමන්ලාට මෙතැන කයිවරු ගහන්න පුළුවන්, මෙතැන දඟලන්න පුළුවන්, අවබෝධයෙන් බොරු කියන්නත් පුළුවන්, ඔබතුමන්ලාට ඕනෑ ඕනෑ විධියට චෝදනා හදන්නත් පුළුවන්, නහන්නත් පුළුවන්, කියවන්නත් පුළුවන්. හැබැයි ඉතින් මතක තියාගන්න, සමස්තයක් විධියට මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය විනාශ කිරීම නිසා, පොලීසිය සහ අධිකරණ පද්ධතිය විනාශ කිරීම නිසා මොකද වෙන්නේ කියලා. ඔබතුමන්ලා එක පැත්තකින් මේ රටේ වෛද්‍යවරුන්ට, නීතිඥවරුන්ට, ඉංජිනේරුවන්ට, රණ විරුවන්ට මඩ ගහලා, ඔවුන්ගේ චරිත ඝාතනය කරලා සමස්ත වෘත්තීන් කඩා වට්ටන්න දඟලනකොට,- මහත්තයෝ ලජ්ජයි, නීතිඥවරු මෙතැන වාඩිවෙලා ඉන්නවා. මේ නීතිඥවරු තමන්ගේ වෘත්තියටත් ගරහනවා - සමස්තයක් විධියට රාජ්‍යය කඩා වැටෙන එක නවත්වන්න බැහැ. රාජ්‍යය කඩා වැටුණාට පස්සේ ඇවිල්ලා "අනේ, මේ රාජපක්ෂලාගේ වැඩක්" කියලා නම් කෙඳිරි ගාන්න ලැහැස්ති වෙන්න එපා. මොකද, අපි ඔබතුමන්ලා වාගේ පස්ස දොරෙන් දුවන අය නොවෙයි. ඔබතුමන්ලා දන්නවා නේ අපි ගැන. *[බාධා කිරීම්]* ඒ හින්දා ඒවාට ලෑස්ති වෙන්න එපා. අපි ළඟ හැංගි හොරා වැඩ නැහැ. *[බාධා කිරීම්]* අපි ඒක වෙලාව ආවාම බලාගනිමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Namal Rajapaksa, your time is up.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම ඔබතුමන්ලාගෙන් මං ඉල්ලන්නේ ඔය කියන සහන ටික දෙන්න කියලායි. Hacker කෙනෙක් ඇවිල්ලා මේ රුපියල් බිලියන 100ත් උස්සාගෙන යනකම් බලාගෙන ඉන්නේ නැතුව කරුණාකරලා මේ රුපියල් බිලියන 100 ජනතාවට දෙන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Arun Hemachandra. The Floor is yours and you have ten minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.09]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, යන්න එපා පොඩ්ඩක් ඉන්න. දුවන්න එපා. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතාම වැදගත් කාරණයක් පිළිබඳවයි අපි අද සාකච්ඡා කරමින් ඉන්නේ. විශේෂයෙන්ම පසුගිය කාල වකවානුව තුළ සිද්ධ වෙච්ච, තවමත් සිද්ධ වෙන මැදපෙරදිග අර්බුදයත් එක්ක රජයක් විධියට අපි තීරණය කළා, පීඩාවට පත් වෙන ඒ පාර්ශ්වවලට අදාළව යම්කිසි සහනාධාර වැඩ පිළිවෙළක් සකස් කරන්න. විශේෂයෙන් ඒ සහනාධාර වැඩ පිළිවෙළේදී ඉන්ධන

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

සඳහා අපි යම්කිසි සහනයක් ලබා දීලා තිබෙනවා. නිසි පරිදි, ඒ නිශ්චිත වෙළෙඳ පොළ මිල වටිනාකමටත් වඩා අඩු මිලට අපට එය දෙන්න හැකියාව ලැබුණා. කුඩා තේ වතු හිමියන්ටත් අපි ඒ සහනාධාරය දුන්නා. ඒ වාගේම, ධීවර ක්ෂේත්‍රයේ අය, අස්වැසුම ප්‍රතිලාභීන් ඇතුළු ඒ කණ්ඩායමට අපි සහනාධාර ලබා දුන්නා. අපි ඉතාම සතුටු වෙනවා, කිසිම අලුත් ණයක් ගන්නේ නැතුව, ඒ වාගේම වෙනත් පැතිවලින්, වෙන අමාත්‍යාංශයකින් මේකට අදාළ වෙන් කිරීම් කරන්නේ නැතුව මුදල් අමාත්‍යාංශය තුළින්ම මේ කටයුත්ත කරගැනීමට හැකි වීම ගැන. ඒක ඉතාම සතුටුදායක ආරංචියක්. ඒ වාගේම අපේ ආර්ථිකය කොච්චර ස්ථාවරභාවය සහිත ආර්ථිකයක් විධියට පරිවර්තනය වෙලා තිබෙනවාද කියන එක ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවන්.

මේ වෙලාවේ මම කාරණා කිහිපයක් මතක් කරන්න කැමැතියි. අපි 2024 සැප්තැම්බර් මාසයේ මේ රට භාරගන්න කොට ඉතාම දුර්වල ආර්ථික තත්ත්වයක් තමයි තිබුණේ. නමුත් අපි ක්‍රමානුකූලව ඒක වෙනස් කළා. දූෂණ, වංචා, නාස්තිය ඇතුළු අක්‍රමිකතාවලින් තොරව, ඉතාම හොඳ, ශක්තිමත් රාජ්‍යයක් ගොඩනැඟීමට කටයුතු කරන්න අපි සමත් වුණා. ඒ වාගේම තමයි, ජාතික සමඟිය පිරුණු ඉතාම ශක්තිමත් රටක් ගොඩනැඟීමට අපි කටයුතු කරගෙන යනවා. අපි මේ කටයුත්ත කරගෙන යනකොට යම්කිසි ගැටලු කිහිපයකට අපි මුහුණ දුන්නා. ඉන් එකක් තමයි, "දිට්වා" සුළි කුණාටුව එක්ක බිහිවෙච්ච ආපදා තත්ත්වය. ඒ හරහාත් අපේ ආර්ථික වර්ධන වේගයට යම්කිසි බාධාවක් වුණා. ඒ වාගේම තමයි, මාස කිහිපයකට පෙර මැදපෙරදිග කලාපයේ ඇති වුණු ගැටුම් නිසාත් අපේ ආර්ථිකයට යම්කිසි හානියක් සිද්ධ වෙලා තිබෙනවා. නමුත් මේ අර්බුද තුළ පවා අපි ඉතාම ශක්තිමත් විධියට මූල්‍ය විනය සහිතව මේ වැඩකටයුතු ටික කළමනාකරණය කරගෙන ගියා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි, රටක් විධියට අපි ඉතා හොඳ වැඩ පිළිවෙළක් සකස් කරගෙන, හැම පැත්තෙන්ම ඒ අර්බුදවලට උත්තර හොයාගෙන, කිසිම ගැටලුවක් නැතුව ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක්, පරිසරයක් අද ඇති කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දන්නවා අවුරුදු කිහිපයකට පෙර - ඔබතුමියට මේ ගැන අදහසක් ඇති - ලෝකයේම ඉන්ධන තිබුණා, ගෑස් තිබුණා, විවිධ දේවල් තිබුණා. නමුත්, අපේ රටේ විදේශ විනිමය සංචිත තිබුණේ නැහැ, ඒවා මිල දී ගන්න. ඒ නිසා අපි හැමෝම එදා පෝලිම්වල හිටියා. එදා මෙ රටේ විදුලි කප්පාදුවත් සිද්ධ වුණා, ඉන්ධන හිඟයක් ඇති වුණා. ඒ වාගේම, ගෑස් ප්‍රශ්න මතු වුණා, අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය මතු වුණා. ඒ වාගේ විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. නමුත්, අද වන කොට අපි මේ ආර්ථිකය ඉතාම ශක්තිමත් විධියට කළමනාකරණය කරගෙන යන එකේ ප්‍රතිඵලයක් විධියට, ලෝකයේ කුමන ප්‍රශ්න ගැටලු ආවත්, ඒ ප්‍රශ්න ගැටලුවලට මුහුණ දීමේ හැකියාව සහිත රාජ්‍යයක් අප බිහි කර තිබෙනවා. මම කියනවා, එය සියයට 100ක් සම්පූර්ණ නැහැ කියලා. අප මේ රට භාර අරගෙන තවම අවුරුදු දෙකක් සම්පූර්ණ වෙලා නැහැ. සැප්තැම්බර් මාසය වනකොට තමයි අපගේ ආදරණීය අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති ධුරයට පත් වෙලා අවුරුදු 2ක් සම්පූර්ණ වෙන්නේ. ඒ වාගේම, නොවැම්බර් මාසයේදී තමයි පාර්ලිමේන්තුව නියෝජනය කරන අප සියලුදෙනා එක්ව හදපු ආණ්ඩුවට අවුරුදු 2 සම්පූර්ණ වෙන්නේ. තවම අවුරුදු දෙකක්වත් සම්පූර්ණ වෙච්ච නැති ආණ්ඩුව ඉතාම හොඳ විධියට මේ ටික කළමනාකරණය කර ගෙන යන එක දරා ගන්න බැරි පිරිසක් විපක්ෂයේ ඉස්සරහ පුටුවල වාඩි වෙලා ඉන්න එක ගැන අපි විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ නැහැ. නමුත් ඒක තමයි හැමදාම මේ රටට වෙලා තිබුණු ප්‍රශ්නය.

ඒ වාගේම, මම තවත් වැදගත් කාරණා කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. අපි විශේෂයෙන්ම මූල්‍ය විනය ඇතිව කටයුතු කරනවා. ඒ ගැන කියන කොට අප සඳහන් කරන්න ඕනෑ විශේෂ දෙයක් තිබෙනවා. ඒ තමයි, දේශපාලන සංස්කෘතිය ඇතුළු මේ රාජ්‍ය යන්ත්‍රණය තුළ තිබුණු අක්‍රමිකතා අපි වෙනස් කරලා තිබෙනවාය කියන එක. නමුත්, කියන්න ඉතාම කනගාටුයි, මීට පෙර මේ රට පාලනය කරපු සියලු ආණ්ඩු මේ අක්‍රමිකතාවලට ඉඩ දීලා තිබෙන බව. ඒ සඳහා මම එක උදාහරණයක් කියන්නම්. මා ළඟ ලිපි ගොනුවක්ම තිබෙනවා. අපගේ දිස්ත්‍රික්කයේ මීට කලින් අමාත්‍යවරයෙක් හිටියා. එතුමා රත්නපුර දිස්ත්‍රික්කයෙන් තමයි පාර්ලිමේන්තුවට ආවේ. ඒ අමාත්‍යවරයා එක්තරා කාලයක එක්සත් ජාතික පක්ෂයේ හිටියා. පසුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ගියා. කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් හිටියා. පසුව සමගි ජන බලවේගයේ වේදිකාවටත් ගොඩ වෙන්නට එතුමා යම්කිසි උත්සාහයක් දරා තිබුණා කියලාත් අපට ආරංචියක් ආවා. නමුත් මේ මොහොත වන කොට ජනතාව එතුමා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දේශපාලනයෙනුත් අයින් කරලා තිබෙනවා. එතුමාගේ නම තමයි සුසන්ත පුංචිනිලමේ. සුසන්ත පුංචිනිලමේ හිටපු අමාත්‍යවරයා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට ආවේ 2008 වර්ෂයේ. එතුමා 2008 වර්ෂයේ ත්‍රිකුණාමලයට යනකොට දිසාපතිතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබුණා, එතුමාට නිල නිවාසයක් ඕනෑ කියලා. දිසාපතිතුමා ඒකට අදාළ කටයුතු කරලා තිබුණා. එතුමා නිල නිවාසයක් භාර ගත්තාට පසුව තවම කිසිම කුලියක් හෝ වතුර බිලක් හෝ විදුලි බිලක් හෝ ගෙවා නැහැ. එතුමා 2019 ඡන්දයේදී පරාජයට පත් වුණා. පරාජයට පත් වුණාට පසුව එතුමාගේ ගෝලයෙකුට තමයි යතුරත් භාර දීලා ගිහින් තිබෙන්නේ. හිටපු සියලු දිසාපතිවරු ඒ සම්බන්ධව දිගින් දිගටම කටයුතු කරලා තිබෙනවා. මම ඒ ගැන සතුටු වෙනවා. ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යවරයා ලෙස හිටපු පුද්ගලයා පසුව රාජ්‍ය පරිපාලන නියෝජ්‍ය අමාත්‍යවරයා විධියටත් පත්වීම් ලබා ගෙන, ඊට පසුව යම්කිසි බලපෑමක් මත ඒ ගාස්තුව ගෙවා නැහැ. මම මේ ගැන විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන ඇමතිතුමා එක්කත් කථා කළා. ඒ වාගේම බලශක්ති ඇමතිතුමා එක්කත් කථා කළා. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන ඇමතිතුමා එක්කත් කථා කළා. අපි ඒ සම්බන්ධව ඒ ඒ අමාත්‍යාංශවලින් වෙන වෙනම පරීක්ෂණ පවත්වනවා. අපි COPA එකටත් මේ කාරණය යොමු කරනවා. ඒ වාගේම අපි මේ ලිපි ගොනුව අපරාධ පරීක්ෂණ කොට්ඨාසයටත් ඉදිරිපත් කරනවා. එතැනදී යම්කිසි action එකක් ගනියි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. මොකද, ඒවා සියල්ල රාජ්‍ය මුදල්. මට ලැබී තිබෙන තොරතුරු අනුව ගත්තොත්, එය ඉතාම විශාල මුදල් ප්‍රමාණයක්. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 11ක වාගේ විදුලි බිලක් ගෙවන්න තිබෙනවා. වතුර බිල් දිහා බැලුවොත්, ඒ වාගේම විශාල මුදලක් ගෙවන්න තිබෙනවා. ඇත්තටම මේවා ජනතාවගේ බදු මුදල්. මේවා සාමාන්‍ය දේවල් නොවෙයි.

ඒ වාගේම තවත් කෙනෙක් හිටියා. එතුමා ජනාධිපති ලේකම් කාර්යාලය හරහා 2008 වාගේ කාලය තුළ තමයි ආවේ. එතුමාගේ නම ප්‍රියන්ත පතිරණ ප්‍රේමකුමාර. එතුමා හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙක්. ඒ පළාත් සභා මන්ත්‍රීවරයාටත් පේදුරු කොටුව ඇතුළේ නිල නිවාසයක් ලබා දී තිබෙනවා. ඒ පළාත් සභා මන්ත්‍රීවරයා ඒ නිල නිවාසයට අදාළවත් කිසිම ගාස්තුවක් ගෙවා නැහැ. විශේෂයෙන්ම එතුමා මැතිවරණ කොමිසමේ කාර්යාලය අවට හිටපු නිසා කිව්වා, එතුමා ඒ ආසන්නයේ තියාගෙන මැතිවරණ කටයුතු කරන්න බැහැ කියලා. ඒ නිසා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්ගේ ඉල්ලීම පරිදි එතුමා එයින් ඉවත් කරන්නට සිද්ධ වුණා. නමුත් ඉතාම කනගාටුදායක තත්ත්වය තමයි, එහිදී ආයෙත් ලිපි ලේඛන රාශියක් හුවමාරු වෙලා තිබීම. අන්තිමට නීතිපතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින්, කරුණාකර දින 30ක් තුළ අදාළ හිඟ මුදල ගෙවන්න කියා

තිබෙනවා. සමස්තයක් විධියට රුපියල් 633,436.34ක මුදලක් දින 30ක් තුළ ගෙවන්න කිව්වත් තවම කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. තවම කිසිම මුදලක් ගෙවලාත් නැහැ. මේකෙන් ඇත්තටම තේරුම් යන්නේ, නිලධාරීන් කොච්චර තීන්දු තීරණ ගත්තත්, පසුගිය කාල වකවානු තුළ බලයේ හිටපු දේශපාලන අධිකාරිය ඒ තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්න ඉඩ දීලා නැහැ කියන එකයි. ඒ අයගේ බලපෑම් දිගටම එල්ල වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හැදීම උදෙසා අපි මේ රට භාර ගත්තා. අපට ඒ පිළිබඳ බලාපොරොත්තුවක් තිබෙනවා, අවංක චේතනාවක් තිබෙනවා. මේ ආණ්ඩුව භාරගත් අපි මේ රට කොහොම හරි ගොඩනඟන්න ඕනෑ කියන අවංක ප්‍රයත්නයත් එක්ක තමයි ඉදිරියට කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා, පැවැති වැරැදි දේශපාලන සංස්කෘතිය තුළ තිබූ දූෂණය, වංචාව, නාස්තිය, අක්‍රමිකතා ආදියට කිසිසේත් ඉඩ නොදී අපි මේ ආණ්ඩුව ඉස්සරහට අරගෙන යනවා. මේ ආණ්ඩුව ඒ විධියට ඉස්සරහට අරගෙන යනකොට සමහරු විවිධ පැතිවලින්, විවිධ කුමන්ත්‍රණ කරනවා. අපි දන්නවා, ඒ අය මේ ආණ්ඩුව ගැන සමාජයේ යම්කිසි අවිශ්වාසයක් ඇති කරන්න ඕනෑය කියන චේතනාව මත විවිධ අර්බුද මතු කරන්න උත්සාහ කරන බව. ඒක, ඉන්ධන අර්බුදය වෙන්න පුළුවන්, විදුලි අර්බුදය වෙන්න පුළුවන්. ඒ වාගේම පසුගිය දිනවල සිද්ධ වුණු බන්ධනාගාරයේ අර්බුදය වෙන්නත් පුළුවන්. කුමන අර්බුද ආවත් ආණ්ඩුවක් විධියට ඒ සියලු කුමන්ත්‍රණ පරාජය කරමින්, දූෂිතයන්ට දඬුවම් දෙමින් අපි මේ රට ඉස්සරහට අරගෙන යනවා කියන පණිවුඩය ලබා දෙන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා.

[අ.භා. 2.18]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩු පක්ෂයේ අදහස් ඉදිරිපත් කරපු බොහෝ දෙනෙක් කිව්වා, රට ස්ථාවර වෙලා, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් දැන් නිර්මාණය වෙලා කියලා. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2024 සංඛ්‍යාලේඛනවලට අනුව, අපට ලැබී තිබෙන තොරතුරුවලට අනුව වැඩිහිටි ප්‍රජාව 3,900,000ක් ඉන්නවා. ඒ වැඩිහිටි ප්‍රජාවට පසුගිය කාලය පුරාවටම තමන්ගේ ඉතිරි කිරීම් සඳහා සියයට 15ක පොලී ප්‍රතිලාභයක් ලැබුණා. අද වන විට ඒ සියයට 15ක පොලී ප්‍රතිලාභය සියයට 7 දක්වා අඩු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම, රුපියල් ලක්ෂ 10ක තැන්පතුවක් තිබෙන විශ්‍රාමික මහත්මයෙක් මට කියලා එවනවා, මීට පෙර අපට පොලිය සියයට 15ක් ලැබුණා, ඊට පස්සේ ඒක සියයට 11.56ට අඩු වුණා, එතකොට පොලිය විධියට රුපියල් 9,633ක් ලැබුණා, එක පාරටම පොලී අනුපාතය සියයට 7ට අඩු කළා, පොලිය ලෙස දැන් රුපියල් 5,833ක් තමයි ලැබෙන්නේ කියලා. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව විශ්‍රාමික වැඩිහිටි ප්‍රජාව 3,900,000ක් ඉන්නවා. ඉතින් මේකද ඔබ කථා කරන ස්ථාවරත්වය? මේකද පොහොසත් රට ලස්සන ජීවිතය? අපි අහන්නේ ඒකයි.

ගොවි ජනතාවට එදා පැහැදිලි පොරොන්දුවක් ලබා දුන්නා, හොඳ ස්ථාවර මිලක් ලබා දෙනවා කියලා. ස්ථාවර මිලක් ලබා දෙනවා විතරක් නොවෙයි, වී කිලෝවකට රුපියල් 150ක් ලබා දෙනවා කියලාත් කිව්වා. ඒ කථාව එසේ මෙසේ තැනක නොවෙයි කිව්වේ. කුඹුරට බැහැලායි කිව්වේ. තවත් වෙලාවක ගොයම් කකා කිව්වා, වී කිලෝවකට රුපියල් 150ක් දෙනවා කියලා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? කලට වේලාවට බිත්තර වී ටික ලැබෙන්නේ නැහැ. ඒවා ගුණාත්මකභාවයෙන් අඩුයි. පොහොර සහනාධාරය ප්‍රමාණවත් මදි. බාල පොහොර තමයි ලැබෙන්නේ. සමහරෙකුට පොහොර සහනාධාර මුදල් ලැබෙනවා වගා කටයුතුවලින් පසුව. කඩයෙන් කඩයට කෘෂි රසායන මිල වෙනස්. ඒවායේ ගුණාත්මකභාවයත් වෙනස්. ගොවි උපකරණවලට මේ රජය තවමත් VAT එක ගහනවා. ඒවායේ මිල අධික තත්ත්වයක් තිබෙන්නේ. වනඅලි-මිනිස් ගැටුම තුළින් ජීවිත හානි, වගා හානි, දේපළ හානි සිදු වෙනවා. අලිත් මැරෙනවා. මේ බරපතළ අර්බුද තුළ කන කර බඩු ටික උකස් කරලා කරපු ගොවිතැනේ අස්වැන්නට නිශ්චිත මිලක් ලබා දෙන්නට මේ රජයට බැරිවෙලා තිබෙනවා. ඒකද, ස්ථාවරභාවය? ඒකද පොහොසත් රට, ලස්සන ජීවිතය ද කියලා අපි අහන්න කැමැතියි. මම කියන්නම්, කොහොමද මේ රජය මේ ස්ථාවරභාවය ඇති කරලා තිබෙන්නේ.

IMF එක කිව්වා, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ප්‍රාථමික ශේෂය සියයට 2.3ක් තිබුණොත් ප්‍රමාණවත් කියලා. නමුත්, මේ රජය ඒක සියයට 5.4ක් දක්වා අරගෙන ගිහිල්ලා තිබෙනවා. මොකක්ද ඒකේ තේරුම? මොකක්ද ප්‍රාථමික ශේෂය කියන්නේ? ආදායමින් වියදම අඩු කරලා ඒකට පොලී ආදායම සම්බන්ධ කර ගන්නේ නැහැ. ප්‍රාථමික ශේෂය සියයට 2.3 සියට සියයට 5.4 දක්වා ඉහළ යනවා කියන්නේ, ජනතාව මත අසීමිත බදු බරක් පටවලා තිබෙනවා කියන එකයි. 2025 රාජ්‍ය ආදායම විධියට IMF එක ලබා දුන් ඉලක්කය වුණේ සියයට 13.9යි. නමුත්, ඔබ ගිහිල්ලා තිබෙනවා සියයට 15.4ක ඉලක්කයට. ඒක ස්ථාවරයි කියනවා. කොහොමද සියයට 13.9ක ඉලක්කය අභිභවා සියයට 15.4 දක්වා ගිහිල්ලා තිබෙන්නේ? ඒ, බදු බර පටවලා.

අද මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52ක් දායකත්වය ලබා දෙන ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් බරපතළ තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. දැන් තරගෙට ඒ අයගේ දේපළ වෙන්දේසි කරනවා; තරගෙට පරාටේ නීතිය ක්‍රියාත්මක කරනවා. කිසිම සහනයක් නැහැ. ප්‍රාග්ධනයට ප්‍රවේශයක් නැහැ. කාරක ප්‍රාග්ධනය නැහැ. ඒ නිසා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් පහළ වැටිලා. දැන් කියනවා, රට ස්ථාවරයිලු. සියයට 33කින් විදුලි බිල අඩු කරනවා කිව්වා. රුපියල් 9,000 බිල රුපියල් 6,000 කරනවා කිව්වා, 3,000 බිල රුපියල් 2,000 කරනවා කිව්වා. ඒ පොරොන්දු ඉෂ්ට කරලා නැහැ. ඒ පොරොන්දු ඉෂ්ට කරන්නේ නැතුව කියනවා, රට ස්ථාවරයිලු. වරායේ ගොඩබාන මිලටම මේ රටේ පාරිභෝගික ප්‍රජාවට තෙල් ටික ලබා දෙනවා කිව්වා. දැන් ලබා දෙනවාද? තෙල්වලින් මහා භාණ්ඩාගාරයට ලබාදෙන මුදල නතර කරනවා කිව්වා. හැම ලීටරයකින්ම රුපියල් 50ක් දෙනවා, ඒක නතර කරනවා කිව්වා. බදු ඔක්කෝම ඉවත් කරනවා කිව්වා. හෝමුස් සමුද්‍ර සන්ධිය තුළ නිර්මාණය වෙලා තිබෙන ඒ සට්ටනය තුළත්, ඇති වී තිබෙන ඒ යුද්ධය තුළත් ලෝකයේ බොහෝ රටවල් තෙල්වලට ගහපු බද්ද එක්කෝ අඩු කරලා තිබෙනවා, එක්කෝ ඉවත් කරලා තිබෙනවා. නමුත් ගාණක් නැතිව අපේ රටේ එලෙසම ක්‍රියාත්මක වෙනවා.

"දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ ඔබතුමන්ලා කිව්වා නේ, ඒ සඳහා රුපියල් බිලියන ගණන් වෙන් කළා කියලා. දුන්නාද අර තහඩුවක් ගියත් ලබා දෙනවා කියපු ලක්ෂ දහය? කෝ දේපළ අහිමි වුණු, ඉඩම් අහිමි වුණු, ජීවනෝපාය අහිමි වුණු අයට ලබා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දෙන්න පොරොන්දු වුණු දේවල්? ඒ සඳහා රුපියල් බිලියන 500කට වැඩි ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අනුමත කර ගත්තා නේ. තවත් විශාල ප්‍රමාණයක් විදේශ ආධාර විධියට ලැබුණා නේ. නමුත්, අවසානයේ ඒ කියපු දේවල් මේ මහ පොළොවේ ක්‍රියාත්මක වෙලා නැහැ. ඒවා සත්‍යයක්, යථාර්ථයක් බවට පත් කර ගන්න මේ රජයට බැරිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ රජයට කියන්න කැමැතියි, කරුණාකරලා ඔබ කථා කරන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන පොරොන්දු පත්‍රිකාව නැවත වරක් කියවා බලා ඒකේ සාර්ථකත්වය ගැන සොයා බලන්න කියලා. ඔබතුමන්ලා කියපු දේවල් කොච්චර කරලා තිබෙනවාද කියන එක ගැන විශ්ලේෂණය කරලා, දිගින් දිගටම බොරු කියන්නේ නැතුව, ජනතාව රවට්ටන්නේ නැතුව, අන්දවන්නේ නැතුව කටයුතු කරන්න කියලා. ටොන් පව න්‍යාය තුළ ජනාධිපතිකමත් ගත්තා, තුනෙන් දෙකක බලයත් ගත්තා, පළාත් පාලන ආයතන විශාල ප්‍රමාණයක බලයත් ගත්තා. අඩුම ගණනේ දැන්වත් මේ රටේ ජනතාව පිළිබඳව සංවේදී වෙලා, කියපු දේ කරන්නට කාලය එළැඹිලා තිබෙනවා. ඒ දේ ඉෂ්ට කරන්න කියලා අපි රජයට යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.26]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මොහොත මේ රටේ ණය සීමාවට හෝ ණය ගැනීමේ සීමාවට බලපෑමකින් තොරව, රුපියල් බිලියන 100ක පමණ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් මේ රටේ ජනතාවට සහන සැලසීමට ක්‍රියා කරන මොහොතක්. අපට පෙනෙනවා, මේ විරුද්ධ පක්ෂය දීර්ඝ කාලයක් තිස්සේ මේ රට විනාශ කරපු හැටි, දේශපාලනඥයන් පාලකයන් හැටියට බලයට පත් වෙන්න, ඒ බලය භුක්ති විඳින්න කටයුතු කරපු හැටි. ඒගොල්ලෝ කිව්වේ බලය භුක්ති විඳිනවා කියලායි. ඇත්ත වශයෙන්ම ඒගොල්ලෝ බලය භුක්ති වින්දේ නැහැ. ඒගොල්ලෝ රට කෑවා කිව්වොත් නිවැරදියි. ඒගොල්ලෝ බලය භුක්ති විඳින ගමන් මේ රටේ ජනතාවට කන් හැන්දෙන් තමයි බෙදුවේ. නමුත්, අපේ ජනාධිපතිවරයා ඇතුළු රජය මේ වසර එකහමාරක කාලය තුළ මේ රටේ ජනතාවට ලබා දුන් සහන මොනවාද, පාලකයන් හැටියට, එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂය හැටියට අපේ ඥාතින්ට, අපේ හිතවතුන්ට වරප්‍රසාද දෙනවා වෙනුවට මේ රටේ ජනතාවට දීපු සහන මොනවාද කියා අපට පෙනෙනවා. ජනතාව කරදරයට පත්වෙච්ච වෙලාවට කටයුතු කරපු ආකාරය පෙනෙනවා. "දිට්වා" සුළි කුණාටුව වෙලාවේ මේ රටේ ජනතාව බලාගන්න අපි රජයක් හැටියට කොයිතරම් දුරට කටයුතු කළාද කියලා පෙනෙනවා. ඒකට මේ රටේ ජනතාව සාක්ෂි දරනවා. මේ මොහොතේත් අපේ රටේ ආපදා තත්ත්වයක් මතු වෙලා තිබෙනවා.

බන්ධනාගාර ගැනත් අද කිහිපදෙනෙක් කථා කළා. ඒ වාගේම විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම පිළිබඳ විවාදයකුත් මතු කර තිබෙනවා. මේ සියලු කාරණා දිහා බැලුවාම පෙනෙන්නේ එල්ලෙන්න වැලක් නැති නිසා රජය හැටියට අපි සෑම ක්ෂේත්‍රයකම ආරම්භ කර තිබෙන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ පක්ෂය ගල් මුල් ගසමින් යන බවක්. නමුත්, ඒවායෙන් ප්‍රයෝජනයක් නැහැ; ඒවා සාර්ථක නැහැ. ඒවා රජයට අභියෝගයක් නොවන බව පෙනෙනකොට ඒගොල්ලන් විවිධ බළල් අත් පාවිච්චි කරන්න හදනවා. ආණ්ඩුවට එරෙහිව කටයුතු කරන්න ශක්තිමත් නැති වෙනකොට විවිධ ආවරණවලට මුවා වෙලා කටයුතු කරනවා. අපි දැක්කා, ත්‍රෛනිකායික මහනායක ස්වාමීන් වහන්සේලාගේ ප්‍රකාශයක් පිළිබඳව විපක්ෂ නායකතුමා අදහස් ඉදිරිපත් කරනවා. ඒවා "ආරංචි" හැටියට තමයි එතුමා ඉදිරිපත් කරන්නේ. හැබැයි රජයක් හැටියට අපි කටයුතු කරන්නේ ආරංචි සමඟ නොවෙයි. දත්ත, සංඛ්‍යාලේඛන සහ නිවැරදි තොරතුරු මත තමයි අපේ රජය කටයුතු කරන්නේ.

ඊයේ පෙරේදා මහර බන්ධනාගාරයේ මතුවෙච්ච තත්ත්වය ගත්තත්, අපේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ කිසිම පිළිවෙළක් නැතුව පවත්වාගෙන ආපු බන්ධනාගාර ක්‍රමයක් තිබුණා. 1832 කැමරන් යුගයේදී ආරම්භ කරපු බන්ධනාගාර පද්ධතිය කිසිම ක්‍රමයක් නැතුව ලංකාව තුළ වර්ධනය වුණා. අද වෙනකොට ලංකාව පුරා ක්‍රියාත්මක වෙන ආරක්ෂිත බන්ධනාගාර හතර ගත්තොත්, ඒවා ස්ථාපනය කර තිබෙන්නේ ඉතාම ජනාකීර්ණ නගරවල. ඒවා පුළුල් කිරීමට ඉඩකඩ ලැබිලා නැහැ. ඒ සම්බන්ධ අවශ්‍ය කටයුතු කරලා නැහැ. ඒවාට විසඳුමක් හැටියට අඟුණකොළපැලැස්ස ආරක්ෂිත බන්ධනාගාරය සහ බූස්ස බන්ධනාගාරය යම් පමණකට ප්‍රමාණවත් වුණත්, වැලිකඩ සහ බෝගම්බර බන්ධනාගාර පරිශ්‍ර පුළුල් කිරීමට අවකාශ නැහැ කියන එක අපි දකිනවා. මේ මොහොත වෙනකොටත් 38,000කට වැඩි රැඳවියන් ප්‍රමාණයක් ඒ බන්ධනාගාරවල ඉන්නවා. ඒ බන්ධනාගාරවල රඳවා ඉන්න අයගෙන් වැඩි ප්‍රමාණයක් දුප්පත්කම සහ නූගත්කම වැනි සමාජ හේතු මත ඒ තත්ත්වයට පත්වෙච්ච අපේම සහෝදර සහෝදරියන්. ඒගොල්ලන් පාවිච්චි කරලා දේශපාලනය කරනවා වෙනුවට අපට අවශ්‍යයි ඒගොල්ලන් මුදා ගන්න. ඒ තත්ත්වයට පත් වෙලා ඉන්න, සමාජ අසාධාරණයට ලක් වෙලා ඉන්න, ආර්ථිකය තුළ, සමාජය තුළ කොන්වීම නිසා ඒ වාගේ තත්ත්වයට පත් වෙලා ඉන්න අපේම සහෝදර සහෝදරියන් ඒ තත්ත්වයෙන් මුදාගෙන මේ සමාජයට ඵලදායී පුරවැසියන් හැටියට සම්බන්ධ කරගැනීම තමයි අපේ රජයේ මූලික ප්‍රතිපත්තිය. ඒ සඳහා අපි අධ්‍යයන කරමින්, අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

විශේෂයෙන්ම පසුගිය කාලය පුරා අපි මත්ද්‍රව්‍ය විරෝධී මෙහෙයුම් ආරම්භ කිරීමත්, ඊට ඉස්සෙල්ලා පැවති රජය විසින් "යුක්තිය" මෙහෙයුම මඟින් අත්අඩංගුවට ගැනීම නිසාත් රැඳවියන් විශාල ප්‍රමාණයක් බන්ධනාගාරවල ඉන්නවා. ඒ වාගේම විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ පනතට ගෙනාපු සංශෝධනය මඟින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10කට වැඩි ප්‍රමාණයක් ළඟ තබා ගත් පුද්ගලයෙකුට අභියාචනාධිකරණයෙන් ඇප ලබා ගැනීමට සිදුවීම නිසා විශාල පිරිසක් බන්ධනාගාරගත වෙලා ඉන්නවා. මෙ ආදී විවිධ හේතු නිසා බන්ධනාගාරවල තදබදය අපට පාලනය කරන්න බැරි මට්ටමට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය පාවිච්චි කරලා යම් අර්බුද හදන්න හැදුවත් අපි රජයක් හැටියට මේ මොහොත වනකොට ඒ සියල්ල ගැන අවශ්‍ය තොරතුරු ලබා ගනිමින් ඒවා පාලනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා.

මහර බන්ධනාගාරයේ මෑතකදී ඇති වෙච්ච සිද්ධියේදීත් මොකද වුණේ කියලා අපි දැක්කා. බන්ධනාගාරවලට මත්ද්‍රව්‍ය සැපයීම, දුරකථන සැපයීම සීමා වීම නිසා බන්ධනාගාරවල හිටපු පාතාලයට සම්බන්ධ, එහෙම නැත්නම් විශාල ජාවාරම්වලට සම්බන්ධ පිරිස් සමඟ දේශපාලනඥයන් සම්බන්ධ වෙලා හෝ, වෙනත් කිසියම් කුමන්ත්‍රණකාරී බලවේග සම්බන්ධ වෙලා ඒ කටයුතු කරනවාද කියන කාරණයට ආරක්ෂක අංශ අවධානය

යොමු කරලා තිබෙනවා. කොහොම වුණත් මේ රටේ ජනතාවට සහ ඒ රුදවියන්ගේ ආදරණීය දෙමව්පියන්ට, ඒ සහෝදර සහෝදරියන්ට කියන්න කැමැතියි, අපි රජය හැටියට ඉතා විධිමත්ව, කල්පනාකාරීව මේ තිබෙන තත්ත්වය කළමනාකරණය කරමින් ඉන්නවාය කියන එක. පොලිස්පතිවරයා, මේ සිටින නිලධාරින් දේශපාලනීකරණයට ලක් වෙලා ඇති වන තත්ත්වය තුළ අනාගතයේ ඔවුන්ට නරක අත්දැකීම්වලට ලක් වෙන්න පුළුවන් කියලා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කරනවා මම දැක්කා. ඒ තමයි ඔවුන්ගේ අත්දැකීම. රජයක් හැටියට කිසිසේත්ම මේ ආයතනවලට දේශපාලන බලපෑමක් කරන්න මැදිහත් වෙන්නේ නැහැ කියන එක අපි විශ්වාස කරනවා. එවැනි නරක දේශපාලන අත්දැකීම්වලින් හොඳට බැට කාපු ව්‍යාපාරයක් හැටියට එවැනි දේශපාලන මැදිහත්වීමක් කරන්න අපි කිසිසේත්ම කටයුතු කරන්නේ නැහැ. ඒ වාගේම මේ ආයතනවලට අවශ්‍ය ස්වාධීනත්වය ලබා දීලා, මේ හැම ආයතනයක්ම වඩා විධිමත්ම සහ කාර්යක්ෂමව මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳන ආයතන බවට පත් කරන්න, මේ රටේ ජනතාවට වඩාත් හොඳ සමාජයක් නිර්මාණය කරන්න අවශ්‍ය ආයතන පද්ධතියක් බිහි කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ සඳහා ජනාධිපතිවරයා ඇතුළු අපේ අමාත්‍ය මණ්ඩලය, මන්ත්‍රීවරුන්, අපේ නිලධාරින් සියලුදෙනා මෙහෙයවමින් ඉන්නවා. මේ කටයුතු කරගෙන යනකොට අපට විවිධ අභියෝග මතු වෙන්න පුළුවන්. ඒ හැම අභියෝගයක්ම ජයගනිමින් මේ රට පොහොසත්, ලස්සන රටක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය අත්තිවාරම අපි මේ මොහොත වනකොටත් දමා තිබෙනවා. ආර්ථිකයට, එහෙම නැත්නම් ණය සීමාවට කිසිදු බලපෑමකින් තොරව, සහන අවශ්‍ය අයට සහන ලබා දෙමින්, රට ස්ථාවර මට්ටමකට ගෙන එන්න මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම තුළින් අපට හැකියාව ලැබිලා තිබෙනවාය කියන එක ප්‍රකාශ කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ඔබතුමියට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙනකොට රටේ ඉතා උණුසුම් මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය මෙතරම් ඉක්මනින් රජයේ දේශපාලන න්‍යාය පත්‍රයට එන්නේ 2026 දෙසැම්බර් මාසයේ පළමුවැනි දා වර්තමාන අග්‍ර විනිශ්චයකාර ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා වයස අවුරුදු 65 සපුරා විශ්‍රාම යෑමට නියමිත දිනය ළං වෙලා තිබෙන නිසා. යම් හෙයකින් එතුමාගේ වයස අවුරුදු 65 පිරෙන්නේ 2028දී විතර වුණා නම් මෙවැනි සංශෝධනයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්නේ නැහැ. මේක බොහොම පැහැදිලිව තනි පුද්ගලයෙකු ඉලක්ක කරගත්, තනි විනිශ්චයකාරවරයකු ධුරයේ දීර්ඝ කාලයක් රඳවා ගැනීම සඳහා වන දේශපාලනික උපාය මාර්ගයක් මිසක් අධිකරණයේ යහපත සඳහා, නීතියේ ප්‍රමාදය වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ගයක් නොවෙයි. මෙවැනි කූට උත්සාහ වැළැක්වීම පිළිබඳව වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කල් තියාම තේරුම් ගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අධිකරණයේ ස්වාධීනත්වය කියලා වෙනම පරිච්ඡේදයක් තිබෙනවා. එය තිබෙන්නේ 107වැනි ව්‍යවස්ථාවේ. 107වැනි ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63 සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 කියලායි. අග්‍ර විනිශ්චයකාරතුමාටත් උපරිම වශයෙන් වයස අවුරුදු 65යි තිබෙන්නේ. අපි වර්තමාන අග්‍ර විනිශ්චයකාරතුමාට සුබ විශ්‍රාම දිවියක් පතනවා. එතුමාගේ විශ්‍රාම ජීවිතය සාර්ථක වේවා කියලා සුබ ප්‍රාර්ථනා කරනවා. නමුත් එතුමා පාවිච්චි කරලා, එතුමා දීර්ඝ කාලීනව ධුරයේ සිටීමෙන් මේ ආණ්ඩුවට දේශපාලනික වාසියක් ඇතැයි හිතලා එතුමාත් අමාරුවේ දමන්න, එතුමාගේ නමටත් කැළැලක් වන ආකාරයට තමයි මේ කටයුතු සිදු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝකයේ තිබෙන විනිශ්චයකාරවරුන්ගේ විශාලම සම්මේලනය තමයි අන්තර් ජාතික විනිශ්චයකාරවරුන්ගේ සම්මේලනය - International Association of Judges - කියන්නේ. ශ්‍රී ලංකාවත් සාමාජික වන, වර්තමානයේ සිටින ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමන්ලා, අභියාචනාධිකරණ විනිශ්චයකාරතුමන්ලා ඇතුළු ශ්‍රී ලංකාවේ විනිශ්චයකාරවරුන් සියලුදෙනාම සාමාජිකයන් වන මෙම සංගමය 2026 අගෝස්තු මාසයේ 3වැනි දා ප්‍රකාශ කළා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107වැනි ව්‍යවස්ථාව නිසි සමාලෝචනයක් නොමැතිව, අදාළ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමඟ නිසි ලෙස සාකච්ඡා කිරීමකින් තොරව හදිසියේ වෙනස් කිරීම අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීමක්ය, ඒ නිසා මෙම උත්සාහය නතර කළ යුතුයි කියලා. ගෞරවනීය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලාගේ ප්‍රකාශය අපි අගය කරනවා. ඒක උන්වහන්සේලා මේ සමාජය තුළ ඇති වෙලා තිබෙන සමාජ මතවාදය සහ යුක්තිය, සාධාරණත්වය සලකා කළ ප්‍රකාශයක්. නමුත් අපිත් සාමාජිකයන් වන, අග්‍ර විනිශ්චයකාරතුමාත් සාමාජිකයකු වන මේ ලෝකයේ තිබෙන විනිශ්චයකාරවරුන්ගේ විශාලතම සම්මේලනය 2026 අගෝස්තු මාසයේ 3වැනි දා නිල වශයෙන් නිවේදනයක් නිකුත් කරලා ප්‍රකාශ කළා, "මේ රජයේ උත්සාහය වැරදියි, ඒක අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීමක්" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. විපක්ෂය හැටියට අපි කල්පනා කරනවා, අධිකරණයේ කාර්යක්ෂමතාව දියුණු කිරීම සඳහා නව රජයේ ප්‍රතිපත්තිය අනුව සකස් කරපු, කෙටුම්පත් කරපු එකම නීතියක්වත් මේ මාස 21ට අරගෙන ආවේ නැහැ කියන එක. සම්මත කරපු වැදගත් නීති තිබෙනවා. ඒ සෑම නීතියක්ම ඊට කලින් රජයන් යටතේ සම්මත කළ ඒවා. එයින් සමහර ඒවා යහ පාලන රජය කාලයේ කෙටුම්පත් කිරීම ආරම්භ කරපු ඒවා. ඒවා සම්මත කිරීම හොඳයි. හැබැයි, මේ රජය බලයට පත් වෙලා මේ රජයේ ප්‍රතිපත්තිය හැටියට අධිකරණය කාර්යක්ෂම කරන්න එකම පනතක්වත් මේ පාර්ලිමේන්තුවට අරගෙන ආවේ නැහැ. සමස්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා කියලා පරම පොරොන්දුවක් දීලා, විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරන, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ශක්තිමත් කරන අලුත්ම - brand new - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එනවා කියලා පොරොන්දු වෙලා, හදිසියේ, කඩිමුඩියේ 107 වැනි ව්‍යවස්ථාව විතරක් සංශෝධනය කරන්න මේ කරන කටයුත්ත ගැන අපට බලවත් විවේචනයක් තිබෙනවා.

මේක පක්ෂ දේශපාලනය තුළින් කරන විවේචනයක් නොවෙයි. වෘත්තියේ දශක තුනකට අධික කාලයක් යෙදුණු අයට මේ ක්ෂේත්‍රය ගැන විශාල අත්දැකීමක් තිබෙනවා. වෘත්තියේ වාගේම නීති සම්පාදනයේ අත්දැකීම් තිබෙනවා. ඒ නිසා ඒ අත්දැකීම් අනුව, මේ කරන්න යන වැඩේ වැරදියි කියලා අපි

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

දන්නවා. නඩු ඉක්මනින් විසඳීමයි, විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු දෙකකින් වැඩි කිරීමයි අතර කිසිම සම්බන්ධයක් නැහැ. මේ රටේ තිබෙන නඩු ලක්ෂ 11න් ලක්ෂ අටක් තිබෙන්නේ මහෙස්ත්‍රාත් අධිකරණයේ. මහෙස්ත්‍රාත් අධිකරණයේ විනිශ්චයකාරවරුන් කවදාවත් එතැනින් විශ්‍රාම යන්නේ නැහැ. මහෙස්ත්‍රාත් අධිකරණයට පත් වන විනිශ්චයකාරතුමන්ලා විශ්‍රාම යන්නේ එක්කෝ මහාධිකරණයෙන්, නැත්නම් අභියාචනාධිකරණයෙන්. එහෙමත් නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. එතකොට මහෙස්ත්‍රාත් අධිකරණයේ තිබෙන ලක්ෂ අටකට වැඩි නඩු ප්‍රමාණයට මහෙස්ත්‍රාත් අධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම යැමේ වයස අදාළ වෙන්නේ නැහැ. තව ලක්ෂ දෙකක් නඩු තිබෙනවා, දිසා අධිකරණයේ. විනිශ්චයකාරවරයෙක් කවදාවත් දිසා අධිකරණයෙන් විශ්‍රාම යන්නේ නැහැ. සාමාන්‍යයෙන් විනිශ්චයකාරවරයෙක් විශ්‍රාම යන්නේ එක්කෝ මහාධිකරණයෙන්, එක්කෝ අභියාචනාධිකරණයෙන්, එක්කෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. ඒ නිසා දිසා අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස වැඩි කිරීමෙන් නඩු කටයුතු ඉක්මන් වෙනවාය කියන එක ප්‍රායෝගිකව කිසිසේත්ම විය නොහැකියි. නඩු ලක්ෂ 11න් 10ක්ම තිබෙන්නේ එතැන. එතකොට මේ දෙකේ කිසිම සම්බන්ධයක් නැහැ. මේක හරියට, "බෝල්ට් ඇණයි, තක්කාලියි" වාගේ කියලා මගේ මිත්‍රයෙක් කිව්වා; කිසිම සම්බන්ධයක් නැහැ. මේ ව්‍යවස්ථා සංශෝධනය සහ නඩු කල් යැමේ ප්‍රශ්නය සංසන්දනය වන්නේ අන්න ඒ විධියටයි. හරියට, තක්කාලියි, බෝල්ට් ඇණයි වාගේයි. කිසිම සම්බන්ධයක් නැහැ. මෙවැනි අර්ථ විරහිත සංශෝධනයක් ගෙන එන වෙලාවේ විපක්ෂය හැටියට අපි ඉල්ලා සිටිනවා, 100 සිට 110 දක්වා වූ ස්ථාවර නියෝග අනුව අධිකරණයේ සිදු වන ප්‍රමාදය පිළිබඳව සාක්ෂි විමසා ඒ පිළිබඳව සුදුසු නිර්දේශ ලබා ගන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. 2023දී ආසියානු සංවර්ධන බැංකුව විසින් විශාල මුදලක් වියදම් කරලා විනිශ්චයකාරවරුන්, නීතිඥවරුන්, නීතිඥ සංගම්, සාමාන්‍ය ජනතාව, රාජ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා මේ ප්‍රශ්නයට විස්තරාත්මක පිළිතුරු ගණනාවක් හදලා තිබෙනවා. හැබැයි, ඒ එකකවත් විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස වැඩි කිරීම විසඳුමක් හැටියට දක්වා නැහැ. ඒ, 2023දී. ඊට අවුරුදු 3කට පස්සේ තත්ත්වය වෙනස් වෙලා කියලා හිතනවා නම් අපි ඒ යෝජනාත් පදනම් කරගෙන මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරලා ඒ අනුව කටයුතු කරමු කියලා මම යෝජනා කරනවා.

අද උදෑසන අපි ගරු කථානායකතුමාට මේ යෝජනාව භාර දුන්නා. සද්භාවයක් තිබෙනවා නම්, හොඳ හිතින් නම් මේ වැඩේ කරන්නේ, අපි ඉක්මනින් මේ කාරක සභාවේ කටයුතු අවසන් කරලා මාස තුනක් ඇතුළත - නීතියේ කියන්නේ එහෙමයි - ඒ යෝජනා ඉදිරිපත් කරලා ඒකමතිකව සම්මත කර ගනිමු. ඇයි ඒකට බාධා කරන්නේ? යුක්තිය පසිඳලීම වේගවත් වීමට අපි එකඟයි. ඒ සඳහා කළ යුතු දේ කරමු. අසනීපය එකක්, බෙහෙත වෙන එකක් වුණොත් එහෙම ඒකෙන් සමාජයට යහපතක් වන්නේ නැහැ, අලුත් ප්‍රශ්න මතුවනවා පමණයි. ඒ වාගේම ප්‍රශ්නයක් මතුවනවා, මෙවැනි ව්‍යවස්ථා සංශෝධනයක් - 107 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයෙන් පමණක් කරන්න පුළුවන්ද කියලා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, එපා. මට තව පොඩි වෙලාවක් තිබෙන්නේ. ඔබතුමාගේ වෙලාවේ උත්තර දෙන්න. ඔබතුමාට කථා කරන්න කාලය ලබා දීලා තිබෙනවා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පාර්ලිමේන්තුවට පමණක් මේක කරන්න බැහැ. මම කලින් කිව්ව ආකාරයටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ "අධිකරණයේ ස්වාධීනත්වය" පිළිබඳ පරිච්ඡේදය 107වෙනි ව්‍යවස්ථාවෙන් පටන් ගන්නේම වයස සම්බන්ධයෙන්. ඒ කියන්නේ ධුරයට පත් වනකොටම දන්නවා, විශ්‍රාම යැමේ වයස. ධුරයට පත් වනකොටම දන්නවා, වැටුප. ධුරයට පත් වනකොටම දන්නවා, විශ්‍රාම වැටුප. ධුරයට පත් වනකොටම දන්නවා, අධිකරණයක ස්වාධීනත්වය, විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා වන ඒ ව්‍යවස්ථාවලින් විනිශ්චයකාරවරුන්ට ආරක්ෂාව ලැබෙනවා කියලා. එතකොට ඒ ආරක්ෂාවෙන් එකක් හෝ කිහිපයක් ගලවා ඉවත් කිරීම අධිකරණයේ ස්වාධීනත්වයට පටහැනියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ පිළිබඳ ප්‍රශ්නය මීට කලින් සාකච්ඡා වෙලා තිබෙනවා. මගේ උගත් මිත්‍රයකු වන සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමනි, මට ලැබී තිබෙන වෙලාව සීමිත නිසා ඔබතුමාට පසුව පුළුවන්, මට පිළිතුරු දෙන්න. මේ පිළිබඳ කරුණු මා සතුව තිබෙනවා. S.C. (S.D) No. 64/2022 ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ මොකක්ද? මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් බුවනෙක අලුවිහාරේ ශ්‍රේෂ්ඨ විනිශ්චයකාරතුමා, හිටපු අග්‍ර විනිශ්චයකාර මුර්දු ප්‍රනාන්දු මහත්මිය, ඒ වාගේම වර්තමානයේ විනිශ්චයකාර ධුරයක් දරන ජනක් ද සිල්වා විනිශ්චයකාරතුමා උපුටා දක්වා තිබෙනවා, මීට කලින් තීන්දු වෙච්ච S.C. (S.D) No: 30/2022 නඩුව. Industrial Disputes (Special Provisions) Bill කියන එම නඩු තීන්දුව උපුටා දක්වා මෙසේ කියා තිබෙනවා:

> "... held that Sovereignty in Article 3 of the Constitution must be interpreted to include the right to an independent judiciary."

ඊළඟ පරිච්ඡේදයේ කියනවා, 107 හා 108 ව්‍යවස්ථාවලට අත තිබ්බොත් ඒක අධිකරණයේ ස්වාධීනත්වයට පටහැනියි කියලා. ඒ නිසා 107 ව්‍යවස්ථාව කියවන්න ඕනෑ, ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා මේ පිළිබඳව හොඳින් දන්නවා. ඔබතුමා අහලා ඇති, මෙය කියවන්න ඕනෑ, ජනතාවගේ පරමාධිපත්‍යය විස්තර කරන 3වන ව්‍යවස්ථාව සමඟයි, ජනතාවගේ පරමාධිපත්‍යයේ කොටසක් වන ජනතාවගේ අධිකරණ බලය විග්‍රහ කරන 4 වන ව්‍යවස්ථාව සමඟයි කියන එක. ඒ නිසා 107 වන ව්‍යවස්ථාව කියවන්න ඕනෑ, 3 සහ 4 ව්‍යවස්ථා සමඟයි. දැන් කවුද තීරණය කරලා තිබෙන්නේ අංක 30/2022 නඩුව? විජිත් කේ. මලල්ගොඩ විනිශ්චයකාරතුමා, ඒ.එච්.එම්.ඩී. නවාස් විනිශ්චයකාරතුමා සහ ජනක් ද සිල්වා විනිශ්චයකාරතුමා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මෑත කාලීන විනිශ්චය මණ්ඩප දෙකක් විසින් අධිකරණයේ ස්වාධීනත්වයට අදාළ 107, 108 ව්‍යවස්ථා 3වන ව්‍යවස්ථාව සමඟ එක්ව කියවිය යුතු බවත්, එවැනි අවස්ථාවකදී ඒ ව්‍යවස්ථා වෙනස් කරනවා නම්, ඊට බලපාන දෙයක් කරනවා නම් අනිවාර්යයෙන්ම ජන මත විචාරණයක් පැවැත්විය යුතු බවත් සඳහන් කර තිබෙනවා. එම නිසා මෙම සංශෝධනය තුනෙන් දෙකේ බලයෙන් පමණක් සංශෝධනය කරන්න බැහැ. මේ සංශෝධනය සම්මත කිරීමට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයත් ඕනෑ, ඒ වාගේම ජන මත විචාරණයකුත් ඕනෑ. ඒ වාගේම අපි අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ පනත් කෙටුම්පත ඔබතුමන්ලාට පෞද්ගලිකව බලපාන, වරප්‍රසාද ලැබෙන නීතියක් නිසා මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට ආවාම, මේ නඩුව අහන්න විනිශ්චයකාරවරුන් එකොළොස්දෙනාගෙන්ම සම්පූර්ණ වන විනිශ්චය මණ්ඩපයක් සකසා, සාධාරණත්වය තහවුරු කරන්න කියලා. එය අපි ඔබෙන් බලාපොරොත්තු වනවා. තෝරා ගත් විනිශ්චයකාරවරුන් තුන්දෙනෙක්, පස්දෙනෙක් වෙනුවට විනිශ්චයකාරවරුන් එකොළොස්දෙනාම මේ නඩුව ඇසීමට පත් කරයි කියලා අපි අග්‍ර විනිශ්චයකාර සූරසේන මැතිතුමාගෙන් බලාපොරොත්තු වනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.47]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ මේ විවාදය තුළ විශේෂයෙන් මතු වෙච්ච කාරණාවක් සහ බාහිර සමාජයේ මතු වෙච්ච කාරණාවක් වන, යෝජිත විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ ඒ හරහා මේ රටේ අධිකරණ පද්ධතියේ සමස්ත විනිසුරු ප්‍රජාවගේ විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තවශයෙන්ම අපි මේ ප්‍රශ්නය පටු දේශපාලනික වාසි උදෙසා සමස්ත ගැටලුවෙන් වියුක්ත කරලා අරගෙන සාකච්ඡා කිරීම කොයි තරම් සාධාරණද කියලා විපක්ෂයෙන් මම අහනවා. ඒ වාගේම මම මේ රටේ මහජනතාවටත් එය කියනවා. ඇයි, අපි මේක වියුක්තව ගන්නවා කියන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2024 වර්ෂයේ අපේ රජයට මේ රට භාර දෙනකොට බන්ධනාගාරවල 29,000කට ආසන්න රැඳවියන් ප්‍රමාණයක් හිටියා. ඒ වාගේම පැවැතුණු නඩු ප්‍රමාණය විශාල ප්‍රමාණයක්. ඒ නිසා අපට ලැබුණේ බන්ධනාගාර තදබදය තිබුණු, නඩු විශාල ප්‍රමාණයක් ගොඩගැහිලා තිබුණු රටක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, එක පැත්තකින් අපි "රටම එකට" ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කරන බව. ඒ හරහා දෛනිකව විශාල වශයෙන් මේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, ඒ වාගේම සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ අපරාධකරුවන් අත්අඩංගුවට ගනිමින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය විමර්ශන ක්‍රියාත්මක වෙමින් තිබෙනවා, ඒ වාගේම තරාතිරම නොබලා හැමෝටම නීතිය සමානව ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. එතකොට නඩු ගොඩගැසීම, නැවත වතාවක් බන්ධනාගාරවල තදබදය ආදී සියල්ල එන්නේ එහි ප්‍රතිඵලයක් විධියට. එතකොට අපි ඒ සඳහා උත්තර හොයන කොට, මේ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ, මේ රටේ දීර්ඝ කාලයක් තිබුණු ප්‍රශ්නයකට, යෝජනා වෙමින් තිබුණු, සාකච්ඡා වෙමින් තිබුණු විසඳුම්වල එක කොටසක් පමණයි. ඇයි, අපි එක කොටසක් කියන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් ඉතා හොඳින් දන්නවා, මේ සමස්ත ක්‍රියාවලිය හා සම්බන්ධව ආයතන කිහිපයක් තිබෙන බව. අධිකරණ පද්ධතිය තිබෙනවා, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව තිබෙනවා, ශ්‍රී ලංකා පොලීසිය තිබෙනවා, නීතිපති දෙපාර්තමේන්තුව තිබෙනවා. අපි එනකොට ඒ ආයතනවල පැවැතුණු මානව සම්පත් හිඟතාව, ඒ වාගේම ඒවායේ තිබුණු යටිතල පහසුකම්වල ප්‍රශ්න ආදී සියල්ල එක්ක තමයි මේ ප්‍රශ්නය එන්නේ. ඒ නිසා මේ ජාතික ජන බලවේගයේ රජය බලයට ආපු දවසේ ඉඳන් මේ එකක් වියුක්ත කරලා ගන්නේ නැතුව, පොදුවේ මේ සමස්ත ගැටලුව හඳුනාගෙන, ඒ සම්බන්ධයෙන් ගේන්න ඕනෑ විසඳුම් ගෙනෙමින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඇතැම් අවස්ථාවලදී අපට නීතිමය සංශෝධන ගේන්න සිද්ධ වෙච්ච තැන් තිබෙනවා. නව නීති පනවන්න වෙච්ච තැන් තිබෙනවා. ඒ නව නීති අපි ගෙනැල්ලා තිබෙනවා. මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, කිසිම නීති සංශෝධනයක් මේ ආණ්ඩුව ගෙනැල්ලා නැහැ කියලා. ඒ, පට්ටපල් බොරු. මම ඒවා එකින් එක කියන්න යන්නේ නැහැ, කාලය සීමාසහිත නිසා. අපි නව නීති ගෙනැල්ලා තිබෙනවා, නීති සංශෝධනය කරලා තිබෙනවා.

ඒ වාගේම මම කලින් කියපු අධිකරණ පද්ධතියේ, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ හා බන්ධනාගාරවලට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ඒ සඳහා අවශ්‍ය තැනැත්තන් බඳවා ගැනීම ආදී සියල්ල සම්බන්ධයෙන් අපි දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කරමින් ඇවිල්ලා, එහි දිගුවක් විධියට තමයි විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීම සඳහා විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්නේ. ඒක මේ තරම් විශාල ප්‍රශ්නයක් විධියට හඳුනා ගන්නේ ඇයි කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගේන්නේ නැතුව අපට උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කරන්න බැහැ. ඒක තමයි මේ රටේ පවතින නීතිමය තත්ත්වය. ඒ නිසා මේ කාරණය අල්ලාගෙන, මේකට විරුද්ධ වන කණ්ඩායම්වල විරෝධතාව නිවැරදිව හඳුනා ගැනීම, මේ රටේ ජනතාවටත් වැදගත් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් ටිකකට කලින් නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා - අර තෙරපුම් ජනපති, සිහින ජනපති - එතුමාගේ කථාවට විනාඩි පහකට කලින් පාර්ලිමේන්තුවට එනවා මම දැක්කා. එතුමා කථාව කරලා දිව්වා. ඔහොම නම් ජනාධිපති වෙන්න බැහැ. තමන්ට විරුද්ධව නැඟෙන ප්‍රශ්නවලට උත්තර දෙන්න මේ සභාවේ ඉන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බන්ධනාගාරවල ප්‍රමාණවත් පහසුකම් නැහැ, සතුටුදායක සෞඛ්‍ය සේවාවක් සහ අර්ථවත් පුනරුත්ථාපන වැඩ පිළිවෙළක් නැහැ, ඒකට ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැ කියලා එතුමා මාධ්‍යයට ප්‍රකාශයක් කරලා තිබෙනවා මම දැක්කා. කවුද මෙහෙම කියන්නේ? මෙහෙම කියන්නේ, මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් හිටපු අය. එතුමාගේ තාත්තලා, බාප්පලා, මහප්පලා ආණ්ඩු කරලා නිර්මාණය කරපු අධිකරණ පද්ධතිය, නිර්මාණය කරපු

[ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා]

බන්ධනාගාර පද්ධතිය, නිර්මාණය කරපු සමස්ත පද්ධතිය අවුරුද්දයි මාස අටකට කලින් අපට භාර දීලා නාමල් රාජපක්ෂ කියනවා, ප්‍රමාණවත් පහසුකම් නැහැ කියලා. ඒවා ගිහිල්ලා කියන්න ඕනෑ, ගෙදර. මොකද, ඒගොල්ලන්ට මේ රටේ ජනතාව බලය ලබා දීලා තිබුණා, ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගන්න.

ඒ වාගේම එතුමා කියනවා මම අහගෙන හිටියා, අද ඇත්ත වශයෙන්ම සාකච්ඡා කළ යුතු යෝජනාව ගැන. මේ යෝජනාවෙන් ගන්නා මුද්‍රලුත් හැකර්වරු ගෙනියයිද දන්නේ නැහැ කියලා එතුමා කිව්වා. ඊට කලින් එතුමා ඇවිල්ලා කියන්න ඕනෑ, බාප්පා කොහේද කියලා. හැකර්වරු ගෙනිහිල්ලාද? ඥාති සහෝදරයා, හිටපු කථානායකගේ පුතා රටින් පැනලා ගිහිල්ලා. ඔහු කෝ? ඊයේ තමන්ගේ සහෝදරයාට අධිචෝදනා භාර දුන්නා, මහාධිකරණයෙන්.

ඒ විතරක් නොවෙයි, එතුමා හරි ලස්සන කථාවක් කිව්වා. වත්මන් පොලිස්පතිවරයාට කියනවාලු, කලින් පොලිස්පතිවරුන්ට වෙච්ච දේ දිහා බලලා හැදෙන්න කියලා. මොකක්ද කලින් පොලිස්පතිවරුන්ට වෙච්ච දේ? ඒගොල්ලන්ට ඕනෑ විධියට, ඒගොල්ලන්ගේ දේශපාලන වුවමනාවලට වැඩ කරලා වෙච්ච දේ දිහා තමයි බලන්න වෙලා තිබෙන්නේ. නමුත් අද වනවිට පොලිස්පතිවරයා මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක කරනවා. එතුමාට මේ කාරණය කියන්න අමතක වුණා. පොලිස්පති විතරක් නොවෙයි, හිටපු නාවික හමුදාපතිත් ඒගොල්ලන්ට ඕනෑ විධියට වැඩ කරලා, අධිචෝදනා පත්‍රයක් ඊයේ භාර ගත්තා. එහෙම තමයි මේ රට කළේ. එහෙම එකේ නාමල් රාජපක්ෂ අද මෙතැනට ඇවිල්ලා කියනවා, ආණ්ඩුව දැන-දැන බොරු කියනවාලු, අවබෝධයෙන් බොරු කියනවාලු. කවුද එහෙම කියන්නේ? මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහිමි කරලා, තමන්ගේ පවුලට දීර්ඝ කාලයක් බලයේ ඉන්න ඕනෑ විධියට නීති සම්පාදනය කර ගන්න ගෙනාපු දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඉස්සුවා. ඊට පස්සේ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් යම් බලතල ප්‍රමාණයක් අඩු කළාට පසුව නැවත ඒ බලතල ටික ලබා ගන්න ගෙනාපු විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඉස්සුවා. ඊට පස්සේ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඉස්සුවා. නාමල් රාජපක්ෂලා රෙද්දක් ඇඳගෙනද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්නේ හෘදය සාක්ෂියට එකඟව දේශපාලනය කරන්න කියලා? එහෙම කියලා ඒ කිසිම ප්‍රශ්නයකට උත්තර දෙන්න කලින් මොහොතක්වත් සභාවේ රැඳී ඉන්නේ නැතුව දුවනවා. එහෙම දුවලා එළියට ගිහිල්ලා ඊළඟ ජනාධිපති වෙන්න හීන දකිනවා.

තවත් ඉතාම වැදගත් කාරණාවක් මේ වෙලාවේ මම කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. පොදුජන පෙරමුණේ ලේකම්වරයා, නීතිඥයෙක්. ඔහු පසුගිය දවසක මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා වත්මන් පොලිස්පතිවරයාට මරණීය තර්ජනයක් කළා. ඒක මරණීය තර්ජනයක්. ඔහු නම් කරලා මේ පොලිස්පතිවරයාට කිව්වා පාරේ ගුටි කාලා මැරෙන්න වෙන්නේ නැති විධියට වැඩ කරන්න කියලා. ඒ නිසා අපි විශේෂයෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම අපට දැන් තේරෙනවා, මේ අය මේ සංශෝධනවලට විරුද්ධ වෙන්නේ ඇයි කියලා.

මට පෙර කථා කළ මන්ත්‍රීවරයා කිව්වා, මේක තනි පුද්ගලයෙක් ඉලක්ක කරගෙන ගෙනෙන සංශෝධනයක් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නීතිඥවරියක විධියට ඔබතුමියත් දන්නවා, මෙවැනි සංශෝධනයක් කොයි මොහොතේ ගෙනාවත් තත්කාලයේ බලයේ ඉන්න විනිසුරුවරුන්ට ඒක බලපානවා කියන එක. එතකොට කොහොමද කියන්නේ මේක තනි පුද්ගලයෙක් අරමුණු කරගෙන ගෙනෙනවාය කියලා? ඒ වාගේම මේක හදිසියේ ගෙනෙනවාය කිව්වා. හදිසියේ ගෙනෙන්නේ නැහැ. ඔබතුමිය දන්නවා, 2016 අවුරුද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට Subcommittee on Judiciary කියලා අනුකමිටුවක් පත් කළ බව. කවුද ඒකේ හිටියේ? සභාපතිවරයා විධියට රවුෆ් හකීම්, අනුර ප්‍රියදර්ශන යාපා, නවීන් දිසානායක, තලතා අතුකෝරල, චන්දිම වීරක්කොඩි, සුජීව සේනසිංහ වැනි කණ්ඩායමක් තමයි ඒ අනුකමිටුවේ ඉඳලා ඒ මොහොතේදී විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම අනුමත කරලා එව්වේ. ඒ නිසා මේක අලුත් එකක්වත්, මේ ආණ්ඩුව තකහනියේ ගෙනෙන එකක්වත් නොවෙයි. මේක දීර්ඝ කාලීන සාකච්ඡාවක් ඇතුළේ දීර්ඝ කාලීනව තිබුණු ප්‍රශ්නයකට බොහෝ විසඳුම් ගෙනාපු තව එක පියවරක් විතරයි කියන එක මේ වෙලාවේදී මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

විපක්ෂයෙන් වාගේම, මේ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වන සියලුදෙනාගෙන් අපට අහන්න එක ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට අපි විරුද්ධයි, අහවල්ලු විරුද්ධයි කියනවා මිසක්, මේකෙන් අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑමක් වෙනවා යැයි කියනවා මිසක්, මේ රටේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම නිසා නිශ්චිතව අධිකරණයට සිද්ධ වන බලපෑම මොකක්ද කියලා කවුරුවත් කියන්නේ නැහැ. මොකක්ද සිද්ධ වන බලපෑම? අඩුම ගාණේ මෙතැනින් ඉස්සරහට කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරු මේකෙන් අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑමක් වෙන්නේ කොහොමද කියා මේ සභාවට පැහැදිලි කරයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නඩු තීන්දුවක් දක්වමින් කිව්වා, මේ සඳහා ජනමත විචාරණයකට අනිවාර්ය වශයෙන් යා යුතුයි කියලා. ජනමත විචාරණයකට යනවා කියලා තීරණය කරන්නේ කවුද? ජනමත විචාරණයකට යනවා කියලා එක්කෝ ජනාධිපතිවරයා විසින් ස්වේච්ඡාවෙන් තීරණය කරන්න ඕනෑ. එහෙම තීරණය නොකරන අවස්ථාවකදී මේ සියලු මහත්වරුන්ට ඉදිරියේදී අවස්ථාවක් එනවා, ඒ සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියට පටහැනිද, නැද්ද කියන එක විමසලා ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණය ඒ මොහොතේ සුදුසු තීන්දුවක් අනිවාර්ය වශයෙන්ම ලබා දෙයි. ඒ නිසා ඒකට කල් තියාගෙන ඊට කලින් පටු දේශපාලන අරමුණු වෙනුවෙන් මේ රටේ ජනතාවගේ ජීවිතයට ඉතා තදින් බැඳිලා තිබෙන කාරණයක් ගැන බිල්ලෝ මවන්න එපා. නඩු කියන්නේ මිනිසුන්ගේ ජීවිතය හා බැඳුණු දෙයක්. ඔවුන් ඒ නඩු ඉවර වෙනකම් බලාගෙන ඉන්නවා. රජය ඒ පියවර ගන්නේ දවස ගාණේ උසාවි ගිහිල්ලා පීඩා විඳින මිනිස්සු ඒ පීඩාවෙන් ගලවා ගන්න. පටු දේශපාලනය නොතකා ඒ වෙනුවෙන් සහාය දෙන්න කියන ඉල්ලීම තමයි අපි විපක්ෂයෙන් කරන්නේ.

කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.59]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද පරිපූරක ඇස්තමේන්තුවක් ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. සහන දෙන්න විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා කියනවා. ඒ වෙනුවෙන් විශාල මුදලක් වෙන් කළාට ස්තුතියි. "දිට්වා" ආපදාවෙන් පීඩාවට පත් ජනතාවට සහන ලබා දෙන්න විශාල මුදලක් වෙන් කළා. ඊට වඩා විශාල මුදලක් දැන් වෙන් කරනවා. අපි ජනතාවට සහන ලබා දෙන්න ඕනෑ. අපි ඒක අගය කරනවා.

මැද පෙරදිග යුද්ධය නිසා ඉන්ධනවලට වැඩි ඩොලර් ප්‍රමාණයක් වැය වෙලා තිබුණා. අද වනකොට ලාම්පුතෙල් වාගේ ඉන්ධන පාවිච්චි කරන සුළු පරිමාණයේ බෝට්ටු හිමි ධීවරයා ලොකු අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. හැම අවස්ථාවකදීම ඉලක්කම්වලින් කියනවා, ඒ අය වෙනුවෙන් මෙච්චර මුදලක් වෙන් කළා කියලා. ඇත්තටම ඒ සහනය ධීවර ජනතාවට ලැබෙනවාද කියලා බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා ගොවි ජනතාව ගැනත් කථා කළා. විශාල මුදලක් පොහොර සහනාධාරය ලෙස දෙනවා කිව්වා. කල්පිටිය, නොරොච්චෝලේ වාගේ කෘෂිකාර්මික ප්‍රදේශයක ජීවත් වන පුද්ගලයකු වන මම දන්නවා, අද පොහොර මිටියක් රුපියල් 14,000ක්, 15,000ක් වෙනවා කියලා. රුපියල් 1,000ක සහනයක්වත් ඒ ප්‍රදේශවල ජනතාවට හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා අපේ රටේ ඉන්න කෘෂිකාර්මික කටයුතු කරන ජනතාවට සහ ධීවර ජනතාවට ඒ සහනාධාර දෙන එක ගැන හිතලා බලන්න. එක කොටසකට දීලා ඔවුන් සතුටු කරනවා වෙනුවට සියලු ජනතාවට ඒ සහන ලබා දෙන්න ඕනෑ. ඇත්තටම ධීවර ජනතාව, ගොවි ජනතාව අද වනකොට ලොකු පීඩනයක ඉන්නේ. අද වනකොට ඉන්ධනවලින් ක්‍රියාත්මක වන කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ තිබෙනවා. විදුලියෙන් ක්‍රියාත්මක වන යන්ත්‍රෝපකරණ තිබෙනවා. ඒ නිසා පලතුරු, එළවලු අඩු මිලට දෙනවා. ආණ්ඩුවක් හැටියට ඒ අයට සහන ලබා දෙන්න කටයුතු කරන්න කියලා කාරුණිකව මම ඉල්ලා සිටිනවා.

අද තිබෙන තත්ත්වය බලන්න. ජනතාවට ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද? දැන් කිව්වා, අස්වැසුම සහනාධාරය දෙනවා කියලා. අස්වැසුම සහනාධාරය දීලා දුප්පත්කම නැති කරන්න බැහැ. කලින් සමෘද්ධි සහනාධාරය දුන්නා. දැන් අස්වැසුම සහනාධාරය දෙනවා. කාලයෙන් කාලයට මේවා දෙනවා. දුන්නාට ජනතාවට ඒකෙන් ප්‍රයෝජනයක් නැහැ. ඔබතුමන්ලා කලින් කිව්වා, ඉන්ධන ලංකාවට ගෙනැවිත් බානකොට ලෝක වෙළෙඳ පොළේ පවතින මිලට ඉන්ධන දෙනවා කියලා. දෙන්නේ නැහැ නේ. අද ඉන්ධන මිල කීයද? ඇත්තටම අද දුප්පත් ජනතාව ඉතා අසරණ වෙලා ඉන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනතාවට සහන දෙනවාට මා විරුද්ධ නැහැ. මෙම පරිපූරක ඇස්තමේන්තුව අද අනුමත වනවා. ඇත්තෙන්ම කිව්වොත්, රටේ සමස්ත ජනතාවටම මේ සහන ලැබෙන්න ඕනෑ.

පොහොර සහනාධාරය දෙනවා, දෙනවා කිව්වාට ලැබිලා නැහැ. අද මම වගකීමෙන් කියනවා, මේ කාරණය. ඔබතුමන්ලා ගිහින් බලන්න, නොරොච්චෝලේ, කල්පිටිය ගොවි ජනතාවට රුපියලක සහනාධාරයක් ලැබිලා තිබෙනවාද කියලා. අද පොහොර මිල ඉහළ ගිහින් තිබෙනවා. ඩීසල් හා ලාම්පුතෙල් මිල ඉහළ යනවා. ඒ වාගේම electricity bill එක ඉහළ යනවා. කොහොමද ගොවිතැන් කරන්නේ? කොහොමද ධීවර ජනතාව ධීවර රස්සාව කරන්නේ? ඒ තත්ත්වයට රට වැටිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මස 10වැනි දා උසස් පෙළ විභාගය ආරම්භ වනවා. එම විභාගයට රට පුරා සිටින දරුවන් පෙනී ඉන්නවා. ළමයින් අවුරුදු 12ක්, 13ක් අධ්‍යාපනය ලබලා උසස් පෙළ විභාගයට ලියන්නේ. 10වැනි දා උසස් පෙළ විභාගය පටන් ගන්නවා. ඒ වාගේම Grade 5 Scholarship Exam එකට ලියන ළමයිනුත් ඒ exam එකට ලියන්න තිබෙනවා. හැබැයි, අද කරන්ට් එක කපනවා. මන්නාරම, පුත්තලම දිස්ත්‍රික්කවල, ඒ දුෂ්කර ප්‍රදේශවල ළමයින් පාඩම් කරමින් ඉන්නකොට කරන්ට් එක යනවා. එතකොට හරියට පාඩම් කරගෙන විභාගයට යන්න බැහැ. මම දේශපාලනය පැත්තෙන් නොවෙයි කියන්නේ. විශේෂයෙන්ම මේ ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමියගේත්, විදුලිබල මණ්ඩලයේත්, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේත් අවධානය යොමු වෙන්න ඕනෑ. ළමයින් ලක්ෂ ගණනක් උසස් පෙළ විභාගයට ලියන්න ලැහැස්ති වෙනවා. ඒ ළමයින් වෙනුවෙන් අපි සියලුදෙනාට වගකීමක් තිබෙනවා. ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා නැතුව අපට ඒ වගකීම තිබෙනවා. එම දරුවන්ට හොඳ මානසික මට්ටමෙන් උසස් පෙළ විභාගයට ලියන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ.

අපි දැක තිබෙනවා, සමහර centresවල කරන්ට් එක නැති වෙනවා, ජලය නැති වෙනවා. එතකොට ළමයින් කොච්චර දුෂ්කරතාවලට, ප්‍රශ්නවලට මුහුණ දෙනවාද? ඒ දරුවන් සම්බන්ධයෙන් ආණ්ඩුවට සහ අපි සියලුදෙනාට වගකීමක් තිබෙනවා. එම දරුවෝ වෙනුවෙන් හොඳ centres ලබා දීලා, ඒ අයට ආරක්ෂාකාරීව උසස් පෙළ විභාගයට ලියන්න පුළුවන් විධියට කටයුතු සකස් කර දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා මේ ගැන සොයා බලන්න. සමහර ළමයින් පාඩම් කරමින් ඉන්නකොට කරන්ට් එක යනවා. එතකොට ළමයින් මානසිකව වැටෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ගැන අවධානය යොමු කරලා, විශේෂයෙන්ම උසස් පෙළ විභාගයට සහ scholarship විභාගයට පෙනී ඉන්න ළමයින් වෙනුවෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා අධ්‍යාපන විෂය භාර ඇමතිතුමිය වන ගරු අගමැතිතුමියගෙනුත්, විදුලිබල මණ්ඩලයෙනුත්, ජල සම්පාදන මණ්ඩලයෙනුත් මා ඉල්ලා සිටිනවා.

අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රත්න ගමගේ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.05]

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන පරිපූරක ඇස්තමේන්තුවට

[ගරු රත්න ගමගේ මහතා]

අදාළවයි අප කථා බහ කරන්නේ. මෙම පරිපූරක ඇස්තමේන්තුව යොමු කරලා තිබෙන්නේ, මැදපෙරදිග ඇති වෙලා තිබෙන ව්‍යසනකාරී තත්ත්වය නිසා ඇති වුණු ඉන්ධන අර්බුදය නිසා අපේ රටේ පීඩා විඳින විවිධ ක්ෂේත්‍ර සඳහා සහන ලබා දීමටයි. ගෝලීය අර්බුදයක් පවතින මොහොතක එම අර්බුදයේ ප්‍රතිඵල අපේ වාගේ රටවල මොන මොන ක්ෂේත්‍රවලට බලපායි ද කියලා රජයක් වශයෙන් අපි පළමුව තේරුම් ගත්තා. අපේ රටේ විශේෂයෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයත් එක්ක බැඳුණු ප්‍රජාවට තමයි ඒකෙන් බරපතළ ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, විශේෂයෙන්ම ගොවි ජනතාවට, ධීවර ජනතාවට, කුඩා තේ වතු හිමියන්ට සහ කර්මාන්ත ක්ෂේත්‍රවල නියුතු ප්‍රජාවට. ඒ වාගේම ආර්ථික මට්ටමෙන් පහළ අය, විශේෂයෙන්ම අස්වැසුම්ලාභීන් වැනි අයට ගැටලුවලට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා.

ඊළඟට, මෙතැනදී බලපාන ප්‍රශ්නයක් තමයි, විදුලිය නිෂ්පාදනය කිරීමේදී බලපාන ඉන්ධන අර්බුදය. ඒ නිසා විදුලි පාරිභෝගිකයන්ට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙනවා. මේ ක්ෂේත්‍ර සඳහා කඩිනම් සහන ලබා දීමේ අරමුණින් රජය මේ සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් යොමු කර තිබෙනවා, රුපියල් බිලියන 100ක. මේ ඇස්තමේන්තුව තුළින් රටේ ජනතාවට කෙටි කාලීන පහසුකම් ලැබුණා. විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ක්ෂේත්‍ර සඳහා ඒ පහසුකම් ලැබුණා. අපේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදීත් ඉදිරිපත් කළා, ධීවර ප්‍රජාව සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ඉන්ධන ප්‍රශ්නය පිළිබඳව. ඉන්ධන - තෙල් - මත තමයි මේ කර්මාන්තය පවතින්නේ. ඒ නිසා ධීවර කර්මාන්තයේ නියුතු ජනතාව වෙනුවෙන් විශේෂයෙන්ම සුළුපන්න ධීවර කාර්මිකයන්ට මසකට රුපියල් 31,250 ගණනේ මාස 3කට රුපියල් 93,750ක සහනාධාරයක් සඳහා මුදල් වෙන් කළා, යාත්‍රා 35,000කට. ඒ වාගේම අපි දන්නවා, බහුදින ධීවර යාත්‍රාවකට අතිවිශාල ඉන්ධන ප්‍රමාණයක් වැය වන බව. එහෙම වැය වන නිසා බහුදින යාත්‍රාවකට එකවර ලක්ෂ එකහමාරක ඉන්ධන සහනාධාරයක් සැපයුවා මාස 3ක කාලයක් සඳහා. ඒක මේ මොහොතේ අස්වැසිල්ලක්. අපි දන්නවා, ඉන්ධන සඳහා ඔවුන් විශාල වියදමක් දරනවා කියලා. අපි ඒක නිහතමානීව පිළිගන්නවා. රජයක් වශයෙන් අපි ඒක තේරුම් ගත්තා. තක්සේරුවක් තිබෙනවා අපට. ඔවුන් මේකෙන් පීඩාවට පත් වනවා කියලා දන්නා නිසා, අවබෝධයක් තිබෙන නිසා තමයි ධීවර ප්‍රජාවට මේ සහනය ලබා දුන්නේ. ගොවි ජනතාවටත් ඒ සහනය ලබා දුන්නා. ඒ වාගේම ඒ සහනය කුඩා තේ වතු හිමියාටත් ලබා දුන්නා, විදුලි පාරිභෝගිකයාටත් ලබා දුන්නා. ඒ නිසා අද ඔබතුමන්ලාගෙන් පැත්තෙන් කරුණු ඉදිරිපත් කරන්න මේක හොඳ නැද්ද කියලා අපි අහනවා. නරකද මේක?

නාමල් රාජපක්ෂ මහත්මයා බලාගෙන ඉන්නේ ජනාධිපති වෙනවා කියලා නේ. අනේ ෂෝක්! මරු. එතුමා නියම කථාවක් කළා. නියමෙට පරිණතභාවය පෙන්නුම් කළා. අන්න, නියම අනාගතය. මම බලාගෙන හිටියේ, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට හරි හිනා, ඒ කථා කරන වෙලාවේ. මම දන්නේ නැහැ, මොන විධියේ සිහිනයක ද ඉන්නේ කියලා. ඒ හින්දා එක දෙයක් කියන්න ඕනෑ. තව ඉගෙන ගන්න වෙනවා ඕවා. අඩු ගාණේ කථාවක් කරන හැටි තේරුම් ගන්න. ඒ නිසා audience එකට, මයික් එකට, එක එක channelsවලට දමන්න කථා කියලා හරියන්නේ නැහැ. පරිණත වෙන්න එපායැ. ආවා, කථා කළා, ගියා.

මම එතුමාගෙන් අහන්නේ මේ සහන ලබා දෙනවාට විරුද්ධද කියලායි. ධීවර ජනතාවට සහන ලබා දෙනවාට එතුමා විරුද්ධද? ඒක එතුමා මෙතැන හිටියා නම් අහන්න තිබුණා. කථා කරලා ගියා, ඉන්නේ නැහැ නේ. වැඩි වෙලා ඉන්න බැහැ. ගොවි ජනතාවට සහන දෙනවාට විරුද්ධද? කුඩා තේ වතු හිමියාට සහන දෙනවාට විරුද්ධද? විදුලි පාරිභෝගිකයාට සහන දෙනවාට විරුද්ධද? මට දැන් එතුමාගේ හිස් පුටුව දිහා බලාගෙන කථා කරන්න වෙලා තිබෙන්නේ. අයියනායක දෙවියන්ට කොළ ඉත්ත ගහලා යනවා වාගේ තමයි මෙතැන වෙලා තිබෙන්නේ. පුටුව දිහා බලාගෙන කථා කරන්න වෙලා තිබෙන්නේ. අඩු ගණනේ මොකක් හරි තිබුණා නම් හරි. කුලුනක්වත්, සොහොන් කොතක්වත් හරි තිබෙන්න එපායැ ඔතැන, මොකක් හරි කථා කරන්න. කියනවා නම්, කියන දේ ගැන වගකීමක් තිබෙන්න ඕනෑ.

අපි නාමල් මහත්මයාගෙන් අහන්නේ, ගොවි ජනතාවට, ධීවර ජනතාවට, කුඩා තේ වතු හිමියාට, කර්මාන්තකරුවාට, විදුලි පාරිභෝගිකයාට, අස්වැසුම්ලාභියාට අපේ රජයෙන් සහන දෙනවාට විරුද්ධද, නැද්ද කියලායි. ප්‍රකාශයක් කරන්න ඒ ගැන. දැන් මෙතැනට ඇවිල්ලා පුළුවන් නම් ප්‍රකාශයක් කරලා යන්න. විරුද්ධයි නම් ඒක කියන්න. සහන ලබා දීමේ චේතනාවෙන් මේ ඉදිරිපත් කරපු ඇස්තමේන්තුවට අද එතුමන්ලාගේ පැත්තෙන් උත්තර නැත. දැන් කරන්න දෙයක් නැහැ නේ, මේ කාලයේ. කියන්න දෙයක් නැහැ. දැන් ආණ්ඩුව වට්ටන්න දැවැන්ත වැඩ පිළිවෙළක් කථා කරමින් යනවා. කොහේ වට්ටන්නද? වට්ටයි! පසුගිය දවස්වල කිව්වා, පෙරළනවා කියලා. කොහේ පෙරළන්නද? පෙරළයි! කෙණ්ඩ පෙරළෙනවා දැන් රට වටේ ගිහිල්ලා. කෙණ්ඩ තමයි පෙරළිලා තිබෙන්නේ, ඒගොල්ලන්ගේ.

දැන් වෛර කල්ලියක් එකතු වෙලා ඒ අය දැවැන්ත වැඩ පිළිවෙළක් ගෙනියනවා. ඒ තමයි, එක් එක් පුද්ගලයන් ඉලක්ක කරගත් මඩ ප්‍රහාර නිකුත් කරන එක. කාලයක්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ රංග දිසානායක මැතිතුමාට දිගට හරහට ගහන්න පටන් ගත්තා. දැන් ඒ ජවනිකාව පොඩ්ඩක් ඉවර කරලා පැත්තකින් තබා තිබෙනවා. ඊළඟට, ප්‍රහාරයක් නිකුත් කළා, ශානි අබේසේකර මහත්මයාට. ඒකත් දැන් පොඩ්ඩක් තාවකාලිකව නතර කරලා තිබෙනවා. ඊළඟට, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මැතිතුමාට ප්‍රහාරයක් නිකුත් කරගෙන ගියා. දැන් ඒකත් පොඩ්ඩක් නතර කරගෙන තිබෙනවා. ඊළඟට, අගවිනිසුරුතුමා ඉලක්ක කරගෙන ප්‍රහාරයක් නිකුත් කරගෙන ගියා. ඒකත් දැන් පොඩ්ඩක් නතර කරලා තිබෙනවා. දැන් කවුද අල්ලා ගත්තේ? නාමල් මහත්මයාගේ කථාවේදී පොලිස්පතිතුමා අල්ලා ගත්තා. ඊයේ එතුමන්ලාගේ පක්ෂයේ මහ ලේකම් සාගර කාරියවසම් මහත්මයා ප්‍රකාශයක් කරමින් කිව්වා, "මේ 37වැනි පොලිස්පතිවරයා, මහ පාරේදී ජනතාවගේ පහරකෑමට ලක් වෙලා නසිනවා" කියලා. ඒක ත්‍රස්තවාදී නායකයෙක් කරන ප්‍රකාශයක්. මම ගරු මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණයක් කරන්න කියලා. ගරු මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙනුත් ඉල්ලනවා, ඒ සම්බන්ධයෙන් කඩිනම් පරීක්ෂණයක් කරන්න කියලා. ඒක ත්‍රස්තවාදී නායකයෙක් කරන ප්‍රකාශයක්. එතුමා ඒ පක්ෂයේ මහ ලේකම්. ජාතික සංවිධායක කියන්නේත් ඒ හා සමාන දේවල්. බොහොම පැහැදිලිව, මේ යන්නේ එක ලයින් එකක්. මේ එකිනෙක අතර අවස්ථා සම්බන්ධයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බොහොම පැහැදිලිව අපි මේකත් කියන්න ඕනෑ. අපි මේ රට හොඳින් කරගෙන යන්න සැහෙන්න උත්සාහයක් දරමින් යනවා. අපේ රටට හදිසි ව්‍යසනයක්, අර්බුදයක් ආපු වෙලාවේදී තමයි ගරු

ජනාධිපතිතුමා පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කරලා රුපියල් බිලියන 100ක සහනාධාර ප්‍රමාණයක් දෙන්න යන්නේ. නමුත්, විපක්ෂයේ අය අද ඇවිල්ලා මොනවාද කථා කරන්නේ? මෙතැනට ඇවිල්ලා විභාග ගැන කියනවා. විභාග ගැන මගෙන් අහගන්න එපා. එයාලා ඉතින් කාමර ඇතුළට වෙලා විභාග ලියපු කට්ටිය නේ; කාමර ඇතුළේ A/C දාගෙන විභාග ලියපු අය නේ.

අද උදේ ගරු අගමැතිතුමිය ප්‍රකාශයක් කළා, පවතින කාලගුණ තත්ත්වය පිළිබඳව හෙට දවසේදී - 05වන දා- තීරණයක් ගන්නවා කියලා. කාලගුණ තත්ත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස්තුමියත් මාධ්‍යයට ප්‍රකාශයක් කරලා තිබුණා. එහෙම නේද, ගරු අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමනි? ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නවා. හෙට දවසේ ඒ ගැන තීන්දුවක් ගන්නවා කියලා ප්‍රකාශ කළා. නමුත් විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමා දැන් කියනවා, උසස් පෙළ විභාගය ගැන. අනේ! අපෙන් අහගන්න එපා විභාග ලියපු හැටි. කාමර ඇතුළට වෙලා A/C දාගෙන තනියම විභාග ලියපු අය නේ, ඒ. විභාගයක් ලියන්න තේරෙනවාද දන්නේ නැහැ. විභාගයක් ලියන්න මහන්සි වන හැටි දන්නවාද දන්නේ නැහැ. පොත පත කියවා තිබෙනවාද දන්නේත් නැහැ. එහෙම නිකම් කථා කරන්න එපා. ඔයිට වඩා තව පොඩ්ඩක් සූදානම් වෙලා එන්න, කථාවක් කරන්න. ඒ මන්ත්‍රීතුමා අදත් මෙතැනට ඇවිල්ලා ටෝක් එකක් දීලා ගියා. දැන් ළඟපාත ඉන්නවා නම් එන්නකෝ. කොහේ හරි ළඟක ඉන්නවා නම් පුළුවන් නම් ඇවිල්ලා කථා කරන්නකෝ. පුළුවන් නම් මේවාට උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* ජනාධිපති වෙන්න සිහින දකිනවා. මොන ජනාධිපති ද? පිස්සු කථා! ඕනෑ නම් ඊළඟ පාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ඉල්ලන්න පුළුවන්. *[බාධා කිරීමක්]* අද මෙතැනට ඇවිල්ලා ආණ්ඩුවට දොස් කියනවා. *[බාධා කිරීමක්]* බන්ධනාගාර ගැනත් කථා කරනවා. ඒක එයාගේ favourite එකක් නේ.

බන්ධනාගාර ගැටලුව ගැන අපි දන්නවා. අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. අපි ඒ අර්බුදය තේරුම් ගත්තා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දකුණු පළාතට බන්ධනාගාර 5ක් තිබෙනවා. ඒවා පිහිටා තිබෙන්නේ, බූස්ස, ගාල්ල, මාතර, අඟුණකොළපැලැස්ස සහ වීරවිල. ඊයේ අපි දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමායි, අපේ දේශපාලන අධිකාරියයි, මේ කියපු බන්ධනාගාර පහේ බන්ධනාගාර අධිකාරිතුමන්ලායි, ත්‍රිවිධ හමුදාව සහ පොලීසියයි කැඳවලා මේ ප්‍රශ්න පිළිබඳව කථා කළා. රැඳවියන් 450ක් ඉන්න පුළුවන් ගාල්ල බන්ධනාගාරයේ මේ වන විට රැඳවියන් 2,000ක් විතර ඉන්නවා කියලා අපි දන්නවා. රැඳවියන් ප්‍රමාණය වැඩි වෙලා. ඒක ඇත්ත කථාව. මාතර බන්ධනාගාරයේ රැඳවියන් තුන්ගුණයක් වැඩි වෙලා තිබෙනවා. රැඳවියන් 700ක් ඉන්න පුළුවන් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ මේ වන විට රැඳවියන් 3,000ක් විතර ඉන්නවා. අපි ඒක දන්නවා. ඒවාට අවශ්‍ය විසඳුම් පිළිබඳව අපි දැන් සාකච්ඡා කරලායි තිබෙන්නේ. අපේ ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා ඇමතිතුමා ඒකට පිළියම් යොදා තිබෙනවා. 2027-2028 වනකොට ඒ අයට පහසුකම් සහිත ස්ථාන බවට බන්ධනාගාර පත් කරන්න අවශ්‍ය පිළියම් යොදා තිබෙනවා.

මේ බන්ධනාගාර ගැටලුව සම්බන්ධයෙන් අද "දිවයින" පුවත් පතේ සඳහන්ව තිබෙනවා. එම පුවත් පතේ සඳහන්ව තිබෙනවා, "මේ අර්බුදය සංවිධානාත්මක කල්ලියක් විසින් සිදු කරන කටයුත්තක්" කියා. මම ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාගෙනුත්, ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා. ඒ වෙච්ච සිදුවීම්වලයි විපක්ෂයේ ඇතැම් අය කරන ප්‍රකාශවලයි කිසියම් අන්තර් සම්බන්ධයක් තිබේ දෝයි සැකයක් තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කරන්න කියා මම කියනවා. මේ ප්‍රශ්නය බරපතළයි. මොකද, මේ සිද්ධිය සිදු වුණේ බන්ධනාගාරවලයි. ඒ නිසා තමයි කියන්නේ බන්ධනාගාරවල තදබදය අඩු කිරීමට නම් අධිකරණ පද්ධතිය කාර්යක්ෂම විය යුතුයි කියලා. ඒ නිසා විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව දීර්ඝ කිරීම, විනිසුරුවරුන් ප්‍රමාණය වැඩි කිරීම, අධිකරණ ප්‍රමාණය වැඩි කිරීම ආදිය එක් පිළියමක්. එම නිසා මේ එකකට එකක් අතර තිබෙන්නේ ගැළපීමක්. පොලිස්පතිවරුන්ට ඒ කියපු තත්ත්වය උදා වුණේ තමුන්නාන්සේලා හින්දා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොමියුනිස්ට් ප්‍රකාශනයේ තිබෙන මෙන්න මේ ප්‍රකාශය මට මතක් වෙනවා. ඉතිහාසයේ මෙන්න මේ විධියේ අවිචාරවත් පාලනයක් කරගෙන ගිය, එවැනි පාලකයන් සිටි රටක සියල්ල විනාශයටයි ගියේ. එම ප්‍රකාශනයේ සඳහන් වෙනවා, "ශුද්ධ වූ සියල්ල කෙලෙසෙන්නේය; ඝනීභූත වූ සියල්ල වාෂ්පශීලී වන්නේය; ඉහළ මණ්ඩලවල සිට ප්‍රභාවත්ව, දීප්තිමත්ව හිටපු විනිසුරුවරුන්, නීතිවේදීන්, කලාකරුවන්, පූජකයන්ගේ ප්‍රභා මණ්ඩලය අහෝසි වන්නේය" කියලා. එතුමන්ලාගේ පාලන කාල තුළ, අවිචාරවත් කාලයක හිටපු අපේ රටේ වටිනා, ඉහළ, උසස් තනතුරු දැරූ අයට මේ තත්ත්වය උදා වුණා. ඒ නිසා මෙන්න මේ පරිපූරක ඇස්තමේන්තුව සඳහා විපක්ෂයේ තමුන්නාන්සේලාගේත් සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.16]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தின விவாதத்தில் நான் முக்கியமான ஒரு விஷயத்தைப் பேச விரும்புகின்றேன். இன்றைக்கு மலையகத்தின் பல்வேறு பகுதிகளிலுமுள்ள மக்கள் மழையினாலும் வெள்ளத்தினாலும் அதிகம் பாதிப்படைந்திருக்கிறார்கள் என்பது நிறையப் பேருக்குத் தெரியும். அந்த வகையில் குறிப்பாகச் சொல்வதென்றால், கௌரவ அமைச்சர் தோழர் சமந்த வித்யாரத்ன அவர்கள் பேசும்போது, மழையினாலும் புயலினாலும் பாதிக்கப்பட்ட மக்களுக்குப் பல்வேறு நிவாரணங்களை வழங்கவிருப்பதாக உறுதியளித்திருக்கிறார்; கட்டாயம் வழங்குவீர்கள் என்று நான் எதிர்பார்க்கிறேன்.

இந்த இடத்தில் நான் ஒரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். 'தித்வா' புயலுக்குப் பிற்பாடு, பாதிக்கப்பட்ட இடங்களிலுள்ள மக்களைச் சந்திப்பதற்காக நாங்கள் கள விஜயம் செய்திருந்தோம். நுவரெலியா மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கே தற்காலிகக் குடியிருப்புகளில் வாழ்ந்துகொண்டு இருக்கின்ற பல்வேறு குடும்பத்தினருடனும் நாங்கள் கலந்துரையாடினோம். அப்போது அவர்கள் எங்களிடம் முன்வைத்த ஒரேயொரு முறைப்பாடு என்னவென்றால், காவற்றுறையினர் மூலமாகவும் தோட்ட முகாமையாளர்கள் மூலமாகவும் பல்வேறு வகையிலும் அதிகளவான pressure கொடுத்து, தங்களை அந்தப் பகுதியில் இருந்து 'ஆபத்தான பிரதேசம்' என்று அடையாளம் காணப்பட்ட பகுதிக்கு மீண்டும் நகர வேண்டும் என்று சொன்ன விடயமாகும். அவர்கள் ஏற்கனவே இருந்த வீட்டுப்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

பகுதியில் மண்சரிவு ஏற்படுவதற்கான வாய்ப்பு அதிகமாக இருப்பதாகவும் அது 'சிவப்புப் பகுதி' என்று அடையாளப்படுத்தப்பட்டிருப்பதாகவும் NBRO தெளிவாகச் சொல்லியிருக்கிறது. அப்படியிருக்கும்போது தற்காலிகக் குடியிருப்பில் இருக்கின்ற மக்களைத் திரும்பவும் அந்தப் பகுதிக்குப் போகச் சொல்வது எந்த வகையிலும் நியாயம் இல்லை என்பதை நாங்கள் அப்போதே இந்தப் பாராளுமன்றத்தில் சொன்னோம். இவர்கள் சொல்வதுபோல் ஒருவேளை மக்கள் அங்கு போய்க் குடியேறிய பின்பு மீண்டும் ஏதாச்சும் புயல் இல்லாவிட்டால் மழை வெள்ளம் ஏற்பட்டு, அவர்களுக்கு ஏதாவது பாதிப்பு ஏற்பட்டால், அதுக்கு யார் பொறுப்புக் கூறுவார்கள்? என்றுகூட நாங்கள் இதே பாராளுமன்றத்தில் கேள்வி எழுப்பியிருந்தோம்.

இன்றைக்கு நுவரெலியா மாவட்டத்தைப் பொறுத்த வரைக்கும் GAயின் புள்ளிவிபரங்களின்படி, 1,091 குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன; கிட்டத்தட்ட 4,000க்கும் மேலான மக்கள் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள்; 6 பேர் உயிரிழந்திருக்கிறார்கள்; 523 குடும்பங்கள் 20 தற்காலிகக் குடியிருப்புகளில் வாழ்ந்துகொண்டு இருக்கின்றன. இது மலையகத்தில் ஏற்பட்டிருக்கின்ற ஓர் ஆபத்தான சூழ்நிலை! எனவே, அரசாங்கம் இந்தச் சூழ்நிலையைக் கட்டாயம் கருத்தில் எடுத்து, அந்த மக்களுக்கு நிவாரணம் வழங்குமென்று நான் எதிர்பார்க்கின்றேன். கௌரவ அமைச்சர் சமந்த வித்யாரத்ன அவர்கள் இந்த இடத்தில் இல்லாவிட்டாலும், கௌரவ அமைச்சர் சந்திரசேகர் அவர்கள் இருக்கிறார், அவர் கட்டாயம் இதற்கொரு பதிலை இன்றைக்கு இல்லாவிட்டாலும், நாளையாவது வழங்குவார் என்று நான் எதிர்பார்க்கிறேன்.

அதுமட்டுமல்ல, நாங்கள் சமீபத்தில் மாண்புமிகு ஜனாதிபதி அவர்களைச் சந்தித்தபோது, மாகாண சபைப் பிரச்சினையாக இருக்கலாம், புதிய அரசியலமைப்புப் பிரச்சினையாக இருக்கலாம், எங்களுக்கு இருக்கும் முக்கியமான விடயங்கள் பற்றி சொன்னோம். ஜனாதிபதி அவர்கள் எமது பிரச்சினை களைச் செவிமடுத்தமைக்கு நான் நன்றி சொல்லியாக வேண்டும். ஆனால், அவ்வேளையில் எனக்கு இருந்த சில குறைபாடுகளையும் நான் இந்த இடத்தில் முன்வைக்க விரும்புகிறேன். அந்த வகையில், இந்த இடத்தில் நான் பேச விரும்புகின்ற விடயம் காணி சம்பந்தமானதாகும். இன்றைக்கும் எமது மக்கள் சொந்தமாகக் காணி இல்லாமல் பாதிக்கப்பட்டு, வாழ இடமில்லாமல் 'லயன்' அறைகளிலும் அங்குள்ள பாதுகாப்பற்ற பல்வேறு பகுதிகளிலும்தான் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். இந்த மாதிரியான சூழலில் அவர்களுக்குக் காணி வழங்குவது பொருத்தமான திட்டமாக அமையும்.

மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் காணி சம்பந்தமாகப் பேசும்போது அவர் சொல்லியிருந்த விடயம், "காணி வழங்குவதாக இருந்தால், பத்து பேர்ச்சஸ் வீதம் ஒன்றரை இலட்சம் குடும்பங்களுக்கும் பதினைந்து இலட்சம் பேர்ச்சஸ் வேண்டும். நாம் இயற்கை வளங்களைப் பாதுகாக்க வேண்டும்; மரங்களைப் பாதுகாக்க வேண்டும்" என்பதாகும். நான் அதை ஏற்றுக் கொள்கிறேன்; இயற்கையைப் பாதுகாத்துத்தான் ஆக வேண்டும், இல்லையென்று சொல்லவில்லை. இயற்கையை நிறையப் பேர் சுரண்டிச் சுரண்டியே அழித்திருக்கிறார்கள். அங்கு மண்சரிவு ஏற்படுவதற்கு அதுவும் ஒரு காரணமாக அமைந்திருக்கின்றது; நாங்கள் அதை இல்லை என்று சொல்ல முடியாது. அதேநேரத்தில், இன்றைக்கு மக்களுக்கு காணி உரிமை வழங்காமைக்கு, வளங்களைப் பாதுகாக்க வேண்டும் என்ற காரணத்தை மாத்திரம் எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால், எவ்வளவுக்கு எவ்வளவு வளங்கள் முக்கியமோ, அவ்வளவுக்கு அவ்வளவு அல்லது அதையும் தாண்டி, அங்கு வாழும் மக்கள் முக்கியமானவர்கள். நாங்கள் "காணி உரிமை வழங்குங்கள்!" என்று சொல்லும்போது, பதினைந்து இலட்சம் பேர்ச்சஸ் காணியையும் உடனேயே எடுத்துக் கொடுங்கள் என்று சொல்லவில்லை.

கௌரவ அமைச்சர் சமந்த வித்யாரத்ன அவர்கள் காலையில் உரையாற்றியபோது, அவர் பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு அமைச்சர் என்ற வகையில் இந்த மக்களுக்கான நிவாரணத் திட்டம் என்ன? இன்றைக்கு கொழும்பு - நுவரெலியா road மூடப்பட்டு இருக்கின்றது, இவ்வாறான விடயங்களுக்குத் தீர்வு என்ன? என்பதை அவர் சொல்வார் என்று நான் எதிர்பார்த்தேன். ஆனால், வருத்தத் துக்குரிய விஷயம் என்னவென்றால், அவர் வழமைபோல எழுந்து, "ஏற்கனவே இருந்த ஆட்சியாளர்களால்தான் பிரச்சினை, எங்களால் மழையைக் கட்டுப்படுத்த முடியுமா?" என்றவாறுதான் பேசினார். அதை யாருமே விமர்சிக்கவில்லை. "தேசிய மக்கள் சக்திதான் இந்தப் புயலை உருவாக்கியது, தேசிய மக்கள் சக்தியால்தான் மக்கள் புயலால் கஷ்டப்பட்டுக் கொண்டிருக்கிறார்கள்" என்று நான் எந்த இடத்திலும் சொல்லவில்லை. யார் ஆட்சியில் இருந்தாலும் இந்தப் பிரச்சினை வந்தால், அதற்கு முகங்கொடுத்துத்தான் ஆக வேண்டும். ஆனால், பொறுப்பில் இருக்கின்ற அமைச்சர் அதற்குத் தீர்வு காண்பதற்குப் பதிலாக, மீண்டும் மீண்டும் எதிர்க்கட்சியைக் கைநீட்டி, இவற்றுக்குக் காரணம் எதிர்க்கட்சிதான் என்று சொல்வதை என்னால் ஏற்றுக்கொள்ள முடியாது. யாரையும் விமர்ச்சிக்க வேண்டும் என்ற எண்ணம் எனக்குக் கிடையாது. ஆனால், கௌரவ அமைச்சரின் செயற்பாடு காரணமாகத்தான் இந்த விஷயத்தை வெளிப்படையாகச் சொல்லிக்கொண்டு இருக்கின்றேன். காரணத்தை நீங்கள் சிந்தித்துப் பாருங்கள்!

இன்றைக்கு உறவினர் வீட்டிலிருந்தும் சொந்த வீட்டிலிருந்தும் ஆயிரக்கணக்கான மக்கள் பயத்தினால் வெளியே வந்து வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். அப்படி இருக்கும்போது, அமைச்சர் இதற்குத் தீர்வு கொடுப்பது பற்றி பேசுவார் என்று எதிர்பார்த்தால், அதைப் பற்றி பேசாமல் திரும்பத் திரும்ப எதிர்க்கட்சியினரைத்தான் குறை கூறுகின்றார். ஓர் இடத்தில் கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார், "2012இல் நடந்த மண்சரிவால் பாதிக்கப் பட்டவர்களுக்கு நாங்கள் இப்போதுதான் வீடு கட்டுகிறோம்; நாங்கள்தான் தீர்வு கொடுக்கிறோம்" என்று. சரி! அப்படியென்றால், உங்களுடைய ஆட்சியில் சென்ற வருஷம் நடந்த மண்சரிவில் பாதிக்கப்பட்டவர்களுக்கு இன்னும் வீடு கட்டவில்லையே! ஏன்? அன்றைக்கு ஜனாதிபதி அவர்கள் 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கு வீடு வழங்குவதாக கேகாலையில் ஒரு வீட்டைத் திறந்து வைத்ததைப் பார்த்தேன். சரி, மலையகத்தில் யாருக்கு வழங்கினீர்கள்? அதுமட்டுமல்ல, எனக்கு ஒரேயொரு கேள்வி இருக்கிறது. இப்பொழுது நீங்கள் மலைகத்துக்குக் கட்டுகின்ற வீடுகள் 1,300 வீடுகளுக்குக்கீழ் வருகின்ற வீட்டுத் திட்டமா அல்லது அதற்கு மேலதிகமாக நீங்கள் ஆரம்பத்தில் கொடுத்த அறிக்கை மாதிரி 4,500 வீட்டுத் திட்டத்தின்கீழ் வருகின்ற வீட்டுத் திட்டமா? ஏனென்றால், அதில் எங்களுக்குக் குழப்பம் இருக்கின்றது.

இந்த வீட்டுத் திட்டம் இடைநிறுத்தப்பட வேண்டும் அல்லது இழுத்தடிக்கப்பட வேண்டும் என்ற எந்தவித

நோக்கமும் எனக்குக் கிடையாது. ஆனால், இங்கிருக்கின்ற மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அனைவரிடமும் கௌரவ அமைச்சர் அவர்களிடமும் சொல்கிறேன், இதில் பிரச்சினையாக இருப்பது ஆட்சியில் இருக்கும் நீங்களோ, இதற்கு முன்னால் ஆட்சியில் இருந்தவர்களோ, இனிமேல் ஆட்சிக்கு வரப்போகின்றவர்களோ கிடையாது. இதற்கு முக்கியமான பிரச்சினையாக இருப்பது பெருந்தோட்ட நிறுவனங்களே! ஏனென்றால், பெருந்தோட்ட நிறுவனங் களைப் பொறுத்தவரை யாரும் மலையகத்தில் வீடு கட்ட வேண்டுமென நினைத்தால், பெருந்தோட்ட நிறுவனத்தில் அனைவரிடமும் நிதியமைச்சிலிருந்தும் அனுமதி பெற்ற பிற்பாடுதான் அங்கு வீட்டைக் கட்ட முடியும். 'தித்வா' புயலுக்குப் பிற்பாடு வேறு ஏதாவது ஒரு பகுதியில் வீடு கட்ட வேண்டுமென நினைத்தால், உடனே கட்ட முடியும். ஆனால், மலையகத்தில் அவ்வாறு கட்ட முடியாது. அதை நீங்களே பார்த்திருப்பீர்கள். பல்வேறு இடங்களில் நான் இதுபற்றி சொல்லியிருக்கிறேன். அப்படியென்றால், பிரச்சினையாக இருப்பது நீங்கள்தான் என்று ஒத்துக்கொள்ள முடியுமா? இல்லையே! பிரச்சினையாக இருப்பது அந்த system தான். நாம் அந்த systemஐ மாற்ற வேண்டும் என்றால், முதலில் தயவுசெய்து இந்தப் பாராளுமன்றத்தினூடாக அந்த ஒப்பந்தத்தை மீளாய்வு செய்வோம்! அந்த ஒப்பந்தத்தை எக்காரணத்தைக் கொண்டும் extend பண்ண அனுமதிக்க முடியாது. ஏனென்றால், இருக்கின்ற 22 நிறுவனங்களில் 16 நிறுவனங்கள் என்ன சொல்கின்றன?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Just one minute. I am almost done.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் மலையகத்துக்குப் புதியவரல்லர், தொழிற்சங்கத்துக்கும் புதியவரல்லர். உங்களுக்கே நன்றாகத் தெரியும், நீங்கள் எதிர்க்கட்சியில் இருந்த காலத்திலும் சரி, பாராளுமன்றத்தில் இல்லாமலிருந்த காலத்திலும் சரி, இந்த 16 பெருந்தோட்டக் கம்பனிகளும் என்ன சொல்லியிருக்கின்றன? "நாங்கள் நஷ்டத்தைத்தான் பார்க்கிறோம், நஷ்டத்தைத்தான் பார்க்கிறோம்" என்றுதான் சொல்கின்றன. நஷ்டத்தைப் பார்க்கிறவர்களுக்கு நாங்கள் ஏன் ஒப்பந்தத்தைக் கொடுக்க வேண்டும்? அப்படி இருக்கும்போது, அன்றைக்கு ஒரு வார்த்தை சொல்லப்பட்டது; இந்த ஒப்பந்தத்தை நீடிக்கப் போவதாகப் பேச்சு வந்திருக்கிறது. நான் இந்தச் சபையில் அதை வெளிப்படையாகப் பேசுவது நாகரிகம் கிடையாது. நீங்கள் கட்டாயம் அதை எதிர்ப்பீர்கள் என்று நான் எதிர்பார்க்கிறேன். ஏனென்றால், திரும்பவும் மக்களைப் பகடைக்காயாக வைத்து இந்த ஒப்பந்தத்தை இன்னும் நீடிப்பதில் எனக்கு எந்தவிதமான இஷ்டமும் கிடையாது; நீங்களும் அதே நிலைப்பாட்டில்தான் இருக்கிறீர்கள் என்று நான் எதிர்பார்க்கிறேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.24]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකාබද්ධ විපක්ෂය යැයි කියන නඩය මේ තරම් කලබල වෙලා තිබෙන්නේ ඇයි, අධිකරණය සම්බන්ධයෙන් ඇයි මෙච්චර කලබල, ඇයි අධිකරණය හා සම්බන්ධ සංශෝධනය පිළිබඳව මේ තරම් කලබල වෙන්නේ කියන කාරණය අපි ගනිමු.

මීට ස්වල්ප මොහොතකට කලින්, විනාඩි 45කට කලින් ගරු අභියාචනාධිකරණය නඩු තීන්දු 7ක් දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒවායේ වගඋත්තරකරු වන්නේ ජොන්ස්ටන් ප්‍රනාන්දු. මොකක්ද ඒ නඩු තීන්දුවල කියන්නේ? 2023.05.19 මහාධිකරණයෙන් නඩු 7ක් ප්‍රතික්ෂේප කළා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ එක කොමසාරිස්වරයෙකුගේ අත්සනක් නැහැ කියලා. ඒ කියන්නේ ගිය ආණ්ඩුව කාලයේ. ගිය ආණ්ඩුව කාලයේ ජොන්ස්ටන් ප්‍රනාන්දු එහෙම නිදහස් වෙලා ගෙදර ගියා. අල්ලස් කොමිසම ඒකට ඇපෑලක් දැම්මා. අල්ලස් කොමිසමේ ඒ අභියාචනයට තමයි අද තීන්දුව දෙන්නට හේතු වුණේ. මොකක්ද ඒ තීන්දුවේ කියන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "As the Petitioner had established sufficient exceptional grounds before this Court, this Court in the exercise of the discretionary remedy of revision, directs to set aside the Order dated 19.05.2023 of the Learned High Court Judge of Colombo.
>
> Therefore, the Learned High Court Judge is hereby directed to revert the case back to the case role of the Court and issue notices on the Respondents, and to commence the trial..."

අභියාචනාධිකරණය තීන්දු කරලා තිබෙනවා, ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ නඩු 7ම යළි අසන්න. ජයවේවා අධිකරණයට! ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතින් කලබල වෙන්න එපායැ. ඉතින් එහෙම කලබල වීමේ ස්වභාවයක් ඇති වෙලා මේ ඒකාබද්ධ කුටුම්භයට ගිහිල්ලා ගොඩ වෙනවා. ඒකාබද්ධ කුටුම්භය ඇතුළේ දැන් මේවාට ඇති පදම් විවේචන එල්ල කරනවා. දැන් අහයි, මීට විනාඩි 45කට කලින් දීපු නඩුවේ තීන්දුව මගේ අතට ආවේ කොහොමද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් අධිකරණය කාර්යක්ෂම කරලා තිබෙනවා. ප්‍රකාශයට පත් කරපු තීන්දුව එවෙලේම website එකට දානවා. දැන් ඕනෑ කෙනෙකුට ඒ ප්‍රසිද්ධ තීන්දුව දැක බලාගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, මීට දවස් දෙකකට කලින් අග්‍ර විනිශ්චයකාරතුමාගේ කථාව ඇතුළේදී මේක කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද තමන්ට ගෙදර ඉඳගෙන නඩුවක් පවරාගන්න පුළුවන්. සියලු journal entries ඇතුළු නඩුව තමන්ට ගෙදර ඉඳන් follow කරන්න පුළුවන්. ඒ මුදල් ගෙවීම් කටයුතු online ක්‍රමයට කරන්න පුළුවන්. එතකොට දැන් මොකක්ද වෙන්නේ? මේ වාගේ සැලකිය යුතු පහසුකම් ටිකක් එක්ක අධිකරණ කටයුතු තව තව කාර්යක්ෂම කරන්න තමයි මේ අධිකරණය හා සම්බන්ධ සංශෝධනය එන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි විශ්‍රාම යෑමේ වයස වර්ෂ දෙකකින් වැඩි කරලා සමස්ත විනිශ්චයකාරතුමන්ලාට ලබා දෙන මේ සහනය ඇත්ත වශයෙන්ම අධිකරණ ක්ෂේත්‍රය ඇතුළේ කරන පුළුල් පරිවර්තනය තුළ කරන පුංචි එකක්. ගරු නියෝජ්‍ය

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

කාරක සභා සභාපතිතුමියනි, අර කියන අනෙක් සංශෝධන ඇතුළේම තමයි මේකත් එන්නේ. නමුත් මේ කැල්ල අල්ලාගෙන, ඉලක්ක කරගෙන දැන් විවේචනය කරනවා.

අපි මේ කාරණය අහනවා. සමගි ජන බලවේගයේ කිහිප දෙනෙකුම මේ ගරු සභාවේදී කිව්වා, පුළුවන් නම් ඒ සංශෝධනය දෙසැම්බර් මාසයෙන් පස්සේ ගෙනෙන්න කියලා. අජිත් පී. පෙරේරා මහත්මයා තමන්ගේ කථාව කළේ, ඒ සංශෝධනය හොඳ නැහැයි කියන තැනට දමලායි. හැබැයි, ඒගොල්ලන්ගේ තව කණ්ඩායමක් කියනවා, සංශෝධනයේ වරදක් නැහැ කියලා. ඒගොල්ලෝ ක්‍රම දෙකක් යෝජනා කරනවා. එකක් තමයි, සංශෝධනය දෙසැම්බර් මාසයෙන් පස්සේ ගෙනෙන්න කියන එක. අනෙක් එක තමයි, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනකොට සංශෝධනය ගෙනෙන්න කියන එක. එහෙම නම් සංශෝධනයේ දෝෂයක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ සංශෝධනය දැන් ගෙනෙනකොට නරක්වෙලා, දෙසැම්බර් මාසයෙන් පස්සේ ගෙනෙනකොට හොඳ වෙන්නේ කොහොමද? ඒක කිසිසේත්ම වෙන්න බැහැ. ඒකෙන් පෙනෙනවා, මේගොල්ලන්ගේ "රෑ දනියෙල් දවල් මිගෙල්" කථාව. මේ අධිකරණ system එක විධිමත් කරලා මහජනයාගේ දේපළ මංකොල්ල කාපු, හොරා කාපු නඩය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න එක ගැන ඒගොල්ලෝ කලබල වෙලා. ඒගොල්ලෝ කලබල වෙලා තිබෙන්නේ ඒ නිසා. අර, "කොල්ලෝ නෙල්ලි කැලේට පොලු ගහන්නා වාගේ" අහුවෙන අහුවෙන පොල්ලෙන් දැන් ඒගොල්ලෝ ආණ්ඩුව පැත්තට දමලා ගහනවා. ඒ වාගේම නිවැරදිව හිතලා, නිවැරදිව වැඩ කරන රාජ්‍ය සේවකයා සම්බන්ධයෙන් මහ අන්ත, අසික්කිත විධියට කථා කරන තත්ත්වයටත් ඔවුන් පත්වෙලා තිබෙනවා. දැන්, පොලිස්පතිතුමාට මොනවාද කියන්නේ? ගල් ගසා මරා දමනතුරු ඔබ ආණ්ඩුවට කඩේ යනවාද කියලා අහනවා. පැලවත්තේ ඉඳලා තමයි වැඩ කරන්නේ කියනවා. මොනවාද මේ කථා? මේවා ඉතාම පහත් කථා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එහෙම කථා කියන්නේ ඇයි? ඒ, වත්මන් පොලිස්පතිවරයා නීත්‍යානුකූල රාමුව ඇතුළේ සමස්ත පොලීසියම මෙහෙයවන නිසායි. එහෙම මෙහෙයවන එක ජනතාවට හොඳයි. එදා සතුරු ආකල්පයක් ඇතිකරගෙන තිබ්බ පොලීසිය, මහජන ආරක්ෂක කමිටු හරහා දැන් මිත්‍රශීලීභාවයක් ඇතිකරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒගොල්ලන්ට මේක දිරවන්නේ නැහැ.

පොලිස්පතිවරයා නීතිය හරියට ක්‍රියාත්මක කරන එක ඒගොල්ලන්ට දැන් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒක, නාමල්ගේ කටින් කියැවුණා නේ. දේශපාලනය කරපු පොලිස්පතිවරුන්ට වෙච්ච වැඩේ දැක්කාද කියලා අපෙන් අහනවා. ඒක හිතාමතා නොවෙයි කිව්වේ. හැබැයි, ඒක කියැවුණා. "දේශපාලනය කරපු පොලිස්පතිට වෙච්ච වැඩේ" කියලා කිව්වා. ඒ කොයි කාලයේද? වත්මන් පොලිස්පතිවරයා ඉන්නේ අපේ කාලයේ. ඊට කලින් හිටපු පොලිස්පතිවරු සම්බන්ධයෙන් එතුමා අනාවැකියක් පළ කළා. ඔවුන් දේශපාලනය කරන්න ගිහිල්ලා තමයි එවැනි තත්ත්වයකට වැටුණේ කියන එක කිව්වා. එහෙම වුණේ ඒගොල්ලන්ගේ ආණ්ඩු කාලයේ නේ. ඒගොල්ලන්ගේ රාජ්‍ය පාලනය යටතේ ආපු පොලිස්පතිවරු නේ. මිය ගිය පොලිස්පතිවරයෙක් කියලා තිබෙනවා, OICලාට දුන්න තරමක් දුන්නේ දේශපාලන පත්වීම් කියලා. OICලාට දෙන පත්වීම දේශපාලන පත්වීමක් බව මිය ගිය සී.ඩී. වික්‍රමරත්න මහත්මයා කියා තිබෙනවා. එහෙම කියන්න සිදුවෙන තරමටම pressure එකක් දීලා, පොලීසිය මෙහෙයවලා තිබෙනවා. ඒගොල්ලෝ තමයි පොලීසිය මෙහෙයවන මේ ක්‍රියාවලිය දේශපාලනීකරණය කළේ. නමුත් අපි නීත්‍යානුකූල රාමුවක් ඇතුළේ කටයුතු කරමින් ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. පොලීසිය මෙහෙයවපු, CID එක මෙහෙයවපු ශානි අබේසේකර මහත්මයාටත්, රවී සෙනෙවිරත්න මහත්මයාටත් මේ විධියට විවේචන එල්ලවෙනවා. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ රංග දිසානායක මහත්මයාටත් එළව එළවා පහර දෙනවා. ඒ විතරක් නොවෙයි. වත්මන් අගවිනිසුරුවරයා අධිකරණ කටයුතු අර්ථවත් කරලා, කෙළින් කරලා නඩු විමසන ක්‍රියාවලිය හරියටම rule එකේ ගෙනියනවා. එහෙම කරන එකට ඒගොල්ලෝ විරුද්ධයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වෙනදාට වඩා කාලයක් දැන් නඩු අසනවා.

ඊට පස්සේ, හැමදාම නඩු අහන්න දෙන්න එපා කියලා විවේචනය කළා. ඒ කියන්නේ, දිනපතා නඩු ඇසීම නීතිඥ මහත්වරුන්ට ගැටලුවක් කියලා. ඒක ඇත්ත වෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් අපට ලැබී තිබෙන ජන වරම ඇතුළේ මේ කටයුත්ත කඩිනම් කරන්න කියලා තිබෙනවා. ජන වරමෙන් තමයි ඉල්ලන්නේ, යුක්තිය ඉතා වේලාසනින් දෙන්න කියලා. අපරාධ නඩු විධාන සංග්‍රහයෙත් තිබෙනවා, හැමදාම නඩු අහන්න කියලා. එම නිසා තමයි අද වනකොට ඇතැම් අධිකරණ කිහිපයක දිනපතා නඩු අහන්න දාලා තිබෙන්නේ. අල්ලස් නඩු විතරක් වෙනම ඇසීම සඳහා හිටපු අමාත්‍යවරුන් පරිහරණය කළ නිල නිවාසවල උසාවි දෙකක් දාලා තිබෙනවා. වාණිජ මහාධිකරණ දෙකක් අලුතෙන් දාලා තිබෙනවා. අලුත්කඩේ ඇරෙන්න රට වටේම ස්ථාන කිහිපයක අලුතෙන් උසාවි දාලා තිබෙනවා. ඉතින්, අපි ක්‍රමය විධිමත් කරලා තිබෙනවා නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ආණ්ඩු බලය ගත්තු දවසට පහුවැනිදා ඉඳන් මේ වැඩේ කරපු නිසා තමයි අද වනකොට අධිකරණ ක්‍රියාවලිය මේ තරම් කඩිනම් වෙලා, කෙළින් වෙලා එන්නේ.

නමුත් අපට විවේචනයක් එල්ල කරනවා, "නැහැ, ඔයගොල්ලෝ අමාත්‍යාංශයේ වැඩේ හරියට කරන්නේ නැහැ" කියලා. දොරේ සද්දෙයි, බෙරේ සද්දෙයි දෙකම අපට තේරෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මෙහෙම සද්ද කරන්නේ ඇයි? ඒ, මේ වැඩේ හරියට යන නිසා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මේ වෙලා තිබෙන්නේ මොකක්වත් නොවෙයි. දැන් බමුණු කුලයට වැදිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අලුත්කඩේ උසාවියේ එක එක cartels තිබුණා කියලා අපි දන්නවා. අලුත්කඩේ උසාවියට අයිතිකාරයෝ ඉන්නවා. අලුත්කඩේ උසාවිය තමන්ගේ බල පරාක්‍රමයක් කරගෙන හිටියා. අලුත්කඩේ උසාවියේ cartels තිබුණා, සංවිධාන තිබුණා. ඒවාට දැන් වැදිලා තිබෙනවා. ඒකයි මේ රිදිල්ල.

ඉතිහාසය පරිශීලනය කරද්දී අපට පෙනෙනවා, කයිසාරුවත්තේ මුහන්දිරම්ට මොකක්ද වුණේ කියලා. මුහන්දිරම්ට වෙච්ච වැඩේ ගැන ගම්පෙරළිය නව කථාවෙන් යස අගේට කියනවා. කලියුගයයි, යුගාන්තයයි කියන නවකථා දෙකෙන් ඒක තව තවත් යථාවත් කළා, ඒක තව තවත් විධිමත් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "සිලිඳුගේ නඩුව" කියලා ප්‍රසිද්ධ නඩුවක් තිබෙනවා නේ. ඒ හරහා ආවෙත් දුප්පත්කමේ විලාපය. තමන්ට නීතියෙන් සහනයක් ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ දුප්පත්කමේ සාපය තමයි එතැනින් මතු වුණේ. ඉතිහාසය පරිශීලනය කරලා මේ සියලු දත්ත සහිතව ආපු ජන වරමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ මැතිවරණය නැමැති සිතියමේ maroon colour එක, රතු colour එක තැන් තැන්වලින් තමයි තිබුණේ. හැබැයි, පසුගිය ජන වරම ඇතුළේ මේ colour එක සමස්ත ශ්‍රී ලංකාව වසා ගත්, සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන සියලු ජන වර්ගයන් වෙළා ගත්තු ජන වරමක් බවට පරිවර්තනය වුණා. එහෙම පරිවර්තනය වෙච්ච ජන වරමක අභිලාෂයක් තිබෙනවා. එම නිසා එක එක කල්ලිවල, බමුණු කුළවල මත පරාජයට ලක් කරලා අහවරයි; දැන් ඒක ඉවරයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බමුණු කුලයේ ප්‍රශ්නය තමයි දැන් මේ ඇවිල්ලා තිබෙන්නේ. අධිකරණය සම්බන්ධයෙන් අපි ගෙනාපු ප්‍රතිසංස්කරණය ගැසට් කරලා විධිමත් ක්‍රියාවලිය ඇතුළේ අපි ඒ කටයුත්ත කරනවා කියලා අපි කියනවා. කාට හරි විරුද්ධ වෙන්න ඕනෑ නම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කරුණු කියන්න පුළුවන්. නීති විශාරද ජී.එල්. පීරිස් මැතිතුමා මොකක්ද කියන්නේ? නැහැ, ඒක ඊට එහා අධිකරණයකට - ජනතා අධිකරණය කියලා එකකට - ගෙනියන්න ඕනෑලු. ඒවාත් හැල්ලු කරමින් තමයි කථා කරන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණය ඉස්සරහා තමන්ට පුළුවන් මෙහි තිබෙන හොඳ නරක, සියලු දේවල් කථා කරගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැන මතු වුණු තව කාරණයක් තිබෙනවා. නාමල් රාජපක්ෂ මැතිතුමා දරුවෝ ගැන කියමින් කිඹුල් කඳුළු හෙළුවා, A/L විභාගය කල් දැම්මේ නැහැ, syllabus cover කරලා නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමාට ඒ දවස්වල syllabus එකක් තිබුණේ නැහැ නේ. එවකට හිටපු විදුහල්පතිතුමා එතුමාට වෙනම AC කරපු කාමරයක් දීලා ප්‍රශ්න ටිකයි, මෙන්න උත්තර ටික කියලා උත්තර ටිකත් පෙන්වලා, ඔයාට ලියන්න බැරි නම් වෙන කෙනෙක් ලවා හරි ලියවලා දෙන්න කිව්වා. ඊට පස්සේ ප්‍රශ්නවලට ලියපු උත්තර ටික බලනකොට මෙයාට බලාගෙන ලිවීමවත් කරන්න බැහැ. ලකුණු 90කට වඩා ගත්තේ නැහැ; බලාගෙන ලිවීම කරලාත් ලකුණු අඩුයි. අද දරුවන් ගැන කිඹුල් කඳුළු හෙළනවා. වෙනම කාමරයක විභාග ලියපු නාමල් රාජපක්ෂ දැන් ඇවිල්ලා කියනවා, A/L විභාගය කරන ආකාරය ගැන. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඕක තමයි පැහැදිලිවම තත්ත්වය. මේ අධිකරණය සම්බන්ධ සංශෝධනය ජනතාවට යහපත් එකක්; ජනතාවගේ අභිලාෂයක්; ජනතාවගේ අධිකරණ කටයුතු කඩිනම් කරන්න ගෙනෙන එකක්. ඒක ජන වරමේ කොටසක් බැවින් අනිවාර්ය ලෙස මේ සංශෝධනය අපි ගෙනෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 3.40]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

"அல்லாஹும்ம ஹவா லைனா வலா அலைனா, அல்லாஹும்ம அலல் அகாமி வழ்ழிராப்"

யா அல்லாஹ்! இன்று எமது நாட்டில் நிலவும் மோசமான காலநிலை காரணமாக ஏற்பட்டுள்ள மழையை மக்கள் வசிக்காத, நீர்த்தேக்கங்கள் உள்ள பகுதிகளுக்கு அனுப்புவாயாக. ஆமீன்!

இன்று காலையில் நான் பாராளுமன்றத்தில் இந்த நாட்டில் நிலவுகின்ற சீரற்ற காலநிலை பற்றி கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களுடன் பேசினேன். கம்பளை, நாவலப்பிட்டிய மக்கள் எதிர்நோக்கும் பிரச்சினை பற்றியும் நாங்கள் பேசினோம். கஷ்டப்பட்டு செய்த Watawala Railway Station பாதிக்கப்பட்டு விட்டதாக மன வருத்தத்துடன் பேசியபொழுது அவர் என்னிடம் சொன்னார், இந்த மழை நிற்க வேண்டுமென உங்களுடைய அல்லாஹ்விடம் பிரார்த்தனை செய்யுங்கள் என்று. அதனால்தான் நான் இந்த துஆவை ஓதினேன்.

අද දින මම පාර්ලිමේන්තුවට ආපු අවස්ථාවේ සභානායක ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් සමඟ කථා කරනකොට මම නිකම් කිව්වා, කාලගුණය වෙනස් වීම හේතුකොටගෙන, ලස්සනට හදපු වටවල දුම්රිය ස්ථානය විනාශ වුණා වාගේම ගම්පොල, නාවලපිටිය වැනි ප්‍රදේශවල ජනතාව නැවතත් පීඩාවට පත්වෙලා තිබෙන බව. ඒ අවස්ථාවේදී එතුමා මට කිව්වා, අල්ලාහ් දෙවියන් වහන්සේට ප්‍රාර්ථනා කරන්න කියලා. අල්ලාහ් දෙවියන් වහන්සේ පරිසරය පාලනය කිරීමේ සර්ව බලධාරියෙක් වශයෙන් විශ්වාස කරන ජනතාව හැටියට එතුමා අපගේ ඒ විශ්වාසයට respect කරලා ඒක කිව්වා කියලායි මම නම් විශ්වාස කරන්නේ. මම ඒ පිළිබඳව තිබෙන ආයාචනය කියවා බැලුවා. "අල්ලාහුම්ම හවාලයිනා වලා අලයිනා අල්ලාහුම්ම අලල් අකාම් වළ්ඩිරාබ්" කියන ඒ ආයාචනයෙන් හරි ලස්සන දෙයක් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැන කියන්නේ, මේ පීඩිත කාලගුණය, වැස්ස ජනතාව ජීවත් වන දිශාවෙන් ඉවත් කරලා පරිසරයට, එහෙම නැත්නම් කොත්මලේ වැනි ජලාශ ආශ්‍රිත ප්‍රදේශවලට වහින්න කියලා දෙවියන් වහන්සේගෙන් අපි ආයාචනා කරන බවයි. අපි වහින්න එපා කියන්නේ නැහැ. හැබැයි, මෙතැන ඊට වඩා ඉතා ගැඹුරු අදහසක් තිබෙනවා. අල්ලාහ් දෙවියන් වහන්සේ හෝ වේවා, තම තමන් විශ්වාස කරන, ස්වභාවය පිළිබඳ විශ්වාස කරන, ආගමක් විශ්වාස නොකරන පුද්ගලයෙකු හෝ වේවා, එහෙම නැත්නම් ක්‍රිස්තු ධර්මය, හින්දු ධර්මය කියන ඕනෑම ධර්මයක් විශ්වාස කරන පුද්ගලයෙකු වේවා ඒ සියලුදෙනා විශ්වාස කරනවා, මේ ලෝකය ජීවීන්ට ජීවත් වීම සඳහා සුදුසු පරිසරයක් මතයි හදලා තිබෙන්නේ කියලා. ඒ සඳහා

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

ජලාශ තිබිය යුතුයි. ඒ ජලාශවලට වැස්ස ලැබිය යුතුයි. ජනතාවට ජීවත් වන්න වෙනත් ස්ථාන තිබුණා. මොනවාද අපි කළේ? අපි එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරන්න අවශ්‍ය නැහැ. ඒ අපේ ආයාචනයෙන් වැස්ස නවත්වන්න කියලා අපි කියන්නේ නැහැ. ජනතාව වෙසෙන ප්‍රදේශයෙන් වැස්ස ඉවත් කරලා ජලාශ ආශ්‍රිත ප්‍රදේශවලට වහින්න කියලා තමයි අපි කියන්නේ. ඇත්තටම වෙලා තිබෙන්නේ මොකක්ද? අද පවා සර්ව බලධාරි අල්ලාහ් දෙවියන් වහන්සේ හෝ පරිසරයට අසාධාරණයක් කරලා නැහැ. වැස්ස හරි තැන්වලට වහිනවා. ජලාශ තිබෙන ස්ථානවලට තමයි වහින්නේ. අපි තමයි පරිසරය පිළිබඳව කිසිම සැලැස්මක් නැතිව ඒ ප්‍රදේශවලට ගිහිල්ලා ජීවත් වන්නේ. එහෙම ජීවත් වෙලා කියනවා, අනේ මෙතැනට වැස්ස එන්න එපා කියලා. ඒක හරියන්නේ නැහැ. දෙවියන් වහන්සේ ස්වභාව ධර්මය, ලෝකය ලස්සනට හදලා තිබෙන්නේ. මේක විශාල ප්‍රශ්නයක්. මට මේක මතක් වුණේ වෙන මොකවත් නිසා නොවෙයි.

ඊයේ අපි ජනාධිපතිතුමා හමුවෙලා කථා කරපු විස්තරය ගැන මට මෙතැන කියන්න අවශ්‍යතාවක් නැහැ. අපි දෙමළ කථා කරන ජනතාවගේ දේශපාලන බලවේගයක්, එකමුතුවක් හදාගෙන අපේ ප්‍රශ්න පිළිබඳව කථා කරනකොට මලෙයහම් දෙමළ ජනතාව පිළිබඳව කථා කරන අවස්ථාවේදී ජනාධිපතිතුමා කිව්වා, ලංකාවේ බිම් ප්‍රමාණයෙන් සියයට 13ක බිම් ප්‍රමාණයක් තිබෙන මධ්‍යම කඳුකරයට තමයි සියයට 70ක වැස්ස ලැබෙන්නේ කියලා. ඒක ගැන හරියට බලන්න. ඒක තමයි ඇත්ත. ඒ සියයට 13ක බිම් ප්‍රමාණයට තමයි මුළු ලංකාවටම ජලය සැපයීම සඳහා අවශ්‍ය සියයට 70ක වර්ෂාව ලැබෙන්නේ. වර්ෂාපතනයෙන් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ එතැනට. ඒ පරිසරය පිළිබඳව සැලකිලිමත් නොවී අවාසනාවකට මෙන් අපේ ජනතාව එහි වාසය කරන්න පටන් ගත්තා. අපේ ගම්වලත් එහෙමයි. ඒ ඇයි?

දැන් බලන්න, අපි මේ පාර්ලිමේන්තුව හැදුවේ ජලාශයක් මැද. අපට ඕනෑ වුණේ ලස්සන. නමුත්, අපි පරිසරය ගැනත් හිතුවා. හැබැයි, ඒ කාලයේ ජපාන විශේෂඥයින් පරිසරය ගැන හිතලා තමයි ජලය රැඳීම සඳහා මෙතැන තිබුණු ස්ථාන ටිකට compensate කරන්න, මෙතැනින් ඉවත් කරපු ඒ කොටස් ටික වෝටර්ස් එජ් ඉඩම ආශ්‍රිත ප්‍රදේශයට අරගෙන ගියේ. වෝටර්ස් එජ් ඉඩම සම්බන්ධ ප්‍රසිද්ධ නඩුව ගැන හැම කෙනෙක්ම දන්නවා. එතැන තිබෙන ගොල්ෆ් ක්‍රීඩාංගණය privatize කළාට පස්සේ එතැන හිටපු ජනතාව ඉවත් කළේ, ඒගොල්ලන්ට වෙන ස්ථානයක් දීලා මෙතැනින් යන ජලයේ ඝන ප්‍රමාණය එතැන නවත්වා ගැනීම සඳහායි. මේ සැලසුම් ගැන අපට කිසිම තැකීමක් නැහැ. මම මේ කාටවත් දොස් කියනවා නොවෙයි, අපි අපි ගැනමයි කියන්නේ. මේකෙන් මිදෙනකොට වෙන්නේ මොකක්ද? ඇයි, මේ ජනතාව පරිසරයේ නුසුදුසු තැන්වල ජීවත් වන්නේ? ආර්ථික ප්‍රශ්න නිසා. මේ ගැන පොඩ්ඩක් හොයලා බලන්නකෝ. අපි නම් කොළඹට ආවේ ළඟදි. අප සිටින හැම ඉඩමක්ම ජලාශයක් සඳහා වෙන් කරන ලද ඉඩම්. ඇයි ඒ? ජනතාවට වාසය කිරීමට සුදුසු හැම ගොඩ ඉඩමක්ම අපි කොළඹට එනකොට වෙනත් අය අරගෙන ඉවරයි. ඒවා ගොඩක් මිලයි. අන්තිමට ඉඩම් බ්‍රෝකර්වරු විසින් පුරවා විකුණපු ඉඩම් තමයි අපට අයිති වන්නේ සහ විශේෂයෙන්ම නැඟෙනහිර පළාතේ අපේ මුස්ලිම් ජනතාවට අයිති වන්නේ. ඒ අහිංසක ජනතාව දැන් එම ඉඩම්වල පදිංචි වෙලා ඉන්නවා. ඒ වාගේ තත්ත්වයක් තමයි මලෙයහම් ජනතාවටත් සිදු වුණේ. ඉතින් මම හිතුවා, ඒ පිළිබඳව යමක් කථා කරන්න ඕනෑය කියලා. සාමාන්‍යයෙන් විෂය ඇතුළත කථා කරන්න ඕනෑ වුණත්, අද දින මට ඒක කරන්න නොහැකි වීම ගැන මට සමාවෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට තව වැදගත් කාරණයක් කියන්න තිබෙනවා, මම ඒක නොකියා ඉඳගත්තොත් වැරදියි. ගරු බිමල් රත්නායක ඇමතිතුමා දැන් සභාවට එනවා. මම වරදක් කිව්වේ නැහැ. ඔබතුමා කරපු ආයාචනය ගැන, ඒ prayer එක ගැන මම කිව්වා. එච්චරයි. I prayed, හැබැයි, gave a different interpretation; ඒකට වෙනත් අර්ථ කථනයක් දුන්නා.

මගේ නායකයා ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමායි. ගරු රවුෆ් හකීම් මැතිතුමා 2016දී කරපු සංශෝධනය ගැනත් පොඩ්ඩක් කථා කළා. ඒ subject එක ගැන දැන්ම කථා කරන්න මම එච්චර කැමැති නැහැ. මම වෙන වෙලාවක ඒක කියන්නම්. නමුත්, මම එක ප්‍රශ්නයක් ඔබතුමන්ලාගෙන් අහන්නම්. 2016දී ඒ අනුකමිටුව ලබා දුන් නිර්දේශය සම්බන්ධයෙන් ඔබේ පක්ෂයේ ස්ථාවරය මේ පාර්ලිමේන්තුව තුළ ඔබතුමන්ලා කථා කරලා තිබෙනවාද? මට ඒක පෙන්වන්නකෝ. රවුෆ් හකීම් හිටපු ඇමතිතුමාගේ Subcommittee එකේ තිබුණු කරුණු පැත්තකට දාලා ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ ස්ථාවරය, ඒ සම්බන්ධයෙන් ජන වරම ලබා දීමට ඔබතුමන්ලාගේ Manifesto එකට ඇතුළත් කරපු කරුණු සම්බන්ධයෙන් කියන්න. හැබැයි, අද ඒක පටන් ගන්න එපා. අපට විවාද කරන්න තව කාලය තිබෙනවා නේ. ඒවා ගැන පොඩ්ඩක් හොයලා ඇවිල්ලා කථා කරන්න. මොකද, ගරු අගමැතිතුමිය පළමුවැනි දවසේ ඉඳලාම කියනවා, වෛරයකින් තොරව අපි මෙතැන වෙනස් විධියේ සංවාදයක් කරන්න ඕනෑය කියලා. හැබැයි, විවේචනය කළ හැකි සංවාදයක් ඇති කරන අවස්ථාවේ අදාළ කාරණයේ කොටසක් අල්ලාගෙන කථා කරන එක වැරදියි. වැරදි කරපු අය එහෙම කළාය, විපක්ෂයේ හිටපු අය එහෙම කළාය, ඉස්සර හිටපු අය එහෙම කළාය කියලා ඔබතුමන්ලාත් ඒක කරන්න පටන් ගත්තොත්, ඊට පස්සේ ඔබතුමන්ලාත් ඒ ගණයට වැටෙනවා. එම නිසා මම ඒ පිළිබඳව කථා කරනකොට මගේ ස්ථාවරයත්, මම ඒක දකින්නේ කොහොමද කියන එක පිළිබඳවත් මම අවංකව කථා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

එම නිසා, නැවතත් මේ දරුණු කාලගුණයෙන් පීඩාවට පත් පත් ගම්පොල, නාවලපිටිය ඇතුළු ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් අපට කරන්න පුළුවන් හැම දෙයක්ම කරමු කියා මම යෝජනා කරනවා. අනාගතයේදී වැරදි තැන්වල, ජනතාව ජීවත් නොවිය යුතු තැන්වල ජීවත් වීම වැළැක්වීමේ වැඩ පිළිවෙළක් හදමුයි කියා යෝජනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.50]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைக்கு ஒதுக்கீட்டுச் சட்டத்துக்கான குறைநிரப்புப் பிரேரணை பற்றிய மிகவும் முக்கியமான ஒரு விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. இந்தக் குறைநிரப்புப் பிரேரணையினுடைய முக்கியமான நோக்கம் வேறெதுவுமல்ல, கடந்த காலத்திலும் சரி, இப்போதும் சரி, இயற்கைப் பாதிப்புகளால் மக்களுக்கு ஏற்பட்ட பாதிப்புகளுக்கு நிவாரணம் வழங்கும் நடவடிக்கையை முன்னெடுப்பதாகும். எங்கள் எல்லோருக்கும் தெரியும், 'தித்வா' புயலின்போது இந்த நாட்டு மக்கள் பாதிக்கப்பட்டார்கள்; அது முழு நாட்டையுமே ஒரு ஸ்தம்பித நிலைக்குக்கொண்டு வந்தது என்பது. அந்த நிலையிலிருந்து எமது நாட்டை மீட்டெடுக்க வேண்டிய தேவை எங்களுக்கு இருந்தது; அதன் காரணமாக மக்களுக்கு நிவாரணம் வழங்கவேண்டிய தேவை இருந்தது. அந்த நிவாரணங்களை வழங்கும் செயற்றிட்டத்தைத் தொடர்ந்து முன்னெடுப்பதற்கான நிதியைப் பெற்றுக்கொள்வதற்காக இன்றைக்கு இந்தப் பிரேரணை விவாதிக்கப்படுகின்றது. இது தொடர்பாக நாங்கள் மிகவும் தெளிவாகச் சொல்கின்றோம்.

இன்று காலையிலிருந்து எதிர்க்கட்சித் தரப்பிலிருந்து பேசியவர்களில் தற்போது பேசிய நிசாம் காரியப்பர் அவர்கள், எங்களுடைய அரசாங்கமும் முன்னைய அரசாங்கங்கள் தொடர்பாக விமர்சனங்களை மாத்திரமே செய்கின்றது; அந்த விமர்சனங்கள் வேண்டாம், பழைய பாணியில் விழுந்துவிட வேண்டாம், அதிலிருந்து மீண்டு வரவேண்டுமென்று குறிப்பிட்டார். இன்றைக்கும் மக்கள் அதிகமாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அந்தப் பாதிப்பிலிருந்து அவர்கள் மீண்டெழ வேண்டும். அந்தப் பாதிப்பிலிருந்து மீள, கடவுளிடம் பிரார்த்தனை செய்யும் நபராகக்கூட இன்றைக்கு நிசாம் காரியப்பர் அவர்கள் திகழ்கின்றார். அதனை நான் வரவேற்கிறேன்; இதில் எந்தவிதமான விவாதமும் கிடையாது. இருந்தபோதிலும், இன்றைக்கு இந்தப் பிரேரணை தொடர்பாக அவருடைய நிலைப்பாடு என்ன? இந்தப் பிரேரணை நல்லதா, கெட்டதா, மக்களுக்குத் தேவையா, இல்லையா என்பது தொடர்பாக அவர்களுடைய நிலைப்பாடு என்ன? அதேபோன்று, ஏனைய விடயங்களைப் பற்றி பேசுகின்றபோது உண்மையில் அவர்களுடைய நிலைப்பாடு எவ்வாறு இருந்தது? இதற்கு முன்னர் பேசிய ஏனையவர்களின் கருத்துகளைப் பார்க்கின்றபொழுது, குறிப்பாக கௌரவ நாமல் ராஜபக்ஷ பேசியதைப் பார்க்கின்றபோது, அவர்கள் எவ்வாறான நிலைப்பாடுகளை முன்னெடுக்கின்றார்கள் என்பது புரிகிறது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எது எவ்வாறாக இருந்தபோதிலும், 'தித்வா' புயலின்பொழுது குறிப்பாக கடற்றொழிலாளர்கள் வெகுவாகப் பாதிக்கப்பட்டார்கள். இறால் பண்ணைகள் அடித்துச் செல்லப்பட்டன; நூற்றுக்கணக்கான படகுகள், வள்ளங்கள் காணமற்போயின; ஆயிரக்கணக்கான வலைகள் அழிந்து போயின. அந்த நிலைமைகளிலிருந்து அவர்களை மீட்பதற்கான நடவடிக்கைகளை என்னுடைய அமைச்சான கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சின் சார்பில் நாங்கள் முன்னெடுத்திருந்தோம். அதன்பொழுது படகுகளையும் வள்ளங்களையும் இழந்து பாதிக்கப்பட்ட அனைவருக்கும் அவற்றை மீளப் பெற்றுக்கொடுப்பதற்கு நாங்கள் நடவடிக்கைகளை எடுத்திருந்தோம். அதுமாத்திரமல்ல, உடைந்த, சேதமுற்ற படகுகளைத் திருத்திக் கொடுப்பதற்கான நடவடிக்கைகளையும் புதிய வலைகளை அவர்களுக்குப் பெற்றுக்கொடுப்பதற்கான நடவடிக்கைகளையும் மேற்கொண்டிருந்தோம். ஆனால், எனக்கு முன்னர் பேசிய ஒரு சிலர், "இன்றைக்கு கடற்றொழில் அமைச்சின்மூலமாக மீன்பிடியாளர்கள் பாதிக்கப் பட்டுள்ளார்கள்; வள்ளங்கள் கரையில் ஒதுக்கப் பட்டிருக்கின்றன" என்று குறிப்பிட்டார்கள்.

நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். நாங்கள் இந்த நாட்டில் ஆட்சி பீடத்திற்கு வருகின்றபோது இந்த நாடு வங்குரோத்தடைந்த நிலையில் இருந்ததென்பது எல்லோருக்குமே தெரியும். அந்த ஆட்சியில் மக்கள் பல்வேறு வகையிலும் பாதிக்கப்பட்டிருந்தார்கள். மீனவர்கள் தங்களுடைய படகுகளைக் கடலுக்குக் கொண்டுசெல்ல முடியாத நிலை இருந்தது. அது சிறிய படகுகளா, பெரிய படகுகளா என்பதல்ல, படகுகள் அனைத்தும் கரையில் ஒதுக்கிக் கட்டப்பட்டிருந்தன. அதுதான் உண்மை! அந்த நிலைமையை மாற்றியமைப்பதற்காக, மீனவர்களுடைய வாழ்க்கையை மீளக் கட்டியெழுப்புவதற்காக, அவர்களுக்குப் புத்துணர்ச்சியை ஏற்படுத்துவதற்காக நாங்கள் ஆட்சிக்கு வந்தவுடன் முதலாவதாக அவர்களுக்கு மானியங்களை வழங்கினோம். மானியங்கள் வழங்கப்பட்டதன் காரணமாகவே மீன்பிடித்துறை மீண்டும் சகஜ நிலைக்கு அல்லது சுமுக நிலைக்கு வந்தது என்பதுதான் உண்மை!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 'தித்வா' புயலின் பாதிப்பைத் தொடர்ந்து, இப்பொழுது ஏற்பட்டுள்ள எரிபொருள் விலை அதிகரிப்புக் காரணமாகவும் மக்கள் பாதிக்கப்பட்டுள்ளனர். குறிப்பாக, எமது மீனவர்கள் பாதிக்கப்பட்டுள்ளனர் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும். அதிலிருந்து அவர்களை மீட்பதற்கு, அவர்களுக்கு உதவுவதற்கு, சிறிய படகுகளுக்கு ஒரு நாளைக்கு 25 லீற்றர் வீதம் 25 நாட்களுக்கு, ஒரு லீற்றருக்கு 50 ரூபாய் மானியம் வழங்குகின்றோம். அது மாத்திரமல்லாது, பலநாட் படகுகளுக்கு 150,000 ரூபாவை மானியமாகப் பெற்றுக் கொடுக்கின்றோம். ஏனென்றால், இந்த நெருக்கடியான வேளையில் கடற்றொழிலாளர்கள் மீண்டும் கடலுக்குச் செல்லவேண்டும்; மீன்பிடித் தொழிலில் ஈடுபட வேண்டும். அதன்மூலமாக அவர்களின் வாழ்க்கையில் ஒரு மாற்றத்தை ஏற்படுத்த வேண்டும் என்பதுதான் எங்களுடைய நோக்கமாக இருந்தது. அந்த வகையில், எங்களுடைய தரப்பில் இருந்து இதுபோன்ற பல்வேறு திட்டங்களை நாங்கள் இன்று முன்னெடுத்து வருகின்றோம். அதுபோல், 'அஸ்வெசும' திட்டத்தை எடுத்துக்கொண்டால், இதுநாள்வரைக்கும் இருந்த பயனாளர் குடும்பங்களின் எண்ணிக்கையை மேலும் 400,000இனால் அதிகரிப்பதற்கான வாய்ப்பை நாங்கள் ஏற்படுத்தியிருக்கின்றோம். அது மாத்திரமல்ல பாதிக்கப்படுகின்ற அனைத்து மக்களுக்கும் நிவாரணங்களைப் பெற்றுக் கொடுப்பதற்கான நடவடிக்கைகளை எடுத்து வருகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போது மலையகம் மீண்டும் ஒரு நெருக்கடியான நிலைக்குத்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

தள்ளப்பட்டிருக்கின்றது. மலையகத்தில் வாழுகின்ற மக்கள் மீண்டும் தங்கள் இருப்பிடங்களை இழந்தவர்களாக மாறியிருக்கின்றார்கள். இன்றைக்கும் நூற்றுக்கணக்கான குடும்பங்களைச் சேர்ந்த ஆயிரக்கணக்கான மக்கள் பாதிக்கப்பட்டுள்ளதுடன், ஆறுக்கும் அதிகமான உயிர்களையும் இழந்த பிரதேசமாக மலையகம் காணப்படுகின்றது. அந்த மக்களுடைய வாழ்க்கைக்கு மீண்டும் உதவி தேவைப்படுகின்றது; அவர்களுக்கு நிவாரணம் தேவைப்படுகின்றது. அதனால் நாங்கள் சொல்கின்றோம், விசேடமாக நாங்கள் முதலில் குறிப்பிட்டதுபோன்று அவர்களுக்கான நிவாரண உதவிகளை வழங்குவோம். எனக்குச் சற்று முன்னர் பேசிய கௌரவ உறுப்பினர் ஜீவன் தொண்டமான் அவர்கள்கூட இது தொடர்பாக நேற்று நடைபெற்ற சந்திப்பில் பல்வேறு புள்ளிவிபரங்களை முன்வைத்தார். நாங்கள் சொல்கின்றோம், புள்ளிவிபரங்களில் முன்வைக்கப்பட்ட விபரங்கள் உண்மையானவை. நாங்கள் அவைகளை நிராகரிக்கின்ற அல்லது negativeஆன கோணத்திலிருந்து பார்க்கின்ற அரசாங்கமல்ல; எல்லாவற்றையும் positiveஆகப் பார்ப்பவர்கள் என்பதை இந்த இடத்தில் நான் சொல்லிக்கொள்ள வேண்டும். அந்த வகையில், இவ்வாறு பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்கு நிவாரணங்களைப் பெற்றுக்கொடுப்பதே எங்களது அரசாங்கத்தின் நோக்கமாகும். அவர்கள் எங்களுடைய மக்கள்; அவர்கள் எங்களுக்கு ஆணையை வழங்கியவர்கள். அவர்களுக்கு உதவுவது எங்களுடைய தலையாய கடப்பாடாகும்.

அவ்வாறான நிலையில், நாங்கள் மக்களுக்கான நிவாரணங்களை வழங்குவதற்கான நடவடிக்கைகளை எடுக்கின்றபொழுது, இன்றைக்கு இங்குள்ள எதிர்க்கட்சியைச் சார்ந்தவர்கள் அனைவரும் நீதித்துறை சம்பந்தமாக, நீதிபதிகள் சம்பந்தமாக, பொலிஸ்மா அதிபர் சம்பந்தமாக, இலஞ்சம் அல்லது ஊழல் பற்றிய ஆணைக்குழுத் தலைவர் சம்பந்தமாக, பொதுமக்கள் பாதுகாப்பு அமைச்சின் செயலாளர் சம்பந்தமாகவே கூடுதலாகப் பேசுவதைக் காணமுடிகின்றது. அவ்வாறான பேச்சுகள் அடிபடுவதற்கான காரணத்தை நாங்கள் தேடிப்பார்க்கின்றபொழுது, இதுநாள் வரைக்கும் இந்த நாட்டில் இடம்பெற்ற சில விடயங்களை நாங்கள் மீண்டும் மீண்டும் உச்சரிக்க வேண்டிய தேவை இருப்பது தெரிகின்றது. நாங்கள் மக்களிடம் ஆணையைக் கேட்டதும் மக்களின் பிரதானமான சுலோகமாக இருந்ததும் வேறு எதுவுமல்ல; இந்த நாட்டை இலஞ்ச, ஊழல் மோசடிகளிலிருந்து மீட்டெடுக்க வேண்டும், அச்செயற்பாடுகளில் ஈடுபட்டவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதேயாகும்.

மக்கள் எமக்கு அந்த ஆணையை வழங்கியிருக்கின்றார்கள். அந்த நடவடிக்கைகள் இன்றைக்கு ஆரம்பிக்கப்பட்டுத் துரிதப்படுத்தப்பட்டிருக்கின்றது. அதற்குச் சான்றாக இன்று பொலிஸ் திணைக்களம் சுயாதீனமாக இயங்குகின்றது; பொலிஸ்மா அதிபர் சுயாதீனமாக இயங்குகின்றார். அது மாத்திரமல்லாமல், இலஞ்சம் அல்லது ஊழல் பற்றிய புலனாய்வு ஆணைக்குழு சுயாதீனமாகவும் திறமையாகவும் இயங்கித் தனது நடவடிக்கைகளைத் துரிதப்படுத்தியுள்ளது. தற்போதைய எங்களுடைய பிரதம நீதியரசரை எடுத்துக்கொண்டாலும்கூட, உண்மையிலேயே சட்டத்தைச் சரிவர நடைமுறைப்படுத்துகின்ற ஒரு நபராக அவர் இருக்கின்றார் என்பது இன்றைக்கு எல்லோருக்குமே தெரியும். அதுமாத்திரமல்ல, எங்களது நாட்டில் குற்றச் செயல்கள் அதிகரித்திருக்கின்ற காரணத்தினால், அவ்வாறான குற்றச் செயல்களில் இருந்து எங்களுடைய மக்களை மீட்க வேண்டும் என்ற நோக்கிலும், அந்தக் குற்றச் செயல்களின் உண்மைத் தன்மை என்ன என்பதை நாங்கள் கண்டுகொள்ள வேண்டும் என்ற நோக்கிலும் இன்றைக்குப் பல்வேறு புதிய நீதிமன்றங்களை உருவாக்குவதற்கும் நடவடிக்கைகள் எடுக்கப்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையில் நீர்கொழும்புச் சிறைச்சாலையில் ஏற்பட்ட நெருக்கடி மற்றும் மகர சிறைச்சாலையில் ஏற்பட்ட நெருக்கடி தொடர்பாக இன்றைக்கு ஒருசிலர், விசேடமாக எதிர்க்கட்சியினர், சந்தோசத்தில் திளைக்கின்றவர்களாக, மகிழ்ச்சியில் குதூகலிக்கின்றவர்களாக இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. நாங்கள் ஒரு விடயத்தை மாத்திரம் இந்த இடத்தில் சொல்லிக்கொள்கின்றோம். மகர சிறைச்சாலையை எடுத்துக்கொண்டாலும் சரி, நீர்கொழும்புச் சிறைச்சாலையை எடுத்துக்கொண்டாலும் சரி, ஏனைய சிறைச்சாலைகள் அனைத்தையும் எடுத்துக்கொண்டாலும் சரி, அவை எல்லாவற்றையும் இல்லாமற்செய்து, சிறைச்சாலை இல்லாத நாட்டை, குற்றவாளிகள் இல்லாத நாட்டை உருவாக்க வேண்டும் என்பதே எங்களுடைய இறுதியான நோக்கமும் குறிக்கோளும் ஆகும்.

கடந்த காலத்தில் இந்த நாட்டை நாசம் செய்த நாசகாரக் கும்பல், எங்களுடைய இளைஞர், யுவதிகளைப் போதைப்பொருளுக்கு இரையாக்கி, நாசகரமான பாதைக்குத் தள்ளியதன் விளைவாகவே இன்றைக்கு அவர்கள் சிறைக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள் என்பது எங்களுக்குத் தெரியும். அதுபோல், சிறையில் இருக்கின்ற பிரச்சினை என்னவென்றும், சிறையில் வாடுகின்ற அந்தக் கைதிகள் எவ்வாறான நெருக்கடியில் இருப்பார்கள் என்றும் எங்களுக்குத் தெரியும். சிறை வாழ்க்கை என்பது எவ்வாறானதாக இருக்கும் என்பதும், சிறையில் உள்ளவர்களுக்கு அது எவ்வாறான மன அழுத்தத்தைக் கொடுக்கின்றது என்பதும் எங்களுக்குத் தெரியும். ஏனென்றால், நாங்களும் வருடக் கணக்கில் சிறையில் இருந்தவர்கள்; சிறையில் வேதனைப்பட்டவர்கள். அதுமாத்திரமல்ல, பொலிஸ் பாதுகாப்பின்கீழ் இருக்கின்ற வர்களுக்கு என்ன நடக்கின்றது என்பதும் எங்களுக்குத் தெரியும். அதனால் அந்தச் சிறை வாழ்க்கையில் இருந்து அவர்களை மீட்பதற்கான, அந்தச் சிறை வாழ்க்கைக்கு முற்றுப்புள்ளி வைப்பதற்கான செயற்றிட்டத்தை நாங்கள் முன்னெடுத்து வருகின்றோம், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! அந்த வகையிலே, எதிர்வரும் காலத்தில் குற்றச்செயல்கள் இல்லாத ஒரு நாட்டை உருவாக்க வேண்டும் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம். அவ்வாறு குற்றச்செயல்கள் இல்லாத நாட்டை நாங்களும் நீங்களும் இந்த நாட்டில் இருக்கின்ற மக்களும் உருவாக்குகின்றபொழுது, நிச்சயமாக நல்லதொரு சமுதாயத்தை உருவாக்க முடியும் என்று நான் நினைக்கின்றேன்.

இன்றைக்குச் சட்டத் துறையை எடுத்துக்கொண்டாலும் சரி, நீதித் துறையை எடுத்துக்கொண்டாலும் சரி, பொலிஸ் துறையை எடுத்துக்கொண்டாலும் சரி, இவைகளைச் சரியான தளத்தில் இயங்கவைப்பதற்கான வேலைத்திட்டங்களை எங்களுடைய அரசாங்கத்தின்மூலம் நாங்கள் முன்னெடுத்து வருகின்றோம். அவ்வாறான செயற்பாடுகளை முன்னெடுக்கின்றபொழுது, மீண்டும் ஏதேனும் ஒரு குழப்பத்தை ஏற்படுத்த முடியுமா? மீண்டும் மக்கள் மத்தியில் ஒரு கிலேசத்தை ஏற்படுத்த முடியுமா? மன அழுத்தங்கள் கூடிய பிரதேசங்கள் எதுவோ, மன அழுத்தங்கள் கூடுதலாக இருக்கின்ற நிறுவனங்கள் எதுவோ, அந்தப் பிரதேசங்களில்

உள்ள மக்களிடம் சென்று, அங்குள்ள சிறைக்கூடங்களுக்குச் சென்று, மீண்டும் ஏதாவது ஒரு வகையில் கலவரத்தை ஏற்படுத்த முடியுமா? மீண்டும் ஒரு யூலைக் கலவரம் போன்ற ஒன்றை ஏற்படுத்த முடியுமா? அதன்மூலமாக இந்த அரசாங்கத்துக்கு ஏதாவது ஒரு நெருக்கடியை ஏற்படுத்த முடியுமா? என்ற அடிப்படையிலான வேலைத்திட்டத்தை, பாவித்தனமான செயற்பாடுகளை முன்னெடுக்கின்றவர்களாக இன்றைக்கு இந்த எதிர்க்கட்சியினர் மாறியிருக்கின்றார்கள்.

ஆனால், நாங்கள் ஒரு விடயத்தை மாத்திரம் சொல்லுகின்றோம். அதாவது, இவர்கள் எதைச் செய்தாலும், என்ன சொன்னாலும், இந்த நாட்டில் இருக்கின்ற தமிழ், சிங்கள, முஸ்லிம் மக்கள் இனியும் இவர்களுடைய அந்த இனவாதப் பொறிக்குள்ளோ அல்லது மதவாதப் பொறிக்குள்ளோ விழமாட்டார்கள். அதேபோன்று, எதிர்வரும் காலங்களில் உணர்ச்சி வசப்பட்டு முடிவுகளை எடுக்க மாட்டார்கள்; உணர்வுபூர்வமான முடிவுகளையே எடுப்பார்கள். ஏனென்றால், இலங்கை மக்கள் இன்றைக்கு உணர்வுபூர்வமான முடிவுகளை எடுக்கும் ஆற்றல் உள்ளவர்களாக மாறி இருக்கின்றார்கள். அதனால் இவர்களுடைய சித்துவிளையாட்டுக்கள் இனியும் பலிக்காது என்று கூறிக்கொண்டு, விசேடமாக இன்றைக்குக் கொண்டுவரப்பட்ட இந்த பிரேரணைமூலமாக மக்களுக்கு உதவி வழங்கும் வேலைத்திட்டத்தை முன்னெடுப்பதற்கான சக்தி கிடைக்க வேண்டும் என வேண்டி, விடை பெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මුලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී. ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.04]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் குறைநிரப்புத் தொகை தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. மேலதிக ஒதுக்கீடு அவசரமாகத் தேவை என்ற அடிப்படையிலேயே இந்தக் குறைநிரப்புத் தொகை கொண்டுவப்பட்டு இருக்கின்றது. மத்திய கிழக்குக்கு வேலைவாய்ப்புக்குச் சென்ற எமது இளைஞர், யுவதிகள் இப்பொழுது வேலையற்ற நிலையிலும் அவர்களுடைய 'விசா' காலாவதியாகிய நிலையிலும் இலங்கைக்குத் திரும்பி வரவேண்டிய நிலையில் இருக்கின்றார்கள். இது தொடர்பாக குவைத் நாட்டிலிருந்து 54 பேர் என்னிடம் குறிப்பிட்டார்கள். நான் இந்த விடயத்தை வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர் கௌரவ அருண் ஹேமச்சந்திராவிடம் சொன்னேன். அதன் விளைவாக, அவர்கள் நாட்டுக்கு வரக்கூடிய நிலைமை ஏற்பட்டிருப்பதாக நான் அறிகின்றேன். அவர்கள், தங்களுக்கு ticket போடப்பட்டு இருப்பதாகச் சொல்லியிருந்தார்கள். அதற்காக கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். இன்னும் சிலரின் 'விசா' காலாவதியாகியுள்ளதால் அவர்களும் இலங்கைக்கு வரவேண்டிய நிலையில் இருக்கிறார்கள். அவர்களுக்கும் நிவாரணம் அளிப்பது தொடர்பாக இங்கே குறிப்பிடப்பட்டு இருக்கின்றது. எனவே, குறைநிரப்புப் பிரேரணைமூலம் ஒதுக்கப்படுகின்ற நிதியிலிருந்து செய்யவேண்டிய பல விடயங்கள் இருக்கின்றன. 'அஸ்வெசும' நலன்புரித் திட்டமானது, வருமானம் குறைந்தவர்களுக்கு நிவாரணம் அளிக்க வேண்டும் என்ற அடிப்படையிலேயே கொண்டுவரப்பட்டது. இன்றும் சில இடங்களில் மின்சார வசதி இல்லாமல் மக்கள் வாழ்கின்றார்கள். அவர்கள் இப்பொழுதும் குப்பி லாம்பில் இரவுப் பொழுதைக் கழிக்கின்ற நிலைமை காணப்படுகின்றது. எனவே, அவர்களுக்கும் மின்சார வசதி கிடைக்க வேண்டும்.

குடிநீர் என்பது மிக முக்கியமான ஒரு விடயமாக இருக்கின்றது. எனினும், நாட்டின் சில பகுதிகளில் இன்னும் குடிநீர் கிடைக்காத நிலைமை காணப்படுகின்றது. கிரான் பிரதேச செயலாளர் பிரிவில் காணப்படுகின்ற முறுத்தானை, பொண்டுகள் சேனை, பூலாக்காடு போன்ற பிரதேசங்களில் குடிநீர் தட்டுப்பாடு காணப்படுவதால், அங்குள்ளவர்கள் இப்பொழுதும் - 21ஆம் நூற்றாண்டிலும் - ஆற்றுநீரைப் பருகுகின்ற நிலைமையே காணப்படுகின்றது. அங்குள்ள கிணறுகள்கூட வற்றிப் போயிருப்பதாகச் சொன்னார்கள். சுத்தமான குடிநீர் மக்களின் அடிப்படைத் தேவையாக இருக்கின்றபடியால், கட்டாயம் இந்த நிதி ஒதுக்கீட்டின்மூலம் அனைவருக்கும் சுத்தமான குடிநீரை வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு மிகவும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் அமைக்கப்பட்ட NHDA வீட்டுத்திட்டங்கள் பல முடிவுறுத்தப்படாத நிலையில் காணப்படுகின்றன. கிட்டத்தட்ட 326 வீடுகள் கூரை மட்டம் வரையே கட்டப்பட்டு இருக்கின்றன. அந்த வீடுகளின் நிர்மாணப் பணிகளையும் முடிவுறுத்த வேண்டிய தேவை இருக்கின்றது. எனவே, அவற்றையும் இந்தக் குறைநிரப்புத் தொகைமூலம் செய்து முடிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்னும் சில பிரச்சினைகளைத் தொட்டுக் காட்டலாமென நினைக்கின்றேன். மிகவும் கஷ்டத்துடன் இயங்கிக்கொண்டு இருக்கின்ற, கஷ்டப் பிரதேசங்களிலுள்ள உள்ளூராட்சிச் சபைகளில் பணியாற்றுகின்றவர்களுக்குப் போக்குவரத்து வசதி என்பது பிரச்சினையாகக் காணப்படுகின்றது. குறிப்பாக, அவற்றின் தவிசாளர்கள் தங்களது உந்துருளிகளில் - motorbike - பயணிக்கின்ற நிலைமையே காணப்படுகின்றது. கடந்த முறை கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் எங்களது பிரதேசத்துக்கு வருகை தந்தபொழுது, ஒரு chairman குறிப்பிட்ட விடயத்தைக் கூறுகின்றேன். அதாவது, தனக்குச் செல்வதற்கு வாகனம் இல்லாத நிலையில், சொந்த உந்துருளியில் -motorbikeஇல்- பயணம் செய்வதாக அவர் சொல்லியிருந்தார். உள்ளூராட்சி மன்றமானது, நீர்ப் பிரச்சினை, போக்குவரத்துப் பிரச்சினை உட்பட பல்வேறு பிரச்சினைகளைக் கையாளுகின்ற ஒரு சபையாக இருக்கின்றபடியால், கஷ்டப் பிரதேசங்களிலுள்ள உள்ளூராட்சிச் சபைகளின் தவிசாளர்களுக்கு வாகன வசதி என்பது கட்டாயம் தேவையாகும். குறிப்பாக, வவுணதீவு பிரதேச சபையின் தவிசாளர், தங்களுக்கு வாகனம் இல்லாத நிலைமை காணப்படுவதை என்னிடம் ஒரு முறைப்பாடாகத் தெரிவித்திருந்தார். இன்றும் பல பிரதேச சபைகளுக்கு வாகனம் இல்லாத நிலைமை காணப்படுகின்றது. ஒரு தடவை வாகனம் இல்லாத நிலைமையைக் காட்டக்கூடிய விதத்தில் அவர்கள் உழவு இயந்திரத்தில் கூட்டத்துக்கு வருகை தந்தார்கள். அதன் பின்னர், Governor இரண்டு சபைகளுக்கு வாகனங்களைப் பெற்றுக் கொடுத்திருந்தார். இன்னும் வாகனங்கள் பெற்றுக் கொடுக்கப்படாத சபைகளுக்கு வாகனங்கள் பெற்றுக் கொடுக்கப்பட வேண்டும்.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

அடிமட்டத்திலிருந்து அபிவிருத்திகளை மேற்கொள் வதற்குரிய இயந்திர சாதனங்கள் குறிப்பாக, motor grader, JCB இல்லாத நிலையில் சில சபைகள் காணப்படுகின்றன. மேலும், சில சபைகளுக்கு வருமானத்தை ஈட்டிக்கொள்ளக்கூடிய அளவுக்கு மூலதன வசதியோ, மூலப்பொருள் வசதியோ இல்லாத நிலையும் காணப்படுகின்றது. அப்படியிருந்தும், அந்தச் சபைகள் 30 சதவீத சம்பளத்தை ஊழியர்களுக்குக் கொடுக்கவேண்டிய நிலை காணப்படுகின்றது. எனவே, இந்த விடயத்திலும் கவனம் செலுத்துமாறு கேட்டுக் கொள்கின்றேன்.

மட்டக்களப்பு பிரதேசம் என்பது விவசாயத்துறைக்குப் பெயர்போன ஒரு பிரதேசமாக இருக்கின்றது. எனினும், அங்குள்ள விவசாயத் திணைக்களத்தில் ஊழியர் பற்றாக்குறை அதிகமாகக் காணப்படுவதுடன், நிருவாகிகளும் பற்றாக் குறையாக இருக்கிறார்கள். அப்படி இருக்கும்போது, விவசாயத் திணைக்களத்தில் இருக்கின்ற நிருவாகிகள் மாற்றப்படுகின்றார்கள். இதனால் விவசாயம் சம்பந்தமான நிருவாகத்தை முன்னெடுப்பது கடினமான ஒரு விடயமாக இருப்பதாகச் சுட்டிக்காட்டப்படுகின்றது. எனவே, விவசாயத்துறைக்குப் பெயர்போன அந்தப் பிரதேசத்தில் நிருவாகத்தைச் சரியாக மேற்கொள்வதற்கு ஏற்றவகையில், போதியளவு நிருவாகிகளும் ஊழியர்களும் நியமிக்கப்பட வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். அதேபோன்று, விளையாட்டு உத்தியோகத்தர்களுக்கான தேவையும் இருக்கின்றது. பல பிரிவுகளுக்கு விளையாட்டு உத்தியோகத்தர்கள் பற்றாக்குறையாக இருக்கின்றார்கள். இதனையும் சீர்செய்து தர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நெல்லுக்கான உத்தரவாத விலை நிர்ணயிக்கப் பட்டபோதிலும், களஞ்சியசாலைகளில் இடம் இல்லாததால் நெல்லைச் சேமிக்க முடியாத நிலையில் விவசாயிகள் காணப்படுகின்றார்கள். இதனை மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் அவர்கள் ஒரு குறைபாடாகச் சுட்டிக்காட்டி இருந்தார்கள். எனவே, இந்த விடயத்திலும் கவனம் செலுத்த வேண்டுமென கேட்டுக் கொள்கின்றேன். மேலும், கடந்த காலத்தில் அபிவிருத்தி உத்தியோகத்தர் நியமனம் வழங்கப்பட்டது. அபிவிருத்தி உத்தியோகத்தர்களாக இருக்கின்றவர்கள் எந்தவிதமான வினைத்திறன் அளவீடு மூலமாகவும் பதவியுயர்வு பெறமுடியாமல் அதேமட்டத்தில் இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. இந்த விடயமும் கவனத்தில் கொள்ளப்பட வேண்டிய ஒரு விடயமாகக் காணப்படுகின்றது. எனவே, இந்த விடயங்களைக் கவனத்திற் கொண்டு உரிய நடவடிக்கைகளை எடுக்குமாறு நான் பொறுப்பான அமைச்சர்களைக் கேட்டுக் கொள்கின்றேன். குறிப்பாக, குடிநீர் வசதி மற்றும் மின்சார வசதி இல்லாத மக்களுக்குக் கட்டாயமாக அவற்றைப் பெற்றுக்கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, give me one more minute.

சுதேச வைத்தியத்துறையில் கல்வி கற்று வெளியேறியவர்கள் நீண்ட காலமாக அரச நியமனங்களுக்காக ஏங்கிக்கொண்டு இருக்கிறார்கள். சுதேச வைத்தியத் துறையானது, எமது உள்நாட்டு வைத்தியத்துக்குரிய ஒரு துறையாக இருக்கின்றபடியால், சுதேச வைத்தியத்துறை சார்ந்த பட்டதாரிகளுக்கு உரிய தொழில்வாய்ப்புகளை வழங்க வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.12]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා මේ දින දෙක තුළ දිවයින පුරා ආන්තික කාලගුණ තත්ත්වයක් වර්ධනය වෙලා තිබෙන බව. එහි බලපෑම තිබෙන්නේ විශේෂයෙන්ම මධ්‍යම පළාතට සහ සබරගමුව පළාතටයි. මෙම ගංවතුර සහ නාය යාම්වලින් බලපෑමට ලක් වන ජනතාවට සහන සලසන්න සැලැස්මක් ඇතිව මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. මේ අවුරුදු කිහිපය තුළ ආන්තික කාලගුණ තත්ත්වයන් ළඟ ළඟම ඇති වුණු බව අපි දැක්කා. අපට පුළුවන් වන්නේ, ඒවාට ප්‍රතිචාර දක්වන්න, සැලසුම් කරන්න සහ යථාවත් කරන්නයි.

අපේ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළා වාගේම මේ වෙද්දී නුවරඑළිය දිස්ත්‍රික්කයට වූ හානියේ බරපතළ ස්වභාවයක් තිබෙනවා කියලායි අප හිතන්නේ. අපට වාර්තා වෙනවා, ගංවතුර, වර්ෂාව, අධික සුළං තත්ත්වයන් නිසා ඉවුරු කඩා වැටීම් සහ අනෙකුත් ආපදා තත්ත්වයන් ඇති වෙලා තිබෙන බව.

දිස්ත්‍රික්කයක් විධියට ආපදා කළමනාකරණ කමිටුව දිනපතා රැස් වෙනවා. අද දින වාර්තා වෙනවා, පවුල් වශයෙන් 1,305ක්, එනම් සාමාජිකයන් වශයෙන් 4,833දෙනෙකු පීඩාවට පත් වෙලා සිටින බව. මරණ 5ක් සහ අතුරුදහන් වූවන් එක් කෙනෙකු ගැන වාර්තා වෙනවා. ඒ වාගේම අර්ධ හානි වෙච්ච නිවාස 97කුත්, පූර්ණ හානි වෙච්ච නිවාස 5කුත්, සුරක්ෂා මධ්‍යස්ථාන 30කුත් තිබෙනවා. සුරක්ෂා මධ්‍යස්ථානවල පවුල් 674ක සාමාජිකයන් 2,757ක් වාගේ පිරිසක් රැඳී ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, මේ ආපදා තත්ත්වයේදී ජනතාව සහ මහජන නියෝජිතයන් සමඟ එක්ව නිලධාරි මහත්ම මහත්මීන් මුළ ඉඳලාම කැප වෙලා, දිවා රෑ නොබලා වැඩ කළ බව. ඒ නිසා අපි මෙය අවස්ථාවක් කර ගන්නවා, ඔවුන්ට ස්තුති කරන්නත්, පීඩාවට පත් වෙච්ච සහ මිය ගිය අපේ සහෝදර පුරවැසියන්ගේ පවුල්වල අයට අපගේ ශෝකය පළ කරන්නත්.

මේ මොහොත ගත්තොත්, ප්‍රතිචාර දැක්වීම සහ යථාවත් කිරීම කියන ක්‍රියා දෙකම කරන මොහොතක් විධියට තමයි අප සලකන්නේ. අපට මුහුණ දෙන්න වෙච්ච මූලික ගැටලුවක් තමයි ප්‍රවාහන පද්ධතිය අවහිර වීම; මූලික පාරවල් ටික වැහිලා තිබීම. මේ වන කොට අවිස්සාවේල්ල-හැටන් මාර්ගය යථා තත්ත්වයට

පත් වෙමින් පවතිනවා. 40වන සැතපුම් කණුව අසල යම්කිසි බාධාවක් තිබෙනවා. නමුත්, ඒ පාර වාහන ගමනාගමනයට විවෘත කර තිබෙනවා. ඒ වාගේම තමයි නුවරඑළිය-නුවර පාරත් විවෘත කර තිබෙනවා. මේ වන විට අතුරු පාරවල් ප්‍රතිසංස්කරණය කරනවා. අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට, සේවක මහත්ම මහත්මීන්ට, දිවා රාත්‍රී නොබලා, වැහිබර කාලගුණයක් පවතිද්දීත් වැඩ කටයුතු කරලා ඒ මාර්ග ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන්.

විශේෂයෙන් කඳුකර ප්‍රදේශවල ප්‍රවාහන කටයුතු කියන්නේ අත්‍යවශ්‍ය දෙයක්. ඒවායේ අතුරු මාර්ගවල ප්‍රවාහන කටයුතු සිදු නොවන විට සහ සුරක්ෂා මධ්‍යස්ථාන තිබෙන විට ඒවාට භාණ්ඩ රැගෙන යෑම ගැටලුවක් වනවා. මේ ක්‍රියාවලියේදී ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන් විශේෂ වැඩ කටයුත්තක් කරනවා. අපි දකිනවා, නෝර්වුඩ්, කොත්මලේ, අඹගමුව, තලවාකැලේ සහ නුවරඑළිය කියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරි මහත්ම මහත්මීන් මේ අපහසුතා යටතේ - විශේෂයෙන් ප්‍රවාහන අපහසුතා යටතේ - තමන්ගේ වැඩ කටයුතු කරන ආකාරය. දැනට ඥාති නිවාසවල ඉන්න සියලුදෙනාට වියළි සලාක ලබා දෙනවා. සුරක්ෂා මධ්‍යස්ථානවල ඉන්න පිරිසට පිසූ ආහාර ලබා දෙනවා. ඒ වාගේම, මේ වන කොට සෞඛ්‍ය අංශ විශේෂයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් එක්ක එකතු වෙලා එම සුරක්ෂා මධ්‍යස්ථාන සියල්ල නිරීක්ෂණය කරනවා. විශේෂයෙන් දීර්ඝ කාලීන රෝගී තත්ත්වයන් පවතින ලෙඩුන්ට ඒ තැන්වලටම ගිහින් බෙහෙත් දෙනවා. අප මේ මොහොතේ ප්‍රතිචාර දැක්වීමට අමතරව යථාවත් කිරීමත් පටන්ගෙන තිබෙනවා.

අපට මේ මොහොතේ මුහුණ දෙන්න සිදු වන තවත් ගැටලුවක් තමයි, සෞඛ්‍ය පද්ධතිය පවත්වා ගෙන යෑම. එක රෝහලක පමණයි ප්‍රවාහන කටයුතු අඩාළ වෙලා තිබුණේ. දැන් ඒ ගැටලුවත් නිරාකරණය වෙලා තිබෙනවා. ඊට අමතරව සමහර රෝහල්වලට ජල පහසුකම් සැපයීම අපහසු වෙලා තිබුණා. අද දිනය වෙද්දී ඒ ස්ථානවලට ජල පහසුකම් සපයමින් පවතිනවා. ඒ වාගේම විදුලිය විසන්ධි වීම් කිහිපයක් වාර්තා වුණා. අද දිනය අවසන් වන කොට අපට පුළුවන් වෙයි, ට්‍රාන්ස්ෆෝමර් 15ක් සම්පූර්ණයෙන් යථාවත් කරන්න.

ඊට අමතරව, කොත්මලේ ජලාශය සම්බන්ධයෙන් නිතර සාකච්ඡා වන නිසා ඒ ගැන විශේෂයෙන් කථා කරන්න ඕනෑ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලයෙන් ගත්තා නම් හරි නේද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තත්පර කීපයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කථාව අවසන් වුණාම කථා කරමුද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක පැහැදිලි කර ගැනීමක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කැමැති නැහැ වාගෙයි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මගේ කථාවෙන් පසුව කථා කරන්න. *[බාධා කිරීමක්]* හොඳයි, ඔබතුමා කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආණ්ඩුවේ මන්ත්‍රීවරු පිරිසක් හිනා වෙනවා. ඔබතුමන්ලා හිනා වෙන්න එපා.

මම අහන්නේ මේකයි. ඒ ආපදාවට ලක්වුණු ප්‍රදේශවල උසස් පෙළ විභාගය පැවැත්වීම සම්බන්ධව ඔබතුමන්ලාට වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මම ඒ සම්බන්ධයෙන් කථා කරන්නම්. ස්තුතියි, ඔබතුමා ඒ ප්‍රශ්නය අසුවාට.

ගරු මන්ත්‍රීතුමනි, අපි හෙට දිනයේදී එම විභාගය සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වනවා. ඒ සාකච්ඡාවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින්, විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහභාගි වනවා. එතැනදී, මේ පවතින සුවිශේෂී කාලගුණ තත්ත්වය හමුවේ විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නිසි තීරණයක් ගන්නවා. ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා අපි හෙට දිනය නම් කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ වෙද්දී ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරන්නම්.

විශේෂයෙන් අපි ස්තුතිවන්ත වෙනවා, සියලු නිලධාරි මහත්ම මහත්මීන්ට සහ මහජන නියෝජිතයන්ට. ඒ සියලුදෙනා සෑහෙන මහන්සි වුණා. මම කථා කරමින් සිටියේ කොත්මලේ ජලාශය ගැන. ඊයේ ඒ වාන් දොරටු ඇරින්න සිද්ධ වුණා, ගඟ පහළ ජනතාවට අවධානයෙන් ඉන්න කියලා දැන්වීම් කරලා. ඉදිරියේදීත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අපිත් එක්ක නිරන්තර සාකච්ඡාවල ඉන්නවා. අවශ්‍ය වුණොත් ඉදිරි කටයුතු කරන්නේ ගඟ පහළ සියලු පදිංචි පුද්ගලයන් දැනුවත් කරලා.

මේ කාලය ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා ස්තුතිවන්ත වෙමින් මා නතර වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.20]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය මාස කිහිපයක් තිස්සේ අපි රටක් විධියට මුහුණ දෙමින් ඉන්නවා, ලෝකයේ තිබෙන යුද්ධමය ප්‍රශ්නයට. ඒ යුද තත්ත්වය හමුවේ තිබෙන මිල වැඩිවීම් සහ අනෙකුත් අපහසුතා නිසා අපට වැඩි පිරිවැයක් දරන්න වෙලා තිබෙනවා. එහිදී අපි පළමුවන මොහොතේ සිටම ජනතාවට වැඩි සහනයක් දෙන්න, ඒ කියන්නේ, ඒ දුෂ්කරතාව ඒ මට්ටමින් විඳ ගන්න නොදී, රජයක් විධියට ඒක යම් ආකාරයකින් සමනය කරන්න ගත යුතු ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම රජයෙන් යම් පිරිවැයක් දරමින් ඉන්ධන මිල වැඩි වීම යම් ආකාරයට පාලනය කරන්න, වැඩිවෙන පොහොර මිල හමුවේ ගොවි ජනතාවට, කුඩා තේ වතුහිමියන් ඇතුළු පිරිසට දෙන පොහොර සහනාධාරය තව වැඩි කරන්න, ධීවර ජනතාවට තවත් ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්න ඇතුළු ගිය අය වැයෙන් අපේක්ෂා නොකළ අතිරේක පිරිවැයක් දරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. තිබෙන තත්ත්වය තුළ අවශ්‍ය රුපියල් බිලියන 71ක් - මිලියන 71,000ක් - මේ කටයුතු වෙනුවෙන් ලබා දෙන්න, වෙන් කරන්න තමයි අද අපි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා සම්මත කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුළු ලෝකයම අමාරුවෙන් යුද තත්ත්වයට මුහුණ දෙනවා. ඒක අපේ පාලනයෙන් තොර දෙයක්. නමුත් අපට රට ඇතුළේ මේ තත්ත්වයට මේ ආකාරයෙන් මුහුණ දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ, පසුගිය අවුරුදු දෙකක් ඇතුළත මේ රටේ ආර්ථිකය, මේ රටේ සංචිත, මේ රටේ අනෙකුත් ආර්ථික පරිසාධන මට්ටම් මේ ආණ්ඩුව විසින් විධිමත්ව සහ ක්‍රමවත්ව, ක්‍රමානුකූලව ඉහළට ඔසවපු නිසායි. ඒ නිසා තමයි මේ ආණ්ඩුවට මේ ආකාරයෙන් මුදල් සම්මත කරගෙන ඒ අවශ්‍ය සහන සඳහා මුදල් වෙන් කරලා මේ කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. පවතින දුෂ්කරතා මැද්දේ ලෝකයේ ආර්ථිකය ගැන කථා කරන සංවිධාන, පිරිස් හා විද්වතුන් සියලුදෙනා අගයන ආර්ථික වර්ධනයක් පසුගිය අවුරුදු දෙකේ ඇතිකර ගන්න මේ ආණ්ඩුව ගත්ත පියවරත් මේ පරිපූරක ඇස්තමේන්තුව අනුමත වෙන මොහොතේ අපි සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේ වැඩි කාලයක් වෙන් කරනවා, අද ගොඩක් දෙනෙක් කථා කරපු පොලිස්පතිතුමා සම්බන්ධයෙන් මතු වෙලා තිබෙන කාරණය ගැන යමක් කියන්න. මේ රටේ තිබෙනවා, අශිෂ්ට දේශපාලන පක්ෂයක්. මේ රටේ විවිධ දේශපාලන පක්ෂ රාශියක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේත් දේශපාලන පක්ෂ ගණනාවක් ඉන්නවා. අප අතර විවිධ වෙනස් මත තිබෙනවා. ඒවා ගැටලුවක් නැහැ. හැබැයි, එක දේශපාලන පක්ෂයක් තිබෙනවා, ඒක ඉතා අශිෂ්ට ආකාරයෙන් හැසිරෙනවා. ශිෂ්ට සම්පන්න සමාජයක අපි කියන්නේ නැති දේවල් තිබෙනවා, අපි කරන්නේ නැති දේවල් තිබෙනවා, අපි සමාජයක් විධියට සංවිධානය නොකරන දේවල් ඇතුළු ගුණාංග තිබෙනවා. ඒක තමයි ශිෂ්ට සම්පන්න සමාජයක අපි පිළිගන්නා දේ. හැබැයි, මේ රටේ සියයට 2.5ක් තිබෙන දේශපාලන පක්ෂය - පොහොට්ටුව - මේ අශිෂ්ටත්වය සංවිධානය කරනවා. ඊයේ ඒ පක්ෂයේ ලේකම් ප්‍රසිද්ධ මාධ්‍ය කැඳවලා කියනවා, "අපි කැමැති නැහැ, මේ රටේ පොලිස්පතිවරයා පාරේ ගහලා මරනවා දකින්න" කියලා. එහෙමයි කියන්නේ. කොහොමද එහෙම කියන්නේ?

මේ රටේ ජනතාව ප්‍රතික්ෂේප කරපු, - මේක නොකියා ඉන්න ජනතාව ප්‍රතික්ෂේප කරන්න ඕනෑ නැහැ - පැත්තකට ඇදලා දාපු දේශපාලන පක්ෂයක ලේකම් ඇවිල්ලා කියනවා, "අපි කැමැති නැහැ, පොලිස්පතිවරයා පාරේ ගහලා මරනවා දකින්න" කියලා. මොකක්ද මේ කියන්නේ? පැහැදිලිව මේක තර්ජනයක්. මේ රටේ නීතියේ විධානය වෙනුවෙන් ක්‍රියා කරන නිලධාරීන්ට විරුද්ධව දිගටම මතු කරගෙන ආපු, දිගටම එල්ල කරමින් ආපු චෝදනා, මඩ, අවලාදවල අලුත්ම එක තමයි මේක. මේක කලින් ඒවාට වඩා වෙනස් වෙන්නේ ඇයි? කලින් මේ රටේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වූ ශානි අබේසේකර මහත්මයාට විරුද්ධව දිගටම ප්‍රහාර එල්ල කරනවා. දිගටම මඩ ගැහුවා, ප්‍රහාර එල්ල කළා. ඒ වාගේම රවී සෙනෙවිරත්න මහත්මයාට විරුද්ධව දිගටම ප්‍රහාර එල්ල කරනවා. අල්ලස් කොමිසමේ සභාපතිවරයාට විරුද්ධවත් දිගටම ප්‍රහාර එල්ල කළා. ඊට පස්සේ ඊයේ පෙරේදා ඉඳන් අගවිනිසුරුතුමාට දිගටම ප්‍රහාර එල්ල කරනවා. දැන් රටේ පොලිස්පතිවරයාට ප්‍රහාර එල්ල කරනවා. ඒක අනෙක් දේවල්වලින් වෙනස් වෙන්නේ එතැනදී මරණ තර්ජන කරන නිසායි. "අපි කැමැති නැහැ, මේ රටේ පොලිස්පතිවරයා පාරේ ගහලා මරනවා දකින්න" කියලා කියන්නේ පක්ෂයේ ලේකම් කෙනෙක්. අපි පොලිසිය භාර ඇමතිතුමාගෙන් ඉල්ලනවා වහාම මේ ගැන විධිමත් පරීක්ෂණයක් පවත්වන්න කියලා. මොකද, මේ ආකාරයෙන් මේගොල්ලන් පාරේදී ගහලා, පාරේදී මිනිස්සුන්ට වෙඩි තියලා, පාරේදී මිනිස්සු මරලා දාපුවා අපි දන්නවා. ඒවාට expertsලා කියලාත් අපි දන්නවා. ඒවාට පරීක්ෂණ සිද්ධ වෙයි. හැබැයි, ඒ යුගය ඉවරයි. ඒක තේ මිනිස්සු එළවලා දැම්මේ. තවමත් හිතාගෙන ඉන්නවා නම්, තවමත් කථා කරනවා නම් පාරේ ගහලා මරන ඒවා ගැන, අපි පොලිසිය භාර ඇමතිතුමාට කියනවා, මේවා ගැන විධිමත් පරීක්ෂණයක් පවත්වන්න කියලා. මොකද, මේවා සරල නැහැ. මේ අය රාජ්‍ය නිලධාරින්. අපි දේශපාලනය කරන අය. ඒ නිසා අප විවේචනය කරන එක වෙනම දෙයක්. නමුත් මේ රාජ්‍ය නිලධාරින්ට, මේ රාජ්‍යයේ නීතිය ස්ථාපනය කිරීමේ මුල් පුටුවල ඉන්න නිලධාරින්ට එක පෙළට ප්‍රහාර එල්ල කරනවා. රවී සෙනෙවිරත්න මහතාට, ශානි අබේසේකර මහතාට, අල්ලස් කොමිසමේ සභාපතිතුමාට, අගවිනිසුරුතුමාට, පොලිස්පතිතුමාට ප්‍රහාර එල්ල කරනවා. මොකක්ද මේ? ඒ අය කරපු හොරකම්, ජඩකම්, මැරකම් ගැන නඩු අහලා නීති ක්‍රියාත්මක වෙනකොට, ඒවාට සාමාන්‍ය විධියට මුහුණ දෙනවා වෙනුවට දැන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින්ට තර්ජනය කිරීමක් තමයි මේගොල්ලන් මේ කරන්නේ. එහෙම කරන්න දෙන්න බැහැ. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම ඒ රාජ්‍ය නිලධාරින්ගේ පැත්තෙන් හිතලා පොලිසිය භාර ඇමතිතුමාගෙන් ඉල්ලනවා මේ ගැන විධිමත්

ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. මේවා නිකම් කට වාචාලකමට කරන ප්‍රකාශ කියලා නම් අපි හිතන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේගොල්ලන්ටත් ඉතිහාසයක් තිබෙනවා. මම ඒක සඳහන් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් එයා ඒ පක්ෂයේ ලේකම් නේ. දැන් පාර්ලිමේන්තුවේ නැහැ නේ. අද අපි දැක්කා නාමල් රාජපක්ෂත් ඒ කථාව අනුමත කරමින් කථා කළා. අද චණ්ඩියා වෙලා. අද එතුමා කිව්වා, "මාත් කියනවා තමයි ඒක. මොකද කියන්නේ?" කියලා අපෙන් අහනවා. හරි චණ්ඩියා වෙලා. පොලිස්පතිතුමා පාරේ මරන්නයි කථාව. රැස්වීමකට මීදුලක් පිරෙන්න සෙනඟ ගෙන්වා ගන්න බැහැ. මීදුලේ සෙනඟ ටික දාලා සාලය ඇතුළේ ඉඳගෙන කථා කරන්නේ, 50ක්, 100ක් වට කරගෙන. රටේ මිනිස්සු තුළ තිබෙන අනුමැතිය ඒක. හැබැයි, පොලිස්පතිතුමා පාරේ ගහලා මරන තැනට තමයි මේගොල්ලෝ සිහින දකින්නේ. මේක ඒගොල්ලන්ගේ ආකල්පය, අශිෂ්ටත්වය, කැතකම, සමාජ විරෝධීකම. මේක අපි හොඳට සලකුණු කරලා යන්න ඕනෑ. මේවා නිකම්ම වචන නොවෙයි. ඒ වාගේම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා පොලිස්පතිතුමාට කිව්වා, "ආණ්ඩුවේ අතකොළුවක් විධියට පොලීසිය හැසිරෙනවා. දේශපාලනඥයන් දෙන ලණු කන්න එපා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි කාරණය මේකයි. මේ ගත වෙච්ච අවුරුදු දෙක තුළ මේ ආණ්ඩුවේ ඇමතිවරු, මන්ත්‍රීවරු පොලීසියට මැදිහත් වෙලා කී දෙනෙක් නීතියේ රැහැනින් මුදවලා තිබෙනවාද? මොනවාද වෙලා තිබෙන එවැනි සිද්ධි? අපි දන්නවා මීට කලින් මේවා කොහොමද වුණේ කියලා. දේශපාලනයේ අතකොළුවක් වෙන්න එපා කියනවා පොලිස්පතිට. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ wedding එකේ බිල ගෙවපු සනත් නිශාන්ත, පොලිස්පතිතුමාගේ කරේ අත දාගෙන ගිහිල්ලා මිනිස්සුන්ට ගහන්නේ. මේගොල්ලෝ දන්නා ක්‍රමය ඒක. එදා ඒ ක්‍රමයයි, දැන් රටේ තිබෙන වෙනසයි ඒගොල්ලන්ට තේරෙන්නේ නැද්ද? ඉතා අභූත චෝදනා නඟමින් හරියට රාජකාරිය කරන නිලධාරින්ට තමයි මේගොල්ලෝ මේ බිය ගැන්වීම්, තර්ජනය කිරීම්, මරණ තර්ජන කිරීම් කරන්නේ. ඒක සුළුවෙන් තකන්න හොඳ නැහැ.

ඒ විතරක් නොවෙයි, නාමල් රාජපක්ෂ මහතාගේ කථාව අවසානයේදී වාගේ කිව්වා, "අපි ඔයාලා වාගේ පස්සේ දොරෙන් දුවන අය නොවෙයි" කියලා. කවුද මේ කියන්නේ? නාමල් රාජපක්ෂ. මීට අවුරුදු දෙකකට කලින් මතක් කරලා බලන්නකෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පස්සේ දොර නොවෙයි, මම හිතන හැටියට දොරවල් හොයා ගන්නත් බැරි වුණා. මේ රටට කරපු අපරාධය වෙනුවෙන් මේ රටේ මිනිස්සු එතුමන්ලා ඉන්න තැන් වට කරද්දී, අන්තිමට ගියේ කොහෙන්ද කියලාවත් දන්නේ නැහැ. අන්තිමට හිටපු තැන අපි දැක්කා. ත්‍රිකුණාමලය කෙලවරේ මුහුද මැද දූපතක හැංගිලා හිටියේ. එහෙමයි පැනලා ගියේ. දැන් ඇවිල්ලා චණ්ඩි කථා කියනවා, "පස්සා දොරෙන් පැනලා යන්නේ නැහැ" කියලා. ඒගොල්ලන්ට අමතකයි. ඒගොල්ලන් පැනලා ගිය මිනිස්සු; එළවපු මිනිස්සු. පැනලා ගිහිල්ලා, දිස්ත්‍රික්ක 25න් යාන්තම් ඡන්ද ටිකක් එකතු කරගෙන නැවතේ එල්ලිලා පාර්ලිමේන්තුවට ආවේ. දැන් ඇවිල්ලා චණ්ඩියා වෙලා. "ඔබතුමන්ලා දන්නවා නේ අපේ හැටි" වාගේ කථාවකුත් එතුමා කිව්වා.

ඔව්, අපි දන්නවා. මොකක්ද මේ කියන්නේ? "අපි" කියලා රාජපක්ෂලා ගැන නේ කියනවා ඇත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා. අපි නොවෙයි, මුළු ලෝකයම දන්නවා. ඒ පවුල ලංකාවට නොවෙයි, ලෝකයටම සිටින ඉතා විශේෂිත පවුලක්. ඒ කියන්නේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ගත්තොත්, එතුමාට නඩු; තාත්තාට නඩු; අම්මාට නඩු; ලොකු මල්ලිට නඩු; පොඩි මල්ලිට නඩු; ලොකු තාත්තාට නඩු; ලොකු තාත්තාගේ ලොකු පුතාට නඩු; ලොකු තාත්තාගේ පොඩි පුතාට නඩු; බාප්පාට නඩු. මම හිතන විධියට මාමා කෙනෙකුටත් නඩු තිබෙනවා. ඒ මුළු පරම්පරාවටම නඩු. මේ පවුල ගැන ලෝකයේ ඉස්කෝලවල උගන්වන්න ඕනෑ. ඒ කියන්නේ කවදාවත් තමන්ගේ පවුල මේ තත්ත්වයට පත් කරගන්න එපා පුතේ, දුවේ කියලා උගන්වන්න ඕනෑ. එහෙම පවුලක් මේක. ආච්චිටත් නඩු.

"දන්නවා නේ, අපි ගැන" කියලා අපෙන් අහන්නේ. අපි නොවෙයි, මේ පවුල ගැන මුළු ලෝකයම දන්නවා. මොකද, ඔහොම පවුල් නැහැ නේ. අඩුම තරමේ එක දරුවෙක් හරි බේරිලා ඉන්නවා නේ. නැත්නම් දෙමව්පියන්ගෙන් කෙනෙක් හරි බේරිලා ඉන්නවා නේ. සාමාන්‍යයෙන් "ඕක කරන්න එපා" කියන්න පවුලක කෙනෙක් ඉන්නවා. නමුත් මෙතැන එහෙම නැහැ නේ. ඔක්කෝම කරලා ඉවරයි. ඒ නිසා ඔය චණ්ඩි පාට් අපට දමන්න ලැහැස්ති වෙන්න එපා. හොඳ යුගයක් ඔයගොල්ලන් ගත කළා. නමුත් දැන් ඒ යුගය ඉවරයි. මට කියන්න තිබෙන්නේ ඒ යුගය ආයෙත් එන්නේත් නැහැ, ඒ ගැන සිහින දකින්නත් එපා කියන එකයි. ඒ නිසා ඒ චණ්ඩි පාට්, චණ්ඩි කථා මේවායේ තියාගන්නත් එපා. මොකද, මේ රට ඊට වඩා ශිෂ්ටසම්පන්න තැනකට අපි අරගෙන ඇවිත් තිබෙනවා. ඉදිරියේදීත් රට යන්නේ ඒ පැත්තට තමයි.

අන්තිමට කිව්වා, "ඒවාට ලැහැස්ති වෙන්න එපා. වෙලාව ආවාම බලා ගනිමු" කියලා. ඇත්තටම අපි නාමල් රාජපක්ෂට කියන්න ඕනෑ, ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න කියලා. මෙවර දිස්ත්‍රික්ක 25ක ඡන්ද කෑලි ටික එකතු කරගෙන පාර්ලිමේන්තුවට ආවේ. 2029 වසර වෙනකොට ඒකත් නැහැ. අපිට කියන්න තිබෙන්නේ වෙලාව ආවාම බලා ගනිමු නොවෙයි, කරපු ඒවාට කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා වෙලාව එනකම් බලාගෙන ඉන්න කියන එකයි. වෙලාව ආවාම බලා ගනිමු නොවෙයි, ගිහිල්ලා වෙලාව බලාගන්න. මොකද, තමන් කරපු වැරදිවලට, අපරාධවලට මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක වෙලා පසුපසින් එළවා ගෙන එද්දී, නීතිය ක්‍රියාත්මක කරන එම නිලධාරින්ට මරණ තර්ජන කරන්න, එම නිලධාරින්ට අපහාස කරන්න, එම නිලධාරින්ව බය ගන්වන්න හෝ හිතනවා නම් ඒ උත්සාහයට අපි කිසිම ඉඩක් දෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවත් කිසිම ඉඩක් දිය යුතුත් නැහැ. ඒක සාමාන්‍ය දේශපාලන විවාදයක්, සංවාදයක් නොවෙයි. අපි-අපි විවේචන කර ගන්න ඒවා, බැණ ගන්න ඒවා කමක් නැහැ. හැබැයි, රාජ්‍ය නිලධාරින්ට මරණ තර්ජනය කරන එක, පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒවා අනුමත කරන එක වාගේ දේවල් කරන්න මේ පාර්ලිමේන්තුව ඉඩ දිය යුතු නැහැ කියලා මම හිතනවා. කොහොමද, එහෙම කරන්නේ? හිතූ හිතූ විධියට ඕනෑ දේවල් කරන්න, මීට අවුරුදු 15කට කලින් ලංකාවේ හිටියා වාගේ තමයි තවම ඉන්නේ කියලා ඒගොල්ලන් හිතාගෙන ඉන්නවාද දන්නේ නැහැ. මේ රටේ මිනිස්සු ඒ ලංකාව වෙනස් කළා. එහෙම ලංකාවක් ආයෙත් හැදෙන්නෙත් නැහැ, මේගොල්ලන් හිතන ලෝකය ආයෙත් හැදෙන්නෙත් නැහැ, ඔය වාගේ සිතුවිලිවලට ආයෙත් ඉඩකුත් නැහැ. දේශපාලනය කරන්න. හැබැයි, දේශපාලනයට කලින් පොඩ්ඩක් ශිෂ්ටසම්පන්න මිනිස්සු වාගේ හැසිරෙන්න. නැත්නම් මේ සමාජයට ගැළපෙන විධියට හැසිරෙන්න. අඩුම තරමේ මේ සමාජය තමන්ට වඩා ශිෂ්ටසම්පන්න දුරකට ගිහින් තිබෙනවා කියා දැනගෙන හැසිරෙන්න. නැත්නම් අන්තිමට තව මාසයක් දෙකක් යද්දී මීදුල පුරවා ගන්නවත් බැරි වෙනවා. එතැනට තමයි මේ යන්නේ. මීදුලේ මල් පෝච්චි මැද්දේ සෙනඟ 50ක්, 100ක් පුරවාගෙන රැස්වීමක්, දෙකක් පවත්වා මෙතැනට ආවාට පසුව හිතනවා, -

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

මොකද, කථා කරන්න තිබෙන එකම තැන මෙතැන නේ. එහෙම කවුරුත් අහන තැනක් මේ රටේ වෙන නැහැ නේ. මෙතැනට ආවාට පසුව චණ්ඩියා වෙලා නිලධාරින්ටයි, ඕක්කෝටම හතර අතේ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මේකයි. දේශපාලන වාද විවාද වෙනයි. හැබැයි, නිලධාරින්ට තර්ජනය කිරීම, විශේෂයෙන්ම මේ දක්වා සිදු වුණු, මරණ තර්ජන කිරීම වාගේ දේවල් අපි පාර්ලිමේන්තුව විධියට හෙළා දකින්න ඕනෑ. මේවාට ඉඩ දෙන්න එපා, මේ ගැන විධිමත් පරීක්ෂණයක් කරන්න කියා අපේ ගරු බිමල් රත්නායක ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ point of Order එක Standing Order No. 91(f) යටතේයි. එහි මෙසේ සඳහන් වෙනවා:

> "No Member shall refer in any motion or debate, to any matter which is under adjudication by a court of law or to any matter on which a judicial decision is pending."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම්ම ගිහිල්ලා අර කන්ටේනර් 323ක් පන්නපු මහින්ද රාජපක්ෂගේ ලොකු පුතාටත් නඩුව දමන්න කියන්නකෝ. එතකොට වැඩේ ඉවරයි නේ. පවුලටම වැඩේ සිද්ධ වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දයාසිරි ජයසේකර මහතා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.34]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ විවාදයට සම්බන්ධවීමට ලැබීම ගැන මා සතුටු වෙනවා. මම මීට කලින් අපේ ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇසුවේ, ප්‍රශ්නවලට ලක් වුණු ප්‍රදේශවල තිබෙන තත්ත්වයත් එක්ක විභාගයට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සිදු කරන්නේ කොහොමද කියන එකයි. මොකද, විභාගය සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම මෙවර විභාගයට පෙනී සිටින ලක්ෂ තුනක් විතර වන අපේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට ලැබී තිබෙන දින ගණන අනෙක් අවුරුදු එක්ක ගත්තාම ඉතාම අඩුයි. ඒ නිසා, ඒ ගැනවත් කල්පනා කරලා යම් කිසි විධියක සහනයක් මේ සියලු දරු දැරියන්ට ලබා දෙන්න කියලා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට මම තව කාරණයක් කියන්න කැමැතියි. අපි මීට පෙරාතුව දැක්කා ජොන්ස්ටන් ප්‍රනාන්දු මහත්මයාට විරුද්ධව අද දීපු තීන්දුව ගැන කියලා මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා, "අධිකරණයට ජයවේවා!" කියලා අත්පුඩි ගහනවා. එය අධිකරණය දුන් තීන්දුවක්. අපි ඒකට ගරු කරන එක, ඒ සම්බන්ධයෙන් යම් කිසි විධියකින් කථා කරන එක වෙනම කාරණයක්. මට හිතා ගන්න බැරි, ජනාධිපතිතුමා කිව්වේ අත්පුඩි ගහන්න ලැහැස්ති වෙන්න කියලා, ඒ වාගේ තීන්දුවක් ලැබුණාමද දන්නේ නැහැ. මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා "ජයවේවා, අධිකරණයට!" කියලා අත්පුඩි ගැහුවා. ඇත්තටම මට හිතා ගන්න බැහැ, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේ වාගේ සිද්ධියක් වුණු එක ගැන. ඒ ගැන තමයි අපට කනගාටුව තිබෙන්නේ. මොකද, මේවා තමයි එක පැත්තකින් අධිකරණයට බලපෑම් කරන විවිධ අවස්ථා විධියට අපට දකින්නට තිබෙන්නේ. මොකද, ජනාධිපතිතුමා මැයි දිනයේදී කිව්වා "ලබන 25වැනිදා තීන්දුවක් දෙන්න තිබෙනවා, එදාට අත්පුඩි ගහන්න ලැහැස්ති වෙන්න" කියලා. මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා අද ඇවිල්ලා කියනවා, "ජය වේවා අධිකරණයට, ඔක්කොම අත්පුඩි ගහන්න" කියලා. මේක තමයි අද සිද්ධ වෙමින් තිබෙන්නේ. ඒක තමයි අපි කියන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීම පිළිබඳ ප්‍රශ්නය ඇති වෙන්නේ මෙතැනින් කියලා. මොකද, අද මේ තීන්දුව තුළින් කරලා තිබෙන්නේ, මහාධිකරණය විසින් technical issues මත ඉවත් කරපු නඩුව, ඇපැල් අධිකරණයේදී නැවත අහන්න කියලා තීන්දුවක් දෙන එක. ඒකේ කාරණා ගණනාවක් තිබෙනවා, ඉතා වැදගත් නඩු තීන්දුවක්. මම හිතන විධියට ඇපැල් උසාවියේ සහ අනෙක් උසාවිවල ඉන්න විනිශ්චයකාරවරුන්ට යම් කිසි විධියක බලපෑමක් කිරීම සඳහා විවිධාකාරයෙන් මේවා පාවිච්චි කරනවා.

මූලික වශයෙන් තිබෙන ප්‍රශ්නය මෙයයි. මුල ඉඳලාම අපි කිව්වේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට තිබෙන බලය අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරුන් හතරදෙනෙක් සහ අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරුන් හතරදෙනෙක් පත් කරන්න තිබෙනවා. ඒ තනතුරුවල හිඩැස් තිබෙනවා. ඊළඟට අපි බැලුවාම, ලංකාවේ මහාධිකරණවල විනිශ්චයකාරවරුන් 110ක් ඉන්න ඕනෑ. නමුත් දැනට ඉන්නේ 93යි. මහාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ පුරප්පාඩු 17ක් තිබෙනවා, පුරවලා නැහැ. ඒකට අධිකරණ ඇමතිතුමා උත්තරයක් දෙනවා, ඒ පුරප්පාඩු පිරවූවාම පහළ අධිකරණවල නඩු අහන්න විධියක් නැහැලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලංකාවේ තිබෙන ප්‍රධානම අර්බුදය තමයි ඒක. මේ තමයි අධිකරණ අමාත්‍යාංශයේ දැනට තිබෙන තත්ත්වය. අද ලංකාවේ ප්‍රශ්නය තිබෙන්නේ අහන්න තිබෙන නඩුවල නොවෙයි, අහමින් තිබෙන නඩුවල. මේ නඩු ගොඩගැහිලා තිබෙනවා කියන්නේ, අහන්නේ නැතුව ගොඩගැහිලා තිබෙනවා නොවෙයි. විනිශ්චයකාරවරුන් නඩු අහනවා, ඒ අහන ඒවායේ විවිධ ප්‍රශ්න නිසා ඒවා අහන්න විධියක් නැහැ, ඉවර කරන්න විධියක් නැහැ.

මේ අනුව ලංකාවේ total pending cases 1,134,474ක් තිබෙනවා. එකෙන් Magistrate's Courtsවල 818,869ක්

තිබෙනවා. District Courtsවල 260,007ක් තිබෙනවා. High Courtsවල 27,376ක් තිබෙනවා. ඊළඟට, පළාත්බද මහාධිකරණවල 6,591යි. Commercial High Courtsවල 6,330යි. මේ ඔක්කොම ගත්තාම පහළ අධිකරණවල සියයට 95.06ක් නඩු හිර වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ලක්ෂ අටහමාරක් විතර තිබෙනවා. අපි කියන්නේ, මෙන්න මේකට වැඩ පිළිවෙළක් හදන්න කියන එකයි. අපි අද භාර දුන් යෝජනාව අනුව Select Committee එක පත් කරන්න කියන්නේ වෙනත් හේතුවක් නිසා නොවෙයි. මේ 850,000ක විතර backlog එක හදන්න විසඳුම හැටියට අපි පාර්ලිමේන්තුව විධියට තීරණය කරන්නේ මොකක්ද? මෙහිදී මූලික කරුණු ගණනාවක් ඉෂ්ට කරන්න තිබෙනවා. පළමුවැනි එක තමයි, නීතිපති දෙපාර්තමේන්තුවේ සහකාර රජයේ නීතිඥවරුන් 130ක් ඉන්න ඕනෑ, දැනට ඒක බින්දුවයි. ඒ කියන්නේ එක්කෙනෙක්වත් නැහැ. ඊළඟට, රජයේ නීතිඥවරුන් 218ක් ඉන්න ඕනෑ, 78ක් අඩුයි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරුන් නවදෙනෙක් ඉන්න ඕනෑ, දැනට කවුරුවත් නැහැ කියලා තමයි සංඛ්‍යාලේඛන අනුව තිබෙන්නේ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින් නැහැ, ඒකට නිලධාරින් විශාල ප්‍රමාණයක් අවශ්‍යයි. පොලීසියේ නිලධාරින් 102,000ක් ඉන්න ඕනෑ, දැනට ඉන්නේ 86,000යි. එතැනත් නිලධාරින් අඩුයි. අනික් කාරණය තමයි, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ තිබෙන නිලධාරි හිඟය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 වර්ෂයේදී විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙනාපු තීන්දුව ගැන අපි ඇති තරම් කථා කරලා තිබෙනවා. ග්‍රෑම් 10කට වැඩි මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් සන්තකයේ තබා ගැනීම හා සම්බන්ධ නඩුවල විත්තිකරුවන්ට ඇප දෙන්න පුළුවන් වෙන්නේ Appeal Court එකෙන්. එතකොට අවුරුදු එකහමාරක් ඒ මිනිස්සු බලාගෙන ඉන්න ඕනෑ, appeal එක දෙන්න. දැන් ආණ්ඩුව කරන්න ඕනෑ මොකක්ද? අධිකරණ ඇමතිතුමා කරන්න ඕනෑ මොකක්ද? මේ තිබෙන ප්‍රශ්න ටික විසඳන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළයි හදන්න ඕනෑ. ඒක පැත්තකින් තිබියදී ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ ධුර කාලය දීර්ඝ කරන්න කථා කරනවා. ඒ ගැන කථා කරනකොට විවිධ කාරණා කියනවා. පිට රට මෙහෙමලු, මේ රටේ මෙහෙමලු. අර මහානායක හාමුදුරුවන් වහන්සේලාට කථා කරලා එළියට ඇවිල්ලාත් බොරු කියනවා. මට තේරෙන්නේ නැහැ, මහානායක හාමුදුරුවන් වහන්සේලාටත් බොරු කියන්නේ ඇයි කියලා. උන්වහන්සේලා නිකුත් කළ නිවේදනය එළියට දෙන්න ඉඩ නොදෙන්නේ ඇයි? කවුද, ඒකට බලපෑම් කළේ? මොන නායක හාමුදුරුවන්ටද කථා කරලා කිව්වේ, මේ සම්බන්ධව ලබන සතියේ මම එනවා හම්බ වෙන්න, දැනට මේක පොඩ්ඩක් නතර කරන්න කියලා? නැත්නම් කවුරුහරි කිව්වාද, හෙට උදේ මම අධිකරණ ඇමතියි, තවත් කවුරු හරියි එවනවා, ඔබවහන්සේලා මේ ලියුම යවන්න එපා කියලා? ඒක තමයි තිබෙන ප්‍රශ්නය. මේ හදන්නේ, සම්පූර්ණයෙන් මේ තත්ත්වය විකෘති කරන්න. ඒ කියන්නේ තිබෙන ප්‍රශ්නය යට ගහන්න.

ප්‍රාථමික අධිකරණවල නඩු 850,000ක් තිබෙනවා. අග්‍ර විනිශ්චයකාරතුමා කිව්වා, එතුමා එනකොට නඩු 5,000ක් විතර තිබුණා, දැන් ඒක 2,000කට විතර අඩු කරලා තිබෙනවා කියලා. ඉතින් එතුමා ඒකට අවශ්‍ය කරන පියවර අරගෙන තිබෙනවා. එහෙම නම් සෙනසුරාදා ඉරිදාත් වැඩ කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ඒ සඳහා මේ තිබෙන අඩුපාඩු ටික හදාගන්න ඕනෑ. මේ තිබෙන අඩු පාඩු ටික හදාගෙන තමයි මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ. නමුත් මේ සිද්ධ වන්නේ ඒක නොවෙයි.

මම මේ සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලිපියක් ඉදිරිපත් කළා. දූෂණ විරෝධී පනතේ 101වන වගන්තියේ බොහොම පැහැදිලිව තිබෙනවා, රජය සමඟ ගනුදෙනු කරන පුද්ගලයින් විසින් රාජ්‍ය නිලධාරින්ට අල්ලස් දීම ගැන. නමුත් අද කැබිනට් මණ්ඩලය විනිශ්චයකාරවරුන්ට වාසියක් වන විධියේ වැඩ පිළිවෙළකට, ලාභයක් ලැබෙන වැඩ පිළිවෙළකට අත්සන් කරලා, අනුමැතිය දීලා තිබෙනවා. එතකොට, දූෂණ විරෝධී පනතේ 104වන වගන්තියේ රජයේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රාජ්‍ය නිලධාරින්ට බලපෑම් කිරීම සම්බන්ධව තිබෙනවා; රාජ්‍ය නිලධාරින් විසින් සිදු කරන දූෂණ සම්බන්ධව 111වන වගන්තියේ තිබෙනවා; 113වන වගන්තියේ ඒ හා සම්බන්ධ තවත් වාතාවරණයක් ගැන තිබෙනවා. සභානායකතුමාත්, විදේශ කටයුතු ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ඉතින් මම කියනවා, කරුණාකරලා දූෂණ විරෝධී පනත අරගෙන කියවන්න කියලා. තමුන්නාන්සේලා සියලුදෙනාම දැන් අල්ලසක් දෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ කරලා ඉවරයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ වෙලාව ගන්න එපා. මේ, මගේ වෙලාව.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, එතකොට 1978 ඉඳලාම ඔබතුමන්ලා කරලා තිබෙන්නේ විනිශ්චයකාරවරුන්ට අල්ලස් දීම නේ. *[බාධා කිරීමක්]* එතුමන්ලාට විශ්‍රාම යැමේ වයසක් නියම කිරීම, විශ්‍රාම වැටුපක් ලබා දීම ගැන නේ ඔබතුමා කියන්නේ, අල්ලසක් දුන්නා කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ. ඒක තේරුම් ගත් විධිය වැරදියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම නේ ඔබතුමා කියන්නේ. *[බාධා කිරීමක්]* රජයේ නිලධාරින්ට pension එකක් දුන්නොත්, විශ්‍රාම යැමේ වයස අවුරුදු 60, 63 කළොත්, ඒක එතකොට අල්ලසක් නේ?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ. ඔබතුමාත් ආනන්ද විද්‍යාලයේ නේද? පොඩ්ඩක් ඉන්න, මට අවස්ථාව දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, මම පාර්ලිමේන්තුවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, එහෙම නොවෙයි. මේ, මගේ වෙලාව. සභානායකතුමා ආනන්ද විද්‍යාලයේ නේ. ඉතිහාසයේ ඉඳලා රජයේ සේවකයින්ට පඩියක් ගෙවන එක, ඔවුන්ගේ පඩි වැඩි කරන එක සාමාන්‍ය රජයේ ක්‍රියාවලියක්. ඔබතුමා කියවන්න, මේ පනත. *[බාධා කිරීමක්]* නැහැ, ඔබතුමා කියවන්න. මේක කියෙව්වාම තමයි තේරෙන්නේ. *[බාධා කිරීමක්]* මට කථා කරන්න දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට මේ කාරණය කියන්න අවස්ථාව දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හොඳයි, කියන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඉතිහාසයත් පටන් ගත්ත තැනක් තිබෙනවා නේ, ගරු මන්ත්‍රීතුමනි. එතකොට මේ පනත්වලින් රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 55, 57 වුණේ, අවුරුදු 57, 60 වුණේ, මහාචාර්යවරුන්ගේ, වෛද්‍යවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 61, 63 වුණේ, වැඩ කරමින් ඉන්නකොට තමයි. මම කියන්නේ මේකයි. ඔබතුමා සිටි හැම ආණ්ඩුවකම වාගේ ඇමති කෙනෙක් වෙලා ඉඳලා තිබෙනවා. ඔබතුමාගේ තර්කය පිළිගන්නවා නම්, ඔබතුමන්ලා තමයි 1978 ඉඳලා වැඩිපුරම අල්ලස් දීලා තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඒකට උත්තරයක් දෙන්නම්. මෙහෙමයි, ඔබතුමා මේ කාරණය නැවත පටලවා ගන්න එපා. ඉතිහාසයේදී, වැඩ කරමින් සිටින විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කරපු එක අවස්ථාවක් තමුන්නාන්සේ මට කියන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
1978.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අසත්‍ය කියන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. නමුත්, ඔබතුමාට තවත් වැඩිපුර විනාඩියක් ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
උපරිමාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස සඳහන් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ. මුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම වෙනස් කරලා තමයි ඒක කළේ. මෙහෙම amendments ගෙනැල්ලා කළේ නැහැ. මට කියන්න, ඉතිහාසයේ කොහේද එහෙම කළේ කියලා. ඒක තමයි කියන්නේ, තමුන්නාන්සේ කරුණාකරලා මේ පනත කියවන්න. *[බාධා කිරීමක්]* මම ඒකයි කියන්නේ, මේ දූෂණ විරෝධී පනත කියවන්න, කියවන්නේ නැතුව මේක ගැන කථා කරලා හරියන්නේ නැහැ කියලා. මොකද ඉතිහාසයට දොස් නඟන අය නේ, මේ අය. හැබැයි මම අහන්න කැමැතියි, මේ රටේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව වෙනස් කරපු amendment එකක් කොහේද තිබෙන්නේ කියලා. මම අහන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට amendment එකක් ගෙනැල්ලා එහෙම කරලා තිබෙන්නේ කොහේද කියලායි. ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට තමුන්නාන්සේලා තමයි එහෙම කරන්න හදන්නේ. අපි කියන්නේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්න කියලායි. තමුන්නාන්සේලාට mandate එක දීලා තිබෙන්නේ ඒකට; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. ඒකට අපි සම්පූර්ණයෙන් සහයෝගය දෙනවා. ඒ විතරක් නොවෙයි. එදාට ඒක තමුන්නාන්සේලා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කරන්න. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා කළේ එහෙම තමයි. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනැල්ලා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වයස් සීමාව අවුරුදු 65ට අඩු කළා. අඩු කළාම මොකද වුණේ? හිටපු අයට දිවුරුම් දෙන්න බැරිව ගියා. ඒකයි කළේ. ඉතින් මම කියන්නේ, ඒක ඉගෙන ගෙන එන්න කියලායි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Doctorsලාගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 63 කළේ කොහොමද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Doctorsලාගේ වැඩේ ඒක නොවෙයි නේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, doctorsලා එන්නේ නැහැ නේ, අධිකරණයට. *[බාධා කිරීමක්]* මේ බලතල බෙදීම ගැන ඔබතුමාට මුල ඉඳලා මම කියලා දෙන්නම්. *[බාධා කිරීමක්]* බලතල බෙදීමේ න්‍යාය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. *[බාධා කිරීමක්]* හිනාවෙන්න එපා, හිකි හිකි ගාලා. ඔළුවේ අතගහගෙන හිනාවෙන්න හදන්න එපා. ඊට පස්සේ ඕක මාධ්‍යයේ යනවා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක, බලතල බෙදීමේ න්‍යාය. Montesquieuගේ න්‍යාය වන්නේ, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණයයි. දැන් විධායකය තමුන්නාන්සේලාගේ. ව්‍යවස්ථාදායකයේත් තමුන්නාන්සේලාගේම 159ක් ඉන්නවා. අද ව්‍යවස්ථාදායකයයි, විධායකයයි එක මතයක ඉන්නේ. ඇයි, මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට 159ක්ම දුන්නා නේ. ඊට පස්සේ ලාල් කාන්ත

මහත්තයා ගිහිල්ලා කියනවා, අපි ආණ්ඩුව අල්ලලා ඉවරයි, දැන් රාජ්‍ය බලය අල්ලන්න ඕනෑ කියලා. රාජ්‍ය බලය අල්ලන්න, තමුන්නාන්සේලා ළඟ දැන් විධායකය සහ ව්‍යවස්ථාදායකය කියන දෙකම තිබෙනවා. අපි දැක්කා තව මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා කියනවා, "ග්‍රාම නිලධාරින් වැඩ කරන්නේ නැත්නම් කොල්ලො කුරුට්ටො දාලා ඒ වැඩේ කරන්න, ප්‍රාදේශීය ලේකම් වැඩ කරන්නේ නැත්නම් කොල්ලො කුරුට්ටො දාලා ඒ වැඩේ කරන්න" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරමු. ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම තව තත්පරයක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තමුන්නාන්සේලා මේ කරන්න හදන්නේ මොකක්ද? ව්‍යවස්ථාදායකයයි, විධායකයයි දෙකම දැන් රට අල්ලාගෙන තිබෙනවා. තමුන්නාන්සේලාට control නැතුව තිබෙන්නේ අධිකරණය විතරයි. දැන් අධිකරණය control කරන්න මොකක්ද කරන්නේ? අර ඇවිල්ලා අත්පුඩි ගහලා එහෙම වටගල මහත්තයා කියන්නේ මොකක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගල් ගහනවාට වඩා හොඳයි නේ, අත්පුඩි ගහන එක.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, හරි. අත්පුඩි ගහලා කියන්නේ මොකක්ද? තව තව මේ වාගේ ඒවා දෙන්න කියනවා. කථා කරන අනික් අය කියනවා, හිරේ යන්න ලැහැස්ති වෙන්න කියලා. එහෙම කොහොමද කියන්නේ? ඒකයි අපි කියන්නේ, මේ රටේ system එකක් තියෙන්න ඕනෑය කියලා. ඒක නිසා තමයි අධිකරණයේ ස්වාධීනත්වයට අත තියන්න එපා කියන්නේ. අධිකරණයේ ස්වාධීනත්වයට අත තියන එකට අපි කවදාවත් සහයෝගය දෙන්න සූදානම් නැහැ. ඒ කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.47]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුව මා මෙය අවස්ථාවක් කර ගන්නවා, අයහපත් කාලගුණය නිසා මේ වනකොට විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේත්, මා ජීවත් වන රත්නපුරය දිස්ත්‍රික්කයේත් විපතට පත් ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්නත්, ඒ වාගේම ඔවුන් වෙනුවෙන් දිවා රෑ නොබලා සහන සැලසීම සඳහා කටයුතු කරමින් ඉන්න ත්‍රිවිධ හමුදාව, පොලිසිය, ඒ වාගේම රාජ්‍ය නිලධාරින් ඇතුළු සහන කණ්ඩායම් වෙනුවෙන් විශේෂ ස්තුතියක් පුද කරන්නත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද දවසේ කථා කරමින් ඉන්නේ මැද පෙරදිග පවතින යුද්ධය නිසා ලංකාව වැනි රටක ආර්ථිකයක ඇති වන අයහපත් තත්ත්වයන් සහ ඒ වෙනුවෙන් අපි ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියන එක ගැනයි. විපක්ෂයේ ඉදිරි පෙළ අද හිස්ව තිබුණත් ඒ අය හිතනවා, ලංකාව ලෝකයේ කොටසක් නොවෙයි කියලා. ඒ නිසා ලංකාව ගැන වියුක්තව තමයි ඒ අය කථා කරන්නේ.

මම බැලුවා, මැද පෙරදිග පවතින යුද්ධයත් එක්ක ගෝලීය වශයෙන් ආර්ථික විද්‍යාඥයින්, ඒ සංවිධාන කරන පුරෝකථන මොනවාද කියලා. පළමුවෙනි පුරෝකථනය හැටියට ඒ අය කියනවා, ගෝලීය ආර්ථික වර්ධන වේගය අඩාළ වනවා, ඒක 2025දී තිබුණු සියයට 2.9 ඉඳලා සියයට 1.3 දක්වා අඩු වෙන්න පුළුවන්, මේක කොවිඩ් 19 අර්බුදයෙන් පස්සේ ලෝකයේ අඩුම ආර්ථික වර්ධන වේගය බවට පත් වනවා කියලා. නමුත් අපි සන්තෝෂ වෙන්න ඕනෑ, අපේ නිවැරදි ආර්ථික කළමනාකරණය නිසා අපි 2026 මුල් මාස හයේත් සියයට 5.1ක ආර්ථික වර්ධන වේගයක් රැක ගනිමින් අපේ ආර්ථිකය කළමනාකරණය කිරීම ගැන. දෙවන පුරෝකථනය තමයි, බලශක්ති මිල ඉහළ යෑම. මේ අය කියනවා, 2026 වර්ෂයේදී ලෝක බලශක්ති මිල සියයට 24කින් ඉහළ යනවා කියලා. උදාහරණයක් දක්වනවා නම් බ්‍රෙන්ට් බොර තෙල් බැරලයක මිල ඩොලර් 120 දක්වා ඉහළ ගියා. නමුත් එහි සාමාන්‍ය අගය ඩොලර් 94ක් වාගේ වෙන්න පුළුවන්.

ඊළඟට පුරෝකථනය කරනවා, ගෝලීය උද්ධමනය ඉහළ යනවා කියලා. ඒකට විශේෂයෙන් ඉන්ධන සහ පොහොර මිල ඉහළ යාම බලපානවා. 2026දී සියයට 4.7ක ගෝලීය උද්ධමනයක් ඇති වෙයි කියලා අපේක්ෂා කරනවා. ලංකාව වාගේ සංවර්ධනය වන රටවල සියයට 5.1 ඉක්මවන උද්ධමනයක් ඇති වෙයි කියලා අපේක්ෂාවක් තිබෙනවා. ඒ වාගේම සැපයුම් දාම කඩාකප්පල් වීම නිසා හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ප්‍රවාහනය කරන සෑම භාණ්ඩ කන්ටේනරයකටම අමතර ඩොලර් 1,000ක පිරිවැයක් වැය වෙලා තිබෙනවා කියන එක අපි දන්නවා. ඒක ලෝකයේ ආහාර පාන සහ පොහොර හිඟයට යම් බලපෑමක් ඇති කරනවා. ඒ නිසා ගෝලීය භාණ්ඩ ප්‍රවාහන පිරිවැය පෙරට වඩා සියයට 84කින් ඉහළ යනවා.

2020 - 2022 කාලය තුළ බින්දුවට බස්සලා නැත්තටම නැති කළ ආර්ථිකයක් ගොඩ ගනිමින් සිටින අපට මේ ගෝලීය සංසිද්ධිවල බලපෑම හොඳින් දැනෙනවා. මේ අර්බුද එනකොට බැරි වෙලාවත් මීට පෙර ඔය ඉස්සරහ පේළිවල හිටපු විපක්ෂයේ ඒ ආර්ථික ඔස්තාර්ලා මේ රට කළා නම් රාත්‍රී 6.55 ප්‍රවෘත්ති ඇහෙන විදිය කොහොමද? එහෙම වුණා නම් වරායෙන් පිට නවතා ඇති තෙල් නැව ගොඩ බා ගැනීමට ඩොලර් නැති බව කියනවා. ඒ විතරක් නොවෙයි, දිනපතා ගණනය කරලා පෙන්වනවා, ඒවාට ගෙවන්න තිබෙන ප්‍රමාද ගාස්තුව. වෙලාවට 2024දී මේ රටේ පින්වන්ත ජනතාව හොඳ ආණ්ඩුවක් පත් කර ගත්තේ, ජනතාව මේ ආණ්ඩුවට බලය දුන්නේ.

මේ අවස්ථාවේදීත් විපක්ෂය හීන දකිනවා, කුමන හෝ අර්බුදයක් ඔස්සේ තමන්ගේ ජනාධිපති සිහින, ආණ්ඩු සිහින සැබෑ කර ගන්න. ඒ කට්ටියට ජන ජීවිතය කඩාකප්පල් වෙනවා නම් මිනිස්සුන්ට හෙණ ගැහුවත් කමක් නැහැ. බලය ගන්න පුළුවන් නම් ඒ වෙනුවෙන් ඒ කට්ටිය ආර්ථික අර්බුදයක් මවලා හරි

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

පෙන්වන්න උත්සාහ කරනවා. පළමුවන මීසයිලය ඉරානයට වදිනකොට මෙහේ තෙල් පෝලිම් ටික හදලා ඉවරයි, බොරු මතක් කරලා. එහෙම අර්බුදයක් තිබුණේත් නැහැ. ඒක අපි හොඳින් කළමනාකරණය කරලා තිබෙනවා. අපි දන්නවා, ජනතාව ඒ තරම් අනුවණ වන්නේ නැති බව. දශක හත අටක් ලිහලා බලපු මල්ල ආයේ මොකටද තව වරක් ඔබලා බලන්නේ. මේ කුමන අර්බුද ආවත් අපි ජනතාවට වෙච්ච පොරොන්දුව අත්හැරලා නැහැ. අපි ඒ අය සමඟ තිබෙන ගිවිසුම කඩන්නේත් නැහැ. අපි ඒ අයත් එක්ක ඉස්සරහට යනවා. අපි ආරම්භ කළ කිසිම සංවර්ධන වැඩක් නවත්වා නැහැ. "දිට්වා" සුළි කුණාටුව ආවා. ඒකෙන් අපේ රටට ලොකු හානියක් සිදු වුණා. ඒත් අපි සංවර්ධන වැඩ කටයුතු නැවැත්වූවේ නැහැ. මැද පෙරදිග අර්බුදය ආවා. ඒක ගෝලීය වශයෙන් ආර්ථිකයට බලපානවා. නමුත් ඒ කිසි දෙයකින් ජන ජීවිතය බිඳ වැටෙන්න අපි ඉඩ තැබුවේ නැහැ. අධිවේගී මාර්ගවල සිට ග්‍රාමීය මාර්ග දක්වා කිසිදු මාර්ග සංවර්ධනයක් අපි නවත්වා නැහැ. දුම්රිය ප්‍රවාහනයේ ඉඳලා බස් ප්‍රවාහනය දක්වා කිසිම ප්‍රවාහනයක් බිඳ වැටෙන්න දෙන්නේ නැතුව අපි ඒවා අඛණ්ඩව පවත්වාගෙන යනවා. ඒ වාගේම රෝහල් පද්ධතිය, සෞඛ්‍ය පද්ධතිය දියුණු කරනවා මිසක් ඒවා බිඳ වැටෙන්න අපි ඉඩ දීලා නැහැ.

අපේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එක්ක සියලු පාසල් පද්ධතිවල භෞතික සහ මානව සම්පත් දියුණු කරමින් අධ්‍යාපනය ගොඩනඟනවා. ආර්ථික අර්බුද ආවා කියලා අපි ඒවා නවත්වා නැහැ. ඒ වාගේම විශ්වවිද්‍යාල සිසුන්ගේ මහපොළ ආදී දීමනා එකට එකක් වැඩි කළා මිසක් අපි ඒවා නවත්වා නැහැ. අපි එම සංවර්ධන කටයුතු 2027 අවුරුද්දේ පටන් ගන්නවා. සියලු විශ්වවිද්‍යාලවල පවතින නේවාසික ප්‍රශ්න විසඳන්න අපි කටයුතු කරනවා. මේ විධියට අපි හැම අවස්ථාවකදීම ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරනවා, ආර්ථික අර්බුදය මොන විධියට ආවත්. අන්න ඒ නිසා තමයි අපි මේ වනකොටත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මේ ආර්ථිකයට එකතු වෙලා ආර්ථිකය නඟාසිටුවන්න සියයට 5ක පොලියකට රුපියල් ලක්ෂ 250 දක්වා ණය ලබා දුන්නේ. කවුරුවත් විශ්වාස කරන්නේ නැහැ, මේ වනකොට බැංකු පද්ධතියෙන් සියයට 2ක පොලියට මිනිසුන්ට රුපියල් ලක්ෂ 5ක ණයක් ලබා දෙනවාය කියන එක. ඉන් තමන්ගේ ජීවිතය ගොඩනඟා ගන්න ආර්ථික කටයුත්තක යෙදෙන්න ඔවුන්ට පුළුවන්.

මීට මොහොතකට කලින් අපේ ගරු විපක්ෂ නායකතුමා පොලී අනුපාතයක් ගැන කථා කළා. මම පොඞ්ඩක් මතක් කරන්න කැමැතියි, 2022, 2023 වනකොට පැවති ණය පොලී අනුපාතය ගැන. මේ රටේ සියයට 28ක, සියයට 30ක තිබුණු ණය පොලී අනුපාතය අද වනකොට සියයට 9 සහ සියයට 12 දක්වා අඩු වෙලා තිබෙනවා. ඇයි ඒ ගැන කථා නොකරන්නේ? ඒවා අමතක කරලා කථා කරන්නේ ඇයි? ඒවාත් පොඞ්ඩක් මේ අතරතුර කථා කරනවා නම් ඉතා වටිනවා. අන්න ඒ නිසා මම නැවත වතාවක් මතක් කරනවා, අපි රුපියල් බිලියන 100ක මේ පරිපූරක ඇස්තමේන්තුව ගෙනෙන්නේ මම කලින් කථා කළ ලෝක ආර්ථික අර්බුදයේ අහිතකර ප්‍රතිවිපාක විඳින ගොවියාට, ධීවරයාට, කුඩා කර්මාන්තකරුවාට වාගේම දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්න, දුක් විඳින, අස්වැසුම ආදී සමාජ ප්‍රතිලාභ ලබන මිනිසුන්ට අවශ්‍ය ප්‍රතිලාභ ලබා දෙන්නයි කියන එක. එම නිසා මොනයම් හෝ අර්බුදයක් එනකොට මාන බලලා ඒ පිනෙන් බලය ඩැහැ ගන්න කටයුතු කරනවා වෙනුවට රටේ ජනතාවට වග කියන, රටේ ජනතාවට ආදරය කරන, දේශපාලනඥයන් විධියට පක්ෂ, විපක්ෂ භේද බලන්නේ නැතුව රට දියුණු කරන්න, රට වෙනුවෙන් වැඩ කරන්න එකතු වෙන්න කියා විපක්ෂයටද ආරාධනා කරමින්, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.57]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

පරිපූරක ඇස්තමේන්තුවක් සම්බන්ධව අද මේ කෙරෙන විවාදයේදීත් ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන දෙගොල්ලන්ම අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳවත්, අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව පිළිබඳවත් කථා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසාන වනතෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය සම්බන්ධව තිබුණු නඩුවක තීන්දුව පසුගිය සතියේ ලබා දුන් බව අපි සියලු දෙනාම දන්නවා. එම තීන්දුව අනුව හිටපු පොලිස්පතිතුමාටත්, හිටපු ආරක්ෂක ලේකම්තුමාටත් මරණීය දණ්ඩනය නියම වුණා. 2019දී විජිත් මලල්ගොඩ අතුරු වාර්තාව මඟින් මේ සම්බන්ධයෙන් 14දෙනෙකුට නඩු පවරන්න කියලා නිර්දේශ කරලා තිබුණා. එම 14දෙනාගෙන් දෙදෙනෙකුට තමයි එම නඩුව පවරන්නේ. එවකට හිටපු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා තමයි එම කමිටුව පත් කළේ. එම වාර්තාව අනුව නිර්දේශ කළ දෙදෙනෙක් තමයි, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු. 2019දී පවරපු එම නඩුවට ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා බලයේ සිටියදී 2021 අවුරුද්දේ ඔවුන්ට අධි චෝදනා පත්‍ර ගොනු කළා. ඔවුන් 2022දී නිදහස් වුණා. 2022දී නීතිපති දෙපාර්තමේන්තුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලුවා, නැවත වතාවක් එම නඩුව ගෙන යන්න ඔවුන්ට අවසරය ලබා දෙන ලෙසත්, සාක්ෂිකාරයන් හැටියට ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරින් කැඳවන්නත්. ඒකට අවසර ලැබුණා. ඒ අවසරය මත තමයි ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් නඩුව විභාග කරලා 2026 අවුරුද්දේ පසුගිය සතියේ ඒ තීන්දුව ලබා දුන්නේ.

මේකේ තිබෙන විශේෂ දේ මේකයි. 2019 වසරේ මේ සිද්ධිය සිදු වුණාට පස්සේ 2019දී මූලික අයිතිවාසිකම් නඩුවක් පවරනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ. ඒක පවරන්නේ කතෝලික සභාව මුල් වෙලා. මේ රටේ සිවිල් පුරවැසියන්, ඒ වාගේම පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් වින්දිතයන් බවට පත් වූ සමහර උදවිය මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු කරනවා, 2019දී. මේ නඩුව 2022දී අවසන් වුණා. මේ මූලික අයිතිවාසිකම් නඩුවේ වින්තිකරුවන් හැටියට නම් කළා, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා, නිලන්ත ජයවර්ධන මහතා, හේමසිරි ප්‍රනාන්දු මහතා, පූජිත් ජයසුන්දර මහතා සහ සිසිර මෙන්ඩිස් මහතා - එතුමා බුද්ධි අංශයේ හිටපු ප්‍රධාන නිලධාරිතුමා. ඔහුත් මේ නඩුවේ වින්තිකරුවකු හැටියට නම් කර තිබෙනවා. මේ නඩුවට 2022දී තීන්දුවක් ලබා දුන්නා, ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. ඒ නඩුව පවරන්නෙත් වගකීම් පැහැර හැරීම යටතේ. දැන් ගිය සතියේ තීන්දුව ලබා දෙන්නෙත්; මරණීය දණ්ඩනය ලබා දෙන්නෙත් ඔවුන් දෙදෙනා වගකීම් පැහැර හැරියා කියලායි.

එතකොට, වගකීම් පැහැර හැරියා කියලා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනටත්, පූජිත් ජයසුන්දරටත්, හේමසිරි ප්‍රනාන්දුටත්, සිසිර මෙන්ඩිස්ටත්, නිලන්ත ජයවර්ධනටත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කළා, රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 75 දක්වා වන්දි මුදල් ගෙවීමට. නමුත්, චෝදනාව එකයි. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වරදකරුවන් වූ දෙදෙනෙකු දැන් මේ නැවත කැඳවපු නඩුවට සම්බන්ධ වෙන්නේ නැහැ. 2022දී ශ්‍රේෂ්ඨාධිකරණය මෛත්‍රීපාල සිරිසේනවත් වරදකරු කළා, නිලන්ත ජයවර්ධනවත් වරදකරු කළා. වන්දි මුදල් ගෙවීමට ඔවුන්ට නියම කළා. නමුත්, නීතිපති දෙපාර්තමේන්තුව ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවරපු, වගකීම් පැහැර හැරීම සම්බන්ධ නඩුවට මොවුන් දෙදෙනාව එකතු කර ගත්තේ නැහැ. එතකොට අපට පෙනෙනවා, නීතිපති දෙපාර්තමේන්තුව හිතා මතාම තමන්ගේ වගකීම පැහැර හැර තිබෙනවා කියන එක. දඬුවම් ලැබිය යුතු දෙදෙනෙකුව මුදා හැර තිබෙනවා. එහෙම කොහොමද වෙන්නේ? එහෙම වෙන්න විධියක් නැහැ.

ජනක් ද සිල්වා ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිලන්ත ජයවර්ධන සම්බන්ධව නිර්දේශ ලබා දී තිබෙනවා, ඔහුට අපරාධමය නඩුවක් පවරන්න කියලා. මෛත්‍රීපාල සිරිසේන සම්බන්ධව නිර්දේශ තිබෙනවා. ඔහු ආරක්ෂක කවුන්සලය කැඳෙව්වේ නැහැ, මාස 6ක් තිස්සේ. ඒ බෝම්බය පිපිරෙනකොට ඔහු ආරක්ෂක ඇමති. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, බුද්ධි අංශය, ඒ සියලු දේවල් තිබුණේ මෛත්‍රීපාල සිරිසේන යටතේ. එතකොට ඔහු වගකීමෙන් බැහැර වෙන්නේ කොහොමද?

තමුන්නාන්සේලා පාස්කු ඉරිදා බෝම්බය ප්‍රහාරය සම්බන්ධව ඉතා සංවේදීව වැඩකටයුතු කරගෙන යන බව අපි දන්නවා. මේකේ මහ මොළකරු හොයන්න ඕනෑ විමර්ශන ඉදිරියට ගෙන යන බව අපි දන්නවා. ඒ ගැන අපට වාද විවාදයක් නැහැ. අපිත් ඉන්නේ ඒ මහ මොළකරු හොයන්න ඕනෑය කියන තැන. ඒ වෙනුවෙන් අපිත් අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. නමුත් තිබෙන ප්‍රශ්නය තමයි, එක පැත්තකින් ඒ පරීක්ෂණ යන ගමන්ම මේ 2024දී පවරපු, නැවත කැඳවපු මේ නඩුවේදී මෛත්‍රීපාල සිරිසේන සහ නිලන්ත ජයවර්ධන මුදා හැරියේ කොහොමද කියන එක. ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා වහාම නැවත ඒ ගැන බලන්න කියලා. නීතිපති දෙපාර්තමේන්තුව තිබෙන්නේ තමුන්නාන්සේලාගේ යටතේ. නීතිපති දෙපාර්තමේන්තුව පැහැදිලිවම කුමන්ත්‍රණකාරී විධියට වැඩ කරලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව පැහැදිලිවම තමන්ගේ වගකීම පැහැර හැර තිබෙනවා. ඒ කියන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වරදකරුවන් වූ පස්දෙනාගෙන් දෙදෙනෙකුව මුදා හැර තිබෙනවා. එහෙම වෙන්න විධියක් නැහැ. නීතියේ ආධිපත්‍යය තිබෙනවා නම්, නීතියේ සාධාරණත්වය ඉෂ්ට වෙනවා නම්, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණත්වය ඉෂ්ට කරන්න ඕනෑ කියලා අභිලාෂය තිබෙන, බලාපොරොත්තුව තිබෙන තමුන්නාන්සේලාගේ මෙවැනි ආණ්ඩුවක් යටතේ එහෙම නිදහස් වෙන්න විධියක් නැහැ. එහෙම බේරිලා යන්න දෙන්න බැහැ.

අපි දන්නවා, 2021දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තමයි මොවුන් දෙදෙනාට විරුද්ධව indictments file කළේ. ඒ ආපු නඩුව තමයි මේ ඉස්සරහට ගෙන ගියේ. ඒ සියලු කරුණු ඇත්ත. දැන් තමුන්නාන්සේලාට බලය ලැබිලා තිබෙනවා. ඒ හින්දා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, මේකට සම්බන්ධ වෙච්ච; පැහැදිලිවම මේ පිළිබඳව වගකීම් දරන්න ඕනෑ කියලා ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සාක්ෂි ඉදිරිපත් කරලා තිබෙන; නිර්දේශ ලබාදී තිබෙන අය සම්බන්ධයෙනුත් ඉදිරි කාලය තුළදී වහාම නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. එවකට හිටපු ජනාධිපතිවරයා පැහැදිලිවම තමන්ගේ වගකීම් පැහැර හැර තිබෙනවා කියන එක ජනක් ද සිල්වා කොමිෂන් සභා වාර්තාවේ හෙළිදරව් වෙලා තිබෙනවා. අන්න ඒ හින්දා ඔවුන්ටත් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, ඔවුන් සම්බන්ධයෙනුත් වහාම නීතිය ක්‍රියාත්මක කරලා, මේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන් බවට පත්වෙලා ඉන්න ඒ ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්න තමුන්නාන්සේලා මේකට මැදිහත් වෙන්න කියලා.

දැන් අධිකරණය ගැන කථා කළා. මේ සම්බන්ධයෙන් කථා කිරීමේදී මොකක්ද අපි මේ කියන්නේ? තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්න කාලයේ හැම තිස්සේම විනිවිදභාවය, නීතියේ ආධිපත්‍යය සහ පරමාධිපත්‍යය ගැන කථා කළා. මේක තමයි 2024 වෙනකොට මේ රටේ තිබුණු සටන් පාඨ වුණේ. අද වෙනකොට විපක්ෂය හැටියට අපි කියන්නේත් ඒ 2024දී තමුන්නාන්සේලා කථා කරපු සටන් පාඨ, තමුන්නාන්සේලා කියපු ඒ අදහස, තමුන්නාන්සේලා ඉල්ලපු දේ තමයි මේ අපිත් කියන්නේ - අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන්. අපි කියන්නේ සම්පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්න කියලායි. තමුන්නාන්සේලාට අධිකරණවල විනිසුරුවරුන්ගේ විශ්‍රාමික වයස් සීමා වෙනස් කර ගන්න ඕනෑ නම් ඒක ගැන ගැටලුවක් නැහැ. සියලු දේවල් වෙනස් කරලා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්න පුළුවන් අවස්ථාවක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රීවරු 159ක් ඉන්නවා. ඒක ගැන ගැටලුවක් නැහැ. ඒකට අපේ සහයෝගය අවශ්‍යත් නැහැ. තමුන්නාන්සේලාට ඒ mandate එක ජනතාව ලබාදීලා තිබෙනවා. එහෙම ලබාදී තිබියදීත් කොනින් කොන, තැනින් තැන මේක කරන්න යාම තුළ මේක අවුලකට යන්න පුළුවන්. එහෙම මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තැනින් තැන සංශෝධනය කරන්න ගිහිල්ලා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලොකු අවුලකට අපි අරගෙන ගිහිල්ලා තිබෙනවා. එම නිසා නැවත වතාවක් තමුන්නාන්සේලාත් ඒ අවුල ඇති කර ගන්න එපා. මොකද, තමුන්නාන්සේලාගේ මූලික සටන් පාඨයක් වුණේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමයි. තමුන්නාන්සේලාගේ දේශපාලන ව්‍යාපාරය ඒක වෙනුවෙන් දිගටම පෙනී සිටියා. ඒක වෙනුවෙන් සටන් කළා. ඒක වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළා. එහෙම දේශපාලන ව්‍යාපාරයක උරුමයක් තිබෙන තමුන්නාන්සේලා අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ආසන 159ක් තියාගෙන මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තැනින් තැන සංශෝධනය කිරීමට එකතු වීම ගැන තමයි අපි මේ විරෝධය පළ කරන්නේ, අපේ අදහස් පළ කරන්නේ.

ඒ නිසා අපි මේ කාරණය කියන්න කැමැතියි. තමුන්නාන්සේලාට ජනතාව mandate එකක් ලබා දීලා තිබෙනවා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ආසන 159ක් ලබා දීලා තිබෙනවා. ඒ තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න පුළුවන්. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්න පුළුවන්. මේ ඕනෑම දෙයක් කරන්න තමුන්නාන්සේලාට දැන් බලය තිබෙනවා. නමුත්, ඒ බලය මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් වෙනුවෙනුත්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙනුත්, විනිවිදභාවයෙන් පාවිච්චි කරන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.08]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අවුරුද්ද කියන්නේ අපි මේ රට යළි ආර්ථික වශයෙන් නගා සිටුවීමේ අවුරුද්ද. වැටිලා තිබිච්ච, බංකොලොත් වෙලා තිබිච්ච රට කෙටි කාලයක් තුළ අප නගා සිටුවන්න පටන් ගත්තා. සියයට 70කට නැඟලා තිබුණු උද්ධමන අනුපාතිකය, සෘණ උද්ධමන අනුපාතිකයක් දක්වා අපි ගෙන ආවා. ඒ අවුරුද්ද ඇතුළේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පියවර ගණනාවක් අපි ඉස්සරහට ගත්තා. අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 17.2ක් දක්වා වැඩි කළා. වැඩිම විදේශ ප්‍රේෂණ ලැබිච්ච අවුරුද්ද බවට 2025 අවුරුද්ද පත් වුණා. විදේශ ආයෝජන ලංකාවට එන්න පටන් ගත්තා. ආර්ථික වශයෙන් රට ශක්තිමත් ගමනක් යන්න ආරම්භ කළා.

ඒ මොහොතේ තමයි "දිට්වා" සුළි කුණාටුව ආවේ. එම සුළි කුණාටුවත් එක්ක අපට අමතර පිරිවැයක් දරන්න වුණා; අමතර බරක් දරන්න වුණා, නැවත මේ ආර්ථිකය ශක්තිමත් තැනට ගේන්න. ඒ වාගේම තමයි, අපි ඒ අභියෝගයත් ජයග්‍රහණය කරමින් ඉස්සරහට එද්දී, මේ අවුරුද්දේ පෙබරවාරි 28වැනි දා මැදපෙරදිග යුද තත්ත්වය ඇති වුණා. ඒ මැදපෙරදිග යුද්ධය අපේ ආණ්ඩුවේ වරදක් නිසා හෝ රට අභ්‍යන්තරයේ ඇති වෙච්ච ප්‍රශ්නයක් නිසා ඇති වූ තත්ත්වයක් නොවෙයි. එය මුළුමනින්ම රටින් බැහැරව, පරිබාහිරව ඇති වෙච්ච ප්‍රශ්නයක්. ඒ යුදමය තත්ත්වය නිසා අපට ආර්ථික වශයෙන් අභියෝග ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වුණා. උද්ධමන අනුපාතිකය අඩු කරලා, බඩු මිල අඩු කරමින් තිබිච්ච ආර්ථිකයට, වේගයෙන් ශක්තිමත්ව ඉදිරියට යමින් තිබිච්ච ආර්ථිකයට අභියෝගයක් එල්ල වුණා. ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න අපට යම් යම් ක්ෂණික පියවර ගන්න වුණා. එදා බොහෝ අය හිතුවා, අපට ඒ අභියෝගයට මුහුණ දෙන්න බැරි වෙයි, තෙල් අර්බුදය සමහන් කර ගන්න බැරි වෙයි, 2022දී වාගේ නැවත තෙල් පෝලිම්වලට, ගෑස් පෝලිම්වලට යන්න වෙයි, ආණ්ඩුවට මේක කර ගන්න බැරිව රට අර්බුදයකට තල්ලු වෙයි කියලා. නැහැ, අපි ඉතා දක්ෂ ලෙස ඒ අභියෝගය ජයග්‍රහණය කළා; ඒ සියලු අභියෝගවලට මුහුණ දුන්නා. අපි ශක්තිමත්ව ඒ අභියෝග ජයග්‍රහණය කරගෙන ඉදිරියට ආවා. ඒ අතරතුර තමයි ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වීමත් එක්ක, ගෑස් මිල වැඩි වීමත් එක්ක ආනයන වියදම වැඩියෙන් දරන්න අපට සිදු වුණේ. අමතර පිරිවැයක් දරා, වැඩි මුදලට තෙල් ගෙන්වන්න අපට සිදු වුණා. එසේ තෙල් මිල ඉහළ යෑමත් එක්ක, රටේ භාණ්ඩ සහ විවිධ සේවාවල මිල ගණන් ඉහළ ගියා. ඒක වළක්වන්න බැහැ. ඒක මේ රටේ පොදු ජනතාව දන්නා දෙයක්. කවුරු මොනවා කිව්වත් මේ රටේ ජනතාව දන්නවා, ඒක රටේ ආණ්ඩුවේ වරදින් සිදු වෙච්ච දෙයක් නොව, මැද පෙරදිග යුද්ධය නිසා අපට මුහුණ දෙන්න සිදු වෙච්ච, යථාර්ථයක් වෙච්ච අභියෝගයක් බව. ඒ නිසා උද්ධමන අනුපාතිකය යම් ප්‍රමාණයක් වැඩි වුණා. ඒක ඇත්ත. ඒ නිසා ජනතාවට දරා ගන්න බැරි විධියේ යම් යම් ගැටලුකාරී තත්ත්වයන් මතු වුණා.

අන්න ඒකට සහනයක් විධියට; ක්ෂණික පිළියමක් විධියට අමතර පිරිවැයක් දරන්න; රුපියල් බිලියන 100ක් අමතරව වෙන් කරලා ජනතාවට සහන දෙන්න ක්ෂණික ක්‍රියාමාර්ග ගන්න අපට සිදු වුණා. ඒක අපේ 2026 වාර්ෂික අය වැය ලේඛනයේ තිබුණේ නැහැ; අපේ පූර්ව සැලැස්මේ තිබුණේ නැහැ. මොකද, ඒක අනපේක්ෂිතව ඇති වෙච්ච තත්ත්වයක්. ඒ නිසා තමයි පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් මුදල් වෙන් කරලා මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්න අපට සිදු වුණේ. ඒ වෙන් කරපු මුදලින් ජනතාවට සහන දීලා, අපේ ආර්ථිකය යථා පරිදි පවත්වා ගනිමින්, මුහුණ දෙන්න නියමිතව තිබිච්ච පීඩාවෙන් ජනතාව මුදාගෙන ශක්තිමත්ව අද අපි ඉස්සරහට යමින් තිබෙනවා. ආර්ථිකය හදන ගමනේ ඉස්සරහට යන කොට රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, නීතියේ ආධිපත්‍යය තහවුරු කරලා අප විසින් ගත යුතු ක්‍රියාමාර්ග ගොඩක් තිබෙනවා.

එදා පාලකයන් මේ රටේ ආර්ථිකය බිඳ වැට්ටුවා විතරක් නොවෙයි, මේ රටේ දේශපාලන සංස්කෘතියත් මුළුමනින් විනාශ කළා. හොරකම, දූෂණය, වංචාව, නාස්තිය, ඝාතන, පාතාලය, දේශපාලන අත පෙවීම්, ඇඟිලි ගැසීම්, රාජ්‍ය නිලධාරීන් රූකඩ බවට පත් කර ගැනීම් සිදු වුණා. නීතිය කැලෑ නීතිය; මැඳමුලන නීතිය බවට පත් වෙලායි තිබුණේ. එහෙමට තිබිච්ච රටක් මේක. මේ රට දේශපාලන කැරකෝප්පුවක් බවට පත් කරලායි තිබුණේ. ඒ නිසා තමයි එදා, තරුණ තරුණියෝ, ජනතාව පාරට බැහැලා, හිටපු පාලකයන් ගහලා පැන්නුවේ. ගොඩක් අයට අද ඒක මතක නැහැ, පොලිස්පතිට පාරේදී ගහනවා වාගේ කථා කියන කොට.

එදා ජනතාව පාරට බැහැලා, මේ රටේ හිටපු පාලකයන් පන්නලා දැම්මා. ඒ පාලකයන් අවසානයේදී රටේත් ඉන්න බැරි තත්ත්වයට පත් වුණා. ජනතාවට එදා තිබුණා ඒ සා විශාල කෝපයක්; කේන්තියක්. ආර්ථික වශයෙන් රට බංකොලොත් කළේ ඒ දූෂිත පවුල් පාලනයයි, ඒ දූෂිත, මජර දේශපාලන සංස්කෘතියයි කියන කේන්තිය තිබුණු නිසා තමයි ජනතාව එදා ඒ පාලකයන් පළවා හැරියේ. මේ පාර්ලිමේන්තුවේ බලය පිහිටුවා ගන්න බැරිව හිටපු, ඔය කථා කරන, කයිවාරු ගහන අය වණ්ඩි රනිල්ගේ නැට්ටේ එල්ලිලා තමයි එදා යන්තම් ආණ්ඩුවක් අටවා ගත්තේ. මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් නැති කෙනෙක්ව ගෙන්වා කරපු ඒ උප්පරවැට්ටියෙන් තමයි ආණ්ඩුව යන්තම් අවුරුද්දක් එහාට ගියේ. එහෙම නොවුණා නම් ජනතාව ඊට වඩා පාඩම් එදා උගන්වනවා. ඒක තමයි ඉතිහාසය. අපි ඒක මතක් කර ගන්න ඕනෑ. එහෙමට තිබිච්ච රටක් තමයි අපි කෙටි කාලයක් තුළ අනෙක් පැත්තට වෙනස් කරමින් තිබෙන්නේ. එතැනදී අපට දේශපාලන අභියෝග ගණනාවක් තිබෙනවා. ඒ දේශපාලන අභියෝගවලටත් අපි මුහුණ දෙනවා. එහිදී අපි දේශපාලන මැදිහත්වීම් නතර කරන්න ඕනෑ. අපි ඒක නතර කරලායි තිබෙන්නේ.

විපක්ෂයේ සමහරු දැන් පොලිස්පතිවරුන් ගැන කථා කරනවා. අපට මතකයි, හිටපු පොලිස්පති බාලසූරියට වෙච්ච දේ. එදා පොලිස්පති බාලසූරිය මොකක්ද කළේ? එදා රොෂේන් චානකලාට වෙඩි තියන්න නියෝග දීලා, නිදහස් වෙළෙඳ

කලාපයේ සේවය කරපු අහිංසක සේවකයන් මරා දමපු අයට තානාපති ධුර දීලා සලකපු විධිය, ඒ පොලිස්පතිලාගෙන් වැඩ ගත්තු විධිය, අන්තිමට යන එන මං නැතිව අනාථ කරපු විධිය, ඒ ඉතිහාසය මේ රටේ ජනතාව දන්නවා. බස්නාහිර පළාතේ හිටපු Senior DIG අනුර සේනානායකගෙන් ඇති තරම් වැඩ ගත්තා. කියපු කියපු හැම දෙයක්ම කරලා අන්තිමට යන්න එන්න තැනක් නැතිව, අවසානයේදී paralyze වෙලා නැඟිට ගන්න බැරිව සිටියදීයි ඔහුගේ ජීවිතය නැති වුණේ. ඒ පාලකයෝ හිටපු DIGsලාට කරපු දේවල් අපට මතකයි; දේශබන්දුලාට කරපු දේවල් අපට මතකයි. දේශපාලන හිතවත්කම්වලට පොලිස්පතිලා අරගෙන, ඔවුන්ව දේශපාලන අතකොලු බවට පත් කරගෙන අන්තිමට වෙච්ච දේ එදා පාලකයෝ රටට පෙන්නුවා.

නමුත්, රාජ්‍ය නිලධාරීන් අද ඒ තත්ත්වයට වැටිලා නැහැ. රාජ්‍ය නිලධාරීන් අද කොන්ද කෙළින් තියාගෙන වැඩ කරනවා. අධිකරණයේ වේවා, පොලීසියේ වේවා, ත්‍රිවිධ හමුදාවේ වේවා, අනෙකුත් රාජ්‍ය ආයතනවල වේවා, දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව ඒ අය අද අලුත් දේශපාලන සංස්කෘතියක් තුළ වැඩ කරනවා. ඔවුන්ට ස්වාධීන තීන්දු-තීරණ ගන්න හැකියාව, ධෛර්යය අපි දීලා තිබෙනවා. ඒ අනුව තමයි නීතියේ ආධිපත්‍යය ඇති වන්නේ. ජනතා පරමාධිපත්‍යය කියන්නේ මොකක්ද? ජනතා පරමාධිපත්‍යයේ ප්‍රධානම කොටස තමයි ජනතාවගේ ඡන්දය. ජනතාව අපට ඡන්දය දුන්නේ මොකටද?

ජනතාව අපට ඡන්දය දුන්නේ නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්නයි; ඒ වාගේම මේ ගොඩගැහිලා තිබෙන කප්පරක් නඩු ගොන්න අවසන් කරන්නයි. අද නඩු ලක්ෂ 11ක් ගොඩගැහිලා තිබෙනවා. නඩු වැඩිපුරම තිබෙන්නේ මහෙස්ත්‍රාත් අධිකරණවල, දිස්ත්‍රික් අධිකරණවල සහ මහාධිකරණවලයි. ඒ නිසා තමයි මහෙස්ත්‍රාත් අධිකරණවල, මහාධිකරණවල, දිස්ත්‍රික් අධිකරණවල ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතු වන්නේ. ඒ ක්‍රියාවලිය සඳහා තමයි වැඩිපුර කාලයක් ගත වන්නේ. ඒවායේ තමයි සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විමසන්නේ, චූදිතයන් ගෙනැල්ලා ඒ අයගෙන් ප්‍රශ්න කරන්නේ, හරස් ප්‍රශ්න අහන්නේ, සාක්ෂි සඳහා නඩු භාණ්ඩ ඉදිරිපත් කරන්නේ. ඒ සියල්ල වැඩිපුරම සිදු වන්නේ පහළ අධිකරණවල තමයි. ඒ නිසා පහළ අධිකරණ සංඛ්‍යාව මදි, මහාධිකරණ සංඛ්‍යාව මදි. එහෙම නම්, මහාධිකරණ ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. මහාධිකරණ ප්‍රමාණය වැඩි කිරීමෙන් තමයි පසුගිය කාලයේ වෙච්ච දේශපාලන අපරාධ; ඝාතන වාගේම බරපතළ දූෂණ චෝදනා පිළිබඳ නඩු ඉක්මන් කරන්න පුළුවන් වන්නේ. ඔය නඩු ලක්ෂ 11 තුළ වැඩිපුරම තිබෙන්නේ එදා මේ රට පාලනය කරපු පාලකයන් කරපු අපරාධවලට එරෙහිව තිබෙන නඩු.

අප බලයට ඇවිල්ලා මහාධිකරණ 7ක් අලුතින් පිහිටෙව්වා. ඒ මහාධිකරණ හතේම අහන්න වෙලා තිබෙන්නේ පසුගිය ආණ්ඩුවල දේශපාලනඥයන් කරපු අපරාධ පිළිබඳ නඩු නේ. ඒ අපරාධ කළේ නැත්නම්; ඒ හොරකම් කළේ නැත්නම්, ඒ ඝාතන කළේ නැත්නම්; තාජුඩීන්ලා ඝාතනය කළේ නැත්නම්, එක්නැලිගොඩලා පැහැර ගත්තේ නැත්නම්, එදා ඔය කියන දේශපාලන හේතු මත ඝාතනය කිරීම් කළේ නැත්නම් අද අධිකරණවල නඩුවලින් භාගයක්ම ඉවරයි. එහෙම නම් අද මෙච්චර නඩු නැහැ. අද වැඩිපුරම අහන්නේ ඒවා තමයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් වැඩිපුරම පැමිණිලි දාලා නඩු අහන්න වෙලා තිබෙන්නේ කවුරුන් ගැනද? දැන් විපක්ෂයේ ඉන්න; එදා ආණ්ඩු කරපු තමුන්නාන්සේලා කරපු අපරාධ, තමුන්නාන්සේලා කරපු දූෂණ චෝදනාවලට එරෙහිව දමපු නඩු තමයි අධිකරණවල අද වැඩිපුරම විභාග වෙමින් තිබෙන්නේ. අධිකරණවල නඩු සංඛ්‍යාව අඩු කර ගන්න නම් ඒවා නොකර ඉන්න තිබුණා. එදා ඒ අපරාධ කළේ නැත්නම්, ඒ වංචා, දූෂණ කළේ නැත්නම් ඇත්තටම ඔය නඩු ලක්ෂ 11න් භාගයක්ම ඉවරයි. එහෙම නම් මේ රටේ ජනතාවගේ මුදලුත් ඉතිරියි; ජනතාවගේ සාමාන්‍ය දෛනික නඩු ටිකත් ඉක්මනින් අහන්න පුළුවන්. ජනතාවට තිබෙන සාමාන්‍ය සිවිල් නඩු; ඉඩම් නඩු වාගේ නඩු අහලා ඉවර කරන්නත් පුළුවන්. ඒ නිසා තමයි ජනතාව ඉල්ලන්නේ, අපරාධ සිදුවීම් සම්බන්ධයෙන් ගොඩ ගැහුණු පරණ නඩු ටික අහලා ඉවර කරන්න කියලා.

ඒ නඩු කටයුතු අවසන් කරන්න නම් අධිකරණය තුළ; අධිකරණ පද්ධතිය තුළ ව්‍යුහාත්මක වෙනස්කමක් කරන්න ඕනෑ. ඒ ව්‍යුහාත්මක වෙනස්කම කරන්න අපි බැඳිලා ඉන්නවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි ඉතා පැහැදිලිව ජනතාවට කිව්වා, අපි ඒක කරනවා කියලා. අප ඒක කරන ක්‍රමය මොකක්ද කියා ජනතාව දන්නවා. ඒක දැනගෙන තමයි ජනතාව අපට ඡන්දය දුන්නේ. ඒ ජනවරමට ගරු කරලා තමයි අප ඒ දේවල් කරන්නේ. ඒවායෙන් එකක් තමයි මේක. අපි තවත් බොහෝ දේවල් කරමින් තිබෙනවා. ජනතාවට දැන් ඒ විශ්වාසය ඇති වෙලා තිබෙනවා. ජනතාව ඒ පිළිබඳව සතුටු වෙනවා. ජනතාව බලාගෙන ඉන්නේ මේ නඩු ඉක්මනින් අහලා ඉවර කරන්නේ නැත්තේ ඇයි කියලායි. ජනතාව හැම දාම කියන්නේ ඒකයි. ඒක තමයි ජනතාවගේ අපේක්ෂාව. මේකේ ඉන්න හතරපස්දෙනෙකු තමන්ට එරෙහිව නැඟෙන චෝදනාවලින් බේරෙන්න එක එක ජාතියේ වැරදි මත හැදුවාට මේ රටේ පොදු මහත් ජනතාව ඉන්නේ මේ නඩු ටික ඉක්මනින් ඉවර කරලා, අපරාධකරුවන්ට දඬුවම් දීලා, නීතියේ ආධිපත්‍යය තහවුරු කරලා අපේ රට ශිෂ්ට සම්පන්න රටක් බවට පත් කරන්නයි. එසේ ශිෂ්ට සම්පන්න රටක් බවට පත් කරන්න දේශපාලන සංස්කෘතියේ බොහෝ වෙනස්කම් කළ යුතුව තිබෙනවා. ඒ වෙනස්කම් තමයි මේ කරන්නේ. එදා වාගේ නොවෙයි දැන් අධිකරණයෙන් සාධාරණ නඩු තීන්දු ලබා දෙනවා. එදා අධිකරණවලින් ජනතාව දැකපු දේ තමයි, ඇමති කෙනෙකුට, දේශපාලන අධිකාරියේ කෙනෙකුට නඩුවක් දැම්මාම "නිදොස් කොට නිදහස් කළා" කියන උත්තරය ලැබුණු ආකාරය. ඒක තමයි එදා උත්තරය. අද එහෙම නැහැ. අද දඬුවම් ලැබෙනවා, නඩු ඇහෙනවා, නීතිය ක්‍රියාත්මක වෙනවා. ජනතාව බලාපොරොත්තු වුණේ ඒක. ඒක තමයි ජනතාව ඉල්ලන්නේ. ඒ නිසා ජනතාව අත්පුඩි ගහනවා. ජනතාව ඒ ගැන සතුටු වෙනවා. උසාවිය මඟින් අපරාධකරුවන්ට දඬුවම් ලැබෙනකොට ජනතාවගේ ප්‍රතිචාරය තමයි තමන්ගේ සතුට අත්පුඩියකින් ප්‍රකාශයට පත් කරන එක.

හැබැයි, එදා ආණ්ඩු කරපු තමුන්නාන්සේලා උසාවිවලට ගල් ගැහුවා. උසාවි කොයිතරම් බලපෑම්වලට ලක් කළාද කියනවා නම් උසාවිවලට ගල් ගහලා, විනිශ්චයකාරවරුන්ගේ ගෙවල්වලට ගල් ගහලා තමයි බිය වැද්දුවේ. අද ඒ ඉතිහාසය නැහැ. අද වනකොට අපි ඒවා වෙනස් කරලා තිබෙන්නේ. විනිශ්චයකාරවරුන්ට හූ කියලා, ගල් ගහලා, තර්ජනය කරලා බලපෑම් කළේ. අද ඒවා නැහැ. ජනතාවට පාරේ දාගෙන ගහන තත්ත්වය නැති කළේ අපි. ජනාධිපතිවරණය ඉවර වෙච්ච ගමන් ඒ ලැබිච්ච මහා ජයග්‍රහණය තුළින් මහ මැතිවරණයෙන් අපි තුනෙන් දෙකක විශාල ජයග්‍රහණයක් ලැබුවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට උතුර, නැඟෙනහිර, දකුණ, බටහිර ඇතුළු මුළු රටින්ම 159ක පාර්ලිමේන්තුවේ බහුතර බලයක් ලැබිච්ච අපේ ආණ්ඩුව විරුද්ධවාදීන්ට ඇල්පෙනිත්තකින්වත් රිදෙව්වේ නැහැ, වචනයකින්වත් විරුද්ධවාදීන්ට රිදෙව්වේ නැහැ. ඇත්තටම ජනතාවට වුවමනාවක් තිබුණා පසුගිය කාලයේ කරපු අපරාධවලට ප්‍රතිචාර දක්වන්න. හැබැයි, ආණ්ඩුවක් විධියට අපි ඉතා වගකීමෙන්, සාමකාමීව, නිහතමානීව තමයි ඒ මැතිවරණයේ ප්‍රතිඵල, ජයග්‍රහණය භුක්ති වින්දේ. ඉතිහාසයේ එහෙම තිබුණේ නැහැ. ජනාධිපතිවරණයෙන් පස්සේ අපි මැතිවරණ දෙකක් - පාර්ලිමේන්තු මැතිවරණය, ප්‍රාදේශීය සභා මැතිවරණය- පැවැත්වුවා. ඒ මැතිවරණ කාලය තුළ කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු වුණේ නැහැ. මැතිවරණයෙන් පසුවත් කිසිදු පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් වුණේ නැහැ. හැබැයි, ඉතිහාසයේ එහෙම නොවෙයි වුණේ.

[ගරු විජිත හේරත් මහතා]

හැබැයි, තුනෙන් දෙකේ බලයක් ගත්තා නම් ඔය හිටපු පාලකයෝ පහුවදාම විපක්ෂයේ කට්ටියගේ, විරුද්ධවාදීන්ගේ අත පය කඩලා, කැති පොලුවලින් ගහලා මරලා, ඉස්පිරිතාලවල හිටපු ඉතිහාසයක් තමයි තිබුණේ. දැන් අපි ඒවා වෙනස් කරලා තිබෙන්නේ. ජනතාව තුළ තිබිච්ච වෛරය කෝපය පවා අපේ පාලනය ඇතුළේ, අලුත් දේශපාලන සංස්කෘතිය ඇතුළේ අපි වෙනස් කරලා තිබෙන්නේ. ඒ වෙනස් කිරීමේ තවත් ඉදිරි පියවරක් තමයි අධිකරණ පද්ධතිය ව්‍යුහාත්මකව වෙනස් කරන එක. මහාධිකරණ ප්‍රමාණය වැඩි කරලා, මහෙස්ත්‍රාත් උසාවිවල, දිස්ත්‍රික් උසාවිවල, අභියාචනාධිකරණයේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ඇසීමේ වේගය වැඩි කරලා, ඒ නඩු කටයුතුවලට මැදිහත් වෙන විනිශ්චයකාරවරුන්ගේ පරිණතකම, අත්දැකීම් උපයෝගී කරගෙන මේ නඩු ඉක්මනින් ඉවර කිරීම තමයි මෙහි අවසාන ඉලක්කය.

අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්නේ මොකටද? අපේ දේශපාලන බලය වැඩි කර ගන්නද? මීට කලින් හිටපු හැම පාලකයාම -ජනාධිපතිවරයාම- බලයට ආපු ගමන් ඒ තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා විපක්ෂයේ අයත් සල්ලිවලට අරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කර ගත්තේ තමන්ගේ බලය තහවුරු කර ගන්න, ධුර කාලය දික් කර ගන්න. නැත්නම් තිබිච්ච ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරලා ඒකාධිපති බලය තහවුරු කර ගන්නයි. අපි එහෙම එකක් කරලා නැහැ. මේ සංශෝධනයේ එවැනි කිසිවක් නැහැ, අපේ දේශපාලන බලය තහවුරු කර ගැනීමේ. මේ තුළින් අධිකරණයට ඇඟිලි ගහන්නේ කොහොමද? මේකෙන් කොහොමද අධිකරණයට බලපෑම් වෙන්නේ? අපේ හිතවතුන් අධිකරණයට දා ගන්නද? දේශපාලන හෙංචයියලා තමන්ට ඕනෑ තැන්වලට ගෙනියන්නද? ඒවා තමයි ඉතිහාසයේ තිබුණේ. අපි ඒක වෙනස් කරලා තිබෙන්නේ. මේ තුළින් වෙන්නේ විනිශ්චයකාරවරුන්ට අධිකරණ පද්ධතිය තුළ ස්වාධීනව මේ කටයුත්ත කර ගෙන යැමට වඩාත් ඉඩ පහසුකම් සලසා දීමයි. ඒක තමයි ජනතාවට ලැබෙන සේවාව. මේකෙන් සහනය ලැබෙන්නේ ජනතාවට. විනිශ්චයකාරවරුන්ගේ ධුර කාලය අවුරුදු දෙකකක් දික් වුණු එකේ ප්‍රතිලාභය, එකේ වාසිය, සහනය ලැබෙන්නේ මේ රටේ පොදු මහත් ජනතාවට. මේක ජනතාව වෙනුවෙන් අපි ගන්න එඩිතර තීන්දුවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විතරක් නොවෙයි, අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම හරහාත් අපි බලාපොරොත්තු වෙන්නේ වෙන මොකක්වත් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවට යුක්තිය සාධාරණත්වය නිවැරදිව ඉටු කර දීමයි.

දැන් විපක්ෂයේ ඉන්න බොහෝ අය එදා යෝජනා කරපු දේවලුත් අපි මේකට අරගෙන තිබෙනවා. නීතිඥ සංගමය මඟින් ඉදිරිපත් කරපු යෝජනාත් අපි අරගෙන තිබෙනවා. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වයස අවුරුදු 63 ඉඳලා 65 දක්වා වැඩි කරන්න කියලා යෝජනාව ඉදිරිපත් කළේ කවුද? රවූෆ් හකීම් මැතිතුමා එදා ඒ කමිටුවේ සභාපතිත්වය දරනකොට නීතිඥ සංගමයෙන් - Bar Association එකෙන් - ඉදිරිපත් කරපු යෝජනාව තමයි ඒ. ඊළඟට, අග්‍ර විනිශ්චයකාරවරයා හෝ අග්‍ර විනිශ්චයකාරවරිය උපරිම ධුරය දැරිය යුතු කාලය අවුරුදු 6යි. ඒ යෝජනාව කාගෙද? අපේ නොවෙයි. ඒක නීතිඥ සංගමය ම එදා ඉදිරිපත් කරපු යෝජනාවක්. අරගෙන හොඳට බලන්න ඒ වාර්තාව. අපි ඉදිරියේදී ඒවා මේ රටේ ජනතාවට පෙන්වනවා. ඔබලා එදා ඉදිරිපත් කරපු අදහසුත් අරගෙන තමයි අපි මේක ගෙනැල්ලා තිබෙන්නේ. ඇයි මේක ගෙනෙන්නේ? ඒ වෙන මොකකටවත් නොවෙයි. මේකේ අවසාන, එකම අරමුණ මේ අධිකරණ පද්ධතිය තුළ ගොඩගැසී තිබෙන ජනතාවට බලපාන නඩු විභාග කිරීම ඉක්මන් කරලා නඩු කටයුතු අවසන් කරලා, ඉක්මනින් නීතිය, සාධාරණය, යුක්තිය ඉටු කිරීම සඳහා වන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි.

ඒ සඳහා දැන් බොහෝ පියවර අරගෙන තිබෙනවා. අද වෙනකොට ඩිජිටල් ක්‍රමය යටතේ නඩු ගොනු කරන්න පුළුවන්, නඩු වාර්තා ලබාගන්න පුළුවන්. එදා ෆොටෝකොපි ගහන්නම රුපියල් ලක්ෂ 10, 15 වියදම් කළා. අද මූලික අයිතිවාසිකම් නඩුවක් මුලතිව්වල ඉඳලා, මඩකලපුවේ ඉඳලා නඩුව online file කරන්න පුළුවන්. ඒ තත්ත්වය ඇති කරලා තිබෙනවා මේ කෙටි කාලය තුළ. මහාධිකරණම හතක් පිහිටෙව්වා අවුරුද්දක් ඇතුළත. දැන් ඒවායේ නඩු ඉක්මනින් ඇසෙමින් පවතිනවා. ඒ නිසා මේක තමයි ඇත්ත. මේක තමයි ඇත්ත වුවමනාව. මෙතැන වෙන යටි අරමුණක් නැහැ. බොහොම පැහැදිලිව අපි කියනවා, මේ ක්‍රියාමාර්ගය ගන්නේ මේ රටේ ජනතාවගේ යහපත වෙනුවෙන්, නීතියේ ආධිපත්‍ය වෙනුවෙන් බව.

අපේ ගෞරවනීය මහානායක හාමුදුරුවන් වහන්සේලාට ගිහිල්ලා බොරු කියලා තිබුණා. ආගමික ප්‍රශ්න මතු කරලා, බොරු, වැරදි තොරතුරු සපයලා තිබුණා. ගරු අධිකරණ ඇමතිතුමා ගිහිල්ලා ඇත්ත තත්ත්වය පැහැදිලි කළාම උන්වහන්සේලා ඒක මැනවින් පිළිගත්තා. උන්වහන්සේලාගේ ආශිර්වාදය දැන් තිබෙනවා. ඒක විපක්ෂයත් පිළිගන්නවා. උන්වහන්සේලා ඉතා පැහැදිලිව දැන් මේ තත්ත්වය තේරුම් අරගෙන තිබෙනවා. මේ රටේ ජනතාව ඉතා පැහැදිලි වුවමනාවකින් ඉන්නවා, මේ ක්‍රියාමාර්ග ඉක්මනින් අවසන් කරලා, අල්ලස් හා දූෂණ චෝදනා නඩු අවසන් කරලා, මේ රටේ හොරකම්, අපරාධ පිළිබඳ නඩු හැම දාම ඇහෙන තත්ත්වය නැතිව, සාමාන්‍ය සිවිල් නඩු, පුංචි සිදුවීම්වලට අදාළ නඩු පමණක් ඇහෙන තත්ත්වයක් ඇති වන ලස්සන රටක් දකින්න. එවැනි ලස්සන රටක් දකින්න ඔවුන්ට ආසාවක් තිබෙනවා. අන්න, ඒක සාක්ෂාත් කරගන්න තමයි මේ අධිකරණ පද්ධතියේ බොහෝ වෙනස්කම් කරන්නේ.

අද සමහර මන්ත්‍රීවරු "බලාගමු අපි ඉස්සරහට" කියලා චණ්ඩි පාට් දැම්මා. ඔය චණ්ඩි අපි එදා දැකලා තිබෙනවා. හැබැයි, ඒ චණ්ඩින්ට ප්‍රතිචාර දක්වන්න ජනතාවට අපි ඉඩ දුන්නා නම් ඔය චණ්ඩි අද නොණ්ඩි වෙලා ඉවරයි. අපි එහෙම කරන්නේ නැතිව සාධාරණ තත්ත්වයක් රටේ ඇති කරලා, විපක්ෂයේ ඕනෑ කෙනෙකුට ඕනෑම අදහසක් දරන්න, ඕනෑ මතයක් ඉදිරිපත් කරන්න, විවේචනය කරන්න තිබෙන අයිතියට ඉඩ සලසා දී තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මූලික අයිතිවාසිකමක් විධියට ඒ විවේචනය කිරීමේ අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියත් ආරක්ෂා කරමින් තමයි අපි යහපත් රාජ්‍ය පාලනයක් පවත්වාගෙන යන්නේ. ඒ යහපත් රාජ්‍ය පාලනය පවත්වා ගැනීමේදී අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම අනිවාර්යය අංගයක් වෙනවා. අන්න, ඒ වෙනුවෙන් තමයි අපි මේ අධිකරණ සංවිධාන පනත සංශෝධනය කරන්නේ. ඒ වෙනුවෙන් තමයි අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්නේ. කවුරු මොන විධියට තමන්ගේ යටි අරමුණු ඉෂ්ට කරගන්න හැදුවත්, හොරකම්වලින්, අපරාධවලින් ගැළවෙන්න මේ කරුණ පාවිච්චි කරලා ජනතාව නොමඟ යවන්න හැදුවත් අපි ඒකට ඉඩ තියන්නේ නැහැ. මේ රටේ ජනතාව වෙනුවෙන් අපි අනිවාර්යයෙන්ම මේ ක්‍රියාමාර්ගය ගන්නවා. මේ පාර්ලිමේන්තුවේ අපි ඒ සංශෝධන සම්මත කරනවා. ජනතාවගේ මතයත් එක්ක අපි එකට හිටගන්නවාය කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය: විගණකාධිපතිගේ වැටුප
## அரசியலமைப்பின் கீழான தீர்மானம்: கணக்காய்வாளர் தலைமையதிபதியின் சம்பளம்
## DETERMINATION UNDER THE CONSTITUTION: SALARY OF AUDITOR-GENERAL

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) සහ 41ඇ(1) ව්‍යවස්ථා ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය අනුව, 2026.02.05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති වශයෙන් පත් කර ඇති හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් නිශ්චය කර ඇති අතර, වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2026.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සන්දේශයට අදාළව අංක අමප/26/1258/801/020 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එල්.එස්.අයි. ජයරත්න මහත්මියට පහත පරිදි වැටුප් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති හෙයින්ද:-

(අ) විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය එම තනතුරට පත් කළ 2026.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-4 වැටුප් කේතයේ (175,000-12x5,300-238,600) 5 වන වැටුප් පියවරෙහි පිහිටුවා, ඒ අනුව එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 196,200/- ක වැටුප් පියවරට අනුරූපීව උපලේඛන III ට අනුව රු. 170,528/- වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීමට; සහ

(ආ) එම වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට සහ උක්ත චක්‍රලේඛයේ කලින් කල සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව වැටුප පරිවර්තනය කිරීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පරිදි මාසික වැටුප් ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය පිළිබඳ විවාදය හෙට දින පැවැත්වීම සඳහා කල් තැබීම, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2, 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය' පිළිබඳ විවාදය හෙට දින පැවැත්වීම සඳහා කල් තැබිය යුතුය"යි යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
***එතැන් සිට විවාදය 2026 අගෝස්තු මස 05වන බදාදා පවත්වනු ලැබේ.***

*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம் 2026 ஓகஸ்ட் 05, புதன்கிழமை மீளத் தொடங்கும்.*

*The Debate stood adjourned accordingly.*
*Debate to be resumed on Wednesday, 05th August, 2026.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

## කුලී නිවැසියන් සඳහා ස්ථිර නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක්
## வாடகை குடியிருப்பாளர்களுக்கு நிரந்தர வீடுகளை வழங்குவதற்கான வேலைத்திட்டம்
## PROGRAMME TO PROVIDE PERMANENT HOUSING FOR TENANTS

[අ.භා. 5.29]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු දේවානන්ද සුරවීර මහතා]

"දිවයින පුරා නිවාස මිලියන 6.1ක පමණ ප්‍රමාණයක මිලියන 22ක් පමණ ජනතාවක් ජීවත් වන අතර, මෙම ජනතාව අතරින් පිරිසක් කුලී නිවාසවල ජීවත් වෙති. මෙම කුලී නිවාසවල ජීවත් වන බොහෝ පිරිසකට තමන්ගේම නිවසක් ඉදිකර ගැනීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට ප්‍රමාණවත් වත්කමක් නොමැති පිරිස් මෙන්ම, තමන් සතුව ඉඩමක් පැවතියද, නිවසක් ඉදිකර ගැනීම සඳහා ප්‍රමාණවත් වත්කමක් නොමැති පිරිස්ද ඒ අතර වේ.

එසේ හෙයින්, මෙම කුලී නිවැසියන් සඳහා ස්ථිර නිවසක් ලබා දීමට දිස්ත්‍රික්ක මට්ටමින් නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරීමටත්, එම නිවාස සහනදායී ගෙවීම් පදනම මත ඔවුන්ට ලබා දීමටත් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම ගරු සභාව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිවසක් යනු ගොඩනැඟිල්ලක් පමණක්ම නොවෙයි. ඇත්තටම නිවසක් තුළ ආරක්ෂාව, රැකවරණය, අනාගතය, අභිමානය සහ ගෞරවය රැඳී පවතිනවා. එම නිසා අපේ රටේ ජනතාවගෙන් විශාල පිරිසකට නිවසක් තුළින් ලබන සතුට සහ අනාගතයේ තිබෙන හිමිකම සම්බන්ධයෙන් බරපතළ ගැටලු ගණනාවක් මේ සමාජය පුරා සමාජමය ප්‍රශ්න ලෙස අපට ඉදිරිපත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රටේ නිවාස සංගණනයට අනුව මිලියන 6.1ක් පමණ පිරිසකට නිවාස ඒකක තිබුණත්, විශේෂයෙන්ම අපේ රටේ ජනතාවගෙන් විශාල පිරිසක් නිවාස අහිමිව ජීවත් වන බව අපට හොඳාකාරව තේරුම් ගන්නට පුළුවන් - දැන ගන්නට පුළුවන්.

දිස්ත්‍රික් මට්ටමින් ගත්තොත්, කොළඹ දිස්ත්‍රික්කය තුළ නිවාස අහිමි 62,000ක පමණ පිරිසක් ජීවත් වෙනවා. ඒ වාගේම, ගම්පහ දිස්ත්‍රික්කය තුළ 48,000ක පමණ පිරිසක් නිවාස අහිමිව ජීවත් වෙනවා. කලුතර දිස්ත්‍රික්කය තුළ 31,000කට අධික පිරිසක් නිවාස අහිමිව ජීවත් වෙනවා. ඒ වාගේම කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තොත්, 36,000ක පමණ පිරිසක් නිවාස අහිමිව ජීවත් වෙනවා. මේ ආදී වශයෙන් ගත්තොත්, මුළු රටේම ලක්ෂ 6කට අධික පිරිසක් නිවාස අහිමිව ජීවත් වන බව ඔබ අප දන්නා කරුණක්.

වර්තමාන ආණ්ඩුව විධියට නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරමින් යම් යම් පිරිස් සඳහා, විශේෂයෙන්ම අපේ රටේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා "තමන්ටම නිවසක්, සුන්දර ජීවිතයක්" යන තේමාව යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් තිබෙන වෙලාවක් මේක. ඒ වාගේම විවිධ ආයතන විසින් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් තිබෙන අවස්ථාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒ කිසිදු category එකකට, කිසිදු ඒකකයකට අයත් නොවන විශාල පිරිසක්; රාජ්‍ය සේවයේ මේ මොහොතේ වැඩ කරන පිරිස් වෙන්න පුළුවන්, පෞද්ගලික අංශයේ මේ මොහොතේ වැඩ කරන පිරිස් වෙන්න පුළුවන්, ඒ වාගේම රාජ්‍ය සේවයේ වැඩ කරපු, පෞද්ගලික අංශයේ වැඩ කරපු පිරිස් වෙන්න පුළුවන්, නිවාස අහිමි පරම්පරා ගණනාවක් අපේ රටේ කුලී නිවාසවල ජීවත් වන වටපිටාවක් තිබෙනවා. මේක හරිම ශෝචනීය තත්ත්වයක්. තමන් රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක වුවත්, ඒ සංවර්ධන ක්‍රියාවලිය ඇතුළේ තමන්ටම අයත් නිවසක් නොමැතිකම විසින් ඒ මිනිසුන්ගේ ජීවිත දුක්ඛදායී තත්ත්වයට පත් වෙමින් තිබෙන වෙලාවක්.

ඒ නිසා තමයි මේ ගරු සභාවේ අවධානය යොමු කරමින්, විශේෂයෙන්ම දිස්ත්‍රික්ක මට්ටමින්, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මට්ටමින් සමාලෝචනයක් කරලා, ඒ සමාලෝචනය අනුව ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිවාස ව්‍යාපෘති හදන්න අපි පොදුවේ කල්පනා කළේ. නිවාස අමාත්‍යාංශය මුල් කරගෙන, එහෙම නැත්නම් අපේ රටේ පළාත් පාලන ආයතන සම්බන්ධ කරගෙන, එහෙමත් නැත්නම් නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරගෙන අපේ රටේ කිසිදු නිවාස ක්‍රමයක හෝ තනි නිවසක හිමිකමක් නොමැතිව පරම්පරා ගණනක් කුලී ගෙවමින් ජීවත් වන මිනිසුන්ට නිවාස ව්‍යාපෘතියක් හදලා දෙන්න අපට පුළුවන් නම්, ඒක මහඟු කාර්යයක් බවට පත් වෙනවා.

වර්තමාන රජය - ජාතික ජනබලවේගයේ ආණ්ඩුව - බලයට පත් වුණාට පසුව මේ පිළිබඳව දැඩිව අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාත්, ඒ වාගේම නිවාස සංවර්ධන ඇමතිතුමාත්, මේ 2026 වසර තුළ අපේ රටේ නිවාස 30,000කට ආසන්න ප්‍රමාණයක් ගොඩනඟන්න කල්පනා කරමින් ඉන්නවා. හැබැයි, මේ පිරිසට අමතරව තවත් විශාල පිරිසක් සිටින බව අපි දන්නවා. ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිවැරදි සමාලෝචනයක් කරලා, ඇත්තටම නිවාස දිය යුතු පිරිසට නිවාස ලබා දීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ අරමුණින් තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ. ඉතින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කටයුතු සූදානම් කරන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු චමින්ද ලලිත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.36]

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පළමුව අපේ ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව බොහොම සතුටින් ස්ථිර කරනවා.

එම අවශ්‍යතාව තේරුම් ගෙන, මෙම යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ දී එතුමා පැහැදිලිව ප්‍රකාශ කළා අපි බලය ගත්තාට පසුව නිවාස අවශ්‍යතාව තිබෙන අයගේ වුවමනා ඉෂ්ට කරන්න අමාත්‍යාංශය සහ ජනාධිපතිතුමාගේ සියලු මැදිහත්වීම හරහා උපරිම මහන්සියක් දැරුවත්, එය ඉෂ්ට කරදෙන්නට බැරිවුණු ප්‍රජාව බොහෝ ඉන්නවා කියන එක. ඉතින්, ඒ කාරණය දැක දැක එය ඉෂ්ට කර දෙන්න අපේ ආණ්ඩුවට පුළුවන් ප්‍රමාණයටත් වඩා වැඩිපුර මහන්සි වෙන කාලයක් තමයි මේක. ගෙවුණු කාලය තුළ ඇති වූ පොදු ආපදාවලදී පවා අපි පෙන්වා දුන්නා, රජයේ මුදල්වලට අමතරව ශ්‍රමය යොදවමින් නිවාස හදන්න වෙච්ච මහන්සිය කොපමණද කියන එක. එහෙම ආදර්ශයක් දීලාත් ඒ කොටස සම්පූර්ණ කරගන්න තිබෙන අපහසුව එතුමාට තේරුම් ගිය නිසා අද දින මෙම යෝජනාව එතුමා ඉදිරිපත් කළා. මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගම්පහ මීරිගමදීත් අපි ඔය අත්දැකීම් විඳිනවා. මේ අවස්ථාවේ දී අපි ගෞරවයෙන් සිහිපත් කළ යුතු පිරිසක් සිටිනවා. මම මේ කියන්න හදන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින් ගැන. ඔවුන් අවම පහසුකම් යටතේ පවා මේ නිවාස ව්‍යාපෘතිවල වැඩ කටයුතු වෙනුවෙන් විශාල කැප කිරීමක්

කරනවා. ලක්ෂ 10ක් බැගින් නිවාස ආධාර ලබා දීලා තිබෙනවා; ඒ වාගේම කුඩා ප්‍රමාණයේ නිවාස ආධාර ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එම ආධාර මුදල ලක්ෂ 15ක් දක්වා ඉහළ නංවන්නත් රජය කල්පනා කර තිබෙනවා. එම නිලධාරින් විශාල වැඩ කොටසක් කරන අතරේ අපිත් ගම් මට්ටමින් ඒවාට සම්බන්ධ වෙනවා. ඒ නිසා අපට විශේෂ අත්දැකීම් ගොඩක් තිබෙනවා. මේ නිවාස ව්‍යාපෘති ආරම්භ කරද්දී, එහෙම නැත්නම් එහි ශ්‍රමදානයකදී, එහෙමත් නැත්නම් එම නිවාසවල පදිංචි වෙන අවස්ථාවලදී මහජන නියෝජිතයන් වශයෙන් අපිත් සම්බන්ධ වෙච්ච අවස්ථා තිබුණා. එහෙම නිවසක් විවෘත කරන වෙලාවට - ගෙට ගෙවදින වෙලාවට - එයට සතුට පළ කරන්න, අත්වැල් බැඳගන්න ගමේ විශාල පිරිසක් ඇවිල්ලා ඉන්නවා. ඒ වාගේම ඔවුන්ගේ දුක බෙදාගන්නත් අපට අඩ ගහනවා.

අපේ මන්ත්‍රීතුමා කියපු විධියට ඔවුන්ට ඒ ඉල්ලන කොන්දේසි සම්පූර්ණ කරගන්න විධියක් නැහැ. එක්කෝ ආබාධිත දරුවා ගෙදර නැහැ; එක්කෝ දරුවන් ගෙදර නැහැ, වැඩිහිටියන් විතරයි ඉන්නේ. නිවසට අයිතිවාසිකම් කියන්න කෙනෙක් නැති නිසා කොන්දේසි සම්පූර්ණ කරන්න විධියක් නැහැ. සමහරුන්ට මේ සේරම තිබෙනවා, ඉඩමක් නැහැ. තවත් සමහරුන්ට ඉඩම තිබෙනවා, නමුත් මූලික අත්තිවාරම හරි දමාගන්න විධියක් නැහැ. මොකද, ඔවුන් තව ගෙදරක කුලියටයි ඉන්නේ. අඩු ආදායම්ලාභී අය ඉන්නවා. ඇත්තටම, ජීවත් වෙන්න බැරි ප්‍රමාණයේ වැටුපක් ලබන අය ඉන්නවා. බොහෝ විට මූලික වැටුප රුපියල් 22,000ක් ගන්න සමුපකාර සේවකයන් ඉන්නවා. එහෙම ගත්තාම අපට විවිධාකාර අය හම්බ වුණා, අපි බලාපොරොත්තු වෙන මේ category එකට අහුවෙන්නේ නැති කට්ටිය. ඒ අතරේ කුලී නිවාසවල සිටින බොහෝ පිරිසක් ඉන්නවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ බොහෝ ඉඩම් තිබෙනවා. යම් ව්‍යාපෘති යෝජනා ඇවිල්ලා නැති, වැඩසටහනක් සිදු කෙරෙන්නේ නැති ඉඩම් කොටස් තිබෙන බව අපි දකිනවා. ඒ නිසා තට්ටු නිවාස හෝ වෙනත් ක්‍රමවලට ගිහිල්ලා, ඉදිරියේදී ඒ අයගේ අවශ්‍යතාව ඉෂ්ට කරදෙන්න ඕනෑකම තිබෙනවා. අපේ ඇමතිතුමාත් ඒ පිළිබඳව අවබෝධයෙන් ඉන්නවා.

සමහර විවාහකයින් ඉන්නවා, ඔවුන් විවාහ වුණත් දරුවන් හදන්නේ නැහැ. හේතුව, නිවසක් නොමැතිවීම. අද ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. හැබැයි, අපි නිවාස ආධාරය රුපියල් ලක්ෂ 10 කරන්න කලින් කාලයේ රුපියල් ලක්ෂ 6 ගණනේ නිවාස ආධාර දීලා තිබුණා. සමහර අවස්ථාවල අපට ගමේදී හමුවුණා, ඒ නිවසේ ඉතිරි ටික හදාගන්න බැරිව ඉන්න අය. මොකද, පළමු කොටස සම්පූර්ණ කළේ නැති නිසා ඉතිරි කොටස හදන්න මුදල් ගන්න විධියක් නැතිව සමහරු ඉන්නවා. හොයලා බලනකොට අත්සන ගහන්න බැරි, කියවන්න බැරි, ආබාධයක් සහිත, මොකක් හරි අමාරුකමක් තිබෙන, තේරුමක් නැති අයටත් නිවාස ලැබුණු අවස්ථා තිබුණා, පසුගිය ආණ්ඩුවලින් ලබා දුන් රුපියල් ලක්ෂ හයෙන්. මම මේ විවේචනයක් කරනවා නොවෙයි. ගමේ ඉන්න පොහොට්ටුවේ වැඩ්ඩා ඒක අතරමැදටත් පැනලා ඒකෙනුත් ගණනක් ගිලලා තිබෙනවා. සමහර අවස්ථාවල බැංකු ගිණුමක් හදාගන්නේත් වෙන කෙනෙකුගේ නමට. අර කෙනාට බැංකු ගිණුමක් හදන්න බැහැ කියලා මොනවාදෝ එකඟතාවලට ගිහිල්ලා අවසානයේ නිවස භාගෙට හදලා ඒ අදාළ කෙනාට දෙන්න විධියක් නැතිව ඉන්නවා. ඒ වාගේම තමන්ගේ කොම්පැනි එකෙන් බඩු ටික ගන්න, උළු ටික බාගන්න කියපු ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් අපට ඉතිහාසයේ හමුවුණා.

මිනිසාගේ මූලික අවශ්‍යතා වෙච්ච, ලෝකයම පිළිගත් ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම්, අධ්‍යාපනය, සෞඛ්‍යය කියන මේ සියලු දේවල් යහපත්ව ලැබෙනවා නම් තමයි ජීවිතය යහපත් ජීවිතයක් බවට පත් වන්නේ. නමුත් අවුරුදු ගණනක් මේ රටේ අයිතිකරුවන් නැති ගෙවල් හදපු පාලකයින් සිටියා. උදාහරණයක් ගත්තොත්, ගම්පහ, ඔරුතොට පාරේ එවැනි නිවසක් තිබුණා. ගම්පහම අයිතිකරුවන් නැති තවත් මාළිගා හදලා තිබුණා. එහෙම රටක නිවාස නැති ප්‍රජාවක් ඉතිරි කරපු පාලකයිනුත් මේවාට වගකියන්න ඕනෑ. ඒ සියලු වගකීම් දරමින් හෙට දවසේ මේ ආණ්ඩුව ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන දිශාවට ගෙනයන්නට මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව නැවතත් ඒ මන්ත්‍රීතුමාට ස්තුතිය පළ කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.41]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

බොහොම ස්තුතියි, Hon. Presiding Member. මම මේක Tamilවලින් කියන්නම්.

வீடுகள் இல்லாதவர்களுக்கு வீடுகள் வழங்கப்படுவது தொடர்பாக இன்றைய தினம் பாராளுமன்றத்திலே ஒரு சிறந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டுவந்த அரசாங்க தரப்புப் பாராளுமன்ற உறுப்பினர் அவர்களுக்கு நன்றி!

நீங்கள் இந்தப் பிரேரணையைப் பாராளுமன்றத்தில் கொண்டுவந்து இருக்கின்ற இதே நாளிலே, தெல்லிப்பளை பிரதேச செயலகப் பிரிவில் தங்களுடைய சொந்தக் காணிகளைத் தருமாறு கேட்ட மக்களை பொலிஸாரைக் கொண்டு அடித்து வெளியேற்றி இருக்கிறார்கள். அரசாங்க அதிபர் உட்பட NPPயினுடைய 'பிராஜா சக்தி' என்று சொல்லப்படுகின்ற குழுக்களும் சேர்ந்துதான் இதனைச் செய்திருக்கிறார்கள். இன்றைக்கு நீங்கள் நல்லதொரு ஒத்திவைப்புவேளைப் பிரேரணையைப் பாராளுமன்றத்தில் கொண்டுவந்திருக்கின்றீர்கள். இலங்கையில் சுமார் 6 மில்லியன் வீடுகள்தான் இருக்கின்றன. ஆனால், 22.5 மில்லியன் மக்கள் இருக்கிறார்கள். சொந்த வீடு இல்லாமல், வாடகை வீடுகளில் இருப்பவர்களுக்கு வீடுகளை வழங்க வேண்டுமென்கின்ற நோக்கில் இந்தப் பிரேரணையைக் கொண்டுவந்த இதேநாளில், வலிகாமம் வடக்கு, பலாலி பகுதியிலுள்ள தங்களுடைய சொந்தக் காணிகளை கோரிய மக்கள் அடித்து வெளியேற்றப்பட்டிருக்கிறார்கள்.

1989ஆம் ஆண்டு வலிகாமம் வடக்கில் gazette பண்ணப்பட்டு சுவீகரிக்கப்பட்ட மக்களுடைய சொந்தக் காணிகளுக்குப் பணம் பெற்றுத்தருவதாகக் கூறி அழைக்கப் பட்ட தெல்லிப்பளை மக்களிடம் சத்தியக்கடதாசியில் கையொப்பமிடுமாறு கேட்டிருக்கிறார்கள். வேண்டுமென்றால், நாளை நான் அதை print பண்ணி பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்கிறேன். பணப் பெறுமதி எவ்வளவு என்றுகூட குறிப்பிடாமல், அவர்களுக்கு "உங்களுடைய காணிகளைத் தருவதற்குச் சம்மதம்" என்ற சத்தியக்கடதாசியை அதாவது, மொட்டைக் கடிதமொன்றை எழுதி வாங்குவதற்கு உங்களுடைய அரசாங்கம் எத்தனித்துக் கொண்டிருக்கின்ற இந்த நேரத்தில், மக்களை ஏமாற்றுவதற்காக, வீடு இல்லாத மக்களுக்கு வீடுகளை வழங்கப் போகிறோம் என்று

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

பாராளுமன்றத்தில் ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டுவந்ததை நினைக்கும்போது, சில நேரங்களில் உங்களுக்கு 'வடக்கு மாகாணம்' என்ற ஒன்று இலங்கையில் இருக்கின்றதா, இல்லையா என்பதுகூட தெரியாதா என்று எண்ணத் தோன்றுகின்றது. 1989ஆம் ஆண்டு பலாலியிலுள்ள 400க்கும் மேற்பட்ட குடும்பங்களின் காணிகள் பறிக்கப் பட்டிருக்கின்றன. ஆனால், அவர்களுக்கு 2026ஆம் ஆண்டின் இன்றையநாள்வரைக்கும் எந்தவித நட்டஈடும் வழங்கப் படவில்லை. அதற்காக அங்கே அழைக்கப்பட்ட மக்கள் போராட எத்தனித்த நேரத்தில், பொலிஸாரைக் கொண்டுவந்து அவர்களை வெளியே விரட்டியிருக்கிறார்கள்.

அதைவிட படுமோசமான நிலைமை என்னவென்றால், 'தித்வா' புயல் வந்தபோது எங்களுடைய ஜனாதிபதி அவர்கள் சொன்னார், வீட்டின் ஒரு தகரம் சேதமடைந்தால்கூட ஐந்து இலட்சம் ரூபாய்; இரண்டு தகரங்கள் போனால் பத்து இலட்சம் ரூபாய் நட்டஈடு என்று. ஆனால், இன்றைக்கு கிளிநொச்சியில் என்ன நடக்கிறது என்றால், அந்த 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்கள் என்ற போர்வையில் NPP அரசாங்கத்தின் கைக்கூலிகளுக்கும், 'பிரஜா சக்தி' அமைப்பு என்று சொல்லிக்கொள்பவர்களுக்கும் -அவர்களுடைய கட்சிக்கு வேலை செய்பவர்களுக்கும் - GA முரளிதரன் அவர்கள் நட்ட ஈட்டு listஐத் தயாரித்து அனுப்பியிருக்கிறார். அந்த listஐ பொதுமக்கள் கேள்விக்குட்படுத்தியபோது, அந்த WhatsApp groupஐ block பண்ணி, யாரும் WhatsApp groupஇல் தொடர்புகொள்ள முடியாதவாறு இந்த அரசாங்கம் செய்திருக்கின்றது.

நான் உங்களுக்குச் சொல்ல வேண்டுமாக இருந்தால், வடக்கு மாகாணத்தில் இருக்கின்ற உங்களுடைய பாராளுமன்ற உறுப்பினர் கௌரவ இளங்குமரன் அவர்கள் உணவு, உறையுள், உடை என்ற அடிப்படைத் தேவைகளில் வீட்டை 'உறையுள்' என்றுகூட சொல்லத் தெரியாதவராக இருக்கின்றார். இப்படியான ஒரு நபரைத்தான் இன்றுவரை வடக்கு மாகாணப் பாராளுமன்ற உறுப்பினராக நாங்கள் வைத்துக்கொண்டிருக்கிறோம்.

ඊළඟට මම මේක සිංහලෙන් කියන්න කැමතියි. අද දවසේ Adjournment Motion එකක් ගෙනැත් තිබෙනවා, අපේ රටේ කුලියට ජීවත් වන මිනිස්සුන්ට ගෙයක් හදලා දෙනවා කියලා. හැබැයි, අද දවසේ උතුරේ Jaffnaවල තෙලිප්පලෛ ප්‍රදේශයේ අත්පත් කරගත් තමන්ගේ land එකට සල්ලි දෙනවාද, නැද්ද කියලා අහන්න ගිය මිනිස්සුන්ට නිකම් කොළයක් දීලා අත්සන් කරන්න කියලා තිබෙනවා, GA. එතකොට ඒ මිනිස්සු කියලා තිබෙනවා, අපේ land එක value කරන්නේ නැතිව නිකම් කොළවලට අපට අත්සන් කරන්න බැහැ කියලා. ඒ රණ්ඩු වෙච්ච ජනතාව මේගොල්ලන් පොලීසිය යොදවා එළියට දාලා තිබෙනවා, අද. හැබැයි, අද Adjournment Motion එකක් දාලා තිබෙනවා, කුලී ගෙවල්වල ජීවත් වෙන මිනිස්සුන්ට, නැත්නම් ගෙවල් නැති මිනිස්සුන්ට ගෙවල් දෙනවා කියලා. සමහර වෙලාවට උතුර කියලා එකක් තිබෙනවා කියලා ඔයගොල්ලන් දන්නවාද කියලා මම දන්නේ නැහැ. හැබැයි, ගිහින් බලන්න.

අපේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. ඇවිල්ලා එක දවසක් ප්‍රකාශ කළා, කිසිම ජනතාවක් එතැන උද්ඝෝෂණ කළේ නැහැ කියලා. මම නම් එක දවසක්වත් ගියේ නැහැ, ඔය උද්ඝෝෂණවලට. හැබැයි, මිනිස්සු හැමදාම ඇවිල්ලා උද්ඝෝෂණ කරනවා. උද්ඝෝෂණ කරන මිනිස්සුන්ට අව්වේ ඉන්න බැහැ කියලා ගහපු hut එකත් ඔයගොල්ලන් පාරට ඇදලා දාලා කකුලෙන් විනාශ කරලා තිබෙනවා. ඒගොල්ලන්ට වතුර දෙන්න කියලා water tank එකක් තිබුණා. ඒකත් ඔයගොල්ලන්ගේ පොලීසියෙන් ගිහිල්ලා වාහනයක දාගෙන අරගෙන ගිහින් තිබෙනවා. ඒ තත්ත්වය තමයි උතුරේ තිබෙන්නේ. හැබැයි, ඔයගොල්ලන්ගේ ලොකු සර්, අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඇවිල්ලා ජම්පර් එකක් දාගෙන ගියා, උතුරේ ජනතාව සාමාන්‍ය විධියට ජීවත් වෙනවා කියලා. උතුරේ තිබෙන දේවල් දකුණට ඇවිත් සිංහලෙන් කියන්න මම කැමතියි. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ මම මෙතැන වැඩිකල් ඉන්නේ නැති එක. ඔයගොල්ලන් මට ඉන්න දෙන්නෙත් නැහැ. ඔයගොල්ලන්ගේ හෘදය සාක්ෂියට අනුව ඕක හරිද කියලා හිතලා බලන්නකෝ.

මම එක දවසක් පාර්ලිමේන්තුවේදී ඇහුවා, උතුර, නැඟෙනහිර හැර වෙන කොහේ හරි අපේ රටේ මිනිස්සුන්ගේ ඉඩම් රජය අයිති කරගෙන තිබෙනවාද කියලා. උත්තරය දුන්නා, "නැහැ" කියලා. ඒ කියන්නේ, උතුරු, නැඟෙනහිර ඉඩම් තමයි රජය අත්පත් කරගෙන තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

1989දී අත්පත් කරගත් එකකට අද ඔයගොල්ලන් නිකම් කොළයකට මිනිස්සුන්ගෙන් අත්සන් ගන්න try කරනවා. මිනිස්සු බැහැ කියපු ගමන් පොලීසිය යොදවා එළියට දාලා තිබෙනවා. කොච්චර ලජ්ජා වැඩක්ද කියලා බලන්නකෝ. උතුරේ අපේ මිනිස්සු ඔයගොල්ලන් විශ්වාස කරලා ඡන්ද 93,000ක් දුන්නා. අපටත් ඡන්ද දුන්නා, ඔයගොල්ලන්ටත් දුන්නා. හැබැයි, උතුරේ මිනිස්සු සිංහල දන්නේ නැහැ. අපි වාගේ මිනිස්සු ඇවිල්ලා පාර්ලිමේන්තුවේ ඒවා කියන කොට අපි ඉවත් කරන්න කටයුතු කරනවා. මම නම් ඉවත් වෙලා යනවා. හැබැයි, ඊළඟ සැරේ මම ඇවිල්ලා මේ පැත්තේ වාඩිවෙන්නේ නැහැ, ඔය පැත්තේ වාඩිවෙනවා. ඒ කාලයට අපේ මිනිස්සුන්ට වෙන්න ඕනෑ දේවල් ඔක්කෝම මම කරලා දෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.47]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා විසින් නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ තිබෙන ප්‍රමුඛතාව පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතා කාලෝචිත යෝජනාවක්. එතුමාත් කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන

මන්ත්‍රීවරයෙක්. කොළඹ නගරය තුළ කුලී ගෙවල්වල ජීවත් වනවා, පවුල් 25,000කට ආසන්න පිරිසක්. විශේෂයෙන්ම මේක කොළඹ නගරය හා මේ නගරයට ආසන්න ප්‍රදේශවල ඉපදිච්ච ජනතාවට දැනෙන ප්‍රශ්නයක්. කාලයක් තිස්සේ කොළඹ නගරය තුළ කුලී ගෙවල්වල ජීවත් වන මිනිස්සුන්ට අවශ්‍ය නිවාස යෝජනා ක්‍රම ඇති වුණේ නැහැ. 1994න් පස්සේ පත් වෙච්ච හැම ආණ්ඩුවක්ම උත්සාහ කළේ කොළඹ නගරයේ තිබෙන වටිනා ඉඩකඩම් විශාල සමාගම්වලට ලබා දෙන්න. ඊට පස්සේ ඒ සමාගම් සුඛෝපභෝගී නිවාස යෝජනා ක්‍රම විශාල වශයෙන් හැදුවා මිසක් මේ නගරය තුළ ජීවත් වන විශේෂයෙන්ම පහළ මධ්‍යම පාන්තිකයන්, එහෙම නැත්නම් මධ්‍යම පාන්තිකයන්ට අවශ්‍ය නිවාස ගොඩනැඟුවේ නැහැ. ඒ හින්දාම අද නගරය හා නගරයට ආසන්නව තිබෙන ප්‍රදේශවල හැම ගෙදරකම විශාල තදබදයක් තිබෙනවා. සමහර ගෙවල්වල පවුල් දෙක, තුන ජීවත් වනවා; තුන හතර ජීවත් වනවා. සමහර ගෙවල් තිබෙනවා, ඒ අය shift ක්‍රමයට නිදාගන්නේ. මොකද, ඉඩ නැති නිසා. කාලයක් තිස්සේ මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබුණේ නැහැ. ඒක නිසා තමයි මම කිව්වේ, මේ ප්‍රශ්නය තුළ නොයෙකුත් සමාජ ප්‍රශ්න පවා ගොඩනැඟිලා තිබෙනවා කියලා.

මම කියපු විධියට කොළඹ නගරයේ කුලියට ඉන්න පවුල් 25,000ක විතර මිනිස්සුන්ගෙන් බොහෝ අයට ඡන්ද අයිතියවත් නැහැ. කුලී ගෙවල් අයිති අය කුලී නිවාසවල ඉන්න අයට ඡන්දය ලියාපදිංචි කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ වාගේම තමන්ගේ ළමයා කොළඹ නගරයේ තිබෙන පාසල්වලට දාගන්න හැදුවාම ඒවාට අවශ්‍ය ලියකියවිලි නැහැ. ඡන්ද අයිතිය නැති හින්දාම පාසල්වලට ළමයින් තෝරා ගැනීමේ ක්‍රමයේදී නගරයේ ඉපදිච්ච හුඟක් දූවා දරුවන්ට නගරයේ පාසල් හම්බ වන්නේ නැහැ. එහෙම හම්බ නොවන්න එක හේතුවක් තමයි, ඔවුන් දීර්ඝ කාලයක් කුලී ගෙවල්වලම ඉන්න එක. මේ යෝජනාව ගෙනා මන්ත්‍රීතුමා මේ ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නිසා මම එතුමාගේ මේ යෝජනාවට තවත් අදහස් කිහිපයක් එකතු කරන්න කැමැතියි.

පසුගිය කාලයේත් නාගරික සංවර්ධන අධිකාරියෙන් බ්ලූමැන්ඩල් ප්‍රදේශයේත්, මට්ටක්කුලිය ප්‍රදේශයේත් ගෙවල් වගයක් හැදුවා, විශේෂයෙන්ම කුලී ගෙවල්වල ඉන්න අයට ඒ ගෙවල් ගන්න. ඒ ගෙවල් සාමාන්‍යයෙන් වර්ග අඩි 450ත්, 550ත් අතර වනවා. නමුත් ඒ ගෙවල්වල විකුණුම් මිල රුපියල් මිලියන 10ක් කිව්වා. ඒ කියන්නේ, රුපියල් කෝටියක්. කොළඹ නගරයේ ඉන්න පහළ මධ්‍යම පාන්තික ජනතාවට ඒ තරම් මුදල් ප්‍රමාණයක් ගෙවන්න බැහැ. එය ඉතාම අධික මුදල් ප්‍රමාණයක්. අන්තිමට ඒ ගෙවල් ගත්තේත් ගෙවල් තිබෙන උදවියමයි. ඒ නිසා මම ආණ්ඩුවට මේ යෝජනාව ඉදිරිපත් කරනවා. හැම ආණ්ඩුවක්ම අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ප්‍රශ්නය වෙනුවෙන් නිවාස හදනවා. නමුත්, පහළ මධ්‍යම පාන්තිකයන් වෙනුවෙන් නිවාස හැදෙන්නේ නැහැ. ඔවුන්ගෙන් බහුතරයක් තමයි මේ කුලී නිවාසවල ජීවත් වෙන්නේ. ඒ නිසා ඔවුන්ට නිවාස හදනවාත් එක්කම මේ නිවාස මිලදී ගැනීම සඳහා වූ ක්‍රමවේදයකුත් අවශ්‍ය වෙනවා. මොකද, ඒ පවුල්වල ජනතාව එහෙම ලොකු ක්‍රය ශක්තියක් තිබෙන, ආර්ථික වශයෙන් හයියක් තිබෙන, විශාල මුදලක් එකවර ගෙවන්න පුළුවන් උදවිය නොවෙයි. ඒ නිසා මුදල් දීලා ඔවුන්ට ඒ නිවාස මිල දී ගන්න පුළුවන් වන විධියේ ක්‍රමවේදයකුත් ආණ්ඩුව විසින් හඳුන්වා දෙන්න ඕනෑ.

දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක් කියලා මම හිතනවා. අපි එතුමාට ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ තමුන්නාන්සේ කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නිසා ඊට මැදිහත් වෙලා කොළඹ නගරය තුළ විශාල අඩුපාඩුවක්ව තිබෙන මෙම නිවාස තදබදය ගැන සොයා බලන්න කියලායි. මොකද, කාලයක් තිස්සේ - අවුරුදු 30ක්, 40ක් තිස්සේ - මේ ප්‍රශ්නය වෙනුවෙන් උත්තරයක් ලැබිලා නැහැ. කුලී නිවාසවල ඉන්න අයට තමන්ට කියලා නිවසක් ලබා ගැනීම සඳහා අවස්ථාව ලැබුණේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේ මූලික වෙලා මේ කටයුත්ත කරන්න කියලා ඉල්ලා සිටිමින්, සභාව කල් තබන අවස්ථාවේ මෙවන් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.53]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සමහර අය උතුර ගැන කිඹුල් කඳුළු හෙළුවා. ඒකටත් උත්තරයක් දෙමින් මගේ පිළිතුරු කථාව මම කරන්නම්. පසුගිය දවසක මුලතිව් දිස්ත්‍රික්කයේ නිවාස කීපයකට මුල්ගල් තැබීමේ අවස්ථාවට සම්බන්ධ වෙන්න මට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම නිවාස කිහිපයක් විවෘත කරන්නත් මට හැකියාව ලැබුණා. මේ අවුරුද්දේ අපි නිවාස සංවර්ධන අධිකාරියෙන් මුලතිව් දිස්ත්‍රික්කය සඳහා පමණක් රුපියල් ලක්ෂ 10ක ආධාර යටතේ පවුල් 300කට නිවාස හදලා අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුව නිසා මුලතිව් දිස්ත්‍රික්කයේ හානියට පත් වෙච්ච නිවාස 2,063කට - සම්පූර්ණයෙන්ම කැඩුණු නිවාස නොවෙයි - රුපියල් ලක්ෂ 50ක් බැගින් ලබා දෙන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ඒක සුළු පටු ගණනක් නොවෙයි. "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් සම්පූර්ණයෙන්ම කුඩු පට්ටම් වෙන්නේ නැතුව මැටි ගෙවල්වලටත් යම් යම් හානි වෙලා තිබෙනවා. නමුත්, චක්‍රලේඛයට අනුව, ඒ නිවාස හදන්න ඕනෑ කියලා තෝරා ගෙන තිබෙනවා. ඒ අනුව මුලතිව් දිස්ත්‍රික්කයේ පමණක් නිවාස 2,063කට රුපියල් ලක්ෂ 50 ගණනේ ලබා දෙන්න අපි මුදල් වෙන් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, උතුර, නැඟෙනහිර දෙපළාතේ යුද්ධය නිසා අවතැන් වෙච්ච ජනතාව ඉන්නවා. ඔවුන්ගේ නිවාස ප්‍රශ්නය තවමත් විසඳිලා නැහැ. යුද්ධය අවසන් වෙලා මේ වනවිට අවුරුදු 16ක් විතර ගත වෙලා තිබෙනවා. අපි මේ අවුරුද්දේ පවුල් 2,500කට රුපියල් ලක්ෂ 20 ගණනේ වෙන් කරලා, උතුර, නැඟෙනහිර නිවාස 2,500ක් හදමින් තිබෙනවා. මේ අවුරුද්දේ අපි ඒ කටයුත්ත අවසන් කරනවාය කියා ජනාධිපතිතුමා ප්‍රකාශයට පත් කරලා තිබුණා. නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ තව පවුල් 13,000ක් ඉන්නවා. ඉදිරි වසර දෙක තුළ අපි මේ නිවාස 13,000ම රුපියල් ලක්ෂ 20 ආධාර යටතේ හදලා ඉවර කරනවා. මේක තමයි උතුර, නැඟෙනහිර නිවාස සම්බන්ධයෙන් තිබෙන අපේ සැලැස්ම. දැන් උතුර, නැඟෙනහිර ජනතාවට තේරිලා

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

තිබෙනවා, මේ ආණ්ඩුව මොකක්ද කියන එක. ඒ නිසා ඔවුන් අපිත් එක්ක අත්වැල් බැඳ ගනිමින් ඉන්නවා. ඒකේ වේදනාව සමහරුන්ට දැනෙනවා. ඉතින් ඒ අය කෑ ගහන්නේ මොකද කියලා අපිට තේරෙනවා.

අද මේ සභාව කල් තැබීමේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමාට නැවතත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරපු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් මේ වෙනුවෙන් හොඳ යෝජනාවක් ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, 2024 දෙසැම්බර් මාසයේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් කරපු ජන සංගණනය අනුව එහි තිබෙනවා, ලංකාව පුරා කුලී නිවාසවල කොච්චර පවුල් සංඛ්‍යාවක් පදිංචි වෙලා ඉන්නවාද කියලා. ලංකාව පුරා කුලී නිවාසවල 512,465ක් ඉන්නවා. රජයේ නිවාසවල පවුල් 124,110ක් ඉන්නවා. පෞද්ගලික නිවාසවල 388,355ක් ඉන්නවා. මේ අතුරින් වැඩිපුර ජනතාව ඉන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ. ඒ ප්‍රමාණය 133,224ක්. මේ සංඛ්‍යාවෙන් අදහස් වෙන්නේ නැහැ, මේ හැම පවුලකටම නිවසක් අවශ්‍යයි කියන එක. අපි උදාහරණයක් ගත්තොත්, වෙළෙඳ කලාපයේ වැඩ කරමින් ඉන්න අය කුලියට නිවාසවල පදිංචි වෙලා ඉන්නවා. ඒ අයත් මේ සඳහා ගණන් හදලා ඇතුළත් කර තිබෙන්නේ. ඒ වාගේම කොහේ හරි ගුරු නිවාසයක කවුරු හෝ ඉන්නවා නම් ඒකත් මේකට ගණන් හදලා ඇතුළත් කර තිබෙන්නේ. ඒ වාගේම රැකී රක්ෂා සඳහා කවුරු හෝ කුලියට නතර වෙලා ඉන්නවා නම් ඒකත් ගණන් හදලා මේකට ඇතුළත් කර තිබෙන්නේ. සමහර පවුල් ඉන්නවා, තමන්ගේ නිවස කුලියට දීලා ඔවුනුත් කුලියට ඉන්න. ඒකත් මේකට ගණන් හදලා තිබෙන්නේ. ඉතින්, මේ 512,465ම නිවාස නැති අය නොවෙයි. නමුත්, එවැනි යම් පිරිසක් ඉන්නවා. ඒ, අපි මේ සාකච්ඡාවට බඳුන් කරන පිරිස. ඒ කියන්නේ, ඔවුන් හැම දාම ඉඳලා තිබෙන්නේ කුලී නිවාසවල. ඔවුන්ට කියලා වෙන් වුණු ඉඩමක් නැහැ, ඔවුන්ට කියලා නිවසක් නැහැ. ඒ පවුල්වලට කාගෙන්වත් - දෙමව්පියන්ගෙන්, පරම්පරාවෙන් - නිවසක් හම්බ වෙන්නේ නැහැ. ඔවුන්ට නිවසක් ගන්නත් බැහැ. ඉඩමක් ගන්න වත්කමකුත් නැහැ. පසුගිය දවස්වල මෙවැනි පවුල් සංඛ්‍යාවක් එකතුවක් හදාගෙන ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහට ඇවිල්ලා මාරාන්තික උපවාසයක් කළා. අපි ඔවුන් එක්ක සාකච්ඡා කළා. ඒ සාකච්ඡාව කෙරෙහි විශ්වාසය තබා ඔවුන් ඒ උද්ඝෝෂණය නතර කළා.

ගරු මන්ත්‍රීතුමනි, මේ නිවාස ප්‍රශ්නය තුළ කණ්ඩායම් කිහිපයක් ඉන්නවා. එක කණ්ඩායමක් තමයි, අපි රජයේ ආධාර මත නිවාස ඉදිකර දෙන අඩු ආදායම්ලාභී පවුල් කියන අය. ඔවුන්ට නිවසකුත් නැහැ, නිවසක් හදා ගන්න ආදායමකුත් නැහැ. මේකේ අනෙක් කෙළවරේ ඉන්න අය තමයි සුඛෝපභෝගී නිවසක් මිලදී ගන්න පුළුවන් හොඳ ආදායමක් තිබෙන කණ්ඩායම. ඒ කණ්ඩායමට පෞද්ගලික අංශයෙන් රුපියල් මිලියන 60ක්, මිලියන 70ක් වටිනා apartments හදා ලබා දෙනවා. ඒ කටයුත්ත පෞද්ගලික අංශයෙන් කරනවා. නමුත්, මේ අතරමැද කණ්ඩායමක් ඉන්නවා. ඔවුන් මැදි ආදායම්ලාභී අය. ඔවුන්ට ආදායමක් තිබෙනවා. නමුත් විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ නාගරිකව ඉන්න ඒ වාගේ අයට ඉඩමක් මිලදී ගන්න හෝ නිවසක් හදන්න ප්‍රමාණවත් මුදලක් යට කරන්න බැහැ. ඒ අතරේ තමයි මේ කුලියට ඉන්න කට්ටිය ඉන්නේ. කොළඹ දිස්ත්‍රික්කයේ සංඛ්‍යා දත්ත අපට හරියටම, නිවැරදිව ලැබී නැහැ. නමුත් එවැනි සැලකිය යුතු පිරිසක් ඉන්නවා. ඔවුන් හැම දාම ඉන්නේ කුලියට.

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියපු කාරණය හරියටම හරි. එම ජනතාවට ග්‍රාම නිලධාරි සහතිකයක් හම්බ වෙන්නේ නැහැ, පදිංචි සහතිකයක් හම්බ වෙන්නේ නැහැ, ළමයා ඉස්කෝලයකට දමා ගන්න බැහැ, ඡන්දය දමන්න හම්බ වෙන්නේ නැහැ. ඒ වාගේ නොයෙකුත් ගැටලු තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධව විසඳුමක් හොයන්න ඕනෑ. ඇත්තටම අපි බැංකු එක්ක වාගේම පෞද්ගලික අංශය එක්කත් සාකච්ඡා කළා, ඔවුන්ට නිවාස යෝජනා ක්‍රමයක් ගෙනෙමු කියලා. අපි තව නොබෝ දිනකින් කොළඹ දිස්ත්‍රික් ලේකම්තුමාත් එකතු කරගෙන කොළඹ දිස්ත්‍රික්කය සඳහා නිවාස වැඩ පිළිවෙළක් හදන්න සූදානම් වෙනවා. දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය - නාගරික සංවර්ධන අධිකාරිය යටතේ නිවාස හදන්න වෙනම ආයතනයක් තිබෙනවා, USDA කියලා - ආදී සියලු ආයතන වාගේම මන්ත්‍රීතුමන්ලා සහ ප්‍රාදේශීය ලේකම්ලා එකතු කරගෙන අපි කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන නිවාස ප්‍රශ්නය මොකක්ද, ඒ සංඛ්‍යා දත්ත මොනවාද, තිබෙන ඉඩම් මොනවාද සහ මොන වාගේ කණ්ඩායම් සම්බන්ධවද ඉක්මනින්ම මැදිහත් වෙන්න ඕනෑ කියන සැලැස්ම හදා ගන්න බලාපොරොත්තු වෙනවා. එම සැලැස්මට මෙසේ කුලියට ඉන්න නිවැසියන් සඳහා වන නිවාස යෝජනා ක්‍රමයත් යෝජනා වෙලා තිබෙනවා. සමහර තැන්වලින් - ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් - ඒ සම්බන්ධව යෝජනා කර එවා තිබෙනවා.

මේකේ ගැටලු කිහිපයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ පවුල් විසිරිලා ඉන්නේ. ඔවුන් දැනට කුලියට ඉන්න ප්‍රදේශයේ පොඩි බිස්නස් එකක් කරගෙන ඉන්නේ. එක්කෝ කඩයක්, එහෙම නැත්නම් කොමියුනිකේෂන් එකක් දමාගෙන ඉන්නේ. එහෙම නැත්නම් ලැවරියා හදා විකුණනවා වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් ත්‍රී වීලර් එකක් පදවනවා වෙන්න පුළුවන්. ඒ වාගේ පොඩි ආදායමක් ලබන ආදායම් මාර්ග තමයි ඔවුන්ට තිබෙන්නේ, ඒ ඒ ප්‍රදේශවල. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, කොළඹ දිස්ත්‍රික්කය තුළ නිවාස හදන්න තිබෙන ඉඩම් සීමිත බව. අපි එක තැනකින් ඉඩමක් තෝරා ගෙන මහල් නිවාස හැදුවොත් අපට මේ පවුල් ඈත ඉඳලා එක තැනකට ගෙනෙන්න වෙනවා. එහෙම වුණොත් ඔවුන්ගේ ආර්ථික ජීවිතය යම් ප්‍රමාණයකට විනාශ වෙනවා, ඔවුන්ගේ සමාජ සම්බන්ධතා නැති වෙනවා.

අනෙක් කාරණය මේකයි. අපි දැක තිබෙනවා, මහල් නිවාසවල ජීවත් වෙන්න තවම අපේ රටේ ජනතාවට හුරු නැහැ කියන එක. තවම හැම පවුලකටම මහල් නිවාසවල ජීවත් වෙන්න බැහැ. ඒ නිසා අපි යාන්ත්‍රිකව මහල් නිවාස හැදුවාට ඔවුන් ඒවායේ ජීවත් වෙයිද, ඒකට ඔවුන් අනුගත වෙයිද කියන ප්‍රශ්නයත් තිබෙනවා. ඒ නිසා අපි මේවාට උත්තර හොයන්න ගියාම මෙන්න මේ වාගේ ප්‍රශ්නත් තිබෙනවා. අපිට ඕනෑ කරන්නේ මේකයි. ඔවුන් කොළඹ ඉන්නත් ඕනෑ, ඔවුන්ගේ ආදායම් මාර්ගවලට යම් හානියක් නොකරන්නත් ඕනෑ, ඔවුන්ගේ සමාජ සම්බන්ධතාවලට, සංස්කෘතික සම්බන්ධතාවලට හානියක් නොකරගෙන ඔවුන්ට නිවාස ලබා දෙන්නත් ඕනෑ. මේ කණ්ඩායම්වලට සාමාන්‍යයෙන් මාසයකට රුපියල් 20,000ක් හෝ 30,000ක් තමයි නිවසකට කුලිය විධියට දරන්න පුළුවන් වන්නේ. ඒ නිසා අපි ඔවුන්ට නිවසක් ලබා දෙනවා නම් දැනට එසේ කුලී මුදල විධියට දෙන මුදල් ප්‍රමාණය තමයි අප ඔවුන්ට ලබා දෙන නිවසට ගෙවන්න පුළුවන් වන්නේත්. ඔවුන්ට ඊට එහා ආදායමක් නැහැ. ආදායම් තිබෙන අයත් ඇති. මම මේ කියන්නේ සාමාන්‍යයෙන් පොදුවේ තිබෙන තත්ත්වය ගැනයි. ඒ නිසා ඔවුන්ට නිවසක් හදා දුන්නාම ඒ මුදල ගෙවා ගෙන යන්න ඔවුන්ට හරිහමන් ආදායමක් තිබෙනවාද කියන ගැටලුවත් තිබෙනවා. ඒ කාරණයත් සැලකිල්ලට අරගෙන තමයි අපි ගෙවීමේ ක්‍රමයක් - financial model එකක් - තෝරන්න ඕනෑ.

පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා තමයි අපට මේවා හදන්න වෙන්නේ. මුදල ගෙවී ගෙන යන විධියට ක්‍රමවේදය සකස් කළාම එම නිවැසියන්ට ඒ නිවස හිමි වෙනවා. නමුත් ඒ තරම්

මුදලක් කොච්චර කාලයක් ගෙව්වොත්ද, ඔවුන්ට නිවසක් අයිති වෙන්නේ? සමහර විට පරම්පරා දෙකක් වෙන්නත් පුළුවන්. ඒ නිසා මේ ගැටලුව සරල නැහැ, සංකීර්ණයි. නමුත් ඒ සඳහා උත්තරයක් හොයන්න ඕනෑ. ඒ නිසා අපි නිවාස අමාත්‍යාංශය විධියට සාකච්ඡා කර තිබෙනවා වාගේම කල්පනා කර තිබෙනවා, මේකට විසඳුමක් හොයන්න ඕනෑ කියන කාරණය. විශේෂයෙන්ම පෞද්ගලික අංශය එක්කත් එකතු වෙලා, බැංකු එක්කත් එකතු වෙලා බැංකු ණය ක්‍රමයකුත් යෝජනා කරලා, කොළඹ දිස්ත්‍රික්කය තුළ කුලී නිවැසියන් වැඩිපුර ඉන්න ප්‍රදේශය තෝරා ගෙන, ඒ ප්‍රදේශයෙන් ඉඩමක් අරගෙන මහල් නිවාස හෝ නිවාස සංකීර්ණ හදා ගෙවීමේ ක්‍රමයට ඔවුන්ට ලබා දීලා ඔවුන්ට ඒවා අයිති වෙන විධියක් හදන්නත් අපි දැන් කල්පනා කර තිබෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අපි තව සතියක් දෙකක් ඇතුළත කොළඹ දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ දිස්ත්‍රික්කය සඳහා නිවාස සැලසුමක් හදනවා.

කොළඹ පමණක් නොවෙයි, අනෙක් දිස්ත්‍රික්කවලත් මේ ප්‍රශ්නය එහෙම ම තිබෙනවා. ඒ වාගේම මධ්‍යම පාන්තික දෙවැනි පරම්පරාවේ, අලුත් පරම්පරාවේ පවුල්වල අයට නගරය කිට්ටුවෙන් ඉඩමක් මිලදී ගෙන ගෙයක් හදන්න බැහැ. ඔවුන්ටත් නිවාස යෝජනා ක්‍රම ඕනෑ. දැනටමත් අපි සමහර දිස්ත්‍රික්කවල මධ්‍යම පාන්තික පවුල් සඳහා නිවාස යෝජනා ක්‍රම යටතේ නිවාස හදන්න තැන් තෝරා ගෙන තිබෙනවා. සමහර ඒවාට ශක්‍යතා අධ්‍යයන - feasibility studies - කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා අඩු ආදායම්ලාභීන්, මලෙයහම් ජනතාව, නැවත පදිංචි කරන යුද්ධයෙන් අවතැන් වෙච්ච ජනතාව ඇතුළු කණ්ඩායම් දිහා බලනවා වාගේම, මධ්‍යම පාන්තික කුලී නිවාසවල ඉන්න ජනතාව හා කොළඹ පැල්පත්වාසීන් කියන සියලු කණ්ඩායම් දිහා බලලා, හැමෝටම ගැළපෙන, හැමෝටම සහනයක් වෙන, හැමෝටම නිවසක් හිමි කර ගන්න අවස්ථාව ලැබෙන සම්පූර්ණ, සංක්ෂිප්ත, සංයුක්ත නිවාස වැඩ පිළිවෙළක් සඳහා අපි ළඟ අදහස් තිබෙනවා. ඒක ක්‍රමිකව දියත් කරන්න තමයි අපේ බලාපොරොත්තුව වෙන්නේ. මේ දක්වා නිවාස ව්‍යාපෘතිවල පොදු සාධකය තමයි, භාගෙට හැදීම සහ ඉන්න බැරි වෙන ගෙවල් හැදීම. නමුත්, අපි ආණ්ඩුව විධියට වැඩිම ගෙවල් හදන සහ නිවාස ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකින් විසඳන ආණ්ඩුව බවට පත් කරනවා. අපේ පාලන කාලය ඇතුළත මේ හැම කණ්ඩායමකටම තමන්ගේ නිවාස සිහිනය සැබෑ කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා කියමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.03ට, 2026 අගෝස්තු 05වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.03க்கு, பாராளுமன்றம் 2026 ஓகஸ்ட் 05, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.03 p.m. until 9.30 a.m. on Wednesday, 05th August, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 896/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத் திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 896/2025 - விடையளிப் பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 01 - 896/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 897/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத் திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 897/2025 - விடையளிப் பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 02 - 897/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

## විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස: යෝජිත දීර්ඝ කිරීම
## நீதிபதிகளின் ஓய்வுபெறும் வயது: நீடிப்பதற்கான முன்மொழிவு
## RETIREMENT AGE OF JUDGES: PROPOSED EXTENSION

2120/2026

**3. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 65 සිට අවුරුදු 67 දක්වා සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ වයස අවුරුදු 63 සිට අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(ii) එසේ නම්, ඒ සඳහා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කිරීමට කැබිනට් මණ්ඩලයෙන් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදී තිබේද;

(iii) අමාත්‍යවරයා හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එවැනි කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදී තිබේද;

(iv) උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම සාධාරණය කිරීම සඳහා පදනම් වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உயர் நீதிமன்ற நீதிபதிகளின் ஓய்வுபெறுவதற்கான வயதை 65இலிருந்து 67 வரையும், மேன்முறையீட்டு நீதிமன்ற நீதிபதிகளின் ஓய்வுபெறுவதற்கான வயதை 63இலிருந்து 65 வரையும் நீடிப்பதற்கு அரசாங்கம் கொள்கைத் தீர்மானமொன்றை மேற்கொண்டுள்ளதா;

(ii) ஆமெனில், அதற்கான அரசியலமைப்புத் திருத்தச் சட்டமூலமொன்றைத் தயாரிப்பதற்கு அமைச்சரவையால் கொள்கைசார் அனுமதி வழங்கப்பட்டுள்ளதா;

(iii) அமைச்சர் அல்லது அமைச்சின் செயலாளர், அவ்வாறான சட்டமூலமொன்றைத் தயாரிப்பதற்கு சட்டவரைஞர் திணைக்களத்துக்கு அறிவுறுத்தல்களை வழங்கியுள்ளாரா;

(iv) உயர் நீதிமன்ற நீதிபதிகளின் ஓய்வுபெறுவதற்கான வயதை நீடிப்பதை நியாயப்படுத்துவதற்கு அடிப்படையாக அமைந்த விடயங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether the Government has taken a policy decision to extend the retirement age of the Judges of the Supreme Court from 65 years to 67 years, and that of the Judges of the Court of Appeal from 63 years to 65 years;

(ii) if so, whether the Cabinet of Ministers has granted approval in principle to draft a Constitutional Amendment Bill for that purpose;

(iii) whether the Minister or the Secretary to the Ministry has instructed the Legal Draftsman's Department to prepare such a draft Bill; and

(iv) the grounds on which the extension of the retirement age of superior court judges is justified?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

(අ) (i) ඔව්.

ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ පමණක් නොව, සියලු විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

(ii) ඔව්.

2026.07.27 ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

(iii) ඔව්.

එම ප්‍රතිපත්තිමය අනුමැතිය ලැබීමෙන් පසුව 2026.07.28 වන දින නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දී ඇත.

(iv) උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ට පමණක් නොව, මෙය සියලු විනිශ්චයකාරවරුන්ට අදාළ වන කරුණකි.

අපරාධ සම්බන්ධයෙන් මුල් අවස්ථා අධිකරණ බලය ඇති පළාත්බද මහාධිකරණවලද, සිවිල් අභියාචනා බලය පවතින පළාත්බද සිවිල් මහාධිකරණවල ද පවතින ඉහළ නඩු සංඛ්‍යාව හේතුකොටගෙන එම නඩු විසඳීම ප්‍රමාද වන බව නිරීක්ෂණය වී ඇත. එයට විසඳුමක් ලෙස පළාත්බද මහාධිකරණ සහ පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ සංඛ්‍යාව ඉහළ නැංවිය යුතුය. එම අධිකරණ සංඛ්‍යාව ඉහළ නැංවීමේ දී ඊට අවශ්‍ය මහාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව ද ඉහළ නැංවිය යුතුව ඇත.

අධිකරණ ප්‍රමාණය ඉහළ නැංවීම සහ ප්‍රාදේශීයව අභියාචනාධිකරණ ක්‍රියාත්මක වීම හේතුකොට ගෙන එම අධිකරණවලට පළපුරුදු සහ විද්වත් විනිශ්චයකාරවරුන්ගේ සේවය තවදුරටත් ලබා ගත යුතුය. නමුත්, විනිශ්චයකාරවරුන්ගේ දැනට පවතින විශ්‍රාම වයස් සීමාව අනුව එවැනි පළපුරුදු සහ විද්වත් විනිශ්චයකාරවරුන්ගේ සේවය ලබා ගැනීමේ අවස්ථාව සීමා වී ඇත. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේද, අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේද, මහාධිකරණ විනිසුරුවරුන්ගේද, දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්වරුන්ගේ ද දැනට පවතින ව්‍යවස්ථාපිත විශ්‍රාම වයස ඉහළ නැංවීමේ අවශ්‍යතාවක් පැන නැඟී ඇත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

உயர் நீதிமன்றம், மேன்முறையீட்டு நீதிமன்றம் மட்டுமல்லாது, சகல நீதிபதிகளின் ஓய்வுபெறும் வயதை நீடிப்பதற்கு கொள்கைசார் முடிவு எடுக்கப்பட்டுள்ளது.

(ii) ஆம்.

2026.07.27 அன்று அதற்கான அமைச்சரவை அங்கீகாரம் கிடைத்துள்ளது.

(iii) ஆம்.

குறித்த கொள்கைசார் அங்கீகாரம் கிடைத்ததன் பின்னர், 2026.07.28 அன்று சட்ட வரைஞருக்கு ஆலோசனை வழங்கப்பட்டுள்ளது.

(iv) உயர் நீதிமன்ற நீதிபதிகளுக்கு மட்டுமன்றி, இது அனைத்து நீதிபதிகளுடனும் தொடர்புடைய விடயமாகும்.

குற்றங்கள் தொடர்பாக முதல்நிலை நீதிமன்ற அதிகாரமுள்ள மாகாண மேல் நீதிமன்றங்களிலும், குடியியல் மேன்முறையீட்டு அதிகாரம் கொண்டுள்ள மாகாண குடியியல் மேல் நீதிமன்றங்களிலும் காணப்படுகின்ற அதிகமான வழக்குகளின் எண்ணிக்கையை காரணியாகக் கொண்டு, அவற்றைத் தீர்க்க தாமதமடைவதாக அவதானிக்கப்பட்டது. அதற்கொரு தீர்வாக மாகாண மேல் நீதிமன்றம் மற்றும் மாகாண குடியியல் மேன்முறையீட்டு மேல் நீதிமன்றங்களின் எண்ணிக்கையை அதிகரித்தல் வேண்டும். குறித்த நீதிமன்றங்களின் எண்ணிக்கையை அதிகரிக்கையில், அவற்றுக்குத் தேவையான நீதிபதிகளின் எண்ணிக்கையையும் அதிகரித்தல் வேண்டும்.

நீதிமன்றங்களின் எண்ணிக்கை அதிகரித்துள்ளதாலும் பிராந்திய மேன்முறையீட்டு நீதிமன்றத்தின் செயற்பாடு மேம்பட்டுள்ளதாலும், அந்த நீதிமன்றங்களுக்கு அனுபவம் வாய்ந்த மற்றும் நிபுணத்துவம் பெற்ற நீதிபதிகளின் சேவைகள் மேலும் பெறப்பட வேண்டும். இருப்பினும், நீதிபதிகளின் தற்போதைய ஓய்வுபெறும் வயதெல்லையின்படி, அத்தகைய அனுபவம் வாய்ந்த மற்றும் நிபுணத்துவம் பெற்ற நீதிபதிகளின் சேவைகளைப் பெறும் சந்தர்ப்பம் வரையறுக்கப்பட்டுள்ளது. அதன்படி, உயர் நீதிமன்ற நீதிபதிகள், மேன்முறையீட்டு நீதிமன்ற நீதிபதிகள், மேல் நீதிமன்ற நீதிபதிகள், மாவட்ட நீதிமன்ற நீதிபதிகள் மற்றும் நீதவான்களின் தற்போதைய சட்டபூர்வ ஓய்வுபெறும் வயதை அதிகரிக்கவேண்டிய தேவை எழுந்துள்ளது.

(ஆ) ஏற்புடையதாகாது.

(a) (i) Yes.

A policy decision has been taken to extend the retirement age not only of the Judges of the Supreme Court and the Court of Appeal, but also of all judges.

(ii) Yes.

Cabinet approval for this purpose was granted on 27.06.2026.

(iii) Yes.

Following the receipt of the said policy approval, instructions were issued to the Legal Draftsman on 28.07.2026.

(iv) This matter applies to all judges and not exclusively to superior court judges. It has been observed that the resolution of cases is delayed due to the heavy case backlog existing in Provincial High Courts exercising original criminal jurisdiction, as well as Provincial Civil Appellate High Courts exercising civil appellate jurisdiction. As a measure to address this situation, it is necessary to increase the number of Provincial High Courts and Provincial Civil Appellate High Courts. Such an expansion will also require an increase in the number of High Court Judges.

Due to the increase in the number of courts and the regional operation of the Court of Appeal, the services of experienced and scholarly judges must be further secured for these courts. However, under the current retirement age limit for judges, the opportunity to retain such experienced and scholarly judges remain constrained. Accordingly, a necessity has arisen to raise the existing statutory retirement age of Supreme Court Judges, Court of Appeal Judges, High Court Judges, as well as District Judges and Magistrates.

(b) Does not arise.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.